BOI

SRI LANKA

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආයෝජය ප්‍රවර්ධන අමාත්‍යාංශය

# පටුන


සභාපතිතුමාගේ පණිවුඩය 04

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකසුම

- පරමාර්ථ හා කාර්යභාරය 05
- දැක්ම සහ මෙහෙවර 06
- අධ්‍යක්ෂ මණ්ඩලය 07
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 08

සමාලෝචනය

- ලෝක ආයෝජන ස්වභාවය - 2014 09
- විදේශ සෘජු ආයෝජන ප්‍රවණතා - ආසියානු කලාපය 11
- ආයෝජන කාර්යසාධනය 14
- කාර්යසාධනය පිළිබඳ සුවිශේෂ අවස්ථා 22

අංශවල කාර්යසාධනය

- පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන අංශය 27
- ආයෝජන ප්‍රවර්ධන අංශය 28
- ආයෝජන ඇගයීම් අංශය
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය 43
- ව්‍යාපෘති අධීක්ෂණ අංශය 44
- තාක්ෂණික සේවා අංශය 44
- ඉංජිනේරු අනුමත කිරීම් සහ විශේෂ ව්‍යාපෘති අංශය 45
- ආයෝජන සේවා අංශය 47
- මූල්‍ය අංශය 52
- මානව සම්පත් කළමනාකරණ අංශය 52
- පාලන අංශය 56
- නීති අංශය 57
- තොරතුරු තාක්ෂණ අංශය 58
- පාරිසරික කළමනාකරණ අංශය 60
- මාධ්‍ය හා ප්‍රචාරණ අංශය 62
- කාර්මික සබඳතා අංශය 63
- අභ්‍යන්තර විගණන අංශය 65
- ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය 66
- කලාප කළමනාකරණ අංශය 71

## මූල්‍ය සමාලෝචනය


- ආදායම් ප්‍රකාශය 73
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 74
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 75
- සාමාන්‍ය කොටස් ප්‍රමාණ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 76
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 77
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 79


## විගණන වාර්තා


- විගණකාධිපතිවරයාගේ වාර්තාව 94
- විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ සඳහා අදහස් දැක්වීම 117


## ඇමුණුම්


- 2014.12.31 දිනට සංවිධාන සටහන 143

ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය 144

# සභාපතිතුමාගේ පණිවුඩය



ලොව අග්‍රගන්‍ය සමාගම් කෘතහස්තභාවය, නවෝත්පාදන බිහි කිරීම සහ ගනුදෙනුකරුවන් වෙත ඉමහත් උද්‍යෝගයකින් සේවය සැලසීම වැනි මූලික ලක්ෂණ උපයෝගී කර ගනිමින් නිර්වචනය කරනු ලැබේ.  සභාපතිධූරය දැරීමේ වරප්‍රසාදය මා වෙත උදා කර දුන් විශිෂ්ටතම ආයතනයක් වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ද මෙම මූලික ලක්ෂණ උපයෝගී කර ගනිමින් නිර්වචනය කිරීම අතිශයින්ම යෝග්‍ය වන බව මගේ විශ්වාසයයි.

ආයෝජන සම්බන්ධයෙන් සැලකීමේදී, 2013 වසරේ දී ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමට හැකි වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,391 ට සාපේක්ෂව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2014 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,616 ක් පමණ වටිනා විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමට සමත් විය. 2014 වසරේදී, ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා සීමිත වෙළඳපොළ හෝ කර්මාන්ත අංශයක් වෙත ප්‍රවිශ්ට වී ව්‍යාපාරික කටයුතු සිදු කිරීම හෝ එවැනි අංශයක් තුළ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සම්පත් වැඩි වශයෙන් යොමු කිරීමට පියවර ගන්නා ලදී.  ප්‍රවර්ධන කණ්ඩායම් වෙත වැඩි අවධානයක් යොමු වන ආයෝජන ප්‍රවර්ධන පරිසරයක් ක්‍රමිකව වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සුවිශේෂී අංශ, සමාගම් හා රටවල් ඉලක්ක කර ගනිමින් කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම වසර තුළ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් රාශියක් සඳහා තම සහභාගීත්වය සනිටුහන් කරන ලද අතර දෙවන චීන දකුණු ආසියානු ප්‍රදර්ශනය, චීන ග්වැන්ජොන්ග් 21st Century Maritime Silk Road EXPO, සිංගප්පූරුව, ස්වීඩනය සහ වියට්නාමයේ පැවැත්වූ ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ යනාදී ඇතැම් විදේශ දූත මෙහෙවර සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය. ශ්‍රී ලංකාව වෙත ජපාන ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ටෝකියෝ මිට්සුබිෂි යූඑෆ්ජේ බැංකු සමාගම සහ මිසුහෝ බැංකු සමාගම සමඟ අවබෝධතා ගිවිසුම් ද අත්සන් තබන ලදී. තවද, ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය - 2014 (APBF) සහ සමාලෝචිත වසරේ කොළඹ දී පැවැත්වූ ව්‍යාපාරික සංසදය සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පූර්ණ අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික ආර්ථිකය වැඩි දියුණු කිරීම සඳහා විදේශ සෘජු ආයෝජන වැදගත් මෙහෙවරක් ඉටු කරන බව අපි විශ්වාස කරන්නෙමු. කර්මාන්ත අතර විදේශ සෘජු ආයෝජන බෙදී යෑම මත එම රටවල සේවා නියුක්තිය වර්ධනය කිරීම සඳහා ද විදේශ සෘජු ආයෝජන වැදගත් දායකත්වයක් ලබා දෙයි. විශේෂයෙන්ම, තාක්ෂණ සූක්ෂම කර්මාන්ත වෙනුවෙන් සුදුසුකම් ලත් ශ්‍රම බලකායක් බඳවා ගැනීම සඳහා ඉහළ ඉල්ලුමක් විදේශ සෘජු ආයෝජන මගින් උත්පාදනය කරන බව ද අපි දනිමු. තාක්ෂණයේ භාවිත මට්ටම මත පදනම්ව දේශයේ තාක්ෂණය හුවමාරු කිරීමේ ප්‍රධාන මාර්ගයක් වශයෙන් ද, තාක්ෂණික  සංවර්ධනය ඇති කිරීම සහ දිවයිනේ එකතු කළ අගය වෙත යොමු වූ තරඟකාරීත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට ද විදේශ සෘජු ආයෝජන දායක වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉතා වැදගත් ප්‍රකට කාර්යභාරය ප්‍රගමනය කිරීම සම්බන්ධයෙන් හා මහජනතාව වෙත ඉමහත් කැපවීමෙන් සේවා සැලසීම වෙනුවෙන් ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මගේ ස්තූතිය පුද කරමි. ගෝලීය ආර්ථිකය තුළ මෙන්ම දේශීය වශයෙන් පැවති අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට විශිෂ්ට ප්‍රතිඵල උදා කර ගත හැකි වූ තවත් වර්ෂයක අවසානය සනිටුහන් කිරීමට හැකි වීම පිළිබඳව අපි ඉමහත් සතුටට පත්වන්නෙමු.

**ආචාර්ය ලක්ෂ්මන් ජයවීර**
**සභාපති**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් නිශ්චය කරන ලද ප්‍රදේශවල කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ, සම්බන්ධීකරණය කිරීමේ හා ඒ සඳහා පහසුකම් ලබාදීමේ රජයේ ප්‍රධානම නියෝජිතායතනය ලෙස ක්‍රියා කිරීම සඳහා 1978 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) ලෙස ස්ථාපිත කරන ලද ආයතනය 1992 දී ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සංස්ථාපනය කරනු ලැබීය. බදු සහන සහ වෙනත් පහසුකම් සපයනු ලබන අපනයන ප්‍රවර්ධන කලාප වශයෙන් හඳුන්වනු ලබන සුවිශේෂී ප්‍රදේශ බෙදා වෙන් කිරීම සංවර්ධනය පිළිබඳ මූලිකම ආකෘතිය විය. මෙම කලාප කටුනායක හා බියගම ප්‍රදේශවල මුලින්ම ස්ථාපනය කරන ලද අතර පසුව තවත් කලාප ක්‍රමයෙන් සංවර්ධනය කරන ලදී. වර්තමානයේ, සමස්තයක් වශයෙන් අපනයන සංවර්ධන කලාප 14 ක් ස්ථාපනය කර තිබේ.

මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) විෂය පථය පුළුල් කිරීම තුළින් සමස්තයක් වශයෙන් මුළු දිවයිනම ආවරණය කළ හැකි වන පරිදි 1992 වසරේ පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලද පනතක් මගින් මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) බවට පරිවර්තනය විය. මෙයට පෙර, කටුනායක, බියගම හා කොග්ගල ප්‍රදේශවල මේ දක්වා ස්ථාපනය කරන ලද අපනයන සැකසුම් කලාපවල බෙදා වෙන් කරන ලද සුවිශේෂී ප්‍රදේශවලට පමණක් එහි අධිකාරී බලය සීමා විය. කාර්මික අපනයන සම්බන්ධ ප්‍රදේශවල විදේශ හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු නියෝජිතායතනයක සිට සේවා හා යටිතල පහසුකම් යන අංශ වෙත ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම ඇතුළත් වූ එහි වත්මන් කාර්යභාරය ඉටුකිරීම වෙත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ක්‍රමිකව ප්‍රවිශ්ට විය.

### අපගේ අරමුණු

ආර්ථික සංවර්ධනය කිරීම හා අභිවර්ධනය කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම, දේශීය ආයෝජන මෙන්ම විදේශ සෘජු ආයෝජන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභව විවිධාංගීකරණය කිරීම හා අපනයනය ඉපයීම් වැඩි දියුණු කිරීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම හා නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙන්ම විශේෂයෙන්ම, රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්වය තුළින් දිවයින පුරා ආයෝජන ප්‍රවර්ධන කලාප (IPZs) ස්ථාපනය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධානම අරමුණු වශයෙන් හැඳින්විය හැකි වේ.

### අපගේ කාර්යභාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ සඳහා ආයෝජන ඉලක්ක සැලසුම් කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම, විදේශ සෘජු ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම සහ එමගින් ජාතික වර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දායකත්වයක් ලබා දීම අපගේ කාර්යභාරයයි.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන, යටිතල පහසුකම්, සංචාරක කර්මාන්තය, කෘෂි කර්මාන්තය, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් යුත් ආයෝජකයෙකු සමඟ සම්බන්ධතා පවත්වන පළමු ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ව්‍යාපෘති ඉල්ලුම්පත්‍රය භාරදීමට පෙර තොරතුරු හා මාර්ගෝපදේශන ලබාදෙන අතර වෙනත් නියෝජිතායතනවල අනුමතිය ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවලදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ හා සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු ඉටු කරයි.

දිරි ගැන්වීමේ දීමනා මත සහන ගාස්තු අනුමත කර එම සහන ගාස්තු ලබාදීම, අමුද්‍රව්‍ය හා සංරචක බද්දෙන් නිදහස් කිරීම මෙන්ම මෙම ව්‍යාපෘතිවල තනතුරු දරන විදේශීය පුද්ගලයන් උදෙසා වීසා නිකුත් කිරීමට ආගමන බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඒ ඒ අංශවල ආයෝජනය කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් තක්සේරු කිරීම සිදු කරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ව්‍යාපෘති ආරම්භ කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයන්ට සහාය ලබා දෙන අතර ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආනයන/අපනයන නිෂ්කාෂණ ලබා ගැනීම, ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය සඳහා ද, නිමි භාණ්ඩ අපනයනය සඳහා ද රේගු නිෂ්කාෂණ ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම හා ඒ වෙනුවෙන් මැදිහත් වීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යභාරයයි.

සමස්ත ආයෝජන හා/හෝ අපනයන ඉපයීම් කඩිනමින් වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර ආයෝජකයන්ට සැපයීම සඳහා ආයෝජක ප්‍රවර්ධන කලාපවල සියළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මුදල් ආයෝජනය කරයි.

## දැක්ම

"ආසියාවේ තිරසාර ආයෝජන සඳහා වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත් කිරීම"

## මෙහෙවර

"ජාතික ආර්ථික සංවර්ධනයේ වැදගත්ම දායකයා වශයෙන් ස්වාභාවික පරිසරය සමඟ පවත්වා ගත යුතු ඒකාග්‍රතාව ආරක්ෂා කරන අතරතුර ප්‍රබල ප්‍රවර්ධන කටයුතු තුළින් හා ආයෝජන සඳහා විශිෂ්ට මට්ටමින් පහසුකම් සැපයීම තුළින් සම්පත් හා සහජ කුසලතා ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කර ගැනීම සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා ආරක්ෂා කිරීම".

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2014



ආචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා - සභාපති



චන්න පලන්සූරිය මහතා - සාමාජික



සංජීව වික්‍රමනායක මහතා - සාමාජික



අනුර ජයසිංහ මහතා - සාමාජික



සාගර ගුණවර්ධන මහතා - සාමාජික


## 2014.12.31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු

| නම | තනතුර |
|---|---|
| 1 ආචාර්ය ලක්ෂ්මන් ජයවීර මහතා | - සභාපති |
| 2 ඊ.ඒ.ජේ.එදිරිසිංහ මහතා | - අධ්‍යක්ෂ ජනරාල් |
| 3 ඩී.පී.ආරියසිංහ මහතා | - විධායක අධ්‍යක්ෂ (ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම) |
| 4 එස්.බී.එෆ්. ද සිල්වා මහතා | - විධායක අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| 5 පී.කේ. වල්ගම මහත්මිය | - විධායක අධ්‍යක්ෂ (නීති) |
| 6 පී.ජේ.පනාපිටිය මහතා | - විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති) |
| 7 යූ.සිරිගම්පොල මහතා | - විධායක අධ්‍යක්ෂ (කලාප) |
| 8 ආර්.එම්.වීරකෝන් මහත්මිය | - විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) |
| 9 එස්.බී. ද සිල්වා මහතා | - විධායක අධ්‍යක්ෂ (ව්‍යාපෘති අධීක්ෂණ) |
| 10 කේ.පී.වී.ඩී. ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) |
| 11 ඩී.එස්. සමරසිංහ මහතා | - අධ්‍යක්ෂ (මාධ්‍ය) |
| 12 සී.පී. මලල්ගොඩ මහත්මිය | - අධ්‍යක්ෂ (පර්යේෂන හා ප්‍රතිපත්ති උපදේශන) |
| 13 එච්.එම්. ජයසුන්දර මහතා | - අධ්‍යක්ෂ - මහනුවර කාර්මික උද්‍යානය |
| 14 යූ.ජේ.වීරසිංහ මහතා | - අධ්‍යක්ෂ - වයඹ කලාප කාර්යාලය |
| 15 එම්.ඒ.එස්. පෙරේරා මහත්මිය | - අධ්‍යක්ෂ (පරිසර) |
| 16 එන්. ද සිල්වා මහත්මිය | - අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) |
| 17 ජේ.පී.සී. ජයලත් මහතා | - අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) |
| 18 එස්.පී. ද එස්. මුතුකුමාරණ මහත්මිය | - අධ්‍යක්ෂ (මූල්‍ය) |
| 19 ඒ.කේ. ජයසිංහ මහතා | - අධ්‍යක්ෂ - සීතාවක අපනයන සැකසුම් කලාපය |
| 20 එම්.එස්.සී. සමරකෝන් මහත්මිය | - අධ්‍යක්ෂ (නීති) - රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්ව හා ව්‍යාපෘති අධීක්ෂණ |
| 21 ඩබ්.ඒ.එෆ්. ජයසිරි මහතා | - අධ්‍යක්ෂ (කාර්මික සබඳතා) |
| 22 එම්.කේ.ඩී. ලෝරන්ස් මහතා | - අධ්‍යක්ෂ - බියගම අපනයන සැකසුම් කලාපය |
| 23 ඒ.කේ.ඒ. මහින්ද මහතා | - අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| 24 ජේ. ගුණසේකර මහතා | - අධ්‍යක්ෂ - කොග්ගල අපනයන සැකසුම්කලාපය |
| 25 ඒ.ආර්. කරුණාරත්න මහතා | - අධ්‍යක්ෂ (මානව සම්පත්) |
| 26 ආර්.එම්.යූ. සෙනරත් මහතා | - අධ්‍යක්ෂ (තාක්ෂණික පාලන) |
| 27 එම්. රාමනායක මහතා | - අධ්‍යක්ෂ (ආයෝජන සේවා) |
| 28 එන්.එන්. කුමාරතුංග මහතා | - අධ්‍යක්ෂ (සේවා හා උපයෝගීතා) - ආයෝජන ඇගයීම් අංශය |
| 29 ඩබ්.යූ.කේ.එම්.ඒ. විජයකුලතිලක මහතා | - අධ්‍යක්ෂ (නිෂ්පාදන) - ආයෝජන ඇගයීම් අංශය |
| 30 බ්‍රිගේඩියර් ඩී.ඒ. අමුණුගම මහතා | - අධ්‍යක්ෂ (ආරක්ෂක) |

# ලෝක ආයෝජන ස්වභාවය - 2014
# විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම හා රටින් බැහැරට ගලායෑම.

## විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම

විදේශ සෘජු ආයෝජන සම්බන්ධයෙන් පැවති ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ ලෝක ආර්ථික මගින් අනුගමනය කරන ලද වෙළඳපොළ හිතකාමී ආයෝජන ප්‍රතිපත්ති හේතුකොටගෙන පසුගිය දශක කීපය තුළ ගෝලීය විදේශ සෘජු ආයෝජන (FDI) ප්‍රවාහය වැඩි වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැකි විය. උදාහරණයක් වශයෙන්, 1990 වසරේ ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ.ඩො. බිලියන 200, 2013 වසරේදී ඇ.ඩො. ට්‍රිලියන 1.47 ක් දක්වා ඉහළ නැග 1990 වසරට සාපේක්ෂව 7 ගුණයක වැඩිවීමක් වාර්තා කළ අතර 2014 වසරේදී මෙය ඇ.ඩො. ට්‍රිලියන 1.6 ක් දක්වා තවදුරටත් ඉහළ නගිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, දුර්වල ගෝලීය ආර්ථික බලපෑම් සහ ආයෝජකයන් සඳහා වූ ප්‍රතිපත්තිවල අස්ථිරභාවය සහ භූ-දේශපාලන අවදානම ඉහළ නැගීම හේතුවෙන් 2014 වසරේ ගෝලීය විදේශ සෘජු ආයෝජන රට තුළට ගලා ඒම සියයට 16කින් පහත බැස ඇ.ඩො. ට්‍රිලියන 1.23 ක් බවට පත් වී තිබුණි.





මූලාශ්‍රය: ලෝක ආයෝජන වාර්තාව, 2015
එක්සත් ජාතීන්ගේ වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ සමුළුව

ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයේ පහත බැසීම තුළින් කලාපීය වශයෙන් ඇති වූ විචල්‍යයන් ආවරණය කරනු ලබයි. සංවර්ධිත රටවල් සහ පරිවර්තනය වෙමින් පවතින ආර්ථිකවල විදේශ සෘජු ආයෝජන ගැලීම් කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කරන අතරතුර සංවර්ධනය වෙමින් පවතින ආර්ථික වෙත විදේශ සෘජු ආයෝජන ගැලීම් ඉතිහාසයේ කෙදිනකවත් වාර්තාගත නොවූ පරිදි ඉහළ මට්ටම්වල පැවතුණි. ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය සංවර්ධිත රටවල් වෙත ගලා යෑම 2009 වසරේදී 55% ලෙස පැවති අතර 2014 වසරේදී එය 41% ක් දක්වා පහත බැස තිබුණි. එසේ වුවද, සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත ගෝලීය විදේශ සෘජු ආයෝජන ගලා යාම 2009 වසරේ 39%ක් ලෙස වාර්තාගත වී තිබුණු අතර 2014 වසරේදී එය 56% දක්වා ඉහළ නැග තිබුණි.

අවසාන දශකය තුළ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් 2014 වසරේදී 14% ක සාමාන්‍ය වර්ධන අනුපාතයක් වාර්තා කරමින් ඇ.ඩො. බිලියන 681 ක විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයක් ආකර්ෂණය කර ගැනීමට සමත්ව තිබුණි. පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් 2014 වසරේදී ඇ.ඩො. බිලියන 48 ක විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සමත් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 55% ක කැපී පෙනෙන පහත බැසීමක් වාර්තා කර තිබුණි. ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයේ 59%ක කොටසක් ලබා ගනිමින් සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහ පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් ඇ.ඩො. බිලියන 730 ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය.


**ආර්ථිකයන් මගින් ආකර්ෂණය කරගත් විදේශ සෘජු ආයෝජන (2009-2014)ි ඇ.ඩො. බිලියන**




මූලාශ්‍රය: ලෝක ආයෝජන වාර්තාව - 2015
එක්සත් ජාතීන්ගේ වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ සමුළුව

විදේශ සෘජු ආයෝජන රට තුළට ගැලීම සම්බන්ධයෙන් රටවල් ශ්‍රේණිගත කිරීමට අනුව, 2014 වසරේ ලොව විශාලතම විදේශ සෘජු ආයෝජන ලබා ගත් රට බවට චීනය පත් වූ අතර විශාලතම විදේශ සෘජු ආයෝජන ලැබූ ප්‍රමුඛ පෙළේ ආර්ථික 20 අතරින් අර්ධයක්ම සංවර්ධනය වෙමින් පවතින හා පරිවර්තනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල් විය.

**විදේශ සෘජු ආයෝජන රට තුළට ගැලීම්: ප්‍රමුඛතම සත්කාරක ආර්ථික 20 (2013 හා 2014) (ඇ.ඩො. බිලියන)**




මූලාශ්‍රය: ලෝක ආයෝජන වාර්තාව - 2015
එක්සත් ජාතීන්ගේ වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ සමුළුව


## විදේශ සෘජු ආයෝජන ප්‍රවණතා - ආසියානු කලාපය

2014 වසරේ ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයෙන් 38% ක් (ඇ.ඩො. බිලියන 465ක්) සඳහා දායක වෙමින් සංවර්ධනය වෙමින් පවතින ආසියානු කලාපය ලෝකයේ ප්‍රමුඛතම ආයෝජන ගමනාන්තය වශයෙන් අඛණ්ඩව ශ්‍රේණිගත වී ඇත.

ආසියානු උප කලාපවල විදේශ සෘජු ආයෝජන කාර්යසාධනය සම්බන්ධයෙන් සලකා බැලීමේදී, කලාපීය මුළු ආයෝජන ප්‍රමාණයෙන් 53% ක විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගනිමින් විදේශ සෘජු ආයෝජන සඳහා විශාලතම දායකත්වය ලබාදෙන්නේ නැගෙනහිර ආසියාවයි. මුළු විදේශ සෘජු ආයෝජනවලින් 29%ක් ගිනිකොණදිග ආසියාව ද, 10% ක් දකුණු ආසියාව ද, 10% ක් බටහිර ආසියාව ද ලබා ගනියි. 2014 වසරේ ඇ.ඩො. බිලියන 34 ක් ලබාගත් ඉන්දියාව දකුණු ආසියාතික රටවල් අතරින් ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය ලබාගත් රට වශයෙන් තවදුරටත් රැඳී සිටියි.

පසුගිය දශකය තුළ, තෝරාගත් ආසියානු රටවල් වෙත විදේශ සෘජු ආයෝජන ගලා යෑම සංසන්දනය කිරීමේදී, මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව සහ වියට්නාමය වැනි ගිනිකොණ දිග ආසියාතික රටවල්, ශ්‍රී ලංකාව, මියන්මාරය, ඉන්දියාව හා බංගලාදේශය වැනි දකුණු ආසියානු රටවලට සාපේක්ෂව කැපී පෙනෙන විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට සමත්ව තිබේ. කලාපයේ තරගකාරී රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ද ඇතුළු දකුණු ආසියානු රටවල් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී පෙන්නුම් කරන ලද දුර්වල කාර්යසාධනය 2014 වසරේ ඒක ශීර්ෂ විදේශ සෘජු ආයෝජන රට වෙත ගැලීම් මගින් ද අනාවරණය වේ. උදාහරණයක් වශයෙන්, 2014 වසරේදී, ශ්‍රී ලංකාවේ ඒක ශීර්ෂ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ ඇ.ඩො. 68 හා සංසන්දය කිරීමේ දී, මැලේසියාව ඇ.ඩො. 360 ක් ද, තායිලන්තය ඇ.ඩො. 188 ක් ද, ඉන්දුනීසියාව ඇ.ඩො. 89 ක් ද, වියට්නාමය ඇ.ඩො. 99 ක් ද, වශයෙන් ඒකශීර්ෂ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ ආකර්ෂණය කර ගැනීමට සමත්ව තිබුණි.

**ශ්‍රී ලංකාව සමග තරගකාරීව කටයුතු කරන කලාපීය රටවල වි.සෘ.ආ. එම රටවල් වෙත ගැලීම්, 2003-2014**




මූලාශ්‍රය: ලෝක ආයෝජන වාර්තාව - 2015

එක්සත් ජාතීන්ගේ වෙළදාම සහ සංවර්ධනය පිළිබඳ සමුළුව

## විදේශ සෘජු ආයෝජන රටින් බැහැරට ගලා යෑම

පසුගිය වසරට සාපේක්ෂව, 2014 වසරේ ගෝලීය විදේශ සෘජු ආයෝජන රටින් බැහැරට ගලා යෑම 4%කින් වැඩි වී ඇ.ඩො. බිලියන 1,354 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුව ද, 2007 වසරේ විදේශ සෘජු ආයෝජන සම්බන්ධයෙන් පැවති උපරිම මට්ටම වූ ඇ.ඩො. බිලියන 2,130 ට සාපේක්ෂව එය තවදුරටත් පහළ මට්ටමේ පවතී.


විදේශ සෘජු ආයෝජන බැහැරට ගැලීම සම්බන්ධයෙන් සැලකීමේදී, මුල් සමාගම් මගින් විදේශ රටවල මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා විදේශ රටවල පහසුකම් ඉදිකිරීම මගින් විදේශ සෘජු ආයෝජන සිදු කිරීම හා දේශ සීමා මායිම් අතර සමාගම් ඒකාබද්ධ කිරීම් හා අත් පත් කර ගැනීම් තුළින් විදේශීය මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල බහුජාතික සමාගම් මගින් සිදු කරන ආයෝජන වාර්තාගත ඉහළ මට්ටමක් කරා ළඟා වී තිබේ. 2014 වර්ෂයේ දී, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල බහුජාතික ව්‍යාපාර මගින් පමණක් විදේශ රටවල ඇ.ඩො. බිලියන 468 ක් ආයෝජනය කරනු ලැබූ අතර එය පූර්ව වර්ෂයට සාපේක්ෂව 23% කින් ආයෝජන ඉහළ නැඟීමකි. 2007 වසරේ, බහුජාතික සමාගම් මගින් ආයෝජනය කළ ගෝලීය විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූ 22% ට සාපේක්ෂව සමාලෝචිත වසරේ දී, 35% ක වාර්තාගත ප්‍රතිශතයක් කරා ළඟා වීමට එම සමාගම්වලට හැකියාව ලැබී තිබුණි.

සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් අතර ආසියාවේ බහුජාතික ව්‍යාපාර විදේශීය රටවල දී ඔවුන්ගේ ආයෝජන ප්‍රමාණ ඉහළ නංවන ලද අතර එමගින් ලෝකයේ විශාලතම ආයෝජක කලාපය බවට ආසියාව පත්වී තිබේ. සංවර්ධනය වෙමින් පවතින ආසියාව පදනම් කරගත් බහුජාතික ව්‍යාපාර මගින් විදේශීය රටවල සිදු කරන ආයෝජන ප්‍රමාණය 2014 වසරේදී 29% කින් ඉහළ ගොස් ඇ.ඩො. බිලියන 432 ක් බවට පත් වී තිබේ.


2014 වර්ෂයේදී, හොංකොං (ඇ.ඩො. බිලියන 143), චීනය (ඇ.ඩො. බිලියන 116), ජපානය (ඇ.ඩො. බිලියන 114), සිංගප්පූරුව (ඇ.ඩො. බිලියන 41) සහ ඉන්දියාව (ඇ.ඩො. බිලියන 10) යන රටවල බහු ජාතික ව්‍යාපාර මගින් සිදු කළ මෙම ආයෝජනවල වර්ධනය ප්‍රධාන පෙළේ ආසියානු ආර්ථික සියල්ල තුළ පුළුල් වශයෙන් ව්‍යාප්ත වී ඇත.

2014 වසරේදී, ගෝලීය වි.සෘ.ආ. පිටතට ගැලීම් සම්බන්ධයෙන් සංවර්ධිත ආර්ථිකවල දායකත්වය ඇ.ඩො බිලියන 823 ක් විය. කෙසේ වුව ද, 2013 වසරේ 64%ක ගෝලීය විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් ප්‍රමාණයක් වාර්තා කරන ලද සංවර්ධිත ආර්ථික, 2014 වර්ෂයේ දී, 61%ක ගෝලීය විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් ප්‍රතිශතයක් වාර්තා කිරීම මගින් එහි දායකත්වයේ අඩුවීමක් වාර්තා කර තිබුණි. 2007 වර්ෂයේ දී, ගෝලීය වි.සෘ.ආ. සම්බන්ධයෙන් ඔවුන්ගේ වාර්තාගත දායකත්වය වූ 85% සමාලෝචිත වසර තුළ 24%කින් පහත බැස තිබුණි.

**කලාපීය මටට්මින් විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් 2003-2014**



**විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම්: ඉහළම මට්ටමේ සත්කාරක රටවල් 20 - (2013 සහ 2014) (ඇ.ඩො. බිලියනවලින්)**




මූලාශ්‍රය: www.unctad.org වෙබ් අඩවියෙන් ලබා ගත් දත්ත උපයෝගී කර ගනිමින් සම්පාදනය කරන ලදී

සටහන: වි.සෘ.ආ. පිටතට ගැලීම්වල විශාලත්වය පදනම් කරගෙන ශ්‍රේණිගත කරන ලදී.


2014 වර්ෂයේ දී 7 වන සහ 19 වන ශ්‍රේණිගත කිරීම් ලබා ගත් බ්‍රිතාන්‍ය වර්ජියානු දූපත් සහ කයිමන් දූපත් මෙම ලැයිස්තුවෙන් ඉවත් කරන ලදී.

- ගෝලීය විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් ඇ.ඩො. බිලියන 337 කට ළඟා වූ ඇමෙරිකා එක්සත් ජනපදය ලොව ප්‍රමුඛතම සත්කාරක ආර්ථික 20 අතර පළමු ස්ථානයට පත්ව තිබේ. ඇ.ඩො. බිලියන 143 ක විදේශ සෘජු ආයෝජන පිටතට ගැලීම් ප්‍රමාණය වාර්තා කළ හොංකොං දේශය දෙවන ස්ථානයට ද, ඇ.ඩො. බිලියන 116 ක වි.සෘ.ආ. පිටතට ගැලීම් වාර්තා කරන ලද චීනය තෙවන ස්ථානයට ද පත් ව තිබේ.

- පූර්ව වර්ෂයට සාපේක්ෂව, 2014 වර්ෂය තුළ, ජර්මානු, චීන සහ ප්‍රංශ බහුජාතික ව්‍යාපාරවල වි.සෘ.ආ. පිටතට ගැලීම් ප්‍රවාහ 275%, 77% සහ 72% වශයෙන් ප්‍රබල වර්ධනයක් වාර්තා කර ඇත. එක්සත් රාජධානියේ හා ලක්සම්බර්ග් දේශයේ බහුජාතික ව්‍යාපාරවල වි.සෘ.ආ. පිටතට ගැලීම් ප්‍රමාණය සෘණ අගයක් ගැනීම ජර්මනිය සහ ප්‍රංශයේ වි.සෘ.ආ. පිටතට ගැලීම් වැඩිවීම මගින් හිලව් වී ඇත.

# ආයෝජන කාර්යසාධනය – 2014

## 1. 2014 වර්ෂයේ දී ලැබුණු අයදුම්පත් සැකසීමේ ප්‍රගතිය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (27.01.2016)

2014 වසරේදී ආයෝජන මණ්ඩලයට අයදුම්පත් 194 ක් ඉදිරිපත් කරන ලද අතර එයින් අයදුම්පත් 147 ක් අනුමත කරන ලදී. ඉන් ව්‍යාපෘති 31 ක වාණිජ මෙහෙයුම් කටයුතු 2015 වසර අවසානයේ සිටආරම්භ කර ඇත. ව්‍යාපෘති 96 ක් සක්‍රීය මට්ටමින් විවිධ අදියරවල පවතී. 2014 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රමාණයට සාපේක්ෂව 51% ක සාර්ථකත්ව අනුපාතයක් සාක්ෂාත් කර ගැනීමට මෙමගින් හැකි වී ඇත (ගිවිසුම් 98 ක් අත්සන් තබන ලද බව සැලකිල්ලට ගනිමින්).

## 2. පවතින අදියර අනුව ව්‍යාපෘතිවල තොරතුරු

- 2014 වසරේදී අනුමත කළ ව්‍යාපෘති හා ගිවිසුම් අත්සන් තැබූ ව්‍යාපෘති

සමස්තයක් වශයෙන් ව්‍යාපෘති 185 ක් සඳහා 2014 වසරේදී අනුමැතීන් ලබාදුන් අතර තක්සේරු කළ සමස්ත ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 2979 (රුපියල් මිලියන 388,669) ක් විය. 2014 වසරේදී අනුමත කරන ලද ව්‍යාපෘතිවලින් උත්පාදනය කරනු ඇතැයි තක්සේරු කරන ලද මුළු රැකියා අවස්ථා ගණන 30,000 කට අධික විය.

2014 වසරේදී අනුමත වූ ව්‍යාපෘතීන්වල ආයෝජන හා රැකියා නියුක්තියේ ආංශික දායකත්වය.

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජන සඳහා දායකත්වය % | සේවා නියුක්තිය සඳහා දායකත්වය % |
|---|---|---|---|
| **සේවා/යටිතල පහසුකම්** | **91** | **66%** | **41%** |
| වරාය සංවර්ධනය | 1 | 20% | 3% |
| ප්‍රවාහණ සේවා | 1 | 15% | 3% |
| නිවාස හා දේපළ සංවර්ධනය | 14 | 9% | 7% |
| හෝටල්, ආපනශාලා සේවා සහ විනෝදාස්වාද සංකීර්ණ | 17 | 8% | 10% |
| බලශක්ති උත්පාදනය | 22 | 5% | 2% |
| සාප්පු හා කාර්යාල සංකීර්ණ | 7 | 3% | 4% |
| වෙනත් | 29 | 5.97% | 12.6% |
| **නිෂ්පාදන** | **59** | **12%** | **45%** |
| **කෘෂිකර්මාන්තය** | **2** | **0.03%** | **0.4%** |
| **පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම්** | **33** | **22%** | **13%** |
| **එකතුව** | **185** | **100%** | **100%** |

2014 වසරේ සමස්ත ආයෝජන අනුමතීන් අතරින් සේවා/යටිතල පහසුකම් අංශය 66% ක ඉහළම දායකත්වයක් ලබාදී තිබුණු අතර නිෂ්පාදන අංශයේ දායකත්වය 12% ක් ද, කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය 0.03% ක් ද විය. සමස්ත ආයෝජන අනුමතීන් අතරින් ඉතිරිය වූ 22% පවත්නා ව්‍යාපෘතීන් පුළුල් කිරීම් විය. අනුමත ව්‍යාපෘතීන්වල තක්සේරු කළ මුළු ආයෝජන අතරින් 20% ක් වරාය සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළත් වූ සේවා/යටිතල පහසුකම් අංශය සඳහා ද, මුළු ආයෝජන අතරින් 15% ක් ප්‍රවාහණ සේවා ව්‍යාපෘතියක් සඳහා ද, 9% ක් නිවාස හා දේපළ සංවර්ධනය සඳහා ද, 8% ක් හෝටල්, ආපනශාලා සේවා සහ විනෝදාස්වාද සංකීර්ණ සඳහා ද, 3% ක් සාප්පු හා කාර්යාල සංකීර්ණ සඳහා ද යොදවා තිබුණි

2014 වසරේ අනුමත ව්‍යාපෘතීන්වල තක්සේරු කළ මුළු සේවා නියුක්තියෙන් 45% ක් නිෂ්පාදන අංශයෙන් උත්පාදනය වීමට නියමිත අතර සේවා/යටිතල පහසුකම් අංශයෙන් 41% ක දායකත්වයක් ද, කෘෂිකර්මාන්ත අංශයෙන් 0.4% ක දායකත්වයක් ද මේ සඳහා ලබා දී තිබේ. අනුමත ව්‍යාපෘතීන්වල තක්සේරු කළ මුළු සේවා නියුක්තියෙන් 13% ක් පවත්නා ව්‍යාපෘතීන් පුළුල් කිරීම් මගින් උත්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2014 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් අත්සන් කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 149 ක් වු අතර එහි තක්සේරු කළ ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 2,012 (රුපියල් මිලියන 262,699) ක් විය. මෙම ව්‍යාපෘතිවලින් රැකියා අවස්ථා 25,000 කට අධික ප්‍රමාණයක් උත්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ▪ 2014 වසරේදී ඉදිකිරීම්/ක්‍රියාත්මක කිරීම් ආරම්භ කළ ව්‍යාපෘති

2014 වසරේදී, නව ව්‍යාපෘති 100 ක හා පුළුල් කරන ලද ව්‍යාපෘති 2 ක ක්‍රියාත්මක කිරීම/ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ක්‍රියාත්මක කිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල තක්සේරු කළ මුළු ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 3,286 (රුපියල් මිලියන 429,058) ක් වූ අතර එය 2013 වර්ෂය හා සංසන්දනය කිරීමේ දී 313% ක වැඩිවීමක් විය. අපේක්ෂිත රැකියා ප්‍රමාණය 24,000 කට අධික විය.

**2 වන වගුව: 2014 වසරේදී ඉදිකිරීම්/ක්‍රියාත්මක වීම් ආරම්භ කළ විශාලතම ව්‍යාපෘති 10 (තක්සේරු කළ ආයෝජන පදනම් කර ගනිමින්)**


| ව්‍යාපෘතියේ නම | ව්‍යාපාරික ක්‍රියාකාරකම | තක්සේරු කළ ආයෝජන (රුපියල් මිලියන) | තක්සේරු කළ සේවා නියුක්තිය (සංඛ්‍යා) | පිහිටීම |
|---|---|---|---|---|
| • සීමාසහිත CHEC පෝර්ට් සිටි කළම්බු (පුද්) සමාගම. | කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම | 165,750 | 2,000 | කොළඹ 01 |
| • සීමාසහිත වෝටර්ප්‍රන්ට් ප්‍රොපර්ටීස් (පුද්) සමාගම. | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 82,875 | 4,155 | කොළඹ 02 |
| • සීමාසහිත හැව්ලොක් සිටි (පුද්) සමාගම. | සාප්පු හා කාර්යාල සංකීර්ණය | 27,984 | 245 | කොළඹ 06 |
| • සීමාසහිත වෙල්කම්හොටෙල් ලංකා (පුද්) සමාගම. | කාමර 300 ක් සහිත හෝටලය/මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 15,960 | 500 | කොළඹ |
| • සීමාසහිත C M L - M T D ජොයින්ට් වෙන්චර් සමාගම. | නිවාස ඒකක 5000 ක් ඉදි කිරීම | 14,887 | 644 | මෝදර |
| • සීමාසහිත රිවරිනා රිසෝර්ට්ස් (පුද්) සමාගම. | කාමර 500 ක් සහිත හෝටලය | 10,896 | 870 | බේරුවල |
| • සීමාසහිත අහුන්ගල්ල රිසෝර්ට් සමාගම. | කාමර 501 ක් සහිත හෝටලය | 10,440 | 1,070 | ගාල්ල |
| • සීමාසහිත කෙපෙල් සී ටී ඩෙවලොප්මන්ට්ස් (පුද්) සමාගම. | බද්ධ නිවාස සංකීර්ණය | 8,656 | 30 | කොළඹ 13 |
| • සීමාසහිත සී ඩී සී ඉන්ප්‍රා (පුද්) සමාගම. | බද්ධ නිවාස සංකීර්ණය | 8,288 | 180 | කොළඹ 06 |
| • සීමාසහිත සිලෝන් බෙවරේජ් කෑන් (පුද්) සමාගම. | ඇලුමිනියම් කෑන් සඳහා පියන් නිෂ්පාදනය කිරීම | 6,575 | 109 | හොරණ අ.සැ.ක. |


## ▪2014 වසරේදී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති

2014 වසර තුළ, ව්‍යාපෘති 92 ක් (නව ව්‍යාපෘති 85 ක් හා පුළුල් කිරීමේ ව්‍යාපෘති 07 ක්) වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිවල මුළු තක්සේරු කළ ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,197 (රුපියල් මිලියන 156,230 ක්) වු අතර එය 2013 වසරට සාපේක්ෂව 77% ක වැඩිවීමක් විය. මෙම ව්‍යාපෘතිවලින් රැකියා අවස්ථා 13,000 කට අධික සංඛ්‍යාවක් උත්පාදනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2014 වර්ෂයේ දී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති 92 න් 21 ක් නිෂ්පාදන අංශයට අයත් වූ අතර ව්‍යාපෘති 20 ක් සංචාරක හා විවේක අංශයට ද, ව්‍යාපෘති 15 ක් බලශක්ති උත්පාදන අංශයට ද, ව්‍යාපෘති 11 ක් යටිතල පහසුකම් අංශයට ද, ව්‍යාපෘති 6 ක් සේවා අංශයට ද, ව්‍යාපෘති 5 ක් දැනුමැති සේවා අංශයට ද, ව්‍යාපෘති 4 ක් ඇඟලුම් අංශයට ද, ව්‍යාපෘති 3 ක් කෘෂිකාර්මික අංශයට ද අයත් විය.

2014 වසරේදී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති අනුව දිස්ත්‍රික්ක ව්‍යාප්ත වී තිබූ ආකාරය




මෙම රූපයට අනුව, වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘතිවලින් 50% ක් පමණ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර කළුතර, නුවර එළිය සහ පුත්තලමේ 6% බැගින් ද, මහනුවර දිස්ත්‍රික්කයේ 5% ක් ද, හම්බන්තොට, මාතලේ සහ මාතර දිස්ත්‍රක්කවල 4% බැගින් ද, අම්පාර, බදුල්ල, කෑගල්ල සහ කිලිනොච්චි දිස්ත්‍රක්කවල 2% බැගින් ද, අනුරාධපුර, මඩකලපුව, ගාල්ල, කුරුණෑගල, මන්නාරම, රත්නපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල 1% බැගින් ද වශයෙන් ඉතිරි ව්‍යාපෘති 50% භූගෝලීය වශයෙන් මෙම දිස්ත්‍රික්ක 19 තුළ ව්‍යාප්ත වී තිබේ.


## 3. 2014 වසරේදී ආකර්ෂණය කර ගත් විදේශ සෘජු ආයෝජන

ඇමෙරිකානු ඩොලර් බිලියන 2 කට අධික විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් දිවයින වෙත ආකර්ෂණය කර ගැනීමට හැකි වූ අනුගාමී හතර වන වසර වශයෙන් 2014 වසර වාර්තාගත විය. මෙම වසර තුළ අකර්ෂණය කර ගැනීමට හැකි වූ ඉහළම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වූයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1616.258 කි.

2014 වසරේ ලැබුණු මුළු විදේශ සෘජු ආයෝජනවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 339 ක් (21%) වූ ඉහළතම විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් නිවාස හා දේපළ සංවර්ධනය, සාප්පු හා කාර්යාල සංකීර්ණ අංශයෙන් ලැබී තිබුණ අතර ඇමෙරිකානු ඩොලර් මිලියන 334 ක් (21%) නිෂ්පාදන අංශයෙන් ලැබී තිබුණි. ගුවන් ප්‍රවාහණ සමාගම්වලින් ලබා දෙන ලද සේවා මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 325 ක (20%) විදේශ සෘජු ආයෝජන ලැබී තිබුණි


- <u>විදේශ සෘජු ආයෝජනවල ආංශික සංයුතිය - 2014</u>

| අංශය | වි.සෘ.ආ. (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| නිෂ්පාදන | 334 |
| කෘෂිකර්මාන්තය | 6 |
| සේවා | |
| දුරකථන සහ විදුලි සංදේශ ජාලය | 152 |
| නිවාස හා දේපළ සංවර්ධනය, සාප්පු හා කාර්යාල සංකීර්ණ | 339 |
| වරාය සංවර්ධනය | 178 |
| හෝටල් සහ ආපන ශාලා | 68 |
| ගුවන් ප්‍රවාහණ සමාගම්වල සේවා | 325 |
| ඉන්ධන, ගෑස්, පෙට්‍රෝලියම් සහ වෙනත් | 5 |
| තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාරික කාර්යාවලි බැහැරින් ඉටු කරවා ගැනීම | 25 |
| බලශක්ති උත්පාදනය | 8 |
| වෙනත් සේවා | 88 |
| ආයෝජන මණ්ඩලීය සේවා නොවන | 88 |
| එකතුව | 1616 |




## විදේශ සෘජු ආයෝජනවල ප්‍රධාන ප්‍රභව - 2014

| රට | වි.සෘ.ආ. (ඇමෙරිකානු ඩොලර් මිලියන) |
|---|---|
| චීනය | 404 |
| එක්සත් රාජධානිය | 383 |
| ඇ.එ.ජ. | 128 |
| සිංගප්පූරුව | 103 |
| නෙදර්ලන්තය | 99 |
| මුරුසිය | 98 |
| හොංකොං | 74 |
| ඉන්දියාව | 52 |
| කැනඩාව | 42 |
| ඕස්ට්‍රේලියාව | 37 |
| මැලේසියාව | 37 |
| එ.අ.එ. | 31 |
| ජපානය | 15 |
| ලක්සම්බර්ග් | 14 |
| ප්‍රංශය | 10 |
| වෙනත් රටවල් | 91 |
| **එකතුව** | **1616** |




ඇමෙරිකානු ඩොලර් මිලියන 404 ක් ලබා දෙමින් 2014 වසරේ විදේශ සෘජු ආයෝජනවල විශාලතම ප්‍රභවය වූයේ චීනයයි. එක්සත් රාජධානිය ඇමෙරිකානු ඩොලර් මිලියන 383 ක විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයක් ද, ඇමෙරිකා එක්සත් ජනපදය ඇමෙරිකානු ඩොලර් මිලියන 128 ක් ද, සිංගප්පූරුව ඇමෙරිකානු ඩොලර් මිලියන 103 ක් ද, නෙදර්ලන්තය ඇමෙරිකානු ඩොලර් මිලියන 99 ක් ද, මුරුසිය ඇමෙරිකානු ඩොලර් මිලියන 98 ක් ද, හොංකොං දේශය ඇමෙරිකානු ඩොලර් මිලියන 74 ක් ද, ඉන්දියාව ඇමෙරිකානු ඩොලර් මිලියන 52 ක් ද, කැනඩාව ඇමෙරිකානු ඩොලර් මිලියන 42 ක් ද, ඕස්ට්‍රේලියාව ඇමෙරිකානු ඩොලර් මිලියන 37 ක් ද, මැලේසියාව ඇමෙරිකානු ඩොලර් මිලියන 37 ක් ද, එ.අ.එ. රාජ්‍යය ඇමෙරිකානු ඩොලර් මිලියන 31 ක් ද, ජපානය ඇමෙරිකානු ඩොලර් මිලියන 15 ක් ද, ලක්සම්බර්ග් ඇමෙරිකානු ඩොලර් මිලියන 14 ක් ද, ප්‍රංශය ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් ද වශයෙන් 2014 වසරේ මුළු විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 94% ක් සඳහා මෙම රටවල් පහළොව දායකත්වය ලබා දී තිබුණි.


## 4. උපලබ්ධි වූ සමුච්චිත ආයෝජන




2014 වර්ෂය අවසානයේ දී උපලබ්ධි වූ මුළු සමුච්චිත ආයෝජනය රු. බිලියන 1,756 ක් වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 16% ක වර්ධනයක් පෙන්නුම් කරයි. උපලබ්ධි වූ ආයෝජනය වන රු. බිලියන 1,756 න් 65% ක් වන රු. බිලියන 1,133 මගින් විදේශීය සංරචකය නිරූපණය කරනු ලබන අතර ඉතිරි 35% වන රු. බිලියන 623 මගින් දේශීය පුද්ගලික ආයෝජනය නිරූපණය කරයි.

උපලබ්ධි වූ මුළු සමුච්චිත ආයෝජනයෙන් 75% ක් යටිතල පහසුකම් සහ සේවා අංශය සඳහා ලැබී තිබුණු අතර ඉතිරි 25% ඇඟලුම් අංශය ඇතුළත් වන නිෂ්පාදන අංශය වෙත ලැබී තිබුණි.ලබා දී තිබුණි.


## 5.සමුච්චිත රැකියා නියුක්තිය





2014 වසරේ දෙසැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපෘතිවල සමුච්චිත රැකියා නියුක්තිය 484,675 ක් ලෙස වාර්තාගත වී තිබුණි.

ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපෘතිවල මුළු සමුච්චිත රැකියා නියුක්තියෙන් 62% ක් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ අංශයෙන් උත්පාදනය වී තිබූ අතර 19% ක් වෙනත් නිෂ්පාදන අංශයෙන් ලැබී තිබුණි. 2014 වසරේ මුළු සමුච්චිත රැකියා නියුක්තයෙන් 19% ක් කෘෂිකර්මාන්තය ඇතුළත් වූ සේවා සහ යටිතල පහසුකම් අංශයෙන් උත්පාදනය වී තිබුණි.

# 6.අපනයන කාර්යසාධනය




2014 වසර තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අපනයනවලින් 50% කට අධික ප්‍රමාණයක් ඇඟලුම් අංශය මගින් නිරූපණය කෙරේ. අනෙකුත් අංශවලට සාපේක්ෂව අඩුම අපනයන කාර්යසාධනය කෘෂිකර්ම අංශය මගින් නිරූපණය කරනු ලැබීය.

# කාර්යසාධනය පිළිබඳ සුවිශේෂී අවස්ථා

## 2013 සහ 2014 වසරවල සංඛ්‍යාන සාරාංශය

| ප්‍රධාන දර්ශක – ව්‍යාපෘතිවල අදියර මගින් | | | 2013 | 2014* | 2013/2014 |
|---|---|---|---|---|---|
| | | | | | % වෙනස |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති | | | | | |
| **අ.** ලැබුණු අයදුම්පත් | | | | | |
| අයදුම්පත් සංඛ්‍යාව | | | | | |
| | නව | | 198 | 194 | -2 |
| | පුළුල් කිරීම් | | 39 | 47 | 21 |
| | එකතුව | | 237 | 241 | 2 |
| **ආ.** අනුමැතීන් | | | | | |
| අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | | | | | |
| | නව | | 143 | 152 | 6 |
| | පුළුල් කිරීම් | | 38 | 33 | -13 |
| | එකතුව | | 181 | 185 | 2 |
| | | | | | |
| තක්සේරු කරන ලද ආයෝජනය | | | | | |
| | - විදේශීය (රු. මිලියන) | | 337,980 | 224,687 | -34 |
| | - දේශීය (රු. මිලියන) | | 251,781 | 163,982 | -35 |
| | - එකතුව (රු. මිලියන) | | 589,761 | 388,669 | -34 |
| රැකියා නියුක්තියේ ධාරිතාව (සංඛ්‍යා) | | | 37,514 | 30,845 | -18 |
| **ඇ.** අත්සන් තබන ලද ගිවිසුම් | | | | | |
| ගිවිසුම් සංඛ්‍යාව | | | | | |
| | | නව | 108 | 128 | 19 |
| | | පුළුල් කිරීම් | 37 | 21 | -43 |
| | | එකතුව | 145 | 149 | 3 |
| | | | | | |
| තක්සේරු කරන ලද ආයෝජනය | | | | | |
| | | - විදේශීය (රු. මිලියන) | 370,631 | 98,877 | -73 |
| | | - දේශීය (රු. මිලියන) | 248,185 | 163,822 | -34 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | - එකතුව (රු. මිලියන) | 618,816 | 262,699 | -58 |
| රැකියා නියුක්තියේ ධාරිතාව (සංඛ්‍යා) | | | 41,548 | 25,378 | -39 |
| **ඈ.** <u>ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ</u> | | | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | | | |
| | | නව | 80 | 100 | 25 |
| | | පුළුල් කිරීම් | 8 | 2 | - |
| | | එකතුව | 88 | 102 | 16 |
| | | | | | |
| තක්සේරු කරන ලද ආයෝජනය | | | | | |
| | | - විදේශීය (රු. මිලියන) | 40,287 | 234,809 | 483 |
| | | - දේශීය (රු. මිලියන) | 63,598 | 194,249 | 205 |
| | | - එකතුව (රු. මිලියන) | 103,884 | 429,058 | 313 |
| | | රැකියා නියුක්තියේ ධාරිතාව (සංඛ්‍යා) | 13,883 | 24,807 | 79 |
| | | | | | |
| **ඉ.** වාණිජ මෙහෙයුම් කටයුතු <u>ආරම්භ කළ</u> | | | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | | | |
| | | නව | 97 | 85 | -12 |
| | | පුළුල් කිරීම් | 5 | 7 | 40 |
| | | එකතුව | 102 | 92 | -10 |
| | | | | | |
| තක්සේරු කරන ලද ආයෝජනය | | | | | |
| | | - විදේශීය (රු. මිලියන) | 38,730 | 74,103 | 91 |
| | | - දේශීය (රු. මිලියන) | 49,587 | 82,127 | 66 |
| | | - එකතුව (රු. මිලියන) | 88,317 | 156,230 | 77 |
| රැකියා නියුක්තිය (තක්සේරු කරන ලද) (සංඛ්‍යා) | | | 17,900 | 13,967 | -22 |
| | | | | | |
| **ඊ.** <u>වාණිජ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති සංඛ්‍යාව (දෙසැම්බර් මාසය අවසානය වන විට) **</u> | | | | | |
| | | මුල් ව්‍යාපෘති | 1612 | 1598 | -1 |
| | | පුළුල් කිරීම් | 188 | 202 | 7 |
| | | 200 GFP | 116 | 111 | -4 |
| | | එකතුව | 1,916 | 1,911 | 0 |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| උ. විදේශීය සෘජු ආයෝජන (ජනවාරි සිට දෙසැම්බර්) | | | | | |
| | | (ඇමෙරිකානු ඩොලර් මිලියන) | 1,391 | 1,616 | 16 |
| | | (රු. මිලියන) | 179,592 | 210,986 | 17 |
| | | | | | |
| **ඌ.** අපනයන (ජනවාරි සිට දෙසැම්බර්) | | | | | |
| එකතුව (ඇමෙරිකානු ඩොලර් මිලියන) | | | 7,226 | 7,588 | 5 |
| එකතුව (රු. මිලියන) | | | 932,988 | 990,655 | 6 |
| | | | | | |
| **එ.** ආනයන (ජනවාරි සිට දෙසැම්බර්) | | | | | |
| එකතුව (ඇමෙරිකානු ඩොලර් මිලියන) | | | 4,270 | 4,874 | 14 |
| එකතුව (රු. මිලියන) | | | 551,276 | 636,368 | 15 |
| | | | | | |
| | | ප්‍රවර්ගයට අනුව - (රු. මිලියන) | | | |
| | | ප්‍රාග්ධන භාණ්ඩ | 125,391 | 148,961 | 19 |
| | | අමු ද්‍රව්‍ය | 425,695 | 487,122 | 14 |
| | | වෙනත් ද්‍රව්‍ය | 190 | 284 | 50 |
| **ඒ.** දෙසැම්බර් මාසය අවසානය වන විට රැකියා නියුක්තිය (සමුච්චිත) | | | 483,470 | 484,675 | 0.2 |
| | | | | | |
| | | | | | |
| **ඔ.** ව්‍යාපෘති සංඛ්‍යාව *** | | | | | |
| වසන ලද ව්‍යාපෘති | | | 33 | 65 | 97 |
| තාවකාලිකව අත්හිටුවන ලද ව්‍යාපෘති | | | 5 | 5 | 0 |
| අවලංගු කරන ලද ගිවිසුම් | | | 122 | 54 | -56 |
| එකතුව | | | 160 | 124 | -23 |
| | | | | | |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 16 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති | | | | | |
| **අ.** අනුමැතීන් | | | | | |
| අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | | | 39 | 27 | -31 |
| තක්සේරු කරන ලද ආයෝජනය | | | | | |
| | - විදේශීය (රු. මිලියන) | | 4,920 | 12,195 | 148 |
| | - දේශීය (රු. මිලියන) | | 230 | 338 | 47 |
| | - එකතුව (රු. මිලියන) | | 5,150 | 12,533 | 143 |

| | | | | | |
|---|---|---|---|---|---|
| රැකියා නියුක්තියේ ධාරිතාව (සංඛ්‍යා) | | | 2,789 | 3,278 | 18 |
| B. වාණිජ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති සංඛ්‍යාව (සමුච්චිත) ** | | | | | |
| | ව්‍යාපෘති සංඛ්‍යාව | | 715 | 717 | 0.3 |
| | තක්සේරු කරන ලද ආයෝජනය | | | | |
| | | - විදේශීය (රු. මිලියන) | 21,801 | 22,987 | 5 |
| | | - දේශීය (රු. මිලියන) | 10,220 | 33,576 | 229 |
| | | - එකතුව (රු. මිලියන) | 32,021 | 56,562 | 77 |
| | රැකියා නියුක්තියේ ධාරිතාව (සංඛ්‍යා) | | 33,624 | 36,866 | 10 |
| | | | | | |
| | | | | | |
| | | | | 2013 | 2014 |
| | | | වීනිමය අනුපාතය (ඇ.ඩො.) | 129.11 | 130.56 |

* තාවකාලික

අයදුම්පත්: ලැබුණු මුළු අයදුම්පත් (ප්‍රතික්ෂේප කරන ලද ව්‍යාපෘති සහ අස් කර ගන්නා ලද ව්‍යාපෘති ඇතුළත්ව)

තක්සේරු කරන ලද ආයෝජනය/රැකියා
නියුක්තිය - පුළුල් කිරීම්වල වටිනාකම
ඇතුළත්ව

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (කළමනාකරණ තොරතුරු පද්ධතිය - 2015 දෙසැම්බර් 4 වන දා)

** වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව ගිවිසුම් අවලංගු කළ/වසා දැමූ/තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති හැර

*** වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව ගිවිසුම් අවලංගු කළ/වසා දැමූ/තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති (පුළුල් කිරීම් හැර) (ව්‍යාපෘතියේ ප්‍රවර්තන තත්ත්වයට අනුව)

සම්පාදනයඃ සංඛ්‍යාන ඒකකය/පර්යේෂණ සහ ව්‍යාපෘති අනුමත කිරීමේ අංශය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# "ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අංශවල කාර්යසාධනය"

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අංශවල කාර්යසාධනය

## 1. පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය

ව්‍යාපාරික පරිසරය හා සම්බන්ධ විවිධ ප්‍රතිපත්ති, නීති හා ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම, විදේශීය හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ සේවා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරමින් පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන කාර්යය ඉටු කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශයට පැවරී තිබේ. මෙම සන්දර්භය තුළ, ආයෝජනවලට අදාළ ප්‍රතිපත්ති සංශෝධන ක්‍රියාවලියේ ප්‍රධානම උත්ප්‍රේරකයා බවට පත්වෙමින්, විදේශ සෘජු ආයෝජන ප්‍රතිපත්ති හා ආයෝජන පරිසරය වැඩි දියුණු කිරීම සම්බන්ධ යෝජනා ඉදිරිපත් කිරීමේ හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යභාරය මෙම අංශයට පැවරී තිබේ.

ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා නීත්‍යානුකූල නියාමන සංශෝධන හා ප්‍රතිපත්ති හා සම්බන්ධ ආයෝජකයන්ගේ ගැටළු වෙනුවෙන් කටයුතු කිරීම තුළින් ආයෝජන පරිසරයේ (ව්‍යාපාරික ශ්‍රේණිගත කිරීම්) ක්‍රමික වැඩි දියුණු කිරීම් තහවුරු කිරීමේ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

එයට අමතරව, සුවිශේෂී ලාභදායක වෙළඳපොළවල් හඳුනාගැනීම සඳහා ව්‍යාපාරික පර්යේෂණ සිදු කිරීම ද, වෙළඳ හවුල්කරුවන්ගේ හා කලාපීය තරඟකරුවන්ගේ ආර්ථික හා ව්‍යාපාරික කරුණු සම්බන්ධයෙන් තොරතුරු කෙටියෙන් සම්පාදනය කිරීම, ආයෝජන සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු අංශ හඳුනාගැනීම සඳහා දේශයට හා අංශයට සුවිශේෂී වන අත්‍යවශ්‍ය පර්යේෂණ සිදු කිරීම හා තරඟකාරී හා සාපේක්ෂ ප්‍රතිලාභ මත පදනම් වෙමින් ආයෝජන ප්‍රවර්ධන ක්‍රමෝපාය සකස් කිරීම මෙම අංශයේ විෂය පථයට අයත් වන අනෙකුත් ප්‍රධාන පර්යේෂණ හා ප්‍රතිපත්තිමය කටයුතු වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රකාශන සම්පාදනය කිරීම තුළින් මෙන්ම කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ආයෝජනවලට අදාළ දත්ත සැපයීම තුළින් අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සඳහා තොරතුරු බෙදා හැරීමේ කාර්යභාරය ද මෙම අංශය වෙත පැවරී තිබේ. ආයෝජන මාර්ගෝපදේශ, ආයොජන සම්බන්ධ තොරතුරු අඩංගු ප්‍රචාරක පත්‍රිකා හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම ප්‍රකාශයට පත්කිරීම සඳහා ද පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය ප්‍රධාන වශයෙන්ම දායක විය.

තව ද, 2014 වසරේදී, දත්ත සැපයීම සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් 1000 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා සේවා සපයා තිබුණු අතර මෙයින් නියෝජිතායතන 10ක පමණ ඉල්ලීම්, ආයෝජන ආශ්‍රිත සුවිශේෂී තොරතුරු සැපයීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින නියෝජිතායතනවල ඉල්ලීම් විය.
විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂිත කිරීම පිණිස වන ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් (BITs), නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) හා ඉන්දු ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) වැනි ආයෝජන සම්බන්ධ විධිවිධාන ඇතුළත් සර්වග්‍රාහී ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම් ඇතුළු අන්තර්ජාතික ආයෝජන ගිවිසුම්වලට අදාළ පර්යේෂණ කෙටුම්පත් කිරීම/ඒ පිළිබඳව සාකච්ඡාවල නිරතවීම හා එවැනි පර්යේෂණ සිදු කිරීම ද, වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) වැනි අන්තර්ජාතික සංවිධාන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් ද මෙම අංශය වගකීමෙන් බැඳී සිටියි.

එබැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය ශ්‍රී ලංකාව වෙත විදේශීය හා දේශීය ආයෝජන ආකර්ශණය කර ගැනීමේ ප්‍රයත්නය උදෙසා ඉතා වැදගත් මෙන්ම කැපී පෙනෙන දායකත්වයක් ලබා දී තිබේ.

## 2. ආයෝජන ප්‍රවර්ධන අංශය

### 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැමිණි දූත පිරිස් ප්‍රවර්ධන අංශය

| රට | දූත පිරිස | දිනය | උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර |
|---|---|---|---|
| **චීනය** | | | |
| | ග්වැන්ජොන්ග් පළාතේ ජොන්ග්ෂැන් නගරයේ සිට සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සැදුම් ලත් වෙළඳ සහ ආයෝජක දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. ලංකා වාණිජ මණ්ඩලය මගින් මෙම දූත පිරිස සඳහා ගලදාරි හෝටලයේ දී ව්‍යාපාරික සංසදයක් සංවිධානය කළහ. | 2014.03.04 | ශ්‍රී ලංකාවේ දේශීය ආයෝජන සහ වෙළඳාම සම්බන්ධ වාතාවරණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා. ආලෝකකරනය, ආනයන අපනයන වෙළඳාම, නිෂ්පාදන කටයුතු, ගෘහ විදුලි උපකරණ, ජලජ සහ මුහුදු නිෂ්පාදන ආදි ක්ෂේත්‍ර පිළිබඳව උනන්දුවක් දක්වයි. |
| | ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජි පුයිවට් ලිමිටඩ් හි ප්‍රධාන විධායක නිලධාරී ජයන්ත වික්‍රමසිංහ මහතා කැටුව ගැන්හායි නගරයේ වයිනා පොලි ගෲප් සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.02.27 | නිශ්චල දේපළ සංවර්ධනය වෙනුවෙන් මුදල් ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වයි. |
| | හියුබෙයි හැන්ග්යැන් පවර් ඉන්ජිනියරින් කම්පැණි ලිමිටඩ් හි සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.03.19 | මෙම සමාගම ශ්‍රී ලංකාවේ ජල සම්පාදන සහ මාර්ග ඉදි කිරීම සම්බන්ධ ව්‍යාපෘති අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටින අතර EOI තක්සේරුකරණ ප්‍රතිඵල ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටියි. |
| | පාලිත සිංහලගේ මහතා සමඟ චීනයේ ඩාලියන් නගරයේ සිට සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.03.27 | ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමේ අවස්ථා ගවේශනය කිරීම පිළිබඳව උනන්දුවක් දක්වයි.. |
| | ග්වැන්ජොන්ග් පළාතේ මහජන ආණ්ඩුවේ විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මඟ පෙන්වීම යටතේ ග්වැන්ජොන්ග් පළාතේ දූත පිරිසක්. | 2014 අප්‍රේල් | ඖෂධ, කිරි නිෂ්පාදන සහ රෙදිපිළි සහ ධීවර නිෂ්පාදන ඇතුළු ආනයන ආදේශන ලෙස සැලකෙන නිෂ්පාදන සඳහා මුදල් ආයෝජනය කිරීම පිළිබඳව උනන්දුවක් දක්වයි. |
| | හැන්ග්ජොයි උප කවුන්සලය සහ විදේශ වෙළඳාම පිළිබඳ ලියාමින්ග් පළාත් කවුන්සලය සමඟ සහයෝගයෙන් බීජිං ලාන්සින් සෙන්චරි එක්සිබිෂන් කම්පැණි ලිමිටඩ් මගින් සංවිධානය කරන ලද සාමාජිකයන් 22 දෙදෙනෙකුගෙන් සමන්විත ඉතා වැදගත් ව්‍යාපාරික දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.06.19 | ලංකා වාණිජ මණ්ඩලය මගින් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ව්‍යාපාරික සංසදයක් සහ ද්විපාර්ශ්වික රැස්වීම් සංවිධානය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය ලෝහ සුන්බුන් භාවිත කර ඇලුමිනියම් කුට්ටි නිෂ්පාදනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පිළිගත නොහැකි වූ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. |
| | සම්මේලන සහ ප්‍රදර්ශන කටයුතු පිළිබඳ සියෑමන් කාර්යාංශයේ සංවිධාන කමිටුවේ නිලධාරීන්ගේ ශ්‍රී ලංකා සංචාරය. | 2014.07.15 | අන්තර්ජාතික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා සැප්තැම්බර් මාසයේ දී සියෑමන් හි ෆුජියාන් පළාතේ පැවැත්වීමට නියමිත වාර්ෂික උත්සවයක් වන වෙළඳාම සහ ආයෝජනය සඳහා වන චීන අන්තර්ජාතික ආයෝජන සැණකෙළිය (CIFIT) ප්‍රවර්ධනය කිරීම පිළිබඳව උනන්දුවක් දක්වයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ හමුවක් පැවැත්වීමට ද කටයුතු පිළියෙළ කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජි කම්පැනි ලිමිටඩ් ආයතනය සමඟ එක්ව චීන/ඇමෙරිකානු මූල්‍යායතන සමූහයේ සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත වන දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.07.23 | නිශ්චල දේපළ සංවර්ධනය සහ සංචාරක අංශ සඳහා ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා ගවේෂණය කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වයි. |
| | ශ්‍රී ලංකා චීන මිත්‍රත්ව සංගමය මගින් සංවිධානය කරන ලද ජොන්ග්ෂැන් නගරයේ සිට සාමාජිකයන් 35 දෙනෙකුගෙන් සමන්විත වූ දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. ශ්‍රී ලංකා චීන මිත්‍රත්ව සංගමය මගින් ටාජ් සමුද්‍රා හෝටලයේ දී ව්‍යාපාරික සංසදයක් සහ ද්විපාර්ශ්වික රැස්වීමක් ද සංවිධානය කර තිබුණි. | 2014.08.13 | ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආරාධනා කර තිබුණි. අධ්‍යක්ෂ (මාධ්‍ය සහ ප්‍රචාරණ) මෙම ඉදිරිපත් කිරීම සිදු කළ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ මෙම ඉදිරිපත් කිරීම චීන භාෂාවට පරිවර්තනය කළ ඔලි මෙනවිය ද මෙම අවස්ථාවට සහභාගී වූහ. |
| | පසුගිය ජූනි මාසයේ කුන්මින් පළාතේ පැවැත් වූ " දකුණු ආසියාතික සැණකෙළිය" සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යුන්නන් පළාතේ ප්‍රමුඛ පෙළේ සැපයුම් කණ්ඩායමක සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.08.12 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා/අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද හමුවීමට මෙම දූත පිරිසට අවස්ථාව සලසා දී තිබුණු අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කටුනායක අපනයන සැකසුම් කලාපයේ විධායක අධ්‍යක්ෂ (කලාප) සමඟ ද හමුවීම් සංවිධානය කර තිබුණි. |
| | ශ්‍රී ලංකා චීන මිත්‍රත්ව සංගමය මගින් සිදු කරන ලද ප්‍රවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ මඟ පෙන්වීම යටතේ චැන් සූ නගරයේ සිට සාමාජිකයන් 21 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. | 2014.08.11 | වෙළඳාම, පිඟන් මැටි නිෂ්පාදන, ලෝහ භාණ්ඩ නිෂ්පාදනය සහ ප්ලාස්ටික් කර්මාන්තය ආදිය මෙම දූත පිරිස උනන්දුවක් දැක් වූ ප්‍රධාන ක්ෂේත්‍ර විය. |
| | ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රතිපත්ති සහ ආයෝජන අවස්ථා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා චීනයේ වූහාන් මධ්‍යම කොටසේ සිට 13 දෙනෙකුගෙන් සමන්විත ව්‍යවසායකයන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ. | 2014.08.28 | බලශක්ති පරිණාමක අලෙවි කිරීම සහ නිෂ්පාදනය කිරීම මෙම ව්‍යවසායකයන් කණ්ඩායම උනන්දුවක් දැක්වූ ප්‍රධාන ක්ෂේත්‍ර විය. මේ සඳහා පිරිනමනු ලබන දිරි ගැන්වීම් සහ වෙනත් සහන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු දක්වන ලදී. |
| | ග්වන්සෝ මහ නගර සභා ප්‍රදේශයේ විදේශ වෙළඳාම සහ ආර්ථික සහයෝගිතා ව පිළිබඳ කාර්යාංශයේ (BOFTEC) සිට සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ. | 2014.09.26 | ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය ඔවුන්ගේ රැස්වීමට සහභාගී වන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආරාධනා කරන ලද අතර ආයෝජන මණ්ඩලය මගින් පහසුකම් සැපයීම සහ ප්‍රතිපත්ති පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන ලද අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳව ධනාත්මකව හඳුන්වා දීම සඳහා සකස් කරන ලද වීඩියෝ චිත්‍රපටයක් ද මෙම දූත පිරිස වෙනුවෙන් ප්‍රදර්ශනය කරන ලදී. ඔටෝමොබයිල් ග්‍රෲප්, ෆාර්මසියුටිකල්ස් සමාගම සහ රජයේ නිලධාරීන්ගෙන් ද මෙම දූත පිරිස සමන්විත විය. |
| | ශන්ජාන් නාගරික රජයේ නියෝජ්‍ය මහ ලේකම් ලින් ෂියාඕවෙයි මහතාගේ මඟ පෙන්වීම යටතේ එක්ස්පෝ සංවිධායක කමිටුවේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2014 වසරේ නොවැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ China Guangdong Maritime Silk Road EXPO ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආරාධනා කිරීමට සහ ආයෝජන මණ්ඩලය ඒ සඳහා සහභාගී වීම දිරි ගැන්වීම සඳහා ශන්ජාන් නාගරික | 2014.10.14 | ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා සහ ආයෝජන සිදු කිරීමේ විභවයෙන් යුත් ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා උනන්දුවක් දක්වනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීහු Maritime Silk Road Expo 2014 ප්‍රදර්ශනය සඳහා සහභාගී වූහ. |

| | | | |
|---|---|---|---|
| | රජයේ නියෝජ්‍ය මහ ලේකම් ලින් ෂියාඕවෙයි මහතාගේ මග පෙන්වීම යටතේ එක්ස්පෝ සංවිධායක කමිටුවේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා මුණ ගැසුණහ. | | |
| **ඉන්දියාව** | | | |
| | ඉන්දියාවේ මුම්බායි පළාතේ සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ සහ ආයෝජන දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ. ලංකා වාණිජ මණ්ඩලයේ පී. කුල්කරනි සහ කණ්ඩායම මගින් මෙම ව්‍යාපාරික සංසදය සංවිධානය කරන ලදී. | 2015.02.20 | රසායනික ද්‍රව්‍ය ආනයන සහ අපනයන වෙළඳාම සහ නිෂ්පාදනය සම්බන්ධ ශ්‍රී ලංකාවේ දේශීය සහ වෙළඳ වාතාවරණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම. |
| | සාමාජිකයන් 08 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් තමිල්නාඩුවේ සිට ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.07.23 | ශ්‍රී ලංකාවේ නිශ්චල දේපල සහ සංචාරක කර්මාන්ත අංශයේ ආයෝජන අවස්ථා පිළිබඳව ගවේෂණය කිරීම සඳහා. |
| | FCCISL කැටුව ඉන්දියාවේ සිට සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් | 2014.03.27 | ඔවුහු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) හමු වූහ. |
| **මැද පෙරදිග රටවල්** | | | |
| | 2015 වර්ෂයේ මාර්තු මාසයේ අවසානයේ එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ පැවැත්වීමට නියමිතව තිබූ වාර්ෂික ආයෝජන හමුව 2015 (AIM) සම්බන්ධයෙන් සයිඩ් අසාද් ඉමාම් මහතා හමු වූහ. | 2014.09.18 | එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යයේ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා දූත පිරිස වශයෙන් සහභාගී වූහ. |
| | රජයේ නියෝජිතායතන ඇතුළත්ව මැද පෙරදිග රටවල තානාපතිවරුන් හමු වූහ. | 2014.09.29 | මැද පෙරදිග රටවල් සඳහා ඒකාබද්ධ ප්‍රවර්ධනාත්මක දූත මෙහෙවරක් සංවිධානය කිරීම. |
| | සෞදි අරාබියේ දී පැවැත් වූ ශ්‍රී ලංකා වෙළඳ, ආයෝජන සහ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන මාර්ග දැක්ම ප්‍රදර්ශනයේ දී වාණිජ අමාත්‍යවරයා හමු විය. | 2014.09.30 | රටින් පිටත දී පැවැත් වූ මැද පෙරදිග ප්‍රවර්ධන වැඩසටහන |
| | පොදු ප්‍රවර්ධන සඳහා දින නියම කිරීමට රජයේ නියෝජිතායතන සමඟ පසු විපරම් සාකච්ඡාව | 2014.10.01 | රටින් පිටත දී පැවැත් වූ පොදු ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කිරීම |
| | කටාර් රාජ්‍යයේ සිට පැමිණි දූත පිරිසක් හමු විය. | 2014.10.16 | බ්‍රවුන් ෆීල්ඩ් සමාගම සංචාරක කර්මාන්තය පිළිබඳව උනන්දුවක් දක්වන ලදී. |
| | කටාර් රාජ්‍යයේ සිට පැමිණි සාමාජිකයන් 03 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් | 2014.10.27 | ‍යටිතල පහසුකම් සහ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍ර |
| **ජපානය** | | | |
| | "හිතාචි ඉන්ඩියා" සමාගමේ (ඉන්දියාවේ පිහිටි ජපාන පරිපාලිත සමාගමක්) සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් තොරතුරු සෙවීමේ දූත මෙහෙවරක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් හමු වීමේ අරමුණින් 2014 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.10.30 | එම දූත පිරිස සැපයුම් සේවා සහ නිෂ්පාදන ක්ෂේත්‍ර පිළිබඳව උනන්දුවක් දැක්වූහ. |
| | Kagome නියෝජිතයන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් හමු වූහ. | 2014.11.02 | එම දූත පිරිස තක්කාලි වගා කිරීමේ සහ තක්කාලි පිරිසැකසුම් කිරීමේ ක්ෂේත්‍ර පිළිබඳව උනන්දුවක් දැක්වූහ. |
| | ඕ විල් කෝපරේෂන් හී සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් තොරතුරු සෙවීමේ දූත මෙහෙවරක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන | 2014.11.13 | එම දූත පිරිස හෝටලයක් ඉදි කිරීම පිළිබඳව උනන්දුවක් දැක්වූහ. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩල නිලධාරීන් හමු වීමේ අරමුණින් 2014 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | | |
| | ෆ්ලෝරාන් සමාගමේ සහ සීමාසහිත ෆ්‍රිජියන් සෙකියුරිටීස් සමාගමේ සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් හමු වීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. | 2014.11.21 | ඉහළ පෙළේ පාරිභෝගියන්ගෙන් සැදුම් ලත් වෙළඳපොළ සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබා දෙන රෝහලක් ඉදි කිරීම පිළිබඳව එම දූත පිරිස උනන්දුවක් දැක්වූ අතර ඔවුහු දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වැනි ඒ සම්බන්ධයෙන් අදාළ වන දේශීය අධිකාරීන් හමු වූහ. |
| | බංගලාදේශය පාදක කර ගත් ජපාන සමාගම් 11 ක සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් තොරතුරු සෙවීමේ දූත මෙහෙවරක් සඳහා 2014 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර 2014/11/21 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් හමු වූහ. කොළඹ සහ බංගලාදේශයේ පිහිටි ජපාන විදේශ වෙළඳාම පිළිබඳ සංවිධානය (JETRO) මෙම දූත මෙහෙවර සංවිධානය කළහ. | 2014.11.21 | එම දූත පිරිස නිමි ඇඳුම් නිෂ්පාදනය, ආහාර පිරි සැකසීම, සහ සැපයුම් සේවා ආදී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වූහ. |
| **ඊශ්‍රායලය** | | | |
| | ඊශ්‍රායලය වෙත ශ්‍රී ලංකාව විසින් සිදු කළ සාර්ථක ව්‍යාපාරික දූත මෙහෙවර පිළිබඳව පැවැත්වූ පසු විපරම් රැස්වීම්වලදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කළහ. | සැප්තැම්බර් | පළතුරු වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අවම වශයෙන් හෙක්ටයාර් 100 ක ප්‍රමාණයේ ඉහළ මට්ටමේ යෝග්‍යතාවක් සහිත ඉඩමක් මිලදී ගැනීමට හෝ දීර්ඝ කාලීන බදු පදනම මත හෝ ලබා ගැනීම සඳහා සොයයි. |
| **එක්සත් රාජධානිය** | | | |
| | UK TI සහ කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය මගින් සංවිධානය කරන ලද සාමාජිකයන් 21 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ සහ ආයෝජන දූත පිරිසක් එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරය කළහ.<br><br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහූ සාකච්ඡා සඳහා සහභාගී වූහ. | නොවැම්බර් | • ගුවන් සේවාව සහ සමුද්‍රීය කටයුතු<br>• බල ශක්තිය<br>• වාණිජ<br>• දැනුම<br>• සංචාරක කර්මාන්තය<br>යනා දී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමේ අවස්ථා ගවේෂණය කිරීම. |

## 2014 වර්ෂයේ දී ආයෝජන ප්‍රවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවර

### චීනය

<u>2014 ජූනි 6 වන දා සිට 14 වන දා දක්වා පවත්වනු ලැබූ දෙවන චීන දකුණු ආසියාතික ප්‍රදර්ශනය</u>

2014 ජූනි 6 වනදා සිට 14 වන දා දක්වා යුන්නන් පළාතේ කුන්මින් නගරයේ පවත්වනු ලැබූ දෙවන චීන දකුණු ආසියානු ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය.

මෙම ප්‍රදර්ශනයේ දේශීය සම්බන්ධීකාරක ආයතනය වශයෙන් කටයුතු කළ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ශ්‍රී ලංකාව වෙත පිරි නමා තිබූ ශ්‍රී ලංකා ප්‍රදර්ශන ශාලාවේ පිහිටි මුළු ප්‍රදර්ශන කුටි 90 අතරින් එක් ප්‍රදර්ශන කුටියක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත වෙන් කර දී තිබුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මෙම ප්‍රදර්ශන කුටිය වටා වූ බිත්තිවල ආයෝජන සම්බන්ධ ප්‍රධාන අංශ විශේෂයෙන් ඉස්මතුවන පරිදි පසුබිම් දර්ශන සකස් කරන ලදී. අප දිවයිනේ ව්‍යාපාරික වාතාවරණය හා ආයෝජන ප්‍රතිපත්ති පිළිබඳව විග්‍රහයක් සංක්ෂිප්තව දක්වමින් චීන භාෂාවෙන් පිළියෙළ කරන ලද ප්‍රවර්ධන පත්‍රිකා ප්‍රදර්ශනය නැරඹීමට පැමිණ සිටි අමුත්තන් අතර බෙදා දෙන ලදී. චීන භාෂාවෙන් පිළියෙළ කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ ධනාත්මක හඳුන්වාදීමක් ඇතුළත් වීඩියෝ චිත්‍රපටියක් ද තිරගත කිරීමට කටයුතු පිළියෙළ කරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මාධ්‍ය) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගි විය.

**ප්‍රතිඵලය :**

ඉහත සංචාරයේ ප්‍රතිඵලයක් වශයෙන්, යුන්නන් සැපයුම් සේවා ආයතනයේ සාමාන්‍යාධිකාරීවරයා වන ෂාඕ ජියැන්හේ මහතාගේ මඟ පෙන්වීම යටතේ සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත වන දූත පිරිසක් 2014 අගෝස්තු 14-16 දක්වා කාල පරිච්ඡේදය තුළ යුන්නන් නගරයේ සිට ශ්‍රී ලංකාව වෙත පැමිණියහ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මුලසුන හෙබ වූ ව්‍යාපාර ප්‍රවර්ධන රැස්වීමක් මෙම දූත පිරිස වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවැත්වූ රැස්වීම්වල දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම දූත පිරිස වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවන ලදී.

<u>චීන ග්වැන්ජොන්ග් - 2014 ඔක්තෝබර් 29 වන දා සිට නොවැම්බර් 03 වනදා දක්වා</u>

අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය සඳහා වූ චීන කවුන්සලය ග්වැන්ජොන්ග් කමිටුව (CCIPT) සහ සහාය ලබාදෙන වෙනත් නියෝජිතායතන කීපයක් මගින් සත්කාරකත්වය දැක් වූ ශන්ජාන් නගරයේ දී පැවැත්වූ චීන ග්වැන්ජොන්ග් 21 වන සියවසේ සමුද්‍රීය සේද මාවත ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය.

ශ්‍රී ලංකාව වෙත නොමිලේ පිරිනමන ලද ශ්‍රී ලංකා ප්‍රදර්ශන ශාලාවේ එක් කුටියක් මීටර් 3x3 බැගින් වූ ප්‍රදර්ශන කුටි 30 අතරින් එක් ප්‍රදර්ශන කුටියක් මෙම ප්‍රදර්ශනයේ දේශීය සම්බන්ධීකරණ ආයතනය වශයෙන් කටයුතු කළ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පිරිනමන ලදී.

ආයෝජන සිදු කිරීම සඳහා පවතින ප්‍රධාන අංශ ඉස්මතු කර දක්වමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ප්‍රදර්ශන කුටියේ බිත්තිවල පසුතල දර්ශන පිළියෙළ කරන ලද අතර දිවයිනේ ව්‍යවහාරික වාතාවරණය සහ සංචාරකයන් සඳහා වන ආයෝජන ප්‍රතිපත්ති පිළිබඳ සමස්ථ විග්‍රහයක් දක්වමින් චීන භාෂාවෙන් පිළියෙළ කරන ලද ප්‍රචාරක දැන්වීම් ද බෙදා හරින ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය චීන භාෂාවෙන් පිළියෙළ කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ ධනාත්මක හඳුන්වාදීමක් ඇතුළත් වීඩියෝ චිත්‍රපටියක් ද තිර ගත කිරීමට කටයුතු කරන ලදී. ඇඟලුම් හෝ කොහු නිෂ්පාදන හා ස්වර්ණාභරණ පිළිබඳ පුද්ගලික අංශයේ සමාගම් 27කින් සමන්විත වන දූත පිරිසක් ද මෙම එක්ස්පෝ ප්‍රදර්ශනයට සහභාගි වූහ.

- අධ්‍යක්ෂ (වයඹ කලාප කාර්යාලය)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) සහ චීනයේ ආයෝජන මණ්ඩල කවුන්ටරයේ සේවයේ නියුතු නිලධාරියා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් සහභාගි වූහ.

**ප්‍රතිඵලය :**

ඉහත සංචාරයේ ප්‍රතිඵලයක් වශයෙන්, CPC ශන්ජාන් කමිටුවේ පක්ෂ ලේකම් සහ ශන්ජාන් මහනගර සභා මහජන කොංග්‍රසයේ ස්ථාවර කමිටු අධ්‍යක්ෂකවරයා වන ලියු සියෝහුවා මහතාගේ මඟපෙන්වීම යටතේ ශන්ජාන් නගරයේ සිට සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර දේශීය ව්‍යවසායකයන් හමුවීම සඳහා ද, ශන්ජාන් හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික හා ආර්ථික සම්බන්ධීකරණය සවිබල ගැන්වීම සඳහා ද, කොළඹ හිල්ටන් හෝටලයේ දී, ව්‍යාපාරික ප්‍රවර්ධන සමුළුවක් පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා චීන ව්‍යාපාරික කවුන්සලය හා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම චීන දූත පිරිස වෙනුවෙන් මෙම අවස්ථාව අඛණ්ඩව සම්බන්ධීකරණය කරන ලදී. පුද්ගලයන් 60කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

මෙසේ ඇති කර ගන්නා ලද සහයෝගීතාව තවදුරටත් පවත්වා ගැනීමේ අරමුණින්, බිබිලේ සීනි

## සිංගප්පූරුව

**<u>සිංගපෝර් 2014 ජුනි 10-14 වන දා දක්වා</u>**

සිංගප්පූරුවේ සිටින ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ ආරාධනාවකට අනුව, 2014 ජුනි 11 වනදා සිංගප්පූරුවේදී පැවැත්වූ ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය. මෙම සම්මන්ත්‍රණය සිංගප්පූරුවේ ව්‍යාපාරික සංසද ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර එය සිංගප්පූරු ව්‍යාපාරික සංසදය, අන්තර්ජාතික සිංගප්පූරු ව්‍යාවසාය හා ලංකා වාණිජ මණ්ඩලයේ/ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සලයේ සමායෝජනයෙන් පවත්වනු ලැබීය.

ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව සිංගප්පූරු ආයෝජකයන් අතර දැනුවත් බව තවදුරටත් වැඩි දියුණු කිරීම මෙම සම්මන්ත්‍රණය පැවැත්වීමේ අරමුණ විය. ලංකා වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා සිංගප්පූරු ව්‍යාපාරික කවුන්සලයේ සභාපතිවරයා විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා දූත පිරිස මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූ අතර ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම පිළිබඳව විශාල උනන්දුවක් මෙම අවස්ථාවට පැමිණ සිටි ආගන්තුකයන් අතර දක්නට ලැබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉදිරිපත් කිරීමක් මෙම වැඩසටහනට ඇතුළත් වූ අතර ඉන්පසුව ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ආයෝජකයන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගි විය.

## ඊශ්‍රායලය

**ඊශ්‍රායලය 2014 ජුනි 24 - 28 දක්වා**

ඊශ්‍රායලයේ LR කණ්ඩායම, ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සමීප සහයෝගීතාවෙන් යුක්තව ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් මෙම දූත මෙහෙවර සංවිධානය කරන ලදී.

ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ආයෝජකයන් හඳුනා ගැනීමට සහ එම ආයෝජකයන්ට ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යාපාරික වාතාවරණය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඔවුන් වෙත පිරිනමනු ලබන ප්‍රතිලාභ පිළිබඳ විස්තර ලබා දීම මෙම දූත මෙහෙවරේ අරමුණ විය.

ඊශ්‍රායලයේ ආයෝජනය කිරීමේ හැකියාවෙන් යුත් ආයෝජකයන් අතර ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආරාධනය කරනු ලැබු අතර සභාපතිවරයා හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන) මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් සහභාගී විය.

විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවනු ලැබූ අතර පුද්ගලික අංශය නියෝජනය කරමින් සහභාගි වූ දූත පිරිස අතර මහ බැංකුවේ හා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද වූහ. ව්‍යාපාරික සංසද, ද්විපාර්ශ්වික සාකච්ඡා ද ඉන් අනතුරුව පැවැත් වූ ක්ෂේත්‍ර චාරිකාවලින් ද මෙම වැඩසටහන සමන්විත විය.

පහත සඳහන් සමාගම් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ අභිප්‍රාය ප්‍රකාශ කළහ.

| සමාගමේ නම | යෝජනා/විශේෂ කරුණු |
|---|---|
| 1. ක්‍රුස්ට්‍රෝ ගෲප් (ඊශ්‍රායලයේ විශාලතම රෙදිපිළි සමාගම) | ශ්‍රී ලං කා ඇඳුම් නිෂ්පාදකයන් ලබා ඇති ඉහළ පෙළේ ප්‍රසිද්ධිය පි ළිබඳව සලකා බලා ක්‍රුස් ට්‍රෝ ගෲප් ආයතනය ඇ ඳුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරින් සේවා ලබා ගැනීමට කැමැත්තක් දක්වයි. |
| 2. මෙකොරොට් (ඊශ්‍රායලයේ රාජ්‍ය ජල සමාගම) | ශ්‍රී ලංකාවේ ජල ව්‍යාපෘති වල ආයෝජනය කිරීමට මෙම සමා ගම කැමැත්තක් දක්වයි. ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශය සඳහා ලබා දීමට හැකි ව්‍යාපෘති සැපයීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එකඟ විය. |
| 3. "එල්ආර්" කණ්ඩායම | එල්ආර් කණ්ඩායමට සෞඛ්‍ය අංශයේ ආයෝජනය කිරීමට කැමැත්තක් දැක්වූහ. ජෛව විද්‍යා කා ර්මික උද්‍යාන ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම පිළි බඳ ව්‍යාපෘති යෝජනාවක් ශවුහු ඉදිරිපත් කළහ. |

ප්‍රතිඵලය:

"LR" ඔවුන්ගේ ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලද අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ රැස්වීම් සංවිධානය කරන ලදී.

"Eco – Nexion" සමාගම පුනර්ජනනීය බලශක්ති අංශය පිළිබඳව ඉහළ මට්ටමේ උනන්දුවක් දැක්වූ අතර ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනාව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඉදිරිපත් කළහ.

## ඉන්දුනීසියාව

**ඉන්දුනීසියාව 2014 ඔක්තෝබර් 13 වනදා**

ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපතිනිය වූ අනෝමා විජේතිලක මහත්මිය 2014 ඔක්තෝබර් 13 වනදා පැවැත්වූ "ශ්‍රී ලංකා - ඉන්දුනීසියා ඒකාබද්ධ ආර්ථික කොමිසම" සඳහා සහභාගි වීමට ශ්‍රී ලංකාවට අවස්ථාව සලසා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආයෝජන ප්‍රවර්ධන දූත පිරිස ශ්‍රී ලංකාවට පැමිණියහ.

2014 ඔක්තෝබර් 9 හා 10 දිනවල පැවැත්වූ "ශ්‍රී ලංකා - ඉන්දුනීසියා" ඒකාබද්ධ ආර්ථික කොමිසම හා සමගාමීව ශ්‍රී ලංකා ඉන්දුනීසියා ව්‍යාපාරික සංසදයක් සංවිධානය කිරීමට එම තානාපතිතුමිය යෝජනා කළාය.

ඉන්දුනීසියාවේ බහුජාතික සමාගම් සහභාගි වූ මෙම සංසදයට කොළඹ ඉන්දුනීසියානු තානාපති කාර්යාලයේ නිලධාරීහු, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික දූත පිරිසක් ද සහභාගී වූහ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් සහභාගී වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) මගින් ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා යන මැයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබීය. මෙම සංසදයෙන් පසුව;

- Puna Group
- The Harvest Group
- Diana Furniture
- Salsabita Collection
- Indofood CBP
- PT Tri Cipta Chandre
- PT Jaya Swarsa Agung
- Rainbow Roof
- Biza Satephanes Tiitus Widyasa

යන සමාගම් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබීය.

## ස්වීඩනය

**ස්වීඩනය - 2014 නොවැම්බර් 25 - 30 දක්වා**

ශ්‍රී ලංකාව හා ස්වීඩනය අතර නව ආයෝජන ආකර්ෂණය කර ගැනීම, නව ව්‍යාපාරික සම්බන්ධතා ස්ථාපනය කර ගැනීම සහ ආයෝජන සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වැඩි දියුණු කර ගැනීම සඳහා ස්වීඩනයේ ව්‍යාපාරික හා ආයෝජන ප්‍රජාව අතර ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම මෙම දූත මෙහෙවරේ ප්‍රධාන අරමුණ විය.

ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක්, ස්වීඩනයේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් හා ද්විපාර්ශ්වික සාකච්ඡා මෙම වැඩසටහනට ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව විශේෂයෙන් ඉස්මතු කර දක්වමින්, "ආයෝජන අවස්ථා" පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් විය. ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම හා ව්‍යාපාරික කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් විමසීම් රාශියක් ස්වීඩන ව්‍යාපාරික ප්‍රජාව වෙත ලැබී තිබුණි.

ප්‍රතිඵලය :

ස්කැන්ඩිනේවියා කෙයාර්

පිළිකා සම්බන්ධයෙන් සාත්තු කිරීම පිළිබඳව විශේෂයෙන් සැලකිල්ල යොමුකරමින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ ආයෝජනය කිරීමට ස්කැන්ඩිනේවියා කෙයාර් සමාගම උනන්දුවක් දක්වන ලදී. වෛද්‍ය පීඨයේ සහාය ඇතිව, කොළඹ විශ්ව විද්‍යාලය මගින් ඔවුන්ගේ ඉල්ලීමට අදාළව සවිස්තරාත්මක තොරතුරු ලබා දෙන ලදී.

## Mobil Scandinavia AB

මෙම සමාගම සන්නිවේදන අංශයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ලදී. එම්-ටිකට්න් හා මොබයිල් වොලට් (සියළුම දේශීය හා අන්තර්ජාතික දුරකථන සම්බන්ධතා සඳහා මොබයිල් භාවිතය) ක්‍රියාත්මක කිරීම සඳහා හවුල්කරුවන් වශයෙන් කටයුතු කිරීමට හැකි දේශීය සමාගම් පිළිබඳව ඔවුහු සොයා බලති. මෙම යෝජනාව දේශීය ජංගම දුරකථන සේවා සපයන්නන් වෙත ඉදිරිපත් කර තිබේ.

<u>ස්වීඩනයේ සිට මෙරටට පැමිණි සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත දූත පිරිස</u>

ස්වර්ණාභරණ නිෂ්පාදනාගාරයක් හා අයිස් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා ආයෝජන පරිසරය පිළිබඳව හැදෑරීමේ අරමුණින් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත ස්වීඩන් දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරය කළහ. අදාළ බලධාරීන් සමඟ ක්ෂේත්‍ර චාරිකා හා සාකච්ඡා වට සංවිධානය කර තිබුණි. දේශීය මැණික් සැපයුම්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීමට ඔවුන් සමත් වූ අතර ස්වර්ණාභරණ නිෂ්පාදන සමාගමක් පිහිටුවීමට අවස්ථාවක් එළඹෙන තුරු මේ වන විටත් ඔවුහු අපේක්ෂාවෙන් පසු වෙති.

## ජපානය

ජපානය 2014 ඔක්තෝබර් 19 - 25 දක්වා

ශ්‍රී ලංකාව වෙත ලැබෙන ජපාන ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2014 අගෝස්තු 18 වනදා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ටෝකියෝ මිට්ෂුබිෂි යූඑෆ්ජේ ලිමිටඩ් (BTMU) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, BTMU සමඟ සමායෝජනයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්මන්ත්‍රණ දෙකකින්ද, ද්විපාර්ශ්වික සාකච්ඡාවලින් ද සමන්විත වූ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් 2014 ඔක්තෝබර් 19-25 දක්වා කාල සීමාව තුළ ඔසාකා හා ටෝකියෝ නගරවල පැවැත්වීම සඳහා කටයුතු සංවිධානය කරන ලදී.

මෙම දූත මෙහෙවරේ අරමුණු පහත සඳහන් කර තිබේ.

- ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ජපාන ආයෝජකයන් දැනුවත් කිරීම හා ඔවුන් තුළ ඒ සම්බන්ධයෙන් විශ්වාසයක් ගොඩ නැංවීම තුළින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා ඔවුන් අභිප්‍රේරණය කිරීම.
- ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමේ විභවයෙන් යුත් ආයෝජකයන් හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාවේ පවත්නා ව්‍යාපාරික වාතාවරණය පිළිබඳව මෙන්ම ආයෝජකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිරිනැමෙන ආයෝජන අවස්ථා හා එහි ප්‍රතිලාභ පිළිබඳව ඔවුන්ට විස්තර කිරීම.
- විදේශීය රටවල ආයෝජනය කිරීම සඳහා ජපාන ආයෝජකයන් දිරි ගන්වන ජපාන ආයතනවලට අවශ්‍ය තොරතුරු හා සහයෝගය ලබා දීම තුළින් හඳුනාගත් ආයෝජකයන් සමඟ සමීප සම්බන්ධතා ගොඩ නංවා ගැනීම.

ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ ගරු අමාත්‍යවරයා විසින් මෙම දූත පිරිස මෙහෙයවනු ලැබූ අතර ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ සභාපතිවරයා හා ආයෝජන මණ්ඩලයේ තවත් නිලධාරීන් තිදෙනෙක් මෙම දූත පිරිසට ඇතුළත් වූහ.

වෙළඳාම, නිෂ්පාදනය, සැපයුම් සේවා, ඉදිකිරීම්, මූල්‍ය හා රක්ෂණ අංශ නිෂ්පාදනය කරමින් සහභාගි වූ පුද්ගලයන් 60 දෙනෙකු පමණ ඔසාකා සම්මන්ත්‍රණයට සහභාගි වූ අතර සැපයුම් සේවා, සැහැල්ලු ඉංජිනේරු නිෂ්පාදන නිපදවීම, ඇසුරුම්කරණය, වෙළඳාම, යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණය, රක්ෂණ සේවා, උපදේශනය ආදී අංශ නියෝජනය කරමින් පුද්ගලයන් 185 දෙනෙකු පමණ මෙම සංසදයට සහභාගි වූහ.

ඉහත දක්වන ලද සම්මන්ත්‍රණවලට අමතරව Sharp Inc, Yanmar සමාගම, Sojitzu සමාගම, ITOCHU සමාගම යනාදී ප්‍රමුඛ පෙළේ ජපාන සමාගම් සමඟ මෙම දූත පිරිස සාකච්ඡා පවත්වන ලදී. ජපාන මෝටර් රථ අමතර කොටස් කාර්මික සංගමය (JAPIA) සහ ජපාන ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණ කාර්මික සංගමය (JEITA) යනාදි සමාගම්වල නියෝජිතයන් හමුවීමට ද මෙම දූත පිරිසට අවස්ථාව සැලසුණි.

## <u>විශේෂ අවස්ථා/ක්‍රියාකාරකම්</u>

යුරෝපා හවුල - ශ්‍රී ලංකා ආයෝජක කතිකාව

යුරෝපා හවුල - ශ්‍රී ලංකා ආයෝජක කතිකාව 2014 අගෝස්තු මාසයේදී එළි දක්වන ලදී. යුරෝපා හවුලේ පාර්ශ්වකරුවන් පිළිබඳ ආයෝජක ආශ්‍රිත ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමේ වේදිකාවක් ලෙස ක්‍රියාත්මක වීම මෙම සංසදය පැවැත්වීමේ අරමුණ විය.

ශ්‍රී ලංකා යුරෝපා කොමිසම, යුරෝපීය වාණිජ මණ්ඩලය හා ශ්‍රී ලංකාවේ අදාළ යුරෝපීය දූත මණ්ඩල සියල්ලේම සමීප සම්බන්ධීකරණය තුළින් මෙම වැඩසටහන සංවිධානය කර තිබුණි.

ආයෝජකයන් විසින් සිදු කරන ලද විමසුම් පදනම් කර ගනිමින් අදාළ රජයේ අමාත්‍යාංශ/බලධාරීන්ට මෙම වැඩසටහනට සහභාගී වන ලෙස ඇරයුම් කර තිබුණි

### ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014 (APBF)

ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදයේ එක් ප්‍රධාන අංශයක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුග්‍රහය දක්වා තිබුණ අතර මෙම සංසදය 2014 නොවැම්බර් 24-26 දක්වා කොළඹදී පවත්වන ලදී.

මෙය පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය (CBF) ට සමාන වන පරිදි එක් ප්‍රධාන අංශයක් වාර්ෂිකව ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පරිදි සැලසුම් කළ ක්‍රියාවලියක කොටසක් විය. ශ්‍රී ලංකාව වෙත අවධානය යොමු කර ගනිමින් පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය (CBF) තුළින් ලබාගත් වාසි සහගත තත්ත්වය තවදුරටත් පවත්වා ගැනීම මෙම සංසදය ශ්‍රී ලංකාවේ පැවැත්වීමේ අරමුණු විය.

මෙම අවස්ථාව සංවිධානය කිරීම හා එය සාර්ථකත්වයට පත් කිරීම සඳහා ප්‍රවර්ධන අංශය හා මාධ්‍ය අංශය UNESCAP සමඟ සමීප සමායෝජනයක් පවත්වා ගනිමින් කටයුතු කරන ලදී.

විදේශිකයන් 75කට අධික සංඛ්‍යාවක් සහ දේශීය පුද්ගලයන් 100 ක් පමණ මෙම සංසදයට සහභාගී වූ අතර දේශීය විදේශීය සහභාගීවන්නන්ට සම්බන්ධතා ජාලයක් ස්ථාපනය කිරීම සඳහා අග්‍රගන්‍ය වේදිකාවක් මෙම සංසදය තුළින් නිර්මාණය විය. මෙම සංසදයෙන් අනතුරුව ද්වීපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබූ අතර විභව්‍ය ආයෝජකයන් සඳහා පරිශ්‍ර නැරඹීමේ අවස්ථා ද ලබා දෙන ලදී.

## ජපානය

1. **ජපාන විදේශ සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා උපදේශකයෙකු පත් කිරීම.**

2014 අප්‍රේල් 01 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි, ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපදේශකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා JICA ආයතනය මගින් ජපාන පුරවැසියකු වන කයිසෝ සුචියා මහතා පත් කරන ලද අතර ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ 8 වන මහලේ ඔහුගේ කාර්යාලය පිහිටා තිබේ. 2016 මාර්තු 31 දින වන තෙක් ඔහු මෙම තනතුරේ කටයුතු කරනු ඇත.

2. **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ප්‍රමුඛ පෙළේ ජපාන බැංකු දෙක අතර අවබෝධතා ගිවිසුම.**

ශ්‍රී ලංකාව වෙත ජපාන ආයෝජන ලැබීම තවදුරටත් දිරිගැන්වීම සඳහා පහත දක්වා ඇති ලොව සුපතල ජපාන බැංකු දෙක සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවබෝධතා ගිවිසුම් අත්සන් තබන ලදී.

I ටෝකියෝ මිට්සුබිසි බැංකුව, UFJ - 2014/08/18 වන දින අත්සන් තබන ලදී.
II මිෂුහෝ බැංකු සමාගම - 2014/09/07 වන දින අත්සන් තබන ලදී.

## 2014 ජනවාරි 01 වන දා සිට 2014 දෙසැම්බර් 31 වන දා දක්වා කාල සීමාව තුළ ව්‍යාපාති යෝජනා/අයදුම්පත් සැකසෙමින් පවතින අදියර
## (17 වන වගන්තිය යටතේ)

| අනුක්‍රමික අංකය | විස්තරය | 2014 | | | | | | | | | තක්සේරු කළ ආයෝජනය (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංචාරක කර්මාන්තය | කෘෂි කර්මාන්තය | දැනුම් සේවා | නිෂ්පාදනය | ඇඟලුම් | යටිතල පහසුකම් | උපයෝගිතා | සේවා | එකතුව | විදේශීය | දේශීය | එකතුව |
| 1 | ලැබුණු අයදුම්පත්/යෝජනා | 23 | 3 | 8 | 29 | 17 | 17 | 23 | 8 | 128 | 136,764.95 | 98,232.33 | 234,997.28 |
| 2 | අනුමත කරන ලද ව්‍යාපෘති | 18 | 2 | 6 | 31 | 16 | 17 | 23 | 10 | 123 | 193,428.47 | 95,338.13 | 288,766.60 |
| 3 | ගිවිසුම් අත්සන් තබන ලද ව්‍යාපෘති | 19 | 5 | 8 | 34 | 14 | 16 | 21 | 6 | 123 | 59,984.46 | 101,472.42 | 161,456.88 |
| 4 | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | 14 | 6 | 5 | 23 | 13 | 20 | 10 | 5 | 96 | 216,217.99 | 190,176.13 | 406,394.13 |
| 5 | වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති | 21 | 3 | 5 | 20 | 3 | 10 | 15 | 6 | 83 | 61,620.18 | 53,958.25 | 115,578.42 |

2015/10/09 දින ලබා ගන්නා ලද වාර්තාවකි.

## 2014 ජනවාරි 01 වන දා සිට 2014 දෙසැම්බර් 31 වන දා දක්වා කාල සීමාව තුළ ව්‍යාපාති යෝජනා/අයදුම්පත් සැකසෙමින් පවතින අදියර (16 වන වගන්තිය යටතේ)

| අනුක්‍රමික අංකය | විස්තරය | ව්‍යාපෘති සංඛ්‍යාව | තක්සේරු කළ ආයෝජනය (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|
| | | | විදේශීය | දේශීය | එකතුව |
| 1 | ලැබුණු අයදුම්පත්/යොජනා | 38 | 46,336.04 | 1,534.72 | 47,870.76 |
| 2 | අනුමත කරන ලද ව්‍යාපෘති | 27 | 12,194.85 | 337.92 | 12,532.77 |
| 3 | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | 1 | 179.20 | 716.80 | 896.00 |
| 4 | වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති | 15 | 11,333.13 | 138.25 | 11,471.38 |

2015/10/09 දින ලබා ගන්නා ලද වාර්තාවකි.

## 2014 ජනවාරි 01 වන දා සිට 2014 දෙසැම්බර් 31 වන දා දක්වා කාල සීමාව තුළ ව්‍යාපාති යෝජනා/අයදුම්පත් සැකසෙමින් පවතින අදියර

### *නිෂ්පාදනය කිරීම්*

| අනුක්‍රමික අංකය | විස්තරය | ව්‍යාපෘති සංඛ්‍යාව | තක්සේරු කළ ආයෝජනය (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|
| | | | විදේශීය | දේශීය | එකතුව |
| 1 | ලැබුණු අයදුම්පත්/යෝජනා | **29** | 6,527.36 | 16,617.03 | 23,144.40 |
| 2 | අනුමත කරන ලද ව්‍යාපෘති | **31** | 10,762.70 | 15,570.31 | 26,333.01 |
| 3 | ගිවිසුම් අත්සන් තබන ලද ව්‍යාපෘති | **34** | 8,848.96 | 17,028.94 | 25,877.90 |
| 4 | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | **23** | 5,857.86 | 6,666.74 | 12,524.61 |
| 5 | වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති | **20** | 4,482.60 | 3,046.13 | 7,528.73 |

2015/10/09 දින ලබා ගන්නා ලද වාර්තාවකි.

## 2014 වර්ෂයේ දී අනුමත කරන ලද ව්‍යාපෘතිවල සාරාංශය – අංශය අනුව *

(ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද)

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | තක්සේරු කළ ආයෝජනය (රු. මිලියන) | | | ආයෝජන දායකත්වය % | රැකියා නියුක්තියේ ධාරිතාව | රැකියා නියුක්තියේ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| නිෂ්පාදන - නව ව්‍යාපෘති | 59 | 23180.164 | 24590.098 | 47770.262 | 12.29 | 13966 | 45.28 |
| විද්‍යුත් භාණ්ඩ | 2 | - | 816.2 | 816.2 | 0.21 | 204 | 0.66 |
| ආහාර, මස්, මාළු, කිරි නිෂ්පාදන නිපදවීම | 4 | 915.8 | 620.1 | 1,535.9 | 0.40 | 323 | 1.05 |
| කෘෂිකර්මාන්තය පදනම් කර ගත් ආහාර නිෂ්පාදන - දේශීය කෘෂිකර්මාන්තය පදනම් කර ගත් අමු ද්‍රව්‍ය | 2 | - | 1,954.9 | 1,954.9 | 0.50 | 609 | 1.97 |
| නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය | 2 | 1,371.3 | 687.3 | 2,058.6 | 0.53 | 342 | 1.11 |
| තේ මළු - සීටීසී සහ කාබනික තේ | 3 | 84.8 | 1,793.8 | 1,878.6 | 0.48 | 156 | 0.51 |
| වෙනත් කාර්මික සහ රසායනික නිෂ්පාදන | 1 | - | 200.0 | 200.0 | 0.05 | 160 | 0.52 |
| ටයර්, ටියුබ්, රබර් අත්වැසුම් සහ සෙල්ලම් භාණ්ඩ | 3 | 2,128.0 | 3,134.2 | 5,262.2 | 1.35 | 699 | 2.27 |
| දැවයෙන් සෑදූ ගෘහ භාණ්ඩ | 3 | 1,394.7 | 85.3 | 1,480.1 | 0.38 | 1545 | 5.01 |
| රෙදිපිළි සහ රෙදි වර්ග | 1 | 53.5 | - | 53.5 | 0.01 | 19 | 0.06 |
| වෙනත් රෙදිපිළි නිෂ්පාදන | 1 | 254.1 | - | 254.1 | 0.07 | 120 | 0.39 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 2 | 352.4 | 4,689.3 | 5,041.7 | 1.30 | 581 | 1.88 |
| ග්‍රැනයිට් අතුළුව | 5 | 3,195.3 | 254.5 | 3,449.8 | 0.89 | 348 | 1.13 |
| වෙනත් අලෝහ | 3 | 3541.6 | 0 | 3541.6 | 0.91 | 707 | 2.29 |
| වෙනත් කොහු/කෙඳි නිෂ්පාදන | 1 | 110.0 | 51.8 | 161.8 | 0.04 | 93 | 0.30 |
| වානේ සහ යකඩ නිෂ්පාදන | 1 | 897.6 | - | 897.6 | 0.23 | 233 | 0.76 |
| පිරිසැකසූ ලෝහ නිෂ්පාදන | 1 | 1,315.0 | 5,260.0 | 6,575.0 | 1.69 | 109 | 0.35 |
| යන්ත්‍රෝපකරණ | 1 | - | 255.4 | 255.4 | 0.07 | 201 | 0.65 |
| වෙනත් පිරිසැකසූ ලෝහ නිෂ්පාදන | 1 | 233.725 | 25.969 | 259.694 | 0.07 | 72 | 0.23 |
| ප්‍රවාහණ උපකරණ | 1 | 1003.2 | 0 | 1003.2 | 0.26 | 372 | 1.21 |
| සාය, ජීන්ස්, ස්ලැක්ස්, යට ඇඳුම් | 9 | 147.631 | 1330.804 | 1478.435 | 0.38 | 4844 | 15.70 |
| අත් වැසුම් | 2 | 5012.04 | 1693.56 | 6705.6 | 1.73 | 1113 | 3.61 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 1. | | |
| වෙනත් ඇඳුම් පැළඳුම් | 1 | 96.268 | 0 | 96.268 | **0.02** | 261 | **0.85** |
| වෙනත් පාවහන් | 1 | 357.7 | 3.916 | 361.616 | **0.09** | 53 | **0.17** |
| දිය මත ලිස්සා යෑමේ රුවල් | 1 | 66 | 0 | 66 | **0.02** | 74 | **0.24** |
| වෙනත් කඩදාසි නිෂ්පාදන | 1 | 0 | 168.868 | 168.868 | **0.04** | 100 | **0.32** |
| වෛද්‍ය සහ ඖෂධ නිෂ්පාදන | 2 | 0 | 1440.96 | 1440.96 | **0.37** | 114 | **0.37** |
| ඇඟලුම් උපාංග සහ පිරවුම් | 2 | 148.031 | 90.153 | 238.184 | **0.06** | 147 | **0.48** |
| වෙනත් නිෂ්පාදිත භාණ්ඩ | 1 | 443.7 | 0 | 443.7 | **0.11** | 327 | **1.06** |
| පීවීසී නිෂ්පාදන | 1 | 57.811 | 33.017 | 90.828 | **0.02** | 40 | **0.13** |
| කෘෂි කර්මාන්තය | **2** | **119** | **7** | **126** | 0.03 | **112** | **0.36** |
| කෘෂි කර්මාන්තය | **2** | 119.26 | 6.6 | 125.86 | 0.03 | 112 | **0.36** |
| සේවා / යටිතල පහසුකම් - නව ව්‍යාපෘති | **91** | **182,447.41** | **73,804.97** | **256,252.37** | **65.93** | **12,737** | 41ශ29 |
| සාප්පු සහ කාර්යාල උපකරණ | 7 | 4876.506 | 7203.091 | 12079.597 | **3.11** | 1374 | **4ශ45** |
| නිවාස සහ දේපල සංවර්ධනය | 14 | 16627.2 | 18760.013 | 35387.213 | **9.10** | 2071 | **6.71** |
| හෝටල්, ආපනශාලා සේවා සහ විනෝද සංකීර්ණ | 17 | 15591.77 | 14571.313 | 30163.083 | **7.76** | 3250 | **10.54** |
| බලශක්ති උත්පාදන කම්හල් | 22 | 3611.325 | 16894.667 | 20505.992 | **5.28** | 742 | **2.41** |
| අධ්‍යාපනික සහ පුහුණු ආයතන සහ පර්යේෂණ සංවිධාන | 1 | 73.146 | 0 | 73.146 | **0.02** | 68 | **0.22** |
| බහාලුම් සේවා, ගුදම් කිරීම සහ භාණ්ඩ ප්‍රවාහණය | 5 | 13.4 | 3505.2 | 3518.6 | **0.91** | 264 | **0.86** |
| පරිගණක මෘදුකාංග සංවර්ධනය සහ දත්ත ඇතුළත් කිරීමේ මෙහෙයුම් කටයුතු | 2 | 437.133 | 0 | 437.133 | **0.11** | 73 | **0.24** |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා - ගුවන් විදුලිය සහ රූපවාහිනිය, චිත්‍රපට | 1 | 1499.445 | 138.33 | 1637.775 | **0.42** | 127 | **0.41** |
| ඉන්ධන/වායු/පෙට්‍රෝලියම් සහ වෙනත් | 1 | 704.88 | 1056 | 1760.88 | **0.45** | 12 | **0.04** |
| ගුවන් සේවා | 1 | 0 | 783 | 783 | **0.20** | 64 | **0.21** |
| අපනයන/ආනයන මව් රට සහ විදේශ රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම - මිලදී ගැනීමේ නිවාස | 1 | 0 | 1.188 | 1.188 | **0.00** | 54 | **0.18** |
| රෝහල් සේවා සහ වෛද්‍ය මධ්‍යස්ථාන | 2 | 89.964 | 439.035 | 528.999 | **0.14** | 213 | **0.69** |
| ඇමතුම් මධ්‍යස්ථාන/ව්‍යාපාරික කාර්යාවලි බැහැරින් ඉටු කරවා ගැනීම සහ පිළිදැගුම් මධ්‍යස්ථාන | 1 | 317.768 | 1.957 | 319.725 | **0.08** | 708 | **2.30** |
| ෂමුද්‍රිය සේවා | 2 | 5595 | 0 | 5595 | **1.44** | 508 | **1.65** |
| තොරතුරු තාක්ෂණ පහසුකම් | 2 | 78.3 | 326.25 | 404.55 | | 214 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සේවා සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා | | | | | 0.10 | | **0.69** |
| මෝටර් රථ සේවා | 1 | 0 | 613.35 | 613.35 | **0.16** | 160 | **0.52** |
| මුහුදු භාණ්ඩ සේවා | 1 | 0 | 897.057 | 897.057 | **0.23** | 58 | **0.19** |
| විවේකය සහ විනෝදය | 1 | 0 | 238.163 | 238.163 | **0.06** | 43 | **0.14** |
| වරාය සංවර්ධනය | 1 | 78430.5 | 0 | 78430.5 | **20.18** | 995 | **3.23** |
| ප්‍රවාහණ සේවා | 1 | 52826.4 | 5089.5 | 57915.9 | **14.90** | 965 | **3.13** |
| මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය | 5 | 1492.339 | 3225.545 | 4717.884 | **1.21** | 728 | **2.36** |
| රෙදිපිළි මුද්‍රණය (ස්ක්‍රීන් මුද්‍රණය) | 2 | 182.33 | 61.308 | 243.638 | **0.06** | 46 | **0.15** |
| උප එකතුව - නව ව්‍යාපෘති | **152** | **205,747** | **98,402** | **304,148** | **78.25** | **26,815** | **86.93** |
| උප එකතුව - පවතින ව්‍යාපෘති පුළුල් කිරීම | **33** | **18940.181** | **65580.733** | **84,520.91** | **21.75** | **4030** | **13.07** |
| මුළු එකතුව | **185** | **224,687.01** | **163,982.40** | **388,669.41** | **100.00** | **30,845** | **100.00** |
| * තාවකාලික | | | | | | | |
| සටහන: අවලංගු කිරීම් ඇතුළත්ව | | | | | | | |
| මූලාශ්‍රය: කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (2015 දෙසැම්බර් 4 වන දා) | | | | | | | |

## 2014 වර්ෂයේ අනුමත කරන ලද ව්‍යාපෘතිවල සාරාංශය - අංශ අනුව

*(ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 16 වන වගන්තිය යටතේ අනුමත කරනු ලැබීය)*

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | තක්සේරු කළ ආයෝජනය (රු. මිලියනවලින්) | | | ආයෝජන දායකත්වය % | සේවා නියුක්ති ධාරිතාව | සේවා නියුක්තියේ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| **නිෂ්පාදනය කිරීම - නව ව්‍යාපෘති** | **4** | **110.00** | **32.62** | **142.62** | **1.14** | **108** | **3.29** |
| ආහාර, මස්, මාළු සහ කිරි නිෂ්පාදන නිපදවීම | 1 | 32.63 | - | 32.63 | 0.26 | 20 | 0.61 |
| වෙනත් ආහාර පිරිසැකසුම් කිරීම - දේශීය අමුද්‍රව්‍ය | 1 | 32.62 | 6.52 | 39.14 | 0.31 | 25 | 0.76 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1 | 32.62 | 26.10 | 58.72 | 0.47 | 30 | 0.92 |
| ස්වර්ණාභරණ සහ මැණික් කැපීම | 1 | 12.14 | - | 12.14 | 0.10 | 33 | 1.01 |
| **කෘෂිකර්මාන්තය - නව ව්‍යාපෘති** | **1** | **43.69** | **-** | **43.69** | **0.35** | **14** | **0.43** |
| කෘෂිකර්මාන්තය | 1 | 43.69 | - | 43.69 | 0.35 | 14 | 0.43 |
| **සේවා/යටිතල පහසුකම් - නව ව්‍යාපෘති** | **22** | **12,041.16** | **305.30** | **12,346.46** | **98.51** | **3,156** | **96.28** |
| අපනයන/ආනයන මව් රට සහ විදේශ රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම - මිලදී ගැනීමේ නිවාස | 2 | 326.25 | 87.00 | 413.25 | 3.30 | 34 | 1.04 |
| හෝටල්, ආපන ශාලා සේවා සහ විනෝදාස්වාද සංකීර්ණ | 4 | 216.85 | 166.74 | 383.59 | 3.06 | 142 | 4.33 |
| නිවාස සහ දේපල සංවර්ධනය | 1 | 98.62 | - | 98.62 | 0.79 | 142 | 4.33 |
| රෝහල් සේවා සහ වෛද්‍ය මධ්‍යස්ථාන | 1 | 32.87 | - | 32.87 | 0.26 | 20 | 0.61 |
| ආයෝජන මගින් ආදායම් උපයන සමාගම් | 4 | 137.02 | 6.53 | 143.55 | 1.15 | 63 | 1.92 |
| කළමනාකරණ උපදේශන සමාගම් | 1 | 32.62 | - | 32.62 | 0.26 | 5 | 0.15 |
| කර්මාන්ත ශාලා සහ ගොඩනැගිලි ඉදි කිරීම්, අළුත්වැඩියා කටයුතු සහ තාක්ෂණික සේවා | 5 | 366.21 | 45.04 | 411.25 | 3.28 | 2,645 | 80.69 |
| පරිගණක මෘදුකාංග සංවර්ධනය සහ දත්ත ඇතුළත් කිරීමේ මෙහෙයුම් කටයුතු | 2 | 49.73 | - | 49.73 | 0.40 | 45 | 1.37 |
| වෙනත් සේවා | 2 | 10,781.00 | - | 10,781.00 | 86.02 | 60 | 1.83 |
| මුළු එකතුව | 27 | 12,194.85 | 337.92 | 12,532.77 | 100.0 | 3,278 | 100.00 |

* තාවකාලික
සටහන: අවලංගු කිරීම් ඇතුළත්ව
මූලාශ්‍රය: කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (2015 දෙසැම්බර් 4 වන දා)

## 3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය

**පසුබිම හා ප්‍රධාන කටයුතු**

ආයෝජකයන් සඳහා වඩාත් විශිෂ්ඨ පහසුකම් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් හඳුන්වා දුන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ 2014 අගෝස්තු මස 4 වන දා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය ස්ථාපනය කරනු ලැබීය.

ව්‍යාපෘතියක් වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේ අදියරට කඩිනමින් ප්‍රවේශ කර විය හැකි වන පරිදි ගිවිසුම් අත්සන් තැබීමෙන් අනතුරුව ආයෝජකයන් සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ ප්‍රධානතම වගකීම වේ.
ආයෝජකයන්ට මුහුණ පෑමට සිදුවන අවහිරතා ඉවත් කිරීම සඳහා ආයෝජකයන් වෙනුවෙන් වෙනත් බලධාරීන් සමඟ මැදිහත්වීම් සිදු කිරීමට ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය කටයුතු කරයි.

ගිවිසුමක් අත්සන් තැබූ අවස්ථාවේ, අදාළ ව්‍යාපෘතිය ආර්ථික වශයෙන් ප්‍රායෝගිකව සහ ශක්‍යතාවෙන් යුක්තව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා ආයෝජකයන් විසින් දෛනික පදනමින් ඉදිරිපත් කළ යුතු වාර්තා පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා මූලික මාර්ගෝපදේශ මෙම අංශය මගින් නිකුත් කරයි.

බොහෝ අවස්ථාවල ගිවිසුමේ විශේෂයෙන් සඳහන් කර අත්සන් තබා ඇති කාලසීමාවට වඩා වැඩි සහ අමතර කාලසීමාවක් එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වේ. ඉතිරි වී ඇති වැඩ කටයුතු නිමාවට පත් කිරීම සඳහා කාල සීමාවක් නියම කර, ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන්ද ඇතුළත්ව, මේ වන තෙක් ව්‍යාපෘතිය මගින් සිදු කර ඇති කාර්යභාරය පදනම් කර ගනිමින් ආයෝජකයන් සමඟ ඒකාබද්ධව ව්‍යාපෘතියේ ප්‍රගතිය තක්සේරු කිරීම මෙම අංශය වෙත පැවරී ඇති සුවිශේෂී වගකීමක් වේ. තක්සේරු කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.

සාර්ථකව අවසන් කරන ලද ව්‍යාපෘති අධීක්ෂණ අංශයට මාරු කරනු ලැබේ. එයට අමතරව, අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. ගිවිසුම් මගින් ලබා දී ඇති දිරිදීමනා විශේෂිත කාලයක් සඳහා පමණක් ලබා දී ඇති බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශයේ සහාය ලබාදී තිබුණ ද, වසර ගණනාවක් මුළුල්ලේ ඉදිරි අදියරවලට ගමන් නොකරන ලද ව්‍යාපෘති හඳුනාගැනීමෙන් අනතුරුව අවසන් කිරීමට පියවර ගනු ලැබේ.

අක්‍රියව පැවතුණ ව්‍යාපෘති ඵලදායක අන්දමින් ප්‍රගමනය කිරීම සඳහා නැවතත් ක්‍රියාකාරී තත්වයට පත් කිරීම මගින් මාස 4කට අඩු කාල සීමාවක් තුළ ආයෝජකයන් අතර නව විශ්වාසයක් ගොඩනැංවීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශයට හැකියාව ලැබී තිබේ.

2014 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ වසර තුළ සාක්ෂාත් කර ගත් ප්‍රගතිය

ඉහත දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ, මෙම අංශය මගින් පහත දැක්වෙන ව්‍යාපෘති කටයුතු අවසන් කර ඇත.

(අ) ව්‍යාපෘති මගින් අත්පත් කර ගත් ප්‍රගතිය සුපරීක්ෂාකාරීව සමාලෝචනය කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමේ අදියර සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘති සමාගම් 42 ක් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා දෙන ලදී.
(ආ) සමාගම් 23ක් ඔවුන්ගේ ව්‍යාපෘති සම්පූර්ණ කර වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේ

අදියරට පිවිසි අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය මගින් වාණිජ මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ තත්ත්වය යාවත්කාලීන කර තිබුණු අතර අදාළ ලිපිගොනු සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු සිදු කිරීම සඳහා එම ලිපිගොනු ව්‍යාපෘති අධීක්ෂණ අංශය වෙත භාර දී තිබුණි.

(ඇ) ඉදිරියට ගෙන යා නොහැකි ව්‍යාපෘති 15ක් හඳුනා ගෙන ඒවා අවසන් කිරීම සඳහා කටයුතු කර තිබුණ අතර අදාළ ලිපිගොනු අධීක්ෂණ අංශයට භාර දී තිබුණි.

## 4. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි තථ්‍ය වශයෙන් සාක්ෂාත් කර ගන්නා බව/එම කොන්දේසි සපුරාලීම සඳහා කටයුතු කරන බව තහවුරු කර ගැනීම සඳහා, ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති අධීක්ෂණ අංශය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්වලට ඇතුළත්වී ඇති ව්‍යාපෘතිවල කාර්යසාධනය එම ව්‍යාපෘති කාල සීමාව තුළ දෛනික පදනමකින් තක්සේරු කරනු ලබයි.
සමාගම්වලින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 753 ක් ද, වෙනත් කාලීන ප්‍රකාශන ද මෙම අංශය මඟින් රැස් කර තිබේ.

රැකියා විස්තර, සේවක අර්ථසාධක අරමුදල/සේවක භාරකාර අරමුදල සඳහා ගෙවීම් විස්තර හා අර්ධ වාර්ෂික කාර්යසාධන ප්‍රකාශන මාධ්‍යගතව ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අනුමැතිය ලද වෙළඳ ව්‍යාපාර සඳහා වෙබ් අඩවි මුර පද 61 ක් මෙම අංශය මඟින් නිකුත් කර ඇත.

ඉහත දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ වාර්ෂික බදු සහතික 70 ක් එම සමාගම්වල ඉල්ලීමට අනුව නිකුත් කර ඇත.

ගිවිසුම්වල කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් ද, ආයෝජකයන්ගේ ඉල්ලීම් පරිදි ද, වෙළඳ ව්‍යාපාර 11ක් සමඟ අත්සන් තබන ලද ගිවිසුම් අවසන් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කරන ලදී.

මූල්‍ය හා නීති දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන ගිය ලිපිගොනු සමාලෝචනය කර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ද, එවැනි වෙළඳ ව්‍යාපාර පිළිබඳව විමර්ශනය කිරීමෙන් අනතුරුව ද, දීර්ඝ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබිය යුතුව තිබුණු රු.10,702,294.91 ක මුදලක් මෙම අංශය මගින් ආපසු අය කර ගෙන තිබුණි.

ආයෝජන මණ්ඩල නීතියේ 16 වන වගන්තියට අනුකූලව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පිළිබඳව තොරතුරු/මූල්‍ය දත්ත රැස් කිරීම සඳහා 2014 වසර සඳහා ව්‍යාපාර 892 ක් තුළ වාර්ෂික සමීක්ෂණයක් සිදු කරන ලදී.

## 5. තාක්ෂණික සේවා අංශය

(1) තාක්ෂණික සේවා අංශය පහත සඳහන් වගකීම් ඉටු කිරීම පිළිබඳව ප්‍රධාන වශයෙන්ම වගකීම දරයි.

(අ) නව ආයෝජන කලාප/ව්‍යාපෘති සඳහා පරිශ්‍රයන් හඳුනා ගැනීම.

(ආ) නව ආයෝජන කලාප සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම.

(ඇ) කලාප කළමනාකරණය සහ මෙහෙයුම් කටයුතු සඳහා අනෙකුත් කලාපවල සිදු කරන ලද පරිදි, නව ආයෝජන කලාපවල මූලික සංවර්ධන කටයුතු භාර ගැනීම, මූලික කටයුතු ඉටු කිරීම සඳහා කලාප ඒකක ස්ථාපනය කිරීම සහ බලාධිකාරය බෙදා හැරීම යටතේ අදාළ කලාප අධ්‍යක්ෂවරුන් වෙත ක්‍රමානුකූලව කටයුතු භාර දීම.

(ඈ) දැනට පවතින අපනයන සැකසුම් කලාප 12 මගින් සිදු කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අවස්ථාවලදී

තාක්ෂණික සහාය ලබා දීම.

(ඉ) දැනට පවතින අපනයන සැකසුම් කලාප 12 තුළ ජල සම්පාදන මෙහෙයුම් කටයුතු හා නඩත්තුව, මළ අපද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යෝජනාක්‍රම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(ඊ) ඉඩම් කටයුතු සම්බන්ධ විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා සහාය දැක්වීම හා තාක්ෂණික යෙදවුම් සැපයීම හා යටිතල පහසුකම් සැපයීම.

(උ) යටිතල පහසුකම් සඳහා වන ක්‍රියාකාරී සැලසුම් සමස්තයක් වශයෙන් පාලනය කිරීම.

(ඌ) යෝජනා සකස් කිරීම, ස්ථාන හඳුනා ගැනීම, සමෝධානික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපනය කිරීම/කාර්මික උද්‍යාන ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය අනුමතීන් ලබා ගැනීම හා කලාපවල ජලය ප්‍රතිචක්‍රීකරණය කිරීම.

(එ) 2011 අංක 43 දරන පනත යටතේ රජය වෙත අවසතු කළ වත්කම් නිසි බලධාරීන්ගේ සම්බන්ධීකරණය යටතේ නැවතත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැවරීම.

(ඒ) පාරිසරික ගැටළු ඇති වී ඇති මහජනතාවගේ යහපතට අදාළව අර්බුදවලට ලක්වූ කාර්මික කම්හල්වල තාක්ෂණික අංශ පිළිබඳව පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

(2) අනෙකුත් රටවල පවත්ගෙන යනු ලබන අන්තර්ජාතික කලාපවල ප්‍රමිතියට අනුකූල වන පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අපනයන සැකසුම් කලාප ආදර්ශ කාර්මික කලාප ලෙස ඉහළ මට්ටමකට වැඩි දියුණු කිරීම සඳහා 2014 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පදනම් වෙමින්, අපනයන සැකසුම් කලාපවල දැනට පවතින යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ හා ඉහළ මට්ටමකට පත් කිරීමේ ප්‍රධාන අරමුණින් යුක්තව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රු. මිලියන 320ක මුදලක් ආයෝජනය කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, කටුනායක හා බියගම අපනයන සැකසුම් කලාපවල පොදු අප ජල ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ප්‍රධාන පෙළේ වැඩි දියුණු කිරීම් සිදු කරනු ලැබීය.

(3) නව කලාප සංවර්ධනය හා අභ්‍යන්තර මාර්ග ජාලය පුළුල් කිරීම හා විදුලිබල සැපයුම සම්බන්ධයෙන් කටයුතු කරමින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 375ක මුදලක් වැය කරන ලදී.

## 6. ඉංජිනේරු අනුමත කිරීම් සහ විශේෂ ව්‍යාපෘති අංශය

1. ඉංජිනේරු අනුමත කිරීම් අංශය
2. ඉඩම් හා පහසුකම් සැපයීමේ අංශය

### 1. ඉංජිනේරු අනුමත කිරීම් අංශය

ඉංජිනේරු අනුමත කිරීම් අංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතට ගැනෙන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීමේ අදියර අතරතුර ස්ථානය ආශ්‍රිත සේවා සැපයීම ඉංජිනේරු අනුමත කිරීම් අංශයේ කාර්යභාරය වේ. පහත දක්වා ඇති ප්‍රධාන අනුමතීන් ලබා දීම ද එම කාර්යභාරයට ඇතුළත් වේ.

(අ) ස්ථානීය අනුමත කිරීම්
(ආ) සැලසුම් අනුමත කිරීම්
(ඇ) ප්‍රමාණ සහතික කිරීම්
(ඈ) අනුකූලතා සහතික නිකුත් කිරීම

**(අ) ස්ථානීය අනුමත කිරීම**

ස්ථානීය අනුමතිය ලබා ගැනීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘතියට අදාළ ගිවිසුම අත්සන් තැබීම සඳහා අදාළ ආයෝජකයා විසින් ඉටු කළ යුතු පූර්ව අවශ්‍යතාවකි. මෙම ක්‍රියාවලිය ඉටු කිරීමේදී, ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති අංශය පාරිසරික කළමනාකරණ අංශය සමග ඒකාබද්ධව පරිශ්‍රය නැරඹීමේ කටයුතු සිදු කරනු ලැබේ. තවද, ඉන් අනතුරුව අදාළ බාහිර නියෝජිතායතනවලින් උපදෙස් ලබා ගන්නා අතර කෙටි පාරිසරික බලපෑම් තක්සේරුව ද සිදු කරනු ලැබේ. අවසානයේ දී, ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම සඳහා පරිශ්‍රය සුදුසු බව අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ස්ථානීය අනුමතිය ලබා දීම පිළිබඳ ලිපිය නිකුත් කරනු ලැබේ.

**(ආ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම්**

අදාළ රෙගුලාසිවලින් නියම කරන ලද සියලුම ප්‍රමිතිවලට අනුකූලව ගොඩනැගිලි සැලසුම් කර ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය නිකුත් කරනු ලැබේ. ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ආයෝජකයන් විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය.

**(ඇ) ඉදිකිරීම් අයිතම ආනයනය කිරීම සඳහා ප්‍රමාණ සහතික නිකුත් කිරීම**

තීරුබදුවලින් නිදහස් කිරීමේ පදනම මත ඇතැම් ඉදිකිරීමේ අයිතම හා ද්‍රව්‍ය ආනයනය කළ හැකිය. ව්‍යාපෘතිය සඳහා විශේෂිත අයිතම/ද්‍රව්‍යවල අදාළ ප්‍රමාණ ඒවා ආනයනය කරනු ලබන අවස්ථාවලදී සහතික කිරීම ඉංජිනේරු අනුමත කිරීම් අංශයේ කාර්යභාරයයි. පූර්වයෙන් ආනයනය කරනු ලබන ප්‍රමාණ පරීක්ෂා කිරීමෙන් පසුව හා ඉතිරි අවශ්‍යතාවට වඩා වර්තමාන ප්‍රමාණය අඩු බව අනාවරණය වූ විට මුළු අවශ්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව සහතික නිකුත් කරනු ලැබේ.

**(ඈ) අනුකූලතා සහතිකය**

ඉදිකිරීම් කටයුතු අනුමත සැලසුම්වලට අනුකූලව සම්පූර්ණ කර ඇති බව තහවුරු කිරීම සඳහා ඉදිකිරීම් අවසන් කිරීමෙන් අනතුරුව ඉංජිනේරු අනුමත කිරීමේ අංශය මගින් පරීක්ෂා කරනු ලැබේ. මෙයට අමතරව, තීරුබදුවලින් නිදහස් කිරීමේ පහසුකම යටතේ ආනයනය කරන ලද අයිතම/ද්‍රව්‍ය නිසි පරිදි භාවිත කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා ඒවායේ භෞතික තොග සත්‍යාපනය කිරීම ද මෙම පරීක්ෂාවේ දී සිදු කරයි.

2014 වසරේදී අත්පත් කර ගත් ප්‍රගතිය

- ස්ථානීය අනුමැතීන් සංඛ්‍යාව - 184
- ගොඩනැගිලි සැලසුම් අනුමතීන් සංඛ්‍යාව - 185
- තීරු බද්දෙන් නිදහස් භාණ්ඩ නිෂ්කාෂණ - 1,959
- අනුකූලතා සහතික - 48

## 2. ඉඩම් හා පහසුකම් සැලසීමේ අංශය

ඉඩම් හා පහසුකම් සැලසීමේ අංශයේ කාර්යභාරය

ඉඩම් හා පහසුකම් සැලසීමේ අංශය ආයෝජකයන් සඳහා පහත සඳහන් කර ඇති සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වගකීම දරයි.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබා ගැනීමේදී ආයෝජකයන්ට සහාය
දැක්වීම
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් කලාප ඉදිකිරීමේ දී, අවශ්‍ය අවස්ථාවල රාජ්‍ය ඉඩම්/පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම.
- නව ආයෝජකයන්ගේ භාවිතය සඳහා රාජ්‍ය හා පෞද්ගලික ඉඩම්වලින් සමන්විත වූ ඉඩම්

බැංකුවක්
පවත්වාගෙන යෑම.

- ඉඩම් සම්බන්ධ කරුණුවලදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීති අංශයට හා වෙනත් අංශවලට
සහාය ලබා දීම්

**2014 වර්ෂයේදී අත්පත් කරගත් ප්‍රගතිය**

- කාර්මික කලාපයක් ඉදි කිරීම සඳහා මාතර දිස්ත්‍රික්කයේ හක්මන පිහිටි මාවරලවත්ත නම් ඉඩම අත්පත් කර ගැනීම සඳහා 2014 වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. එකී ඉඩම තලවාකැලේ වැවිලි සමාගමට අයත් වන අතර එම වැවිලි සමාගම මෙම අත්පත් කර ගැනීමට එදිරිව කටයුතු කර නඩුවක් ගොනු කරන ලදී. එම නිසා, එකී ඉඩම කාර්මික කලාපයක් වශයෙන් සංවර්ධන නොකිරීමට තීරණය කරන ලදී. එවකට සිටි මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් මෙම ඉඩම මුල් අයිතිකරු වෙත අවසතු කරන ලෙස 2015.05.19 දින දැනුම් දෙන ලදී.

- පරිසර විද්‍යාත්මක සංචාරක කර්මාන්ත ව්‍යාපෘතියක් වෙනුවෙන් සීදුවේ කඩොල්කැලේවත්තේ පිහිටි අක්කර 22 ඉඩම සඳහා ව්‍යාපෘති වාර්තා පිළියෙළ කරන ලදී.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වන, සීමාසහිත කෑගල්ල වැවිලි සමාගම මගින් කළමනාකරණය කරනු ලබන අක්කර 15 ක ඉඩම පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය පුළුල් කිරීමේ අරමුණින් මිලදී ගන්නා ලදී.

- සීමාසහිත H Hydro W V (පුද්) සමාගම මගින් ක්ෂුද්‍ර ජල විදුලි ව්‍යාපෘතියක් ඉදි කිරීම සඳහා හගුරන්කෙත මානකොළ ප්‍රදේශයේ පිහිටි ඉඩමක් අත්පත් කර ගන්නා ලදී. අත්පත් කර ගැනීම සම්පූර්ණ කරන ලද අතර විකුණුම් ඔප්පු ආයෝජක සමාගම වෙත පවරන ලදී.

- මීරිගම අපනයන සැකසුම් කලාපයේ සේවා ප්‍රදේශය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කෙරේ.

## 7. ආයෝජක සේවා අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ පවතින ව්‍යාපෘතිවල ආනයන හා අපනයන සඳහා අවසර ලබා දීම හා කොළඹ ප්‍රදේශයේ හා අපනයන සැකසුම් කලාපවල වෙනත් ආයෝජන ආශ්‍රිත සේවා සැලසීම සඳහා ද ආයෝජක සේවා අංශය වගකිව යුතු වේ.

ආනයන හා අපනයන ලේඛන පිළියෙළ කිරීම වැනි රේගු සේවා සැපයීම, ආනයනය සහ අපනයනය කළ නැව් භාණ්ඩ සත්‍යාපනය කිරීම, යුරෝපා හවුලට අයත් රටවලට අපනයනය කෙරෙන රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදනවල සම්භවය පිළිබඳ සහතික නිකුත් කිරීම, බඳු ගෙවන තුරු භාණ්ඩ ගබඩා කරන රජයේ ගබඩාවලින් භාණ්ඩ නිෂ්කාෂණය කිරීම සඳහා අනුමැති ලබා දීම, උප කොන්ත්‍රාත්තු සඳහා අනුමති ලබා දීම, පැවරුම් හා දේශීය වෙළඳාම, අයිතම ප්‍රතිඅපනයනය හා ප්‍රතිආනයනය සඳහා අවසර ලබාදීම හා ආයෝජන මණ්ඩලයට අයත් වෙළඳ ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු වන ගැටළු සම්බන්ධයෙන් රජයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම්

අපනයන සැකසුම් කලාපවල පිහිටි ව්‍යාපෘති සඳහා සත්‍යාපන සේවා ලබාදෙන අතරතුර, කලාපවලින් පරිබාහිරව පිහිටි ව්‍යාපෘතිවල භාණ්ඩ සඳහා සත්‍යාපන සේවා ලබා දීමේ අරමුණින් මුහුදින් රැගෙන එන භාණ්ඩ සඳහා මධ්‍යම සත්‍යාපන පර්යන්තය ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රැගෙන එන ගුවන් භාණ්ඩ සඳහා සත්‍යාපන සේවා ලබා දීම වෙනුවෙන් ස්ථාපනය කරන ලද ගුවන් භාණ්ඩ පර්යන්තය කටුනායක ප්‍රදේශයේ ද පිහිටුවා ඇත.

භාණ්ඩ සත්‍යාපනය කිරීමේ කටයුතු වෙනුවෙන් මෙම පර්යන්ත මුළු දිනය පුරාම විවෘතව තබනු ලැබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත කරන ලද අමුද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාණ්ඩ තීරු බදුවලින් නිදහස් පදනම යටතේ ආනයනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරවලට අවසර ලබා දී තිබේ. වර්තමානයේ ව්‍යාපෘති 938 ක් අපනයන සැකසුම් කලාපවලින් පිටත පිහිටා ඇති අතර ව්‍යාපෘති 206ක් කලාප ඇතුළත පිහිටා ඇත. වර්තමානයේ දී, සමස්තයක් වශයෙන් වෙළඳ ව්‍යාපාර 1144 ක් මෙම අංශයෙන් ආනයන/අපනයන සේවා ලබා ගනියි.


2012 වර්ෂයේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දී ASYCUDA ලෝක පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, ආනයන හා අපනයන ක්‍රියාකාරකම් සඳහා විද්‍යුත් භාර දීම, විද්‍යුත් සැකසීම, විද්‍යුත් ගෙවීම හා විද්‍යුත් අනුමත කිරීමේ පහසුකම් භුක්ති විඳීමේ අවස්ථාව ආයෝජන මණ්ඩලයට අයත් සියලුම ව්‍යාපාර සඳහා හිමි වී ඇත. එයට අමතරව, උප කොන්ත්‍රාත්තු සඳහා පවතින ක්‍රියාමාර්ග හා පැවරුම් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කර ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජකයන්ට හා ප්‍රකාශකයන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා පෙර ගෙවුම් ගිණුම්කරණ පද්ධතියක් ද හඳුන්වා දී තිබේ.

හදිසි අවශ්‍යතා වෙනුවෙන් ගුවන් භාණ්ඩ ආනයනය හා අපනයනය සිදු කරන ආයෝජකයන්ට පහසුකම් සැලසීමේ අරමුණින්, ගුවන් භාණ්ඩ පරීක්ෂා කිරීමට අමතරව, ආනයන හා අපනයන ලේඛනගත කිරීම් හා ගුවන් භාණ්ඩ ආනයන අපනයන රේගු ලේඛන පිළියෙළ කිරීම සඳහා කටුනායක ගුවන් භාණ්ඩ පර්යන්ත කාර්යාලය දවසේ පැය 24 පුරාම ආයෝජකයන් සඳහා සේවා සපයයි. එබැවින්, ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලට ආනයන අපනයන රේගු ලේඛන භාරදීම සඳහා සතියේ දින 07 තුළ පැය 24 පුරාම අඛණ්ඩව සේවා සපයා තිබේ.

| | | |
|---|---|---|
| 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත භාර දුන් ආනයනය කළ මුළු භාණ්ඩ ප්‍රමාණය(TEU) | | 83502 |
| 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත භාර දුන් අපනයනය කළ මුළු භාණ්ඩ ප්‍රමාණය(TEU ) | | 97975 |
| 2014 වර්ෂය සඳහා ආනයන වටිනාකම | ශ්‍රී ලංකා රුපියල් මිලියන | 716,255.95 |
| 2014 වර්ෂය සඳහා අපනයන වටිනාකම | ශ්‍රී ලංකා රුපියල් මිලියන | 1,818,858.56 |


## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායන් සඳහා බහාලුම්ගත භාණ්ඩ (ආනයනය/අපනයනය)

| | 2013 | 2014 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 75520 | 83502 | 7982 | 9.56 |
| අපනයන | 88640 | 97975 | 9335 | 9.53 |




## සකස් කරන ලද රේගු ප්‍රකාශන සංඛ්‍යාව


| | 2013 | 2014 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 214,521 | 230,419 | 15,898 | 6.90 |
| අපනයන | 339,300 | 360,506 | 21,206 | 5.88 |



400000
350000
300000
250000
200000
150000
100000
50000
0
214608
340868
230419
360506
2013
2014
ආනයන
අපනයන

**ආනයන සහ අපනයනවල වටිනාකම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)**

| | 2013 | 2014 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 622,218.35 | 716,255.95 | 94,037.60 | 13.13 |
| අපනයන | 868,267.12 | 950,591.45 | 82,324.33 | 8.66 |



## 8. මූල්‍ය අංශය

මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුළු ආදායම රු. මිලියන 3,235.26 ක් වූ අතර එය පසුගිය වසරේ මුළු ආදායම වූ රු.2,822.57 ට සාපේක්ෂව 15% ක වර්ධනයක් සනිටුහන් කර තිබේ.

පසුගිය වසරේ බදු ගෙවීමෙන් අනතුරුව අතිරික්තය වූ රු.මිලියන 290.92 ට සාපේක්ෂව සමාලෝචිත වසරේ බදු ගෙවීමෙන් පසු අතිරික්තය රු.මිලියන 401.78 ක් වූ අතර එය 38% ක වර්ධනයක් වාර්තා කරයි. භූමිය සඳහා වාරික මුදල් 228% කින්ද සහ ජල සම්පාදනයෙන් ලද ශුද්ධ ආදායම 20% කින් හා ආනයන හා අපනයන සේවා ගාස්තු 10%කින්ද ඉහළ නැගීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු ආයෝජන ඉහළ නැගීම හේතුවෙන් ශුද්ධ මූල්‍ය ආදායම වර්ධනය විය.

2013 වසරේ රු.මිලියන 2,493 ක් ලෙස වාර්තා වූ මුළු මෙහෙයුම් වියදම් 2014 වසරේදී රු.මිලියන 2,788 ක් දක්වා ඉහළ නැගි අතර එය 12% ක වර්ධනයකි. 2013 වසරේ රු.මිලියන 1,983.95ක් වූ පරිපාලන වියදම් ප්‍රවර්තන වසරේදී රු.මිලියන 2,303.28ක් දක්වා ඉහළ යෑම මුළු මෙහෙයුම් වියදම විශාල වශයෙන් ඉහළ නැගීමට දායක විය. 2014 වසරේදී, පිරිස් පිරිවැය 20% කින් වැඩි වී තිබීම ඉහත දක්වා ඇති පරිදි පරිපාලන වියදම් වැඩිවීමට දායකත්වය සපයා තිබුණි.

අභ්‍යන්තර වශයෙන් උත්පාදනය කරන ලද අරමුදල් වලින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුළු ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය ආවරණය කර ගත හැකි වූ අතර 2014 වසරේ ප්‍රාග්ධන වියදම රු.මිලියන 780.53 ක් වියි

## 9. මානව සම්පත් කළමනාකරණ අංශය

මානව සම්පත් කළමනාකරණ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමස්ත මානව සම්පත කළමනාකරණය කිරීම පිළිබඳ වගකීම පැවරී ඇති ප්‍රධාන අංශය වන්නේ මානව සම්පත් කළමනාකරණ අංශයයි. එහි ප්‍රධාන කටයුතු පහත දක්වා තිබේ.

- මානව සම්පත් සැලසුම්කරණය
    - වර්තමාන හා අනාගත මානව සම්පත් අවශ්‍යතාව තක්සේරු කිරීම.
    - ඉහත අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා බඳවා ගැනීමේ හා තෝරා ගැනීමේ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.

- කාර්යසාධනය තක්සේරු කිරීම
    - සේවක කාර්යසාධනය වාර්ෂිකව සමාලෝචනය කිරීම හා තක්සේරු කිරීම.
    - සේවක කාර්යසාධනය පදනම් කර ගනිමින් වාර්ෂිකව වැටුප් වර්ධක ලබාදීම.
    - සේවකයන්ගේ කාර්යසාධනය, සුදුසුකම් හා පළපුරුද්ද පදනම් කර ගනිමින් සේවකයන් ඉහළ ශ්‍රේණිවලට උසස් කිරීම.

- මානව සම්පත් සංවර්ධනය
    - තනි පුද්ගල හා සංවිධානාත්මක ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණුවීම් හා වෘත්තීය සංවර්ධන ප්‍රයත්න සමෝධානිකව භාවිත කිරීම. දැනට නිරතව සිටින රැකියාවේ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා තනි පුද්ගලයන්ට අවශ්‍ය වන ප්‍රධාන දක්ෂතා වර්ධනය කර

ගැනීමට ද, මනාව සැලසුම් කරන ලද අධ්‍යයන ක්‍රියාවලි තුළින් අනාගත රැකියා උසස්වීම් සඳහා සුදුසුකම් සපුරා ගැනීමට ද හැකි වනු ඇත.

- විනය පවත්වා ගැනීම
  - සේවකයන්ගේ විනය පවත්වා ගැනීම හා වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
  - කම්කරු විනිශ්චය සහ කම්කරු දෙපාර්තමේන්තුව, මානව සම්පත් කොමිසම හා අධිකරණ වැනි බාහිර ආයතනවල විභාග වෙමින් පවත්නා කම්කරු ගැටළු සඳහා සහභාගි වීම.

- පැමිණීම හා නිවාඩු පිළිබඳ ලේඛන පවත්වා ගැනීම

- සේවක සුභසාධක සේවා
  - විවිධ වර්ගවල ණය යෝජනාක්‍රම, පරිපූර්ණ ජීවිත හා අබලතා රක්ෂණ, වෛද්‍ය පහසුකම්, අවමංගල්‍ය සහාය යෝජනා ක්‍රම, කාර්යාලීය බස් ප්‍රවාහණ සේවා, ප්‍රවාහණ සහනාධාර හා පැමිණීමේ දිරි දීමනා යෝජනා ක්‍රම ආදිය ක්‍රියාත්මක කිරීම.

<u>2014 වසරේ අත්පත් කරගත් ජයග්‍රහණ/කාර්යසාධන</u>

- මානව ප්‍රාග්ධන කළමනාකරණ (HCM) පද්ධතිය තුළින් සේවකයන් විසින් අතිකාල දීමනා සඳහා හිමිකම් ඉල්ලීමේ ක්‍රියාවලිය පරිගණකගත කරනු ලැබීය.

- විධායක නිලධාරීන් දහනව (19) දෙනෙකු, කළමනාකරණ සහකාර ප්‍රභේදයට අයත් සේවකයන් හැට තුන් (63) දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ සේවකයන් හැත්තෑ හත් (77) දෙනෙකු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවයට අළුතින් බඳවා ගන්නා ලදී.


- කළමනාකරණ සහකාර ප්‍රභේදයට අයත් සේවකයන් විසිපස් (25) දෙනෙකු සහ අනියම්/කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් ප්‍රාථමික මට්ටමේ සේවකයන් අසු (80) දෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ගන්නා ලදී


- විධායක ශ්‍රේණියේ නිලධාරීන් විසි නව (29) දෙනෙකු ද කළමනාකරණ සහකාර ප්‍රභේදයට අයත් සේවකයන් එකසිය පස් (105) දෙනෙකු ද, ප්‍රාථමික මට්ටමේ සේවකයන් හැත්තෑ හත් (77) දෙනෙකු ද ඉහළ ශ්‍රේණිවලට උසස් කරන ලදී.


- ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් විසි දෙදෙනෙකු (22) සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වන ලද අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවකයන් සඳහා විශේෂ පුහුණුවීම් අවස්ථා තිස් දෙකක් (32) ක් පිරිනමන ලදී. තව ද, සේවකයන් නවසිය පනස් දෙදෙනෙකු (952) සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පහළොවක් (15) ක් පවත්වනු ලැබූ අතර බාහිර පුහුණු ආයතනවලදී සේවකයන් දෙසිය හතළිස් එක් (241) දෙනෙකු සඳහා රැකියා ආශ්‍රිත පුහුණු වැඩසටහන් ලබා දෙන ලදී.


- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඒකාබද්ධ සමාජ වගකීම (CSR) ඉටු කිරීමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලවල හා වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් පනස් හතර (54) දෙනෙකු සඳහා විවිධ ක්ෂේත්‍රවල කාර්යස්ථ පුහුණුවක් ලබාදෙන ලදී.


ප්‍රධාන කාර්යසාධන ක්ෂේත්‍ර සංසන්දනය කිරීම 2013-2014





ලබා දෙන ලද පුහුණුවීම් සැසඳීම - 2013 සහ 2014
පුහුණුවීම් සංඛ්‍යාව
1000
900
800
700
600
500
400
300
200
100
0
සේවාස්ථ පුහුණුව
බහු අධ්‍යයන ක්ෂේත්‍ර
විදේශ පුහුණුව
ශාස්ත්‍රපති/ විද්‍යාපති උපාධි
2013 876 338 35 15
2014 952 241 32 22


සේවාස්ථ පුහුණුව - 2103 සහ 2014
පුහුණුවීම් සංඛ්‍යාව
800
700
600
500
400
300
200
100
0
විධායකයන්
කළමනාකරණ සහකාර
ප්‍රාථමික මට්ටම
2013 231 484 161
2014 701 233 18


පුහුණුවීම් සංඛ්‍යාව
300
250
200
150
100
50
0
විධායකයන්
කළමනාකරණ සහකාර
ප්‍රාථමික මට්ටම
2013 246 88 4
2014 186 52 3


විදේශ පුහුණුව - 2103 සහ 2014
පුහුණුවීම් සංඛ්‍යාව
35.5
35
34.5
34
33.5
33
32.5
32
31.5
31
30.5
විධායකයන්
2013 35
2014 32


ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධි පාඨමාලා - 2013 සහ 2014
පුහුණුවීම් සංඛ්‍යාව
25
20
15
10
5
0
විධායකයන්
2013 15
2014 22

## 10. පාලන අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් පරිපාලන අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විදේශ ඍජු ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඍජු මැදිහත්වීමක් නොමැති වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සියලුම අංශවලට ඒවායේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සැපයුම් සේවා සැපයීම පාලන අංශය මගින් සිදු කරයි. එම අංශයේ ප්‍රධාන කටයුතු වර්ගීකරණය කර පහත දක්වා ඇත.

1) පරිගණකගත කළ අභ්‍යන්තර සහ බාහිර විද්‍යුත් තැපැල හැසිරවීම සහ එමගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තුළ සහ ඉන් පරිබාහිරව සම්බන්ධතා ඇති කිරීම කඩිනම් කිරීම මගින් අවශ්‍ය නියෝජිතායතනවලට සමීප වීම සඳහා සහාය ලබා දීම.

2) පානීය ජලය, තේ, පවිත්‍රකරණ සේවා, දුරකථන සහ සුබසාධන කටයුතු අඛණ්ඩව සැපයීම සහ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කටයුතු සිදු කිරීමට සඳහා ඉතා පවිත්‍ර වාතාවරණයක් පවත්වාගෙන යෑම පරිපාලන අංශයේ කාර්යභාරයයි. ගොඩනැගිලි සහ උපකරණ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන සියලුම අළුත්වැඩියා කටයුතු, ගෘහ භාණ්ඩ මිල දී ගැනීම ආදිය පිළිබඳව මෙම අංශය වගකිව යුතු වේ.

3) සන්නිවේදනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සාර්ථකත්වයේ මඟ වන අතර පාලන අංශය යටතේ පවතින ප්‍රවාහණ ඒකකය බාහිර ලෝකය වෙත ප්‍රවේශ වීම සහ සම්බන්ධතා පැවැත්වීම සඳහා ද, නිසි වේලාවට අදාළ ආයතන වෙත ළඟා වීම සඳහා ද පහසුකම් සලසයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් විසින් එදිනෙදා ඉටු කළ යුතු ක්‍රියාකාරකම් සඳහා කොළඹ නගරය තුළ සහ දිවයින වටා පහසුවෙන් ගමන් කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා තවත් ඩබල් කැබ් රථ කීපයක් අනාගතයේ දී මිල දී ගැනීමට යෝජිතය.

4) පාලන අංශය යටතේ පවතින සැපයුම් ඒකකය සියලුම කාර්යාලවල කටයුතු අඛණ්ඩව සිදු වන බව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය, උපකරණ සහ සියලුම සැපයුම් ලබා දීම පිළිබඳ ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. එබැවින්, කලට වේලාවට කාර්ය මණ්ඩලය වෙත අඛණ්ඩව සැපයුම් ලබා දීමට පාලන අංශය කටයුතු පිළියෙළ කර ඇත.

**අංශයේ ප්‍රධාන දායකත්වය**

- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ අදාළ අංශවලට යටිතල පහසුකම් සැපයීම.
- පිරිමැසුම්දායක නොවන වාහන වෙන්දේසි පැවැත්වීම තුළින් අපහරණය කර ආදායම් උපදවා ගැනීම.

## 11. නීති අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) නීති අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට මෙන්ම ආයෝජකයන් සඳහා වෘත්තීමය උපදෙස්/සේවා ලබාදීම සම්බන්ධයෙන් ද වගකිව යුතු වේ. ආයෝජනවලට අදාළව පවත්නා නෛතික ක්‍රමය පදනම් කර ගනිමින් ආයෝජකයන් ආශ්‍රිත සේවා සැපයීම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ හා 2008 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ හා සංශෝධිත 2013 මධ්‍යස්ථාන රෙගුලාසි අංක 1 යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා ආයෝජන ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම නීති අංශයේ ප්‍රධාන කාර්යභාරය බවට පත්වී ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එදිරිව සංවිධානාත්මක නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ දී, සංස්ථාපිත නෛතික කටයුතු සම්බන්ධ එහි කාර්යභාරය සම්බන්ධයෙන් වන රාජකාරීවලට ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් නෛතික කටයුතු ආරම්භ කිරීම සඳහා ද මෙම අංශය ක්‍රියාකාරීව දායක වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ස්ථාපනය කිරීමේ නෛතික ක්‍රමය පිළිබඳව තොරතුරු බෙදා හැරීම හා ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘති ස්ථාපනය කිරීමට අවසර ලබා දෙන වගන්ති මනාව අධ්‍යනය කර ඒවාට පිළිගැනීමක් ලබාදීම ආදී වශයෙන් ආයෝජකයන් වෙත පහසුකම් සැපයීමේ නෛතික සේවා උපදේශන සේවා ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම නීති අංශයේ කාර්යභාරයයි.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාරික ආයතන ස්ථාපනය කිරීම සඳහා ගිවිසුම් 92කට ඇතුළත් වන ලදී. 1978 අංක 4 සහ ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ මෙන්ම 2008 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මෙයට ඇතුළත් වේ.

එම ව්‍යාපෘති වන්නේ;
සීමාසහිත කළම්බු ප්‍රොජෙක්ට් (පුද්) සමාගම - 2014.05.13 දින ගිවිසුම් අත්සන් තබන ලදී. (ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති)

<u>නිෂ්පාදන අංශය</u>

1. සිලෝන් බෙවරේජ් කෑන් (පුද්) සමාගම
   රැකියා නියුක්තිය – පුද්ගලයන් 109
   ආයෝජනය - රු. මිලියන 6,575 (විදේශීය + දේශීය)

2. එල්-ටොරෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්
   රැකියා නියුක්තිය – පුද්ගලයන් 147
   ආයෝජනය - රු. මිලියන 3697.50 (දේශීය)

<u>බලශක්ති අංශය</u>

රෝයල් ඒෂියන් කෘස් ලයින් (පුද්) සමාගම - 2014.09.25 දින ගිවිසුම අත්සන් තබන ලදී.
රැකියා නියුක්තිය – පුද්ගලයන් 500
ආයෝජනය - රු. මිලියන 4,290

සංචාරක හා විනෝදස්වාද අංශය

ක්වෙන්වර්ස් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම - 2014.11.03 දින ගිවිසුම අත්සන් තබන ලදී.
රැකියා නියුක්තිය – පුද්ගලයන් 81
ආයෝජනය - ඇ.ඩො. මිලියන 25

යටිතල පහසුකම් අංශය

ඉන්ටර්නැෂනල් ඉක්විටීස් ලංකා (පුද්) සමාගම
රැකියා නියුක්තිය – පුද්ගලයන් 268
ආයෝජනය -

සීඑම්එල්-එම්ටීඩී ජොයින්ට් වෙන්චර් ලිමිටඩ්
රැකියා නියුක්තිය – පුද්ගලයන් 644
ආයෝජනය -

ක්ලියර් පොයින්ට් රෙසිඩන්සීස් (පුද්) සමාගම
රැකියා නියුක්තිය – පුද්ගලයන් 530
ආයෝජනය -

ෆෙයාර්වේ එලිමන්ට්ස් (පුද්) සමාගම
රැකියා නියුක්තිය – පුද්ගලයන් 56
ආයෝජනය -

දැනුමැති සේවා අංශය

රැකියා නියුක්තිය – පුද්ගලයන්
ආයෝජනය -

මෙයට අමතරව, දැනට පවතින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සම්බන්ධයෙන් වැඩිදුර ආයෝජනය කිරීම, පවතින ව්‍යාපෘති පුළුල් කිරීම, ව්‍යාපාරික විෂය පථය වෙනස් කිරීම හා ව්‍යාපෘති ප්‍රතිස්ථාපනය කිරීම, පාඩු ලබන කර්මාන්ත අත්පත් කර ගැනීම හා ඒවා නැවත යථා තත්ත්වයට පත් කිරීමට අදාළව පරිපූරක ගිවිසුම් දෙසිය හතලිස් හතක (247) ක කටයුතු අවසන් කර තිබේ

## 12. තොරතුරු තාක්ෂණික අංශය

- අංශයේ කටයුතු පිළිබඳ සාරාංශය

– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන උපදෙස් සහ තාක්ෂණික සහාය සැපයීම.
– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් සැලසුම් කිරීම, නිර්දේශ කිරීම, ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම. බලතල පැවරීම සහ නඩත්තු කිරීම.
– සංස්ථානික ජාල හා දත්ත සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කිරීම සහ කළමනාකරණය කිරීම.
– ආයෝජන මණ්ඩලයට අවශ්‍ය මෘදුකාංග පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
– දෘඩාංග, මෘදුකාංග, සන්නිවේදනය, ජාල, විද්‍යුත් තැපැල සහ පරිගණක වෛරස්වලට අදාළ

ගැටළු විසඳීමේදී පරිශීලක සහාය සැපයීම

– ව්‍යාපාරික ප්‍රති-ඉංජිනේරුකරණ ප්‍රයත්නයන් සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේදී අනෙකුත් අංශවලට සහාය ලබා දීම්
– සංස්ථානික දත්ත ශබ්දකෝෂය, පරිගණක දත්ත සමුදාය සහ ආශ්‍රිත පද්ධති ලේඛනගත කිරීම වැඩි දියුණු කිරීම සහ පවත්වාගන යාම.

- **2014 වසරේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති**

2014 වසර තුළදී තොරතුරු තාක්ෂණ සම්පත් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ප්‍රධාන කාර්යාලය, කලාප හා කලාප කාර්යාලවලට නව ජාල පුළුල් කිරීම් 37 ක් සපයමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පෙදෙසි ජාලය (LAN)/ පුළුල් ප්‍රදේශ ජාලය (WAN) වැඩි දියුණු කිරීම

– ඇතුළුවීමේ අවසරපත්‍ර නිකුත් කිරීමේ පහසුකම තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින්, හොරණ අපනයන සැකසුම් කලාපයේ නව තන්තු ජාලයක් ස්ථාපනය කිරීම .

– කලාප ද ඇතුළත්ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාල සඳහා පුද්ගලික පරිගණක 123 ක් ද, මුද්‍රණ යන්ත්‍ර 89 ක් ද මිලදී ගෙන සවි කරන ලදී.

– අති බලශක්ති සුරැකුම (UPS) 177 ක් ද, ස්විච හා ජාල උපාංග (ජාල අතුරුමුහුණත් කාඩ්පත් (NIC), මාධ්‍ය පරිවර්තක ද ඇතුළුව) මිලදී ගෙන සවි කරන ලදී.

– ආරක්ෂක පියවරක් වශයෙන් BOC වොලට්ටුවට යවා ඇති උපස්ථ (backups) වලට අමතරව සංස්ථාපිත දත්තවල ආරක්ෂිත උපස්ථ (backups) ලබා ගැනීමේ අරමුණින් බාහිර USB පටි ධාවකයක් (tape driver) මිලදී ගැනීම.

– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල තොරතුරු ජාලයේ ජාල සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන මණ්ඩල තොරතුරු ජාලය සඳහා පවතින ආරක්ෂක පියවර සම්බන්ධව සමීක්ෂණයක් සිදු කළ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (SLCERT) නිර්දේශවලට අනුව ජාල සුරක්ෂිතතා පද්ධතිය මිලදී ගැනීම හා එය ආයෝජන මණ්ඩලයේ භාවිතයට ගැනීමට නියම කිරීම.

– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාල සඳහා නව විද්‍යුත් තැපැල් ගිණුම් 118 ක් සැපයීම.

– ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල විද්‍යුත් තැපැල භාවිතා කිරීම සුසංවිධිත කිරීම සඳහා ආයෝජන මණ්ඩලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යුත් තැපැල් ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම.

– භාවිත කරන්නන්ගේ ඉල්ලීම් වඩාත් ඵලදායීව ඉටු කිරීම සඳහා විද්‍යුත් තැපැල් සේවාදායකයට හැකියාව ලබාදීම සඳහා පරිගණක මතක ධාරිතාව ගිගා බයිට් 4 සිට ගිගා බයිට් 8 දක්වා වැඩි කිරීම.

**මෘදුකාංග යෙදවුම් වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම**
**නව ව්‍යාපෘති**

– ව්‍යාපෘති අයදුම්පත්‍ර ප්‍රවාහය වේගවත් කිරීම සඳහා එක් එක් පරිශීලක අංශයේ දී ඉලෙක්ට්‍රොනිකව උත්පාදනය කළ ව්‍යාපෘති අයදුම්පත්‍රවලට අදාළ වන සියලු වර්ගවලට අයත් ලේඛන පරිග්‍රහණය කිරීමට පරිගණකගත කළ ලේඛන කළමනාකරණ පද්ධතිය (CDMS) ලෙස හඳුන්වනු ලබන මෘදුකාංග නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- ඒකාබද්ධ පාරිසරික කළමනාකරණ පද්ධතිය (IEMS) සඳහා ස්වයංක්‍රීයකරණය කළ දත්ත වලංගු කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය දත්තවල නිවැරදිතාව තහවුරු කිරීම සඳහා පෙර ගෙවුම් ගිණුම් පද්ධති ස්ථාපනය කිරීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල තනතුරු දරන විදේශිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය කරන ලද පද්ධතියක් වැඩි දියුණු කර ක්‍රියාත්මක කිරීම හා එම පද්ධතියෙන් අදාළ ගාස්තු රැස් කිරීම.

- මාධ්‍යගතව අයදුම් කිරීමට සහ අවශ්‍ය ලේඛනවල පරිලෝකනය කරන ලද පිටපත් උඩුගත කිරීමට හැකි වන පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාර සඳහා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ තනි ස්ථානයක් ලෙස ක්‍රියාකල හැකි විශේෂයෙන් සැලසුම් කල වෙබ් අඩවියක් වීසා නිර්දේශ කිරීමේ ක්‍රියාවලිය සඳහා ස්ථාපනය කිරීම.

- පෙර ගෙවුම් ගිණුම්වලින් අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ මාරුකිරීම් වලට අදාළ සේවා ගාස්තු රැස් කිරීම සඳහා මොඩියුලයක් වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**පවත්නා පද්ධතියේ වැඩි දියුණු කිරීම්**

- දේශීය විකිණුම්: දේශීය විකිණුම් අවලංගු කිරීම, සෙවීමේ කවුළුවේ (Search Window) සමාගම පිහිටි ස්ථානය ප්‍රදර්ශනය කිරීමේ පහසුකම් ඇතුළත් කරමින්, පරිශ්‍රයේ පිහිටීම නොතකා ඕනෑම ස්ථානයක සිට දේශීය විකිණුම් නිම් භාණ්ඩ සඳහා අනුමතිය ලබාදීම වෙනුවෙන් විධිවිධාන සැලසීම තුළින් පද්ධතිය වැඩි දියුණු කිරීම.

- පුනරාවර්තන අයවැය - ඊළඟ වසරේ මාර්තු 31 දින වන තෙක් වියදම් සඳහා සංශෝධන සිදු කිරීම සහ ප්‍රතිශෝධන සිදු කිරීම සහ අරමුදල් වෙන් කිරීම සඳහා විධිවිධාන සැලසීම.

- පෙර ගෙවුම් ගිණුම් - දිනය අවසානයේ වාර්තා ලබා ගැනීම, මධ්‍යස්ථානය අධීක්ෂණය කිරීම මගින් දෛනික වාර්තා ලබා ගැනීම, මුදල් හා චෙක්පත් ලැබීම් සාරාංශය ලබා ගැනීම සඳහා පද්ධතිය වැඩි දියුණු කිරීම.

- ඒකාබද්ධ පාරිසරික කළමනාකරණ පද්ධතිය (IEMS): ආනයනය, අපනයනය L/S, උප කොන්ත්‍රාත්තු, පැවරීම් ආදී බහුවිධ සේවා සඳහා බහුවිධ සේවා ස්ථාන තෝරා ගැනමේ අරමුණින් මෙම පහසුකම ඇතුළත් කරන ලදී. ලේඛනගත කිරීම සඳහා OT ද, රේගු ප්‍රකාශන සංශෝධනය කිරීම, පරිශ්‍ර මට්ටම් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමා රැස් කිරීම සඳහා මොඩියුල වැඩි දියුණු කිරීම.
- ව්‍යාපෘති අනුමත කිරීමේ නියැළී සිටින WTC අංශ, කලාප හා කලාපීය කාර්යාලවල වගකීම් සඳහා නව කව අරුතක් එක් කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම්/සංශෝධනය කිරීම.

- පරිශීලක දෙපාර්තමේන්තුවල වෙනස් වන අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සේවා අත්හිටුවීමේ මොඩියුල, ඇතුළුවීමේ අවසරපත්, අධ්‍යක්ෂ/කොටස් හිමිකරුවන්ගේ විස්තර, මධ්‍යම තැපැල් කළමනාකරණ පද්ධතිය වැනි වෙනත් පද්ධති සඳහා වැඩි දියුණු කිරීම්/සංශෝධන සිදු කර ඇත.

## 13 පාරිසරික කළමනාකරණ අංශය

<u>අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශය</u>

- මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) එකඟතාව සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට පාරිසරික නිෂ්කාෂණ ලබා දීම පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පාරිසරික කළමනාකරණ අංශය වගකිව යුතු වේ.

ජාතික පාරිසරික රෙගුලාසි (ව්‍යාපෘති අනුමත කිරීම සඳහා පවතින පරිපාටිය) ප්‍රකාරව, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (EIA) අවශ්‍ය වන ව්‍යාපෘති සඳහා පැවැත්වෙන බලපෑම් තක්සේරු කිරීමේ සැසිවලට සහභාගී වීම මගින් ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා පහසුකම් සැලසීම.

තවද, මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මගින් ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතනය (PAA) වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත් කර ඇති අවස්ථාවලදී, ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතනය (PAA) වශයෙන් කටයුතු කිරීම.

- මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමග එක්ව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) නිකුත් කිරීම.

- සන්නිවේදන කුළුණු ඉදි කිරීම සඳහා යෝජිත ස්ථාන සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRC) වෙත පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවලට අදාළව පරිසර දූෂණයට අදාළ පැමිණිලි විමර්ශනය කිරීම හා අවශ්‍ය දූෂණ මර්ධන පියවර අනුගමනය කර ඇති බව තහවුරු කරමින් එවැනි ගැටළු විසඳීම. අපනයන සැකසුම් කලාපවල කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

උක්ත කටයුතු සම්බන්ධයෙන් සාරාංශයක් පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| 1. (අ) ව්‍යාපෘති සඳහා ලබාදුන් පාරිසරික නිෂ්කාෂණ සංඛ්‍යාව | 104 |
| (ආ) ව්‍යාපෘති පුළුල් කිරීම/ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලබාදුන් පාරිසරික නිෂ්කාෂණ සංඛ්‍යාව | 18 |
| 2. නිකුත් කළ/අලුත් කළ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සංඛ්‍යාව | *909 |
| 3. විදුලි සංදේශක කුළුණු ඉදි කිරීම සඳහා යෝජිත ස්ථාන සම්බන්ධයෙන් නිකුත් කරන ලද පාරිසරික නිර්දේශ (ERR) සංඛ්‍යාව | **86 |
| 4. පාරිසරික ගැටළු සම්බන්ධයෙන් විමර්ශනය කර විසඳුම් ලබාදුන් පැමිණිලි සංඛ්‍යාව | 20 |
| 5. පාරිසරික අධීක්ෂණ කටයුතු | |
| (අ) කර්මාන්තවලින් වෙන් කළ අපද්‍රව්‍ය නියැදි සංඛ්‍යාව | 1200 |
| (ආ) පොදු මළ අපවහන ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණවලින් රැස්කල අපවාහ නියැදි සංඛ්‍යාව | |
| (ඇ) ජල නියැදි සංඛ්‍යාව | 140 |

| | |
|---|---|
| * - පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සකස් කිරීමෙන් උපයාගත් ආදායම | රු. 63,73,084.00 |
| ** - පාරිසරික සම්පත් ගාස්තුවලින් උපයාගත් ආදායම | රු. 17,20,000.00 |
| -මුළු ඉපයීම් | රු. 80,93,084.00 |

- ඉහත කරුණට අමතරව, ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති පරිසරය/රසායනික ද්‍රව්‍ය සම්බන්ධ පහත දක්වා ඇති අන්තර්ජාතික සම්මුති පිළිබඳව පිහිටුවා ඇති ජාතික කමිටුවල ද කටයුතු කරන ලදී.

1. හානිකර අපද්‍රව්‍ය දේශසීමා හරහා රැගෙන යාම පිළිබඳ බාසෙල් සම්මුතිය
2. නොදිරන ඓන්ද්‍රීය පරිසර දූෂක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය
3. ඕසෝන් ස්ථරය ක්ෂය කිරීමේ ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතිය
4. රසායනික අවි සම්මුතිය
5. ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති මාදක මත්ද්‍රව්‍ය සහ මානසික ව්‍යාකූලත්වය ඇති කරන ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ප්‍රවාහණය කිරීමට එරෙහි සම්මුතිය
6. දේශගුණික විපර්යාස සඳහා එක්සත් ජාතීන්ගේ රාමුව (UNFCC)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති මෙම සම්මුතිවලට අනුකූලව ක්‍රියාත්මක වන බව තහවුරු කරනු ලැබීය.

<u>අත්පත් කර ගත් ජයග්‍රහණ</u>

- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLL) සහ පාරිසරික නිර්දේශ (ERR) නිකුත් කිරීම මගින් රු.මිලියන 8.1 කට ආසන්න ආදායමක් උපයා තිබුණි.

- ජාත්‍යන්තර තත්ත්ව සංවිධානයේ 9001:2008 ප්‍රමිතිය පදනම් කර ගත් තත්ත්ව කළමනාකරණ පද්ධතිය යටතේ, 2014 වර්ෂය සඳහා අත්පත් කර ගැනීමට අවශ්‍ය වූ, ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවලින් 95% ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) ලබා ගත් බව තහවුරු කළ යුතු වීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට හැකි විය. ඒ අනුව, එම ඉලක්කයෙන් 95.5% ක් සාක්ෂාත් කර ගත හැකි වූ බව සඳහන් කළ යුතුය.

- යෝජිත මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය හා සූරියවැව ආයෝජන ප්‍රවර්ධන කලාපය සම්බන්ධයෙන් දැනට සකස් කරමින් පවතින පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (EIARR) "ස්කිල්ස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම" මගින් තක්සේරු කරනු ලැබීය. මෙම වාර්තා සම්බන්ධයෙන් සිදු කළ යුතු නිවැරදි කිරීම්/වැඩි දියුණු කිරීම් හඳුනාගෙන ඇති අතර ඒ අනුව, මෙම වාර්තා වැඩි දියුණු කරන ලෙස අදාළ උපදේශකවරයාට දන්වා ඇත.

  එහි ප්‍රතිඵලයක් වශයෙන්, මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමතිය ලැබී තිබේ.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් පහත දැක්වෙන තාක්ෂණික කමිටු නියෝජනය කරමින් සහභාගි වූ අතර ඔවුහු එම කමිටුවල තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ද සක්‍රීය අන්දමින් දායකත්වය දැක්වූහ.

  (අ) මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මුලසුන හෙබ වූ ඉහළ සහ මධ්‍යම පරිමාණ පරිසර දූෂණය සඳහා දායක වන කර්මාන්ත අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යානවලට පිටතින් ස්ථාපනය කළ යුතු ස්ථාන පිළිබඳව තීරණය කිරීමේ කමිටුව.

  (ආ) මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මගින් මුලසුන හෙබ වූ බාසෙල් තාක්ෂණික ඇගයීම් කමිටුව.

  (ඇ) පළිබෝධනාශක රෙජිස්ටාර්වරයා මුලසුන හෙබ වූ කාර්මික පළිබෝධනාශක ආනයනය කිරීමේ කමිටුව.

## 14.මාධ්‍ය සහ ප්‍රචාරණ අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය හා ප්‍රචාරණ අංශය බාහිර සන්නිවේදන කටයුතු සම්බන්ධයෙන් වග කිව යුතු වේ. 2014 වර්ෂයේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා, දිවයිනේ ව්‍යාපාරික වාතාවරණය, ආයෝජන මණ්ඩලයේ සාර්ථකත්වය ආදී කරුණු සම්බන්ධයෙන් විවිධ මාධ්‍ය තුළින් විවිධාකාරයේ ප්‍රේක්ෂකයන් ආමන්ත්‍රණය කරමින් ඔවුන්ව දැන්වත් කිරීම සඳහා සමාරම්භක පියවර තබනු ලැබීය.

2014 වර්ෂයේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ මාධ්‍ය භාවිත කරමින් ප්‍රචාරක වැඩසටහන්වල නිරත විය. තව ද, පුළුල් ප්‍රේක්ෂක ජනකායක් වෙත ආයෝජන මණ්ඩලයේ පණිවුඩය ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මුද්‍රිත ප්‍රවර්ධන ද්‍රව්‍ය වැඩි දියුණු කිරීම, ප්‍රකාශනවල ප්‍රචාරක දැන්වීම් පළ කිරීම හා වාර්තා චිත්‍රපට නිෂ්පාදනය ද සිදු කරන ලදී.

<u>මාධ්‍ය නිවේදන :</u>

- මුද්‍රිත මාධ්‍යවල රාජ්‍ය භාෂා දෙකෙන්ම පුවත්පත් නිවේදන 222 ක මුළු සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

<u>වාර්තා චිත්‍රපට :</u>

- උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම පිළිබඳ වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කරන ලදී. යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල නිෂ්පාදන කම්හල් ඉදි කිරීම හා එම ප්‍රදේශවල ජනතාවගේ ජීවන ශෛලිය වෙනස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දායකත්වය පිළිබඳව මෙම වාර්තා චිත්‍රපටයෙන් ප්‍රචාරය විය.

<u>විවිධ අවස්ථාවලට සහභාගී වීම:</u>

- කුලියාපිටියේ පවත්වල ලද දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහභාගි වීම.
  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රදර්ශන භූමිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල වෙළඳ ප්‍රදර්ශන භූමි ද සමග වෙන් කරන ලද ප්‍රදේශයක ඉදි කරන ලදී. ආයෝජන සම්බන්ධ වැදගත් අංශ පිළිබඳ ඡායාරූප ප්‍රදර්ශන ශාලාවක් ද, රැකියා බැංකු කවුන්ටරයක්, ආයෝජන පිළිබඳ තොරතුරු කවුන්ටරයක් ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ප්‍රදර්ශන කුටියේ සකස්කර තිබුණ අතර විශේෂයෙන් සැලසුම් කරන ලද තොරතුරු පත්‍රිකා මෙම ප්‍රදර්ශන කුටිය වෙත පැමිණි මහජනතාව අතර බෙදා හැර තිබුණි.

- ජපානයේ ටෝකියෝ නුවර පැවැත්වූ CEATEC ජැපෑන් 2014 සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි වූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ප්‍රදර්ශන කුටියක් ද ලබාදී තිබුණ අතර ජපාන ඉලෙක්ට්‍රොනික් සහ තොරතුරු තාක්ෂණ සංගමය (JEITA) හා සමායෝජනයෙන් ආයෝජන සංසදයක් ද පවත්වනු ලැබිණි.

- චීනයේ කුන්මින්ග්හි පැවැත් වූ චීන - දකුණු ආසියාතික ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගී විය. ශ්‍රී ලංකාව වෙත ලබාදී තිබූ ප්‍රදර්ශන ශාලාවේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රදර්ශන කුටි ඉදි කරන ලද අතර තායිලන්තය හා මියන්මාරය යන අසල්වාසී රටවල් දෙක සමග පැවැත්වූ ආයෝජන සංසදයට ක්‍රියාකාරීව සහභාගි විය.

- කොළඹ දී පැවැත්වූ UNESCAP ආසියානු ශාන්තිකර ව්‍යාපාරික සංසදයට ක්‍රියාකාරීව සහභාගි විය.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වෙබ් අඩවිය චීන, ජපාන, ස්පාඤ්ඤ, හින්දි, කොරියන් හා දෙමළ වැනි විවිධ භාෂාවලට පරිවර්තනය කරන ලද අතර ඒ අනුව, ආයෝජන මණ්ඩල වෙබ් අඩවියේ ප්‍රධාන පිටුව ද මෙම භාෂාවලින් කිය විය හැකි වේ.

- දික්ඕවිට ධීවර වරායේ පැවැත්වූ බෝට්ටු ප්‍රදර්ශනයට හා ධීවර ප්‍රදර්ශනයට සහභාගි විය.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳ ධනාත්මක හඳුන්වා දීමක් ඇතුළත් වීඩියෝ චිත්‍රපටියක් කොරියානු භාෂාවෙන් හඬ කවා ඇත.

- ජාතික ආර්ථිකය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දායකත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රධාන පෙළේ දේශීය පුවත්පත් දැන්වීම් ව්‍යාපාර දෙකක් ක්‍රියාත්මක කරන ලදී.

- පහත දක්වා ඇති ප්‍රධාන අවස්ථා සඳහා ප්‍රචාරක ව්‍යාපාර සංවිධානය කරන ලදී.

  - ශ්‍රී ලංකා - යුරෝපා ආයෝජන සංවාදය
  - ජපානයේ ටෝකියෝ බැංකුව සමඟ අවබෝධතා ගිවිසුම
  - ජපානයේ මිසුහෝ බැංකුව සමග අවබෝධතා ගිවිසුම
  - සීශෙල්ස් ආයෝජන මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුම

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වෙබ් අඩවිය කළමනාකරණය කිරීම: 2014 වර්ෂයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල වෙබ් අඩවිය වන **www.investsrilanka.com** හි සම්පූර්ණ වෙබ් පිටු සංඛ්‍යාව 564,830 ක් විය.

## 15. කාර්මික සබඳතා අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරවල මනා කාර්යක්ෂමතාවක් හා ඵලදායිතාවක් ඇති කර ගැනීම සඳහා කාර්මික සබඳතා මනාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා අංශය මඟින් ඉටු කරයි. එකී ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්මික සබඳතා අංශය මගින් පහත කටයුතු මෙහෙයවනු ලබයි.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපාරවල කම්කරු කළමනාකරණය, සම්බන්ධීකරණය, කාර්මික සාමය හා සමගිය හා ඉහළ ඵලදායීතාවයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.
- අවශ්‍ය අවස්ථාවලදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරවල කළමනාකරණය හා සේවකයන් සඳහා කම්කරු නීති/රෙගුලාසි හා කාර්මික සබඳතා පරිචය පිළිබඳව උපදේශන සේවා හා මාර්ගෝපදේශන සේවා ලබා දීම.
- අපනයන සැකසුම් කලාපවල ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල රැකියා නියුක්ති සේවා ඒකක, රැකියා බැංකු වෙබ් අඩවි තුළින් හා බඳවා ගැනීමේ සහාය සේවා වැඩසටහන් තුළින් ශ්‍රම බලකායක් බඳවා ගැනීමේ අවශ්‍යතාව සපුරා ගැනීමට ආයෝජකයන්ට සහාය සැලසීම.

**2014 වසර තුළ කාර්මික සබඳතා අංශය මගින් පහත දැක්වෙන ප්‍රගතිය අත්පත් කර ගැනීමට සමත් විය.**

- **කම්කරු ප්‍රමිති පවත්වා ගැනීම**

  කම්කරු නීති/රෙගුලාසි හා ආයෝජන මණ්ඩල කම්කරු ප්‍රමිති සහ සේවක සම්බන්ධතා සංග්‍රහයේ පැහැදිලිව දක්වා ඇති කම්කරු ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කලාපවල හා ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව කටයුතු කරන කාර්මික සබඳතා නිලධාරීන් විසින් ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරවල කලින් කලට කම්කරු විගණන පවත්වයි.

  2014 වසරේදී, කලාප තුළ පිහිටි ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල මෙන්ම කලාපවලට පරිබාහිරව පිහිටි ආයෝජන මණ්ඩල ව්‍යාපාර 1239 ක කම්කරු විගණන සිදු කරන ලද අතර ඉහත විගණනවලදී අනාවරණය කර ගන්නා ලද අඩුපාඩු/ප්‍රමාදදෝෂ නිවැරදි කිරීම සඳහා ප්‍රතිකාර්යය

ක්‍රියාමාර්ග ද අනුගමනය කරන ලදී.

- **කම්කරු කළමනාකරණ - සම්බන්ධීකරණ කටයුතු ප්‍රවර්ධනය කිරීම**

"සේවක සභා" යනුවෙන් හැඳින්වෙන්නේ ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල කම්කරු කළමනාකරණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කර ගන්නා ප්‍රධානම මෙවලමයි. වෘත්තීය සමිති දිරිමත් කරමින් වෘත්තීය සමිති සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතරතුර, කම්කරු කළමනාකරණය සම්බන්ධීකරණය කිරීමේදී, ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල සේවකයන්ගේ පුළුල් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "සේවක සභා" වලට නිවැරදි මාර්ගෝපදේශනය ලබා දෙනු ලැබේ.

2014 වර්ෂය තුළදී, සේවක සභා 118ක් ක්‍රියාත්මක කර මෙහෙයවීම සඳහා කාර්මික සබඳතා අංශය පහසුකම් සලසන ලදී.

- **කම්කරුවන් සඳහා පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම**

කටුනායක, බියගම, කොග්ගල සහ අපනයන සැකසුම් කලාපවල ස්ථාපනය කරන ලද පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානවලට අමතරව, තවත් පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන දෙකක් (02) 2014 වර්ෂයේ දී වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ හා මහනුවර කාර්මික උද්‍යානයේ ස්ථාපනය කරන ලදී. මෙම පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානවලදී, වෘත්තීය සමිති නිලධාරීන්ට අදාළ කලාපයේ ව්‍යාපාරවල සේවය කරන ඔවුන්ගේ සාමාජිකයන් ඔවුන්ට අවශ්‍ය අවස්ථාවලදී නිදහසේ හා පෞද්ගලික මට්ටමින් හමුවීම සඳහා පහසුකම් සලසා තිබේ

**දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම**

අදාළ රජයේ නියෝජිතායතනවල සමායෝජනයෙන්, 2014 වසර තුළ ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල සේවකයන් හා කළමනාකරණ නිලධාරීන් සඳහා සමාජ සංවාද, කම්කරු නීති/රෙගුලාසි, වැඩබිමේ සහයෝගීතාව, සුහදශීලී වැඩ පරිචයන් සහ රැකියාවට සම්බන්ධ සෞඛ්‍යය හා ආරක්ෂාව ආදී විවිධ විෂයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 76ක් පවත්වා ඇත.

- **කාර්මික අර්බුද විසඳීම සඳහා මැදිහත්වීම/සමගි කිරීම**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාරවල කාර්මික සාමය හා සමගිය පවත්වා ගැනීමේදී, එම ව්‍යාපාරවල ඇතිවන ඕනෑම කාර්මික ආරවුලක් විසඳීම සඳහා කාර්මික සම්බන්ධතා නිලධාරීන් මැදිහත් වේ. අවශ්‍ය අවස්ථාවල දී, කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය පවා ලබා ගනිමින් 2014 වර්ෂය තුළදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තුළ ඇතිවූ කාර්මික අර්බුද/වැඩ වර්ජන 08ක් විසඳන ලදී.

- **බඳවා ගැනීමේ උපකාරක යෝජනා ක්‍රමය**

2014 වර්ෂය තුළ, රැකියා අපේක්ෂකයන් 63,499 ක් අපනයන සැකසුම් කලාපවල පිහිටි රැකියා නියුක්ති සේවා ඒකකවල ලියාපදිංචි වී සිටි අතර ඒ අතරින් 62,329 දෙනෙකු රැකියාගත කිරීමේ අරමුණින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාර වෙත යොමු කරන ලදී.

එයට අමතරව, ආයෝජන මණ්ඩල ව්‍යාපාරවල පවතින රැකියා අවස්ථා වෙත රැකියා අපේක්ෂකයින් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමේ අභිලාසයෙන් වෙනත් අදාළ නියෝජිතායතනවල සමායෝජනයෙන් රැකියා පොළ/වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම සඳහා කාර්මික සබඳතා අංශය මගින් පහසුකම් සලසයි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ, දිවයින පුරා එබඳු රැකියා පොළ/වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 23 ක් පවත්වා ඇත.

## 16. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර පාලන කටයුතු ක්‍රමවත්ව තක්සේරු කරන ලද අතර අනාවරණය වූ අපගමන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාට වාර්තා කරන ලදී. 2014 වසර තුළ, රජයේ නියාමන රාමුවට අනුකූලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කිරීම තහවුරු කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන වශයෙන් එහි අවධානය යොමු කරන ලදී. තීරණ සඳහා යම් සංශෝධන සිදු කිරීම අවශ්‍ය වන අවස්ථාවල දී, ඉහළ කළමනාකරණයට ඒ බව ඒත්තු ගැන්වීම සම්බන්ධයෙන් සාර්ථකව කටයුතු කිරීමට අභ්‍යන්තර විගණන අංශයට හැකි විය.

විශේෂයෙන්ම මෙම වසර තුළ, ආයෝජන සේවා වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා නව පරිගණකගත කළ පද්ධතියක් වැඩි දියුණු කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී, නිසි අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගැනීම සඳහා හිතකර යෝජනා ලබා දෙමින් අභ්‍යන්තර විගණන අංශය වැදගත් දායකත්වයක් ලබා දෙන ලදී.

තවද, අභ්‍යන්තර පාලනවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව තහවුරු කිරීම සඳහා මූල්‍ය කටයුතුවල දෛනික සත්‍යාපන කටයුතු ද, අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳව අනුකූලතා පරීක්ෂණ ද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කොන්ත්‍රාත්තු සඳහා අවසාන ගෙවීම් සම්බන්ධයෙන් පූර්ව විගණන පැවැත්වීමට ද අභ්‍යන්තර විගනන අංශයට හැකි විය.

ඉහත කටයුතුවලට අමතරව, අභ්‍යන්තර විගණන අංශය මගින් කළමනාකරණයේ නියමවලට අනුව, විශේෂ විමර්ශන කටයුතු ද සිදු කළ අතර සුදුසු විනය ක්‍රියාමාර්ග ශා ප්‍රතිකාර්යය කටයුතු අනුගමනය කරමින් මහජන අයිතිවාසිකම්/දේපළ ආරක්ෂා කිරීමේ අරමුණින් ප්‍රමාද දෝෂ/වැරදි පිළිබඳව වාර්තා කිරීම ද සිදු කරන ලදී.

ඉහත සියලු කාර්යයන් ඉටු කිරීමේදී, ප්‍රමාද දෝෂ/නිරීක්ෂණ හා නිර්දේශ පිළිබඳව සංගනනය කිරීමේදී, පරීක්ෂා කිරීමේදී හා වාර්තා කිරීමේදී විධිමත් හා පාරදෘශ්‍ය ක්‍රියාවලි අනුගමනය කිරීම මගින් අභ්‍යන්තර විගණන ඒකකය එහි විෂය මූලිකත්වය හා ඍජු බව පවත්වා ගැනීමට සමත් විය.

### විගණන කමිටු වාර්තාව - 2014

අංක PF/PE3 හා 1999.11.19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව සංවිධානය කරන ලද විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

1. සභාපති - අනුර ජයසිංහ මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
2. සාමාජික - සංජීව වික්‍රමනායක මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
3. සාමාජික - චන්න පලන්සූරිය මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
4. සාමාජික - සාගර ගුණවර්ධන මහතා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
5. සාමාජික - කේ.එම්.එම්.සිරිවර්ධන මහතා (මහා භාණ්ඩාගාර නියෝජිත)
6. සාමාජික - ජගත් විජේවීර මහතා (රේගු අධ්‍යක්ෂ ජනරාල්)

වැඩ බලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන - ප්‍රධාන කාර්යාලය) මෙම විගණන කමිටුවේ ලේකම්/කැඳවුම්කරු ලෙස කටයුතු කරන ලදී.

වසර පුරා සමාන කාල වකවානු තුළ ක්‍රමවත් ලෙස රැස්වීම් පැවැත්වීමට බාධකයක් ලෙස ක්‍රියා කරන රැස්වීමේ ගණපූර්ණය පවත්වා ගැනීම සම්බන්ධයෙන් පවතින අපහසුතාව හඳුනා ගැනීමෙන් අනතුරුව, විගණන කමිටුවට අමතර සාමාජිකයකු පත් කරන ලදී.

2014.12.31 දිනයෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී

විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු සමඟ සංවාදයක් ගොඩනැගීමට සහාය ලබා දෙන පියවරක් වශයෙන් රජයේ විගණන අධිකාරීවරයා විගණන කමිටු රැස්වීම්වලට නිතරම සහභාගී විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බවද, මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය පිළිබඳව ද සමාලෝචනය කිරීමට හැකි වූ අතර විවිධ කරුණු සම්බන්ධයෙන් සහතිකකරණයක් ද ලබා ගත හැකි විය.

2014 වසර සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුගමනය කිරීම මගින් අභ්‍යන්තර විගණන ආවරණයේ ප්‍රමාණවත් බව පිළිබඳව විගණන කමිටුව තහවුරු කරන ලදී.


සියලුම වැදගත් අංශවලට අනුකූලව කමිටුවේ නියම හා සමුද්දේශ මාලාව සම්පාදනය කරන ලද බව විගණන කමිටුවේ මතය විය.

## 17.ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය

2014 වසර තුළ ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය තුළ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් විය. කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ප්‍රශංසනීය මට්ටමක පැවතුණි. කාර්යමණ්ඩලයට වගකීම් පවරන ලද ක්ෂේත්‍රවල වත්කම්වලට හා මිනිස් ජීවිතවල ආරක්ෂාව හා සුරක්ෂිතතාව පවත්ව ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රමිති පවත්වාගෙන යාමට ඔවුන්ට හැකි විය. ප්‍රධාන වශයෙන්ම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අවශ්‍ය වන කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කාර්යමණ්ඩලය තුළ නොමැතිවීම ආදී ගැටළු ගණනාවක් මධ්‍යයේ වුවද, දැනට සේවයේ නිරතව සිටින කාර්යමණ්ඩලය ඔවුන්ගේ විශිෂ්ඨ ප්‍රයත්න තුළින් හා උපරිම කැපවීම තුළින් අපේක්ෂිත ප්‍රමිතියට ළඟා වෙමින් මෙහෙයුම් කටයුතුවල නිරත වූහ.


ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය ආයෝජන මණ්ඩලයට බඳවා ගත් සේවක මණ්ඩලයේ ද, පෞද්ගලික සමාගම්වලින් කුළියට ගත් ආරක්ෂක නිලධාරීන්ගෙන් ද සමන්විත වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එහි කාර්යාල/උද්‍යාන/කලාපවල පවතින සේවක මණ්ඩලවල හිඟය ආවරණය කර ගැනීමට ටෙන්ඩර් ක්‍රියා පටිපාටි මගින් වාර්ෂිකව පෞද්ගලික ආරක්ෂක සමාගම්වල සේවා ලබා ගනියි. නිසි බලධාරියා විසින් පවරා ගන්නා ලද භූමිය හා ගොඩනැගිලිවල ආරක්ෂක විධිවිධාන ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක හා ගිනි නිවීමේ අංශය මගින් ඉටු කරනු ලබයි.

2014 දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව - ආරක්ෂක හා ගිනි නිවීමේ ඒකකය - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සේවා හා කුළියට ගත් සේවා




| | | | |
|---|---|---|---|
| මුළු ආයෝජන මණ්ඩල ආරක්ෂක කාර්යමණ්ඩලය | - | 90 | } 134 |
| ගිනි නිවීමේ කාර්යමණ්ඩලය | - | 44 | |
| කුළියට ගත් මුළු පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව | - | 259 | } 279 |
| වසනු ලැබූ ස්ථාන සඳහා මුළු පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව | - | 20 | |

2014 දෙසැම්බර් මාසය වන විට පැවති ආරක්ෂක ස්ථාන සංඛ්‍යාව පූර්ව වර්ෂයේ පැවති ආරක්ෂක ස්ථාන සංඛ්‍යාවට සමානය.



ආරක්ෂක හා ගිනි නිවීමේ ඒකකවලට පැවරී ඇති ප්‍රධාන කටයුතු අතර වැදගත්ම කටයුත්ත වන්නේ දේපළවල හා මිනිස් ජීවිතවල ආරක්ෂාව හා සුරක්ෂිතතාව තහවුරු කිරීමයි.

<u>ආරක්ෂාව</u>

- සිදු කළ හැකි කඩාකප්පල්කාරී ක්‍රියා, විනාශකාරී ක්‍රියාකාරකම්, හොරකම්, අයිතම අලුත්වැඩියා කිරීම්/නැවත භාර දීම ද ඇතුළත්ව තීරු බදුවලින් නිදහස් භාණ්ඩ හා වෙනත් භාණ්ඩ නීත්‍යානුකූල නොවන ආකාරවලින් ඉවත් කිරීම වැළැක්වීම.

- කලාප තුළට හෝ කලාපවලින් පිටතට නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පිවිසීම හා පිටවීම පිළිබඳව ඉතා අවධානයෙන් පරීක්ෂා කර බැලීම සඳහා සියලුම ඇතුළුවීමේ හා පිටවීමේ ස්ථානවලට සේවක පිරිස් යෙදවීම.

- සියලුම කලාපවල ජංගම මුර සංචාරක කටයුතු, යතුරුපැදි වලින් හා පා ගමනින් මුර සංචාරක කටයුතු සිදු කිරීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලය යෙදවීම.

- තීරු බදු ක්‍රියාත්මකව පවතින ප්‍රදේශවල රාජකාරී කටයුතු ඉටු කිරීම හා කලාපය ආශ්‍රිත ප්‍රදේශවල පැය 24 පුරා සෝදිසියෙන් සිටීම හා එම ප්‍රදේශය සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීම්

- ඇතුළුවීමේ අවසරපත් නිකුත්කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් වගකිව යුතු සති අන්තය හා නිවාඩු දින හැර වැඩ කරන පැය ගණන තුළ හා ඉන්පසුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය හා එක්ව ඇතුළුවීමේ අවසරපත් නිකුත් කිරීම.

- සොරකම් කිරීමට තැත් කිරීම, කාලය ඉකුත් වූ ඇතුළුවීමේ අවසරපත් අවභාවිතය ආදිය අනාවරණය කර ගැනීම සඳහා සියලුම කලාපවල කර්මාන්තශාලා නිරන්තරයෙන් පරීක්ෂා කිරීම.

- කලාප කළමනාකරණය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාර හා නීතිය කිරීමේ බලධාරීන් අතර සම්බන්ධීකරණය ඇති කිරීම.

- වසා දැමූ ව්‍යාපාරවල ආරක්ෂක කටයුතු අධීක්ෂණය සිදු කිරීම.

- සියලුම කලාපවල දෛනික/මාසික රැස්වීම්, උපදෙස් හෝ තොරතුරු ලබාදීමේ රැස්වීම්, පුහුණු කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදෙස් ලබා දීමේ සැසිවාර පැවැත්වීම.

## 2014-ආරක්ෂක මෙහෙයුම්-කාර්යසාධනය

| ප්‍රදේශය | ප්‍රධාන අනාවරණ සංඛ්‍යාව | ගේට්ටු අවසරපත්වලින් ලද ආදායම (ආරක්ෂක අංශ මඟින් මෙහෙයවනු ලබන) | ආරක්ෂාව සම්බන්ධ වෙනත් සිදුවීම් | උසස්වීම්/මාරුවීම්/ නව/විශ්‍රාම ගැන්වීම් |
|---|---|---|---|---|
| කටුනායක අ.ස.ක. | 12 | 5,663,413.00 | 02 | P=05, T=2, R=03, N=10 |
| බියගම අ.සැ.ක. | 04 | 1,915,350.00 | 20 | P=02, R=01, T=1, N=02 |
| කොග්ගල අ.සැ.ක. | 01 | 1,691,765.00 | 03 | P=1, T=1, N=2 |
| මහනුවර කා.උ/මධ්‍යම කලාප කාර්යාලය | 01 | 1,089,240.00 | 01 | P=1, T=1 |
| සීතාවක අ.සැ.ක. | - | 4,929,700.00 | - | - |
| හොරණ අ.සැ.ක. | 01 | 2,364,770.00 | 01 | P=2 |
| තුල්හිරිය-වයඹ කලාපීය කාර්යාලය | - | - | - | - |
| මාවතගම අ.සැ.ක. | 05 | 7,094,920.00 | 03 | P=1 |
| පොල්ගහවෙල අ.සැ.ක. | 10 | 924,415.00 | 02 | P=1 |
| වතුපිටිවල අ.සැ.ක. | 03 | 4640920.00 | - | P=1 |
| මල්වත්ත අ.සැ.ක. | 01 | 1321015.00 | - | - |
| මීරිගම අ.සැ.ක. | 03 | 1,100,000.00 | - | P=1 |
| මිරිජ්ජවිල අ.සැ.ක. | - | - | - | N=2 |
| යාපනය කලාප කාර්යාලය | - | - | - | - |
| ත්‍රිකුණාමලය කලාප කාර්යාලය | - | - | - | - |
| ප්‍රධාන කාර්යාලය / **BJM** | - | - | - | - |

<u>ගිනි නිවීම</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ගිනි නිවීමේ ඒකක කටුනායක, බියගම හා සීතාවක අපනයන සැකසුම් කලාප පදනම් කරගෙන පිහිටුවා ඇත. මෙහිදී, කම්කරුවන්ට ආරක්ෂක සේවා පරිසරයක් ලබාදීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරා ඇත. මෙම කලාපවල සැලකිය යුතු කර්මාන්ත සංඛ්‍යාවක් ස්ථාපනය කර ඇති අතර එම කර්මාන්ත සංඛ්‍යාව තවදුරටත් වැඩි වෙමින් පවතී. කලාපවල හදිසි අවස්ථාවලට අමතරව, කර්මාන්ත ශාලාවේ සේවක පිරිස්වලට ගිනි නිවීමේ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දීමේදී හා මෙම ප්‍රදේශවලට ප්‍රභූ පුද්ගලයන් සංචාරය කිරීමේදී ද, මෙම කලාපවලට පරිබාහිරව සහ ඉතා ආසන්නයේ පිහිටි ප්‍රදේශවල හදිසි අවස්ථා සඳහා ද, මෙම ගිනි නිවීමේ ඒකක සේවයේ යෙදවේ. ප්‍රදේශයේ පොලිස් ස්ථානවල හා ආසන්නම යුධ හමුදා බලධාරීන් සමඟ සමායෝජනයෙන් සියලු ගිනි නිවීමේ කටයුතු සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ගිනි නිවීමේ කටයුතු සඳහා "ඕවර්සීස් රියල්ටි" ආයතනයෙන් හා කොළඹ ගිනි නිවීමේ ඒකකයේ සහාය ලබා ගන්නා අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ගිනි නිවීමේ ඒකක ස්ථාපනය කර නොමැති කලාපවල ගිනි නිවීමේ කටයුතු සඳහා මහ නගර සභාවල, ආසන්නතම යුධ හා නාවික හමුදා කඳවුරුවල සහාය ලබා ගැනේ.

- ගිනි ගැනීම් සම්බන්ධ ඇමතුම් සඳහා මෙන්ම හදිසි අවස්ථා සඳහා ද ප්‍රතිචාර දැක්වීම.
- ගිනි ගැනීම් වැලැක්වීමේ වාර්ෂික පිරික්සීම් කටයුතු තුළින් ගින්නක් හට ගැනීමේ අවදානම පිළිබඳව තක්සේරු කිරීම.
- කර්මාන්තශාලාවල කාර්යමණ්ඩලය/සේවකයන් සඳහා ගිනි ගැනීම්වලදී පුද්ගලයන් ඉවත් කිරීමේ
  අභ්‍යාස හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කාර්යමණ්ඩලයට/කර්මාන්තශාලා සේවකයින්ට ගිනි නිවීමේ උපකරණ මෙහෙයවීම/ප්‍රථමාධාර
  ලබාදීම පිළිබඳව පුහුණුවීම් ලබාදීම.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාර සඳහා අනුකූලතා සහතික, ගිනි නිවීමේ සහතික හා අනතුරුදායක ස්ථානවලින් පුද්ගලයන් ඉවත් කිරීමේ සහතික නිකුත් කිරීම.
- කර්මාන්තශාලාවල ගිනි නිවීමේ උපකරණ සවි කිරීම පිළිබඳව උපදේශනය.
- කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා ගිනි නිවීමේ උපකරණ දෛනිකව පරීක්ෂා කිරීම.
- ගිනි නිවීමේ උපකරණ සර්විස් කිරීම.
- කලාප කළමනාකරණයට අදාළ හදිසි අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීම
- වාර්ෂික ගිනි අනතුරු වැළැක්වීම තුළින් ගිනි අවදානම තක්සේරු

| ප්‍රදේශය | මිනිසුන් ඉවත්කිරීමේ අභ්‍යාස හා පරීක්ෂා කිරීම් | ප්‍රතිචාර දක්වන ලද ගිනි නිවීමේ ඇමතුම් සංඛ්‍යාව | වෙනත් වැඩසටහන් |
|---|---|---|---|
| **කටුනායක අ.ස.ක.** | 155 | 46 | **80** |
| **බියගම අ.සැ.ක.** | 87 | 40 | 55 |
| **සීතාවක අ.සැ.ක.** | 62 | 43 | **42** |

**ආරක්ෂක හා ගිනි නිවීමේ අංශයේ වෙනත් කැපී පෙනෙන වැඩි දියුණු කිරීම්**

ව්‍යාපාරික වශයෙන්, පිළි සැකසුම් කළ ගිනි නිවීමේ වාහන පහක් ජපාන තානාපති කාර්යාලයෙන් ලැබී තිබේ.

මෙම ගිනි නිවීමේ රථ පහත දැක්වෙන පරිදි යොදවා ඇත.

- කටුනායක අ.සැ.ක. ගිනි නිවීමේ ඒකකයට වාහන 02
- බියගම අ.සැ.ක. සඳහා වාහන 02
- සීතාවක අ.සැ.ක. සඳහා වාහන 01

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නව බඳවා ගැනීම් 10 ක් පහත පරිදි සිදු කර තිබේ.

- කටුනායක අ.සැ.ක. ආරක්ෂක අංශය සඳහා පුද්ගලයන් 05 දෙනෙකු
- බියගම අ.සැ.කලාපය සඳහා පුද්ගලයන් 02 දෙනෙකු
- මිරිජ්ජවිල අ.සැ.කලාපය සඳහා පුද්ගලයන් 02 දෙනෙකු
- කෑගල්ල අ.සැ.කලාපය සඳහා 01 පුද්ගලයකු

## 18 කලාප කළමනාකරණ අංශය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති 266 කට ඉඩකඩ සපයමින්, පුද්ගලයන් 133,725 කට රැකියා අවස්ථා ලබා දෙමින්, 2014 වසරේදී අපනයන සැකසුම් කලාප 11 ක් හා කාර්මික උද්‍යාන එහි වාණිජ මෙහෙයුම් කටයුතුවල නිරත වන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජල සම්පාදන හා මළ අපවහන සඳහා පිළියම් කිරීමේ පහසුකම් සැලසීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කලාප තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කලාප තුළ පාරිසරික සංවේදී ව්‍යාපාර පිහිටුවීමේ රජයේ ප්‍රතිපත්ති නියෝගයට අනුකූලව කටයුතු කිරීම සඳහා එවැනි කර්මාන්තවලට පහසුකම් ලබාදීමේ අභිප්‍රායෙන් බියගම, කටුනායක සහ කෑගල්ල අපනයන සැකසුම් කලාපවල දැනට පවතින කසළ පවිත්‍රාගාර පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. පවතින කර්මාන්ත පුළුල් කිරීම හේතුවෙන් මෙවැනි පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීම අවශ්‍ය වී තිබේ. ඒ අනුව වසරක කාලයක් තුළ අදාළ කොන්ත්‍රාත්තු පිරිනමා ඇති අතර මෙම කටයුතු 2016 වසර තුළ සම්පූර්ණ කිරීමට නියමිතය.

කටුනායක හා කෑගල්ල අපනයන සැකසුම් කලාප තුළ ඉඩම් ලබා ගැනීමේ හැකියාව ද, මේ වන විට සංවර්ධනය කරමින් පවතින/තවදුරටත් යාවත්කාලීන කරනු ලබන යටිතල පහසුකම් සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආනයන ආදේශන කර්මාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කරන ලද සුවිශේෂී අංශයක් වන, යටිතල පහසුකම් විශ්වාසනීය අන්දමින් ලබා දීම මූලිකම අවශ්‍යතාවක් වන ඖෂධ සම්බන්ධ අංශය තුළ අලුතින් ආයෝජනය කිරීම සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුමට ප්‍රතිචාරයක් වශයෙන් එම අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා කටුනායක හා කෑගල්ල අපනයන සැකසුම් කලාප සුදුසු බව හඳුනාගෙන එම කලාප ප්‍රවර්ධනය කරනු ලැබීය.

නව ආයෝජන සඳහා මෙන්ම පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා කලාපවල ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් වර්ධනය වන ඉල්ලුමක් පවතින බව ද හඳුනාගෙන තිබේ. සමස්තයක් වශයෙන් මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් නව ආයෝජන සඳහා කලාපවලට අයත් ඉඩම් වෙන් කිරීමේ දී, ආයෝජන යෝජනාවේ යටිතල පහසුකම් සඳහා පවතින තීරණාත්මක අවශ්‍යතාව සඳහා වටිනාකමක් ලබා දෙමින් කාර්මික පොකුරු සංකල්පය ද අනුගමනය කිරීම මගින් මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ආයෝජන මණ්ඩල ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කර ඇත.

කලාපවලින් බහුතරයක් ව්‍යාපාර පිහිටුවීම හේතුකොටගෙන මගින් පරිපූර්ණත්වයට පත් වෙමින් පවතින බැවින් ඉඩම් වත්කම අතිශයින්ම දුර්ලභ සම්පතක් බවට පත් වෙමින් පවතී. එම නිසා ඉඩම් සඳහා පවතින ඉල්ලුම සපුරාලීම සඳහා අමතර ඉඩම් සෙවීම ක්ෂණික අවශ්‍යතාවක් බවට පත් වී ඇත. මෙම සංදර්භය තුළ, නව ආයෝජන අවස්ථා සඳහා අක්කර 16 ක භූමි ප්‍රමාණයක් එකතු කරමින් කටුනායක අ.සැ. කලාපයේ 4 වන අදියර යටතේ පවතින භූමිය සංවර්ධනය කිරීම සඳහා මෙම වසර තුළ දී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

2014 වසරේදී, ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීම හා තෘප්තිමත්භාවය පවත්වා ගැනීම සඳහා මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

# "මූල්‍ය සමාලෝචනය"

| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා<br>ආදායම් ප්‍රකාශය | | | | |
|---|---|---|---|---|
| | | 2014 | | 2013 |
| | සටහන | (රු.) | | (රු.) |
| | | | | |
| **ආදායම** | 4 | 3,100,162,918 | | 2,721,805,586 |
| | | | | |
| | | | | |
| **අඩු කළා: වියදම්** | | | | |
| | | | | |
| මෙහෙයුම් වියදම් | 6 | 299,383,652 | | 337,008,595 |
| | | | | |
| පරිපාලන වියදම් | 7 | 2,303,286,584 | | 1,983,947,246 |
| | | | | |
| රාජ්‍ය බදු | 8 | 161,676,718 | | 148,120,375 |
| | | | | |
| අනෙකුත් වියදම් | 9 | 23,815,616 | | 24,300,318 |
| | | | | |
| **මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵල** | | 312,000,348 | | 228,429,052 |
| | | | | |
| | | | | |
| | | | | |
| මූල්‍ය ආදායම | | 135,105,411 | | 100,765,279 |
| | | | | |
| මූල්‍ය වියදම් | | 14,534,281 | | 15,646,075 |
| | | | | |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | 10 | 120,571,130 | | 85,119,204 |
| | | | | |
| **බදු අය කිරීමට පෙර අතිරික්තය** | | 432,571,478 | | 313,548,256 |
| | | | | |
| බදු වියදම් | | 30,786,759 | | 22,627,258 |
| | | | | |
| **වර්ෂය සඳහා අතිරික්තය** | | 401,784,719 | | 290,920,997 |
| | | | | |

| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා<br>විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | | | | |
|---|---|---|---|---|
| | | 2014 | | 2013 |
| | සටහන | (රු.) | | (රු.) |
| | | | | |
| **වර්ෂය සඳහා අතිරික්තය** | | **401,784,719** | | **290,920,997** |
| | | | | |
| | | | | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | | |
| IFRS කාර්ය මණ්ඩල ණය පොළී සඳහා ගැළපීම් | | 9,166,765 | | |
| අඩු කළා: නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක අලාභය | 21 | 28,339,987 | | 6,283,354 |
| කාර්යමණ්ඩල ණය මත කාර්යමණ්ඩල පිරිවැය | | (9,166,765) | | |
| | | | | |
| | | | | |
| | | | | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | 28,339,987 | | 6,283,354 |
| | | | | |
| | | | | |
| කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම් | | **373,444,732** | | **284,637,643** |

| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | | |
|---|---|---|---|
| | | 2014 | 2013 |
| | සටහන | (රු.) | (රු.) |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 11 | 5,730,557,776 | 5,311,796,082 |
| ආයෝජන දේපල | 12 | 31,276,563,244 | 16,887,855,359 |
| කරගෙන යන ප්‍රාග්ධන කටයුතු | 13 | 1,205,896,487 | 838,860,038 |
| මූල්‍ය වත්කම් | 14 | 417,361,476 | 430,811,757 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **38,630,378,984** | **23,469,323,235** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ටරි | | 15,300,663 | 13,394,315 |
| අපහරණය සඳහා වන නිවාස | | 2,551,000 | 2,551,000 |
| මූල්‍ය වත්කම් | 15 | 149,020,518 | 148,523,279 |
| වෙළඳ ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් | 16 | 200,513,779 | 170,968,291 |
| ඉදිරි ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 17 | 80,971,152 | 73,618,778 |
| මුදල් හා මුදල් සමානතා | 18 | 1,257,382,982 | 811,476,128 |
| **මුළු ජංගම වත්කම්** | | **1,705,740,094** | **1,220,531,792** |
| | | | |
| **මුළු වත්කම්** | | **40,336,119,078** | **24,689,855,028** |
| | | | |
| | | | |
| **කොටස් හිමිකම් සහ වගකීම්** | | | |
| **කොටස් හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල | | 9,342,625,520 | 6,687,975,770 |
| සංචිත | | 15,340,693,234 | 15,340,693,234 |
| | | **24,683,318,754** | **22,028,669,005** |
| | | | |
| විලම්භිත අයභාරය | 20 | 14,924,696,136 | 2,094,695,897 |
| විලම්භිත වියදම | 19 | (415,062,611) | (427,235,029) |
| | | 14,509,633,525 | 1,667,460,867 |
| | | | |
| **මුළු කොටස් හිමිකම්** | | **39,192,952,280** | **23,696,129,872** |
| | | | |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 21 | 263,532,140 | 224,062,180 |
| වසරකට පසුව එළඹෙන දිගුකාලීන ණය ගැනීම් | 22 | 47,146,064 | 54,912,130 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **310,678,204** | **278,974,310** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වසරක් තුළ එළඹෙන දිගුකාලීන ණය ගැනීම් | 22 | 14,123,579 | 14,393,354 |
| උපචිත වියදම් හා ගෙවිය යුතු වෙනත් මුදල් | 23 | 807,844,191 | 695,429,780 |
| ගෙවිය යුතු බදු | | 10,520,825 | 4,927,712 |
| **මුළු ජංගම වගකීම්** | | **832,488,594** | **714,750,846** |
| | | | |
| **මුළු කොටස් හිමිකම් සහ වගකීම්** | | **40,336,119,078** | **24,689,855,028** |

පිටු අංක 8 සිට 25 දක්වා පිළියෙළ කර ඇති "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

උපුල් ජයසූරිය මහතා
සභාපති

මනෝජ් කුරේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

එස්.පී. ද එස්. මුතුකුමාරණ මෙනවිය
වැඩ බලන විධායක අධ්‍යක්ෂ - මූල්‍ය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
## සාමාන්‍ය කොටස් ප්‍රමාණ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණය රු. |
|---|---|---|---|
| **2014 ජනවාරි 1 දිනට ශේෂය** | **6,528,728,331** | **15,340,693,235** | **21,869,421,566** |
| වසර සඳහා අතිරික්තය | 284,637,643 | | 284,637,643 |
| පූර්ව වර්ෂය සඳහා ගැළපීම් | (39,931,716) | | (39,931,716) |
| පවරන ලද ඉඩම් | (84,006,960) | | (84,006,960) |
| ගිණුම්ගත නොකරන ලද ස්ථාවර වත්කම් තක්සේරු කිරීම | 109,740 | | 109,740 |
| අතිවිශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් ලබා දීම | (1,561,266) | | (1,561,266) |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,687,975,770** | **15,340,693,235** | **22,028,669,005** |
| වසර සඳහා අතිරික්තය | 373,444,732 | | 373,444,732 |
| පූර්ව වර්ෂය සඳහා ගැළපීම් | 163,839,727 | | 163,839,727 |
| මහා භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම | (100,000,000) | | (100,000,000) |
| ප්‍රදානය කරන ලද ඉඩම් මත ගෙවන ලද අධි මිල | (12,807,450,000) | | (12,807,450,000) |
| අවසන 'කරන ලද ගිවිසුම් මත ඉඩම් අධි මිලෙන් ලද ආදායම | 217,956,163 | | 217,956,163 |
| පුත්තලමේ ඉඩම ආපසු පැවරීම | 11,270,121 | | 11,270,121 |
| යහසාධක අරමුදල අවලංගු කිරීම | 13,444,429 | | 13,444,429 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙතින් පැවරූ ඉඩම් | (607,000) | | (607,000) |
| ගිණුම්ගත නොකරන ලද ස්ථාවර වත්කම් තක්සේරු කිරීම | 907,415 | | 907,415 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රදානය කරන ලද ඉඩම් | 14,782,600,000 | | 14,782,600,000 |
| අතිවිශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් ලබා දීම | (755,837) | | (755,837) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **9,342,625,521** | **15,340,693,235** | **24,683,318,756** |

පිටු අංක 8 සිට 25 දක්වා පිළියෙළ කර ඇති "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014<br>රු. (මිලියන) | 2013<br>රු. (මිලියන) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වූ මුදල් | 708.65 | 1,139.62 |
| ගෙවන ලද ආදායම් බදු | (25.20) | (24.78) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා ගෙවීම් | (24.11) | (13.58) |
| විලම්භිත අයභාරය | 569.64 | |
| ප්‍රදානය කරන ලද ඉඩම් මත ගෙවන ලද අධි මිල | 12,807.45 | |
| පූර්ව වර්ෂයට අදාළ ගැළපීම් | | (39.93) |
| ශුද්ධ මුදල් ප්‍රවාහය/(මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් පිටතට ගලා යෑම්) | 14,036.43 | 1,061.33 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| ආයෝජන ආදායම | 134.30 | 128.75 |
| මූල්‍ය වත්කම් | 9.56 | (1.81) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (70.79) | (109.65) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | 10.00 | 33.28 |
| කරගෙන යන ප්‍රාග්ධන කටයුතු | (709.25) | (429.50) |
| විශේෂ ව්‍යාපාති | (26.42) | (107.91) |
| විලම්භිත වියදම් | (1.88) | (24.35) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | (654.61) | (511.19) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| කල් බදු මත ගෙවන ලද වාරික මුදල් | (28.47) | (15.03) |
| මහා භාණ්ඩාගාරයට මාරු කරන ලද අරමුදල් | (12,907.45) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | (12,935.92) | (15.03) |
| | | |
| මුදල් සහ මුදල් සමානතාවල ශුද්ධ වැඩිවීම්/අඩුවීම් | 445.91 | 535.11 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානතා | 811.48 | 276.37 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානතා | 1,257.38 | 811.48 |

'අ' සටහන

**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය වූ මුදල්**

| | |
|---|---|
| ආදායම් බදු ගෙවීමෙන් පසු අතිරික්තය | 373.44 |
| ක්ෂය කිරීම් | 429.04 |
| ආදායම් බදු වියදම් | 30.78 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා ප්‍රතිපාදන | 63.57 |
| ණයගැතියන්ගේ හානිකරණ සඳහා ප්‍රතිපාදන | 24.40 |

| | 2014<br>රු. (මිලියන) | 2013<br>රු. (මිලියන) |
|---|---|---|
| වසර සඳහා විලම්භිත අයභාරය | -199.37 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද (ලාභය)/අලාභය | -6.46 | |
| ආයෝජන ආදායම | -135.11 | |
| කල් බදු මත ගෙවන ලද පොළිය | 13.93 | |
| විලම්භිත වියදම් ක්‍රමක්ෂය කිරීම | 40.53 | |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 634.76 | |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | |
| තොග | -1.91 | |
| වෙළඳ ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් | -29.55 | |
| ඉදිරි ගෙවීම් සහ ලැබිය යුතු වෙනත් මුදල් | -6.57 | |
| මූල්‍ය වත්කම් | -0.50 | |
| උපචිත වියදම් සහ ගෙවිය යුතු වෙනත් මුදල් | 112.41 | |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පසු මෙහෙයුම් අතිරික්තය | 708.65 | |
| මුදල් හා මුදල් සමානතා විශ්ලේෂණ කිරීම | 1,257.38 | |
| බැංකු හා මුදල් ශේෂ | 0.00 | |
| ඒක්ෂණ තැන්පතු | 1,257.38 | |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. වාර්තාකරණ ආයතනය

1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සංස්ථාපනය කරන ලද අතර එහි ලියාපදිංචි කාර්යාලය මෙන්ම ප්‍රධාන කාර්යාලය ද කොළඹ 01, ඇවිලන් චතුරස්‍රයේ පිහිටි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ ස්ථාපනය කර තිබේ.

## 2. පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

න්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරන ලද අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට (SLAS) අනුකූලව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, සාමාන්‍ය කොටස්වල වෙනස්කම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය මෙන්ම ආයෝජන මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් ද සහිතව මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ද පිළියෙළ කර තිබේ.

### 2.2 ඇස්තමේන්තු, විනිශ්චයන් හා උපකල්පන භාවිත කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම සඳහා එහි කළමනාකාරීත්වය විසින් වාර්තාකරණ ලබන දිනට වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් ප්‍රමාණ මෙන්ම අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම සඳහා බලපාන විනිශ්චය, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කළ යුතුය. මෙම ඇස්තමේනතු හා බලපවත්වන උපකල්පනයන් පවත්නා පදනම මත සමාලෝචනය කෙරේ. කෙසේ වුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාව තුළින් අනාගතයේ දී බලපෑමට ලක් විය හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ ප්‍රමාණයට වැදගත් ගැළපීම් සිදු කිරීම අවශ්‍ය වන ප්‍රතිඵල ඇති විය හැකිය.

### 2.3 ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය මගින් ආයෝජන මණ්ඩලය සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව තක්සේරු කර තිබේ. අනාගත මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රමාණවත් සම්පත් පවතින බවට සාධාරණ අපේක්ෂාවක් ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය සතු වේ. අනාගතය සම්බන්ධයෙන් ලබා ගත හැකි සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ නවතා දැමීමේ අවශ්‍යතාවක් ආයොාජන මණ්ඩලයට නොමැත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී, අඛණ්ඩව පැවතීමේ පදනම අනුගමනය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි.

### 2.4 ශ්‍රිතයාත්මක ව්‍යවහාර මුදල් හා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන මුදල් වර්ගය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවහාර මුදල් වර්ගය ශ්‍රී ලංකා රුපියල් ලෙස තීරණය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන ද ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ.

## 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 මූල්‍ය වත්කම්

ණය, ලැබිය යුතු මුදල් සහ කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ. කළමනාකාරීත්වය මගින් මූලික හඳුනා ගැනීමේ දී මෙම වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබන අතර ආයෝජන සිදු කිරීමේ හා ආයෝජන ලබා ගැනීමේ අරමුණ මත මෙම වර්ගීකරණය රඳා පවතී.

(අ) වර්ගීකරණය

(i) ණය හා ලැබිය යුතු මුදල්

ණය හා ලැබිය යුතු මුදල් යනු සක්‍රිය වෙළඳපොළක දී මිල සඳහන් කර නොමැති ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමඟ ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙනුවල දී ඇති වන ලැබිය යුතු මුදල් ද මෙම ප්‍රවර්ගය යටතේම වර්ගීකරණය කරනු ලබන අතර හානිකරණය කිරීම සඳහා ඒවා සමාලෝචනය කරනු ලැබේ

(ii) කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන

කල් පිරෙන තෙක් තබනු ලබන ආයෝජන යනු ස්ථාවර හෝ ගණනය කළ හැකි ගෙවීම් සමඟ ව්‍යුත්පන්න කළ නොහැකි මූල්‍ය වත්කම් වන අතර කල් පිරෙන තෙක් තබා ගැනීම පිළිබඳව ආයෝජන මණ්ඩල කළමනාකාරීත්වයට ධනාත්මක අභිප්‍රායක් හා හැකියාවක් ඇති ස්ථාවර කල් පිරීම් වේ.

(ආ) හානිකරණ

හානිකරණ පිළිබඳ යම් හැඟවීමක් තිබේදැයි නිර්ණය කිරීම සඳහා මූල්‍ය වත්කම් ඒ ඒ ශේෂ පත්‍ර දිනයේ දී සමාලෝචනය කරයි. එසේ යම් හානිකරණයක් තිබේ නම්, එම වත්කමේ නැවත ලබා ගත හැකි ප්‍රමාණය තක්සේරු කරනු ලැබේ. වත්කමක ධාරණ ප්‍රමාණය හෝ එම වත්කමේ මුදල් උත්පාදන ඒකක වත්කමේ නැවත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවන විට හානිකරණ අලාභ හඳුනා ගත හැකි අතර එවැනි හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය මගින් හඳුනා ගත හැකිය.

(ඇ) නැවත හඳුනා ගැනීම

පූර්ව කාල සීමාවල දී හඳුනා ගන්නා ලද හානිකරණ අලාභ අඩු වී ඇති බව හෝ තවදුරටත් නොපවතින බව හෝ හඳුනා ගැනීම සඳහා යම් හැඟවීමක් තිබේ දැයි නිශ්චය කර ගැනීම සඳහා ඒ ඒ වාර්තාකරණ දිනයේ දී ඒවා තක්සේරු කරනු ලැබේ. නැවත ලබා ගත හැකි මුදල නිර්ණය කිරීමට භාවිත කරනු ලබන තක්සේරු කිරීම්වල වෙනසක් තිබීම මගින් හානිකරණ අලාභ නැවත හඳුනා ගැනේ.

### 3.2 දේපල, පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව, දේපල, පිරියත හා උපකරණවල තක්සේරුකරන ලද වටිනාකමෙන් 2011 ජනවාරි 1 දිනට සමුච්චිත ක්ෂය කිරීම් අඩු කොට ලැබෙන වටිනාකම 2011 ජනවාරි 1 දිනට එහි පිරිවැය ලෙස සැලකේ.

(ආ) ක්ෂය කිරීම්

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය/තක්සේරු කිරීම්වල සරල මාර්ග පදනම මත ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියලුම දේපල, පිරියත හා උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය පුරා වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

| | 2013 | 2014 |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | වසර 20 | වසර 20 |
| පිරියත හා උපකරණ | වසර 10 | වසර 10 |
| වැද්දුම් සහ සවි කිරීම් | වසර 10 | වසර 10 |
| කාර්යාල ලී බඩු සහ උපකරණ | වසර 10 | වසර 10 |
| පරිගණක | වසර 3 | වසර 3 |
| මෝටර් වාහන | වසර 5 | වසර 5 |

ස්ථාවර වත්කම් මිල දී ගත් වර්ෂයේ දී ඒවා මත ක්ෂය කිරීම් අය නොකරන අතර ඒවා අපහරණය කරන වර්ෂයේ දී ක්ෂය කිරීම් සම්පූර්ණයෙන්ම අය කෙරේ.

(ඇ) නැවත හඳුනා ගැනීම

අපහරණය කිරීමේ දී හෝ දේපල හා උපකරණ අයිතම භාවිත කිරීම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල හා උපකරණ අයිතම නැවත හඳුනා ගැනේ. දේපල, පිරියත සහ උපකරණ අයිතම නැවත හඳුනා ගැනීම මගින් ඇති වන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ විකිණුම්වලින් ලබා ගත් මුදල් සහ වත්කමේ ධාරණ ප්‍රමාණය අතර වෙනස මත වන අතර එය ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

(ඈ) කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු

වර්ෂය තුළ ඇති වී ශේෂ පත්‍ර දිනට සම්පූර්ණ නොකරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු වශයෙන් හඳුන්වනු ලබන අතර වර්ෂය තුළ සම්පූර්ණ කළ සහ භාවිත කිරීම සඳහා ලබා ගත හැකි ප්‍රාග්ධන වත්කම් සියල්ල දේපල, පිරියත සහ උපකරණ ගිණුමට මාරු කර තිබේ.

(ඉ) කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර අදාළ මූල්‍ය වගකීම් හඳුනා ගැනීමෙන් අනතුරුව ඒවා ගෙන කල්බදු මෝටර් වාහන ප්‍රවර්ගය යටතට ඇතුළත් කරනු ලබන අතර මූල්‍ය කල්බදු යටතේ තබා ගන්නා එවැනි වත්කම් භාවිතයට ගන්නා කාල සීමාව මුළුල්ලේ ක්ෂය කරනු ලැබේ.

3.3 ආයෝජන දේපල

ආයෝජන දේපල යටතේ එකී වත්කම් වර්ගීකරණය කරන ලද දිනට පවතින පිරිවැයට ආයෝජන දේපල දැක්වේ.

### 3.4 ඉන්වෙන්ටරි

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් අඩුම වටිනාකමට සියලු ඉන්වෙන්ටරි තක්සේරු කර ඇත. මුලින් පිවිසි මුලින් නිකුතු (FIFO) පදනම මත පිරිවැය නිර්ණය කරනු ලැබේ

### 3.5 වෙනත් වත්කම්

අනෙකුත් ණය ගැතියෝ, ලැබිය යුතු මුදල්, අත්තිකාරම්, තැන්පතු සහ කලින් ගෙවීම් අනෙකුත් වත්කම්වලට අයත් වේ.

**(අ) අත්තිකාරම් තැන්පතු සහ කලින් ගෙවූ වියදම්**

අත්තිකාරම්, තැන්පතු සහ කලින් ගෙවූ වියදම් යනු එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ හෝ සම්බන්ධතා පවතින වියදම් වන අතර එම වියදම් කාල ප්‍රමාණන පදනමකින් අදාළ කාල පරිච්ඡේදය සඳහා ලියා හරිනු ලැබේ.

**(ආ) අනෙකුත් ණයගැතියෝ**

පිරිවැයෙන් හානිකරණ අලාභ අඩු කිරීම මගින් අනෙකුත් ණයගැතියන් හඳුනා ගැනේ.

### 3.6 මුදල් සහ මුදල් සමානතා

අතැති මුදල් සහ නිශ්චිත මුදල් ප්‍රමාණවලට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටිකාලීන, ඉහළ ද්‍රවශීලතාවකින් යුත් ආයෝජන මුදල් සහ මුදල් සමානතාවලට අයත් වන අතර මේවා වටිනාකම වෙනස්වීම පිළිබඳ කැපී පෙනෙන අවදානමකට නිරාවරණය නොවන ආයෝජන වේ. කෙටිකාලීන මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් සහ මුදල් සමානතා පවත්වා ගනු ලැබේ.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

අංක 7 දරන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට (LKAS) අනුකූලව, වක්‍ර ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කර ඇත.

### 3.7 සේවක ප්‍රතිලාභ

**(අ) නිශ්චිත සහභාගී සැලසුම්**

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා දායකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබති. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන අතර තවදුරටත් ගෙවීම් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳියාවක් නොමැත

**ආ) නශවත ප්‍රතලාභ සැලසුම**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත සහභාගී සැලසුම් නොවන පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වර්ගයක් වේ. 198 3 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවකයන් සඳහා පාරිතෝෂික ගෙවීමට ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳේ. ආයුගණක තක්සේරුකරණය පදනම් කර ගනිමින් පනත යටතේ පවතින බැඳීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව තීරණය කෙරේ.

### 3.8 බැරකම් සහ ප්‍රතිපාදන

නිරවුල් කිරීම මගින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත වන සම්පත් පිටතට ගලා යැමට මඟ පාදන්නේ යැයි අපේක්ෂා කරන පසුගිය සිද්ධීන්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නෛතික/සම්මුතික බැඳියාවක් පවතින විට ශේෂ පත්‍රයේ බැරකම් සහ ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

ණය හිමියාගේ ඉල්ලීම පරිදි ගෙවිය යුතු බැඳීම් හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකෙන අතර ශේෂ පත්‍ර දිනට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

**වෙනත් වගකීම්**

උපචිත වියදම් ඇතුළු වෙනත් ණයහිමියන් වෙනත් වගකීම්වලට ඇතුළත් වේ. වෙනත් වගකීම් ඒවායේ සාධාරණ අගය ලෙස සලකනු ලබන ඓතිහාසික වටිනාකමට සඳහන් කරනු ලැබේ.

### 3.9 ආදායම් හඳුනා ගැනීම

**(අ) ආදායම**

සේවා/ගාස්තුවලින් ලද ආදායම ලැබුණු හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ අගයෙන් තක්සේරු කරනු ලැබේ. බලපත්‍ර ගාස්තු හෝ සැකසීමේ ගාස්තු මුදල් පදනම මත හඳුනා ගැනේ

**(ආ) පොළී ආදායම**

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය තක්සේරු කරනු ලබන මූල්‍ය ලේඛන ඇතුළත් පොළී සහිත සියලුම මූල්‍ය ලේඛන සඳහා ලැබෙන පොළී ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම" තුළ හඳුනා ගැනේ.

**(ඇ) වෙනත් ආදායම්**

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගැනේ.

### 3.10 වියදම්

වියදම් හඳුනා ගැනීම

**(අ) අයභාර වියදම**

මෙම වියදම් අදාළ වන කාල සීමාව තුළ දී ලබා දී ඇති හා හඳුනා ගෙන ඇති මුදලේ සාධාරණ අගයෙන් සියලුම වියදම් තක්සේරු කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් උපයන ලද අතිරික්තය වන්නේ දන්නා සියලුම වගකීම් සඳහා මෙන්ම දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම් සඳහා වෙන්කිරීම්වලින් අනතුරුව ඉතිරි වන මුදල් ප්‍රමාණයයි.

**(ආ) ප්‍රාග්ධන වියදම්**

සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ අරමුණින් හෝ සංවිධානයේ සේවා/නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් හෝ ස්ථාවර මට්ටමින් වත්කම් ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ.

**3.11 බදුකරණය**

මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇති පරිදි, පොළී ආදායමේ මූලිකාංග මත ආදායම් බදු පාදක වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව ආදායම් බදු ගණනය කෙරේ. පොළියෙන් ලැබෙන ලාභ හා ආදායම් හැර ලාභ හා ආදායම මත පනවනු ලබන ආදායම් බද්දෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිදහස් කර ඇත.

**3.12 අසම්භව්‍ය බැරකම්**

පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇති විය හැකි අනාගත බැඳීමක් සම්බන්ධයෙන් හෝ පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇති විය හැකි වර්තමාන බැඳීමක් සම්බන්ධයෙන් හෝ ගෙවීම් කිරීම අපේක්ෂා කළ නොහැකි අවස්ථාවක දී හෝ ගෙවීම් ප්‍රමාණය සාධාරණ ලෙස තක්සේරු කළ නොහැකි වන අවස්ථාවකදී හෝ අසම්භව්‍ය බැරකම් අනාවරණය වේ.

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 4 | **ආදායම** | | |
| | බිම් කුලිය | 657,671,171 | 605,761,845 |
| | වාර්ෂික ගාස්තු | 553,143,361 | 543,709,821 |
| | ආනයන/අපනයන සේවා ගාස්තු | 888,755,523 | 809,683,033 |
| | ජල සම්පාදනයෙන් ලද ශුද්ධ ආදායම (4.1 සටහන) | 400,144,483 | 334,629,422 |
| | ඉඩම් සඳහා අධි මිල | 199,372,412 | 60,781,696 |
| | බදු කුලී ආදායම | 101,553,029 | 113,566,109 |
| | බලපත්‍ර ගාස්තුව - 16 වන වගන්තිය යටතේ වන වෙළඳ ව්‍යාපාර | 25,969,310 | 23,178,312 |
| | ඇතුළුවීමේ අවසරපත් අලෙවි කිරීම | 114,696,177 | 103,282,627 |
| | ගිවිසුම්/සැකසුම් ගාස්තු | 45,280,725 | 40,589,957 |
| | නිවාස සහ වෙනත් ව්‍යාපෘතිවලින් ලද ආදායම | 19,864,433 | 19,771,047 |
| | විවිධ ආදායම් | 93,712,294 | 66,851,715 |
| | | **3,100,162,918** | **2,721,805,586** |
| 4.1 | **වෙළඳ ව්‍යාපාර සඳහා ජල සම්පාදනය කිරීමෙන් ලද ආදායම** | | |
| | ජල සම්පාදනය කිරීමෙන් ලද ආදායම | 1,138,986,922 | 1,061,917,400 |
| | ජල සම්පාදනය සම්බන්ධ පිරිවැය | (738,842,438) | (727,287,978) |
| | ජල සම්පාදනය කිරීමෙන් ලද ශුද්ධ ආදායම | **400,144,483** | **334,629,422** |
| 5 | **මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය** | | |
| | පහත දක්වා ඇති වියදම් ද ඇතුළත්ව සියලු වියදම් සඳහා අය කර ගැනීමෙන්/(බැර කිරීමෙන්) අනතුරුව | | |
| | මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය | | |
| | මෙහෙයුම් වියදම් (6 සටහන) | 299,383,652 | 337,008,595 |
| | පරිපාලන වියදම් (7 සටහන) | 2,303,286,584 | 1,983,947,246 |
| | රජයේ බදු (8 සටහන) | 161,676,718 | 148,120,375 |
| | වෙනත් වියදම්(9 සටහන) | 23,815,616 | 24,300,318 |
| 6 | **මෙහෙයුම් වියදම්** | | |
| | ආයෝජන ප්‍රවර්ධන වියදම් | 67,470,738 | 116,561,220 |
| | කලාප නඩත්තු කිරීම | 115,339,883 | 107,053,825 |
| | ආලෝකය සහ බල ශක්තිය | 55,766,589 | 58,037,179 |
| | ආරක්ෂක සේවා | 57,496,320 | 52,032,990 |
| | කලාපවල සේවකයන්ගේ සුබසාධන වියදම් | 3,310,123 | 3,323,381 |
| | | **299,383,652** | **337,008,595** |
| 7 | **පරිපාලන වියදම්** | | |
| | පිරිස් පිරිවැය(7.1 සටහන) | 1,202,671,696 | 1,005,801,591 |
| | කාර්ය මණ්ඩල සුබසාධන වියදම් | 187,561,838 | 178,788,674 |
| | මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය | 24,879,375 | 21,912,827 |
| | P/M පරිගණකය සහ කාර්යාලීය උපකරණ නඩත්තුව | 36,383,952 | 32,810,692 |
| | ගොඩනැගිලි නඩත්තුව | 70,503,103 | 75,308,516 |
| | ප්‍රවාහණ කටයුතු ආශ්‍රිත වියදම් | 100,218,988 | 85,384,338 |
| | කාර්යාල බදු කුලී සහ සත්‍යාපන ඒකක බදු කුලී | 42,174,550 | 37,908,488 |
| | පුවත්පත් දැන්වීම් | 2,447,869 | 2,298,152 |
| | ජල පරිභෝජනය | 6,429,267 | 7,181,794 |
| | සන්නිවේදන වියදම් | 35,661,678 | 34,960,254 |

| | | | |
|---|---|---|---|
| | මහනගර සභා වරිපනම් | 7,545,200 | 7,545,200 |
| | කාර්ය මණ්ඩල පුහුණුව | 14,503,999 | 13,100,708 |
| | නෛතික සහ වෘත්තීය ගාස්තු | 8,813,665 | 7,778,874 |
| | නෛතික බැඳීම් සඳහා වන්දි ගෙවීම | 102,138,350 | 0 |
| | සංයුක්ත සමාජ වගකීම් වියදම් | 1,603,527 | 2,000,000 |
| | ගමන් වියදම් සහ යැපීම් දීමනා | 5,106,655 | 4,554,383 |
| | විගණන ගාස්තු | 1,200,000 | 1,500,000 |
| | ණයගැතියන් මත හානිකරණය | 24,400,841 | 63,810,680 |
| | ක්ෂය කිරීම් | 429,042,030 | 401,302,075 |
| | | **2,303,286,584** | **1,983,947,246** |
| 7.1 | **පිරිස් පිරිවැය** | | |
| | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ගාස්තු | 315,000 | 384,000 |
| | සභාපති/අධ්‍යක්ෂ ජනරාල්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සඳහා වැටුප් | 14,830,000 | 0 |
| | වැටුප් සහ වේතන - විධායක කාර්ය මණ්ඩලය | 341,156,799 | 290,835,260 |
| | වැටුප් සහ වේතන - ලිපිකරු සහ සමාන්තර සේවා කාර්ය මණ්ඩලය | 71,692,729 | 92,853,345 |
| | වැටුප් සහ වේතන - ආරක්ෂක කාර්ය මණ්ඩලය | 35,839,724 | 40,332,018 |
| | වැටුප් සහ වේතන - සුළු සේවක කාර්ය මණ්ඩලය | 84,183,379 | 74,454,572 |
| | අතිකාල දීමනා | 120,656,644 | 116,949,241 |
| | ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් | 55,687,626 | 59,098,318 |
| | ප්‍රසාද මුදල් ගෙවීම් | 37,963,429 | 55,810,744 |
| | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන | 35,237,997 | 30,896,886 |
| | සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් | 81,699,003 | 74,551,196 |
| | සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් | 16,377,900 | 14,910,140 |
| | වෙනත් කාර්ය මණ්ඩල පිරිවැය | 307,031,465 | 153,486,392 |
| | ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය | 0 | 1,239,480 |
| | | **1,202,671,696** | **1,005,801,591** |
| 8 | **රජයේ බදු** | | |
| | මුද්දර ගාස්තු | 377,240 | 518,885 |
| | ජාතිය ගොඩ නැගීමේ බදු | 36,119,784 | 34,619,596 |
| | ආර්ථික සේවා ගාස්තු | 9,885,968 | 9,436,774 |
| | පොළී ආදායම මත රඳවුම් බදු | 0 | 0 |
| | අගය එකතු කළ බද්ද - තහනම් කළ වැට් බදු යෙදවුම් | 115,293,727 | 103,545,120 |
| | | **161,676,718** | **148,120,375** |
| 9 | **වෙනත් වියදම්** | | |
| | විනිමය ලාභ අලාභ | | |
| | හැඳුනුම්පත් නිකුත් කිරීමේ වියදම් | 2,581,353 | 2,501,217 |
| | විවිධ වියදම් | 16,213,541 | 15,710,909 |
| | බහාලුම්වල යතුරු අගුළු | 875,436 | 1,050,600 |
| | රක්ෂණය | 3,025,460 | 3,729,525 |
| | පරිසර පාලන වියදම් | 136,170 | 215,745 |
| | නඩු පිළිබඳ වන්දි ගෙවීම් | | |
| | සංග්‍රහ වියදම් | 983,656 | 1,092,322 |
| | දේපල, පිරියත සහ උපකරණ අපහරණය කිරීම් මත අලාභය | | |
| | | **23,815,616** | **24,300,318** |
| 10 | **ශුද්ධ මූල්‍ය ආදායම** | | |
| | **මූල්‍ය ආදායම** | | |

| | | | |
|---|---|---|---|
| | ඒක්ෂණ තැන්පතු/වෙනත් තැන්පතු මත පොළී ආදායම් | 113,613,178 | 79,000,907 |
| | කාර්ය මණ්ඩල ණය මතපොළී ආදා යම් | 21,492,232 | 21,764,372 |
| | **මුළු මූල්‍ය ආදායම** | **135,105,411** | **100,765,279** |
| | **මූල්‍ය වියදම්** | | |
| | කල් බදු මත පොළිය | 13,931,370 | 15,025,375 |
| | බැංකු ගාස්තු | 602,911 | 620,700 |
| | **මුළු මූල්‍ය වියදම්** | **14,534,281** | **15,646,075** |
| | **ශුද්ධ මූල්‍ය ආදායම** | **120,571,130** | **85,119,204** |
| 12 | **ආයෝජන දේපල** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 16,951,301,806 | 17,000,254,053 |
| | පවරන ලද දේපල, පිරියත සහ උපකරණ - ගොඩනැගිලි | | |
| | වර්ෂය තුළ එකතු කිරීම් | 14,405,399,791 | 53,859,753 |
| | වර්ෂය තුළ අපහරණය කිරීම් | 607,000 | 102,812,000 |
| | අඩු කළා - දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය කිරීම් | 79,531,353 | 63,446,447 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **31,276,563,244** | **16,887,855,359** |
| 13 | **කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු** | | |
| | **සාමාන්‍ය ව්‍යාපෘති** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 631,716,386 | 728,911,501 |
| | වර්ෂය තුළ එකතු කිරීම් | 709,242,322 | 429,500,651 |
| | වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධනීකරණ කටයුතු | (367,690,592) | (526,695,765) |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **973,268,115** | **631,716,386** |
| | **විශේෂ ව්‍යාපෘති** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 207,143,652 | 153,095,367 |
| | ප්‍රාග්ධනීකරණය කරන ලද - ඉඩම් සහ ගොඩනැගිලි | (12,200,000) | (53,859,753) |
| | ආපසු දුන් මුදල් | | |
| | පුත්තලම ඉඩම - B/P No 311/09 අනුව | 11,270,121 | |
| | වර්ෂය තුළ එකතු කිරීම් | 26,414,600 | 107,908,038 |
| | | **232,628,372** | **207,143,652** |
| | **කෙරීගෙන යන මුළු ප්‍රාග්ධන කටයුතු** | **1,205,896,487** | **838,860,038** |
| | එම ව්‍යාපෘති සම්පූර්ණ කරන තෙක් කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු. | | |
| 14 | **ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| | කාර්ය මණ්ඩල ණය (14.1 සටහන) | 403,161,301 | 403,368,949 |
| | මූල්‍ය සහාය වැඩසටහන (14.2 සටහන) | 14,200,175 | 27,442,809 |
| | මූල්‍ය වත්කම් | **417,361,476** | **430,811,757** |
| 14.1 | **දැනට වලංගුව පවතින පොළී අනුපාතිකයට අනුව ගණනය කරන ලද කාර්ය මණ්ඩල ණය** | | |
| | කාර්ය මණ්ඩල ණය - කල් පිරීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත වන කොටස (14.1 සටහන) | 403,161,301 | 403,368,949 |
| | කාර්ය මණ්ඩල ණය - කල් පිරීම සඳහා වසරකට වඩා අඩු කාලයක් ගත වන කොටස (15 සටහන) | 134,080,350 | 131,098,397 |
| | කාර්ය මණ්ඩල ණය සඳහා කලින් ගෙවන ලද කාර්ය මණ්ඩල වියදම් | **25,519,331** | **52,189,614** |
| | අඩු කළා: IFRS ගැළපීම් - කාර්ය මණ්ඩල ණය | **(25,519,331)** | **(52,189,614)** |
| | **මුළු මූල්‍ය වත්කම්** | **537,241,652** | **534,467,346** |
| 14.2 | **මූල්‍ය සහාය වැඩසටහන** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 64,310,750 | 90,792,606 |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය තුළ ප්‍රදානය කරන ලද මුදල් | | - | - |
| | වර්ෂය තුළ ආපසු දුන් මුදල් | | -9,565,815 | -26,481,856 |
| | හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීමට පෙර දෙසැම්බර් 31 දිනට ශේෂය | | 54,744,935 | 64,310,750 |
| | අඩු කළා - හානිකරණ සඳහා ප්‍රතිපාදන | | -31,552,875 | -25,092,321 |
| | හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව දෙසැම්බර් 31 දිනට ශේෂය | | 23,192,059 | 39,218,429 |
| | ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද කල් පිරීම සඳහා වසරකට වඩා අඩු කාලයක් ගත වන කොටස | | 8,991,884 | 11,775,620 |
| | ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද කල් පිරීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත වන කොටස | | 14,200,175 | 27,442,809 |
| | **මූල්‍ය සහාය වැඩසටහන සඳහා එකතුව** | | **23,192,059** | **39,218,429** |
| **14.1** | **මූල්‍ය සහාය වැඩසටහන (Contd.)** | | | |
| | | | කල් පිරීම | |
| | | 2014.12.31 | වසර 1 සිට | වසර 05 කට |
| | | රු. | වසර 05 දක්වා | පසුව |
| | කාර්ය මණ්ඩල ණය | 403,161,301 | 281,471,923 | 121,689,378 |
| | මූල්‍ය සහාය වැඩසටහන | 14,200,175 | 11,778,792 | 2,421,383 |
| | **මුළු ජංගම නොවන මූල්‍ය වත්කම්** | **417,361,476** | **293,250,715** | **124,110,761** |
| | | | කල් පිරීම | |
| | | 2013.12.31 | වසර 1 සිට | වසර 05 කට |
| | | රු. . | වසර 05 දක්වා | පසුව |
| | කාර්ය මණ්ඩල ණය | 403,368,949 | 276,037,410 | 127,331,539 |
| | මූල්‍ය සහාය වැඩසටහන | 27,442,809 | 22,613,885 | 4,828,923 |
| | **මුළු ජංගම නොවන මූල්‍ය වත්කම්** | **430,811,757** | **298,651,295** | **132,160,462** |
| **15** | **ජංගම මූල්‍ය වත්කම්** | | | |
| | ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද කල් පිරීම සඳහා වසරකට වඩා අඩු කාලයක් ගත වන කොටස | | | |
| | කාර්ය මණ්ඩල ණය | | 128,527,839 | 125,856,985 |
| | කාර්ය මණ්ඩල අත්තිකාරම් | | 5,552,511 | 5,241,413 |
| | මූල්‍ය සහාය වැඩසටහන(14.1 සටහන) | | 8,991,884 | 11,775,620 |
| | කල් පිරෙන තෙක් තබන ලද ආයෝජන | | | |
| | ස්ථාවර වත්කම් - රාජ්‍ය ණය සහ ආයෝජන බැංකුව | | 5,928,284 | 5,629,262 |
| | ස්ථාවර වත්කම් | | 20,000 | 20,000 |
| | මූල්‍ය වත්කම් | | **149,020,518** | **148,523,279** |
| **16** | **වෙළඳ ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල්** | | | |
| | වෙළඳ ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් | | 719,431,529 | 664,452,940 |
| | අඩු කළා - ණයගැතියන් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන - (16.1 සටහන) | | (518,917,751) | (493,484,649) |
| | | | **200,513,779** | **170,968,291** |
| **16.1** | **ණයගැතියන් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම** | | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | | 493,484,649 | 492,790,570 |
| | වර්ෂය තුළ ලියා හැරීම් | | 1,055,613 | 13,483,407 |
| | වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන | | 26,488,715 | 14,177,486 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | **518,917,751** | **493,484,649** |
| **17** | **පූර්ව ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු මුදල්** | | | |
| | අත්තිකාරම් ගෙවීම් | | 602,406 | 478,892 |
| | අත්තිකාරම් ගෙවීම්විදේශ සංචාර | | 569,999 | 569,999 |

| | | | |
|---|---|---|---|
| | විදේශ රටවල දී ශ්‍රී ලංකාව ඉටු කළ දූත මෙහෙවර | 1,075,853 | 848,998 |
| | සේවයේ යෙදවීමේ අත්තිකාරම් | 29,958,353 | 46,660,561 |
| | කලින් ගෙවන ලද වියදම් | 74,093 | 0 |
| | පොළී ආදායම් - ලැබිය යුතු මුදල් | 7,699,838 | 6,910,098 |
| | ලැබිය යුතු තැන්පතු | 7,197,689 | 7,133,689 |
| | වෙනත් ලැබිය යුතු මුදල් | 145,502,248 | 131,274,290 |
| | අඩු කළා - ණයගැතියන් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම (17.1 සටහන) | (111,709,326) | (120,257,749) |
| | | **80,971,152** | **73,618,778** |
| 17.1 | **ණයගැතියන් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම - වෙනත් ලැබිය යුතු මුදල්** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 120,257,755 | 61,204,152 |
| | වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන | (8,548,428) | 59,053,597 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **111,709,326** | **120,257,749** |
| 18 | **වාසිදායක මුදල් සහ මුදල් සමානතා** | | |
| | ලංකා බැංකුව - පුද්ගල ශාඛාව | 238,078,501 | 155,933,847 |
| | ලංකා බැංකුව - පුද්ගල ශාඛාව | 2,203,505 | 5,524,895 |
| | ලංකා බැංකුව - කටුනායක | 13,029,434 | 27,278,178 |
| | ලංකා බැංකුව - බියගම | 36,274,435 | 19,526,031 |
| | ලංකා බැංකුව - කොග්ගල | 1,791,003 | 4,470,175 |
| | ලංකා බැංකුව - දිගන | 6,790,134 | 2,308,313 |
| | ලංකා බැංකුව - අවිස්සාවේල්ල | 10,109,215 | 11,539,707 |
| | ලංකා බැංකුව - ඉංගිරිය | 10,933,381 | 2,183,146 |
| | ලංකා බැංකුව - මීරිගම | 992,279 | 647,756 |
| | ලංකා බැංකුව - නිට්ටඹුව | 944,179 | 6,095,290 |
| | ලංකා බැංකුව - කුරුණෑගල | 2,199,359 | 3,247,218 |
| | රන් පවුම් | 44,800 | 44,800 |
| | ප්‍රාංකන යන්ත්‍රයේ ශේෂය | 238,397 | 278,887 |
| | තාවකාලික අතිරික්ත අරමුදල - ලංකා බැංකුව | 83,556,547 | 172,236,126 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව - කාර්ය මණ්ඩල ඇප තැන්පතු | 184,155 | 160,554 |
| | සුරක්ෂිතාගාරය | 849,999,777 | 400,000,000 |
| | ඒක්ෂණ තැන්පතු/වෙනත් තැන්පතු | 0 | 251 |
| | අතැති මුදල් | 13,882 | 956 |
| | **මුදල් හා මුදල් සමානතා එකතුව** | **1,257,382,982** | **811,476,128** |
| 19 | **විලම්භිත වියදම්** | | |
| | වසර 20 ක් පුරා හඳුනා ගන්නා ලද | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 427,235,029 | 440,993,614 |
| | වර්ෂය තුළ විලම්භනය කරන ලද වියදම් | 28,367,305 | 24,345,688 |
| | අඩු කළා - ප්‍රවර්තන වර්ෂයේ වියදම් | (40,539,723) | (38,104,272) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **415,062,611** | **427,235,029** |
| 20 | **විලම්භිත අයභාරය** | | |
| 20.1 | **විලම්භිත අයභාරය – ඉඩම් සඳහා අධි මිල** | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | 2,094,695,897 | 1,792,358,277 |
| | වර්ෂය තුළ ලැබුණා | 13,384,426,852 | 352,768,594 |
| | වර්ෂය තුළ ආපසු ගෙවීම් | (7,333,333) | |
| | ආදායම් ප්‍රකාශන තුළින් හඳුනා ගන්නා ලද ආදායම | (199,319,990) | (50,430,975) |
| | පූර්ව වර්ෂය සඳහා ගැළපීම් | (381,795,890) | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය (20.1.1 සටහන) | **14,890,673,535** | **2,094,695,897** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20.1.1 | **විලම්භිත අයභාරය** | | **කල් පිරීම** | **කල් පිරීම** | **කල් පිරීම** |
| | | 2014.12.31 | වසර 1 ක් | වසර 1 සිට | වසර 5 කට |
| | | රු. | තුළ | වසර 5 දක්වා | පසුව |
| | ඉඩම් සඳහා අධි මිල | 14,890,673,535 | 199,319,990 | 996,599,952 | 13,694,753,593 |
| | | **14,890,673,535** | **199,319,990** | **996,599,952** | **13,694,753,593** |
| | | | **කල් පිරීම** | **කල් පිරීම** | **කල් පිරීම** |
| | | 2013.12.31 | වසර 1 ක් | වසර 1 සිට | වසර 5 කට |
| | | රු. | තුළ | වසර 5 දක්වා | පසුව |
| | ඉඩම් සඳහා අධි මිල | 2,094,695,897 | 50,430,975 | 252,154,876 | 1,792,110,045 |
| | | **2,094,695,897** | **50,430,975** | **252,154,876** | **1,792,110,045** |
| 20.2 | **විලම්භිත අයභාරය – ප්‍රදාන** | | | | |
| | එම වත්කම් මත හඳුනා ගන්නා ලද ක්ෂය කිරීම් වියදම්වලට ගැළපෙන පරිදි කාල පරිච්ඡේදය පුරා ප්‍රදානයන්, ආදායම ලෙස හඳුනා ගන්නා ලදී. | | | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | | | | |
| | වර්ෂය තුළ ලැබුණා | | | 34,022,601 | |
| | ආදායම් ප්‍රකාශන තුළින් හඳුනා ගන්නා ලද ආදායම | | | | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | | **34,022,601** | |
| 21 | **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | | | |
| | ජනවාරි 1 දිනට බැඳීම්වල මුළු වර්තමාන වටිනාකම | | | 224,062,179 | 200,458,965 |
| | පොළී පිරිවැය | | | 22,406,218 | 20,045,898 |
| | වර්තමාන සේවා පිරිවැය | | | 12,831,779 | 10,850,989 |
| | බැඳීම් මත ආයුගණක (ලාභය)/අලාභය | | | 28,339,987 | 6,283,354 |
| | අඩු කළා - වර්ෂය තුළ ගෙවීම්/වර්ෂය තුළ ගෙවිය යුතු මුදල් | | | (24,108,023) | (13,577,026) |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල මුළු වර්තමාන වටිනාකම | | | **263,532,140** | **224,062,179** |
| 21.1 | **ආදායම් ප්‍රකාශන තුළින් හඳුනා ගන්නා ලද වියදම්** | | | | |
| | පොළී පිරිවැය | | | 22,406,218 | 20,045,897 |
| | වර්තමාන සේවා පිරිවැය | | | 12,831,779 | 10,850,989 |
| | ආයුගණක (ලාභය)/අලාභය | | | 28,339,987 | 6,283,354 |
| | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා මුළු වියදම් | | | **63,577,984** | **37,180,240** |
| 21.1 | **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් (Contd.)** | | | | |
| | ආයුගණක විසින් භාවිත කළ ප්‍රධාන උපකල්පන පහත සඳහන් වේ. | | | | |
| **දෙසැම්බර් 31 දිනට** | | | | **2014** | **2013** |
| | (i) වට්ටම් අනුපාතිකය | | | 9% | 10% |
| | (ii) වැටුප් වර්ධන අනුපාතිකය | | | ස්ථාවර | ස්ථාවර |
| | (iii) අනාගත මරණ ප්‍රමාණය පිළිබඳ උපකල්පනය | | | A1967/70 | A1967/70 |
| | (iv) විශ්‍රාම ගන්නා වයස | | | අවුරුදු 60 | අවුරුදු 60 |
| **22** | **මූල්‍ය බදු** | | | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | | | 105,400,650 | 103,827,537 |
| | වර්ෂය තුළ ලබා ගන්නා ලද මූල්‍ය බදු | | | 10,046,400 | 28,230,300 |
| | වර්ෂය තුළ ගෙවන ලද වාරික | | | (28,467,212) | (26,657,187) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | | 86,979,838 | 105,400,650 |
| | අඩු කළා - අවලම්භන පොළිය | | | (25,710,195) | (36,095,165) |
| | **ගෙවිය යුතු ප්‍රාග්ධනය** | | | **61,269,642** | **69,305,484** |
| | වසරක 'තුළ එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | | | 14,123,579 | 14,393,354 |

| | | | |
|---|---|---|---|
| | වසරකට පසුව එළැඹෙන දිගුකාලීන ණය ගැනීම් | 47,146,064 | 54,912,130 |
| | **ගෙවිය යුතු මුළු මූල්‍ය බදු ප්‍රමාණය** | **61,269,642** | **69,305,484** |
| 23 | **උපචිත වියදම් සහ ගෙවිය යුතු වෙනත් මුදල්** | | |
| | විවිධ ණයහිමියන් | 152,496,162 | 65,257,876 |
| | උපචිත වියදම් | 194,739,704 | 203,396,847 |
| | කලින් ලද මුදල් | 157,115,953 | 216,201,116 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | 104,327,709 | 114,902,248 |
| | ඉඩම් වෙන් කිරීමේ ගාස්තු | 12,291,716 | 13,752,598 |
| | ගෙවිය යුතු තැන්පතු | 182,112,751 | 62,781,963 |
| | මධ්‍යම පරිසර අධිකාරිය | 4,760,197 | 4,760,197 |
| | **මුළු මෙහෙයුම් වියදම් සහ ගෙවිය යුතු වෙනත් මුදල්** | **807,844,191** | **695,429,780** |

| 11 දේපල, පිරියත සහ උපකරණ | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් | ගොඩනැගිලි | ව්‍යූහ | පිරියත සහ උපකරණ | වැද්දුම් සහ සවි කිරීම් | ලී බඩු සහ කාර්යාලීය උපකරණ | පරිගණක | මෝටර් වාහන | එකතුව 2014 | එකතුව 2013 |
| සින්නක්කර වත්කම් පිරිවැයට | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ජනවාරි 1 දිනට ශේෂය | 155,209,000 | 1,760,870,831 | 4,852,242,586 | 47,835,708 | 445,099 | 111,408,159 | 130,547,199 | 149,263,884 | 7,207,822,466 | 6,653,805,225 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 417,182,000 | 8,500,000 | | 2,211,449 | 175,232 | 11,581,310 | 20,350,350 | 56,493,698 | 516,494,039 | 46,493,626 |
| කෙරී ගෙන යන ප්‍රාග්ධන කටයුතුවලින් මාරු කිරීම් | | 1,781,882 | 310,492,598 | | | | | | 312,274,480 | 527,111,193 |
| වර්ෂය තුළ අපහරණය කිරීම් | | | 3,358,000 | 315,000 | 8,500 | 1,950,328 | 3,914,725 | 9,411,481 | 18,958,034 | 19,587,580 |
| ආයෝජන දේපලවලට මාරු කිරීම | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **572,391,000** | **1,771,152,713** | **5,159,377,184** | **49,732,157** | **611,831** | **121,039,141** | **146,982,824** | **196,346,101** | **8,017,632,951** | **7,207,822,463** |
| | | | | | | | | | | |
| **ක්ෂය කිරීම්** | | | | | | | | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | 436,034,922 | 1,257,764,460 | 19,652,006 | 75,740 | 35,584,712 | 83,388,994 | 132,846,975 | 1,965,347,809 | 1,609,613,367 |
| වර්ෂය සඳහා අය කිරීම් | | 87,898,335 | 257,943,909 | 4,783,570 | 44,509 | 11,231,557 | 23,429,807 | 24,196,866 | 409,528,553 | 374,665,514 |
| අපහරණය කිරීම් සිදු කරමින් පවතින | | | 1,007,400 | 189,000 | 3,400 | 952,353 | 3,848,346 | 9,407,830 | 15,408,329 | 18,931,071 |
| ආයෝජන දේපලවලට මාරු කරන ලද ක්ෂය කිරීම් | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **523,933,258** | **1,514,700,969** | **24,246,576** | **116,849** | **45,863,916** | **102,970,455** | **147,636,011** | **2,359,468,033** | **1,965,347,811** |
| | | | | | | | | | | |
| **සින්නක්කර වත්කම්වල ලියා හැරි වටිනාකම** | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට** | **572,391,000** | **1,247,219,455** | **3,644,676,215** | **25,485,581** | **494,982** | **75,175,225** | **44,012,369** | **48,710,090** | **5,658,164,918** | **5,242,474,652** |
| | | | | | | | | | | |
| **කල්බදු වත්කම්** | | | | | | | | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | | | | | | | 82,366,071 | 82,366,071 | 65,223,214 |
| වර්ෂය තුළ එකතු කිරීම් | | | | | | | | 6,500,000 | 6,500,000 | 17,142,857 |
| වර්ෂය තුළ අපහරණය කිරීම් | | | | | | | | | | |
| **මුළු කල්බදු වත්කම්** | | | | | | | | **88,866,071** | **88,866,071** | **82,366,071** |
| | | | | | | | | | | |
| **කල්බදු වත්කම්** | | | | | | | | | | |
| ජනවාරි 1 දිනට ශේෂය | | | | | | | | 13,044,642 | 13,044,642 | 0 |
| වර්ෂය සඳහා අය කිරීම් | | | | | | | | 3,428,571 | 3,428,571 | 13,044,643 |
| අපහරණය කිරීම් සිදු කරමින් පවතින | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | | | | | | | **16,473,213** | **16,473,213** | **13,044,643** |
| **කල්බදු වත්කම්වල ලියා හැරි වටිනාකම** | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට** | | | | | | | | **72,392,858** | **72,392,858** | **69,321,429** |
| | | | | | | | | | | |
| **වත්කම්වල ලියා හැරි වටිනාකම** | | | | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට** | **572,391,000** | **1,247,219,455** | **3,644,676,215** | **25,485,581** | **494,982** | **75,175,225** | **44,012,369** | **121,102,948** | **5,730,557,776** | **5,311,796,081** |

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය බදු යටතේ අත්පත් කර ගත් මෝටර් වාහනවල වටිනාකම රු.88,866,071.45 ක් විය. ඒවා ප්‍රධාන වශයෙන්ම පරිපාලන කටයුතු සඳහා භාවිත කරන ලද දේපලවලට අදාළ වේ. මෙම වත්කම්වලට අදාළ වන වගකීම් 22 වන සටහනේ "මූල්‍ය බදු" යටතේ සඳහන් කර තිබේ.

# "විගණන වාර්තාව"

මගේ අංකය / எனது இல. / My No. } ටීසී/ජී/බීඔඅයි/01/2014

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 දෙසැම්බර් 07 දින

සභාපති,

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (ශ්‍රී.ලං.ආ.ම) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (ශ්‍රී.ලං.ආ.ම) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (ශ්‍රී.ලං.ආ.ම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත් 28 ක් මත දරන ලද එකතුව රු.64,535,967 ක් වූ වියදම ප්‍රාග්ධනිත කිරීමෙන් හෝ විලම්භිත වියදම් ගිණුමට මාරු කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලට ඇතුළත් කර තිබුණි. තවද 2008 වර්ෂයේ අත්හරින ලද Borehole pump හා සම්බන්ධිත උපාංග සැපයුම හා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවට අදාළව වැය කරන ලද රු. 5,993,163 ක මුදලක් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වලින් සියයට 67 ක් නියෝජනය වූ ව්‍යුහ ශේෂය රු. 5,162,735,184 ක් විය. ආයෝජන මණ්ඩලය විසින් පිරියත හා යන්ත්‍රෝපකරණ, අභ්‍යන්තර මාර්ග, ඇවිදින මාර්ග, ජීප්රථ මාර්ග, බෝක්කු, මායිම් බිත්ති, වැට, ගේට්ටු, ගොඩනැගිලි පිවිසුම්, වැසි ජල කාණු, සැපයුම් මාර්ග, නල මාර්ග, Manholes සහ වාරිමාර්ග ඇළ ආදිය දේපල පිරියත හා උපකරණ යටතේ වර්ගීකරණය කර තිබුණි. ඉහත ස්ථාවර වත්කම්වල ස්වභාවය, සුන්බුන් වටිනාකම් සහ ජීව කාලය එකිනෙකට වෙනස් වන නමුත් සියලු වත්කම් වර්ෂ 20 ක ආර්ථික ජීව කාලය පදනම් කරගෙන හෝ වර්ෂයකට සියයට 5 ක රේටයට ක්ෂය කෙරේ.

(ඈ) කාර්යයන් තුනකට (කොමන් වෙල්ත් විදේශීය ඍජු ආයෝජන ප්‍රවර්ධනය, ගංවතුර හානි සිදුවූ අයට සහන හා සුනාමි සහන අරමුදල) අදාළව ලැබී තිබුණු රු.6,758,323 ක මුදලක් විධිමත්ව දක්වනු වෙනුවට 2014 දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමියන් යටතේ වැරදි සහගත ලෙස දක්වා තිබුණි.

(ඈ) කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයෝජන මණ්ඩල ව්‍යාපාර 08 ක් විසින් භාවිතා කරන ලද අක්කර 1.46 ක ප්‍රමාණයක ඉඩම් සම්බන්ධයෙන් එකතුව රු.813,238 ක්වූ බිම් කුලී ඉන්වොයිස් කර හෝ 2014 වර්ෂය තුළ ගිණුම්වලට ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කෘෂි ගොවිපොළවල් සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් කඩිනමින් කළයුතු මැනීම් වියදම් සපුරා ගැනීම සඳහා 2010 සැප්තැම්බර් 10 දින රු.24,844,375 ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් සර්වෙයර් ජනරාල් වෙත ගෙවා තිබුණි. පසුව 2011 ජනවාරි 06 දින සර්වෙයර් ජනරාල් විසින් රු.9,000,000 ක මුදලක් ආපසු එවා තිබු අතර 2011 සැප්තැම්බර් 14 දිනැති ලිපිය අනුව ආයෝජන මණ්ඩලය විසින් ලබාගත් සේවා සඳහා රු.14,837,882 ක තවත් මුදලක් අඩුකර ගෙන තිබුණි. ඒ අනුව ලැබිය යුතු තථ්‍ය ශේෂය රු.1,006,492 ක් විය. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මත ප්‍රාථමික වියදම් සඳහා රු.15,844,375 ක ශේෂයක් අත්තිකාරම්වල ඇතුළත් කර තිබුණි.

(ඊ) ආයෝජන මණ්ඩලයේ කාර්මික අංශයෙන් ලබාගත හැකි වූ තොරතුරු අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත් තුනකට අදාළව එකතුව රු.3,546,975 ක්වූ රඳවා ගැනීම් මුදල් දැනටමත් නිරවුල් කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට දැක්වෙන ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ශේෂයෙහි එම මුදල ඇතුළත් කර තිබුණි.

## 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

(අ) ව්‍යාපාර ආයතන වලින් ලැබිය යුතු ශේෂ

---

2014 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර වලින් රු.200,513,779 ක මුදලක් ලැබිය යුතු විය. සමාලෝචිත වර්ෂය අවසානයට හානිකරණය සඳහා ප්‍රතිපාදනය හා ඒ මත ලියාහරින ලද බොල් ණය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආයෝජන මණ්ඩල ව්‍යාපාර ආයතනවලින් අයකර ගත යුතු මුදල් | 719,431,529 | 664,452,940 | 701,884,118 | 623,861,381 | 631,911,594 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 518,917,751 | 493,484,649 | 492,790,570 | 437,041,560 | 249,452,238 |
| හානිකරණය සඳහා ප්‍රතිපාදනය මුළු හිඟ මුදල්වල ප්‍රතිශතයක් ලෙස | 72 | 74 | 70 | 70 | 39 |
| වර්ෂය තුළ ලියාහරින ලද බොල් ණය | 1,055,613 | 13,483,407 | 5,517,032 | 73,113,266 | 8,306,417 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) හානිකරණය සඳහා ප්‍රතිපාදන 2010 වර්ෂයේදී සියයට 39 සිට 2014 වර්ෂයේදී සියයට 72 දක්වා පසුගිය වර්ෂ 05 තුළ සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර ඒ අනුව එම ලැබිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු ඉතා දුර්වල මට්ටමක වූ බව පෙන්නුම් කෙරුණි.

(ii) හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.518,917,751 න්,රු.513,085,170 ක් එනම් සියයට 99 ක් පමණ වූ හානිකරණ ප්‍රතිපාදනය 2014 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද හා වසා දමන ලද ව්‍යාපෘති සඳහා ලැබිය යුතු ශේෂ නියෝජනය විය.

(iii)සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික ගාස්තු හානිකරණය සඳහා රු.201,545,912 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර මෙය 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වාර්ෂික ගාස්තු රු. 240,076,662 කින් සියයට 84 ක් විය.

(ආ) වෙනත් ණයගැතියන්

ආයෝජන මණ්ඩලයේ වෙනත් ණයගැතියන් පිළිබඳ හිඟ ශේෂ සහ ශේෂ පත්‍ර දිනට ඒ මත හානිකරණය සඳහා ප්‍රතිපාදනය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් ණයගැතියන් | 145,502,248 | 131,274,290 | 66,891,763 | 61,204,152 | 103,810,214 |
| අඩමාණ ණය/ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 111,709,320 | 120,257,749 | 61,204,152 | 7,688,630 | 48,234,339 |
| අඩමාණ ණය/ හානිකරණය සඳහා ප්‍රතිපාදනය වෙනත් මුළු ණයගැතියන්ගේ ප්‍රතිශතයක් ලෙස | 76.7 | 91.6 | 91.5 | 12 | 46 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂයෙන් වෙනත් ණයගැතියන් මත හානිකරණය සියයට 76.7 කින් නියෝජනය වූ බැවින් එම ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ තත්ත්වය දුර්වල මට්ටමක පැවති බව දැක්වේ.

(ii) වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර එම සමාගම හා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(iii) වෙනත් ණයගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් ඌනතාවය හා රු.2,090 ක තොග ඌනතාවය වර්ෂ 11 කට වැඩි කාලයක සිට නොවෙනස්ව පැවතුණි.

(iv) වර්ෂ අවසානයට රු.145,502,248 ක්වූ වෙනත් මුළු ණයගැතියන්ගෙන් රු.94,959,501 ක් එනම් සියයට 72 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු ශේෂ වලින් නියෝජනය විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- වර්ෂ 02 කට වැඩි කාලයක් රජයේ ආයතනවලින් ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීම වෙනුවට බොල් හා අඩමාණ ණය සඳහා ගිණුම්වල සියයට 100 ක ප්‍රතිපාදනයක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද ප්‍රතිපාදනය රු.82,911,083 ක් විය.

- පහත සඳහන් පරිදි රජයේ අමාත්‍යාංශ තුනකින් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.5,257,979 ක වෙනත් ණයගැතියන් භෞතිකව නොපැවතුණි.

| රජයේ අමාත්‍යාංශයේ නම | 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල |
|---|---|
| | රු. |
| පුනරුත්ථාපන හා දමිළ කටයුතු අමාත්‍යාංශය | 2,099,895 |
| ව්‍යාපාර සංවර්ධන, කර්මාන්ත ප්‍රතිපත්ති හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 710,550 |
| ව්‍යාපාර සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2,447,534 |
| | 5,257,979 |

### 2.2.3 පැහැරහරින ලද එකතු කළ අගය මත බදු

මණ්ඩලය විසින් 2013 වර්ෂයේ 4 වන කාර්තුවට අදාළව රු.9,108,682 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණි. මෙම මුදල ප්‍රේෂණය කිරීමට 2015 මැයි 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

### 2.2.4 ආපසු ගෙවිය යුතු තැන්පතු

එකතුව රු.25,569,041 ක් වූ රඳවා ගැනීම් මුදල්වලින් කොන්ත්‍රාත් 69 කට අදාළව රු.4,970,347 ක් වූ මුදලක් එනම් සියයට 19 ක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

වියදමේ ස්වභාවය, ගෙවීම් වර්ෂය, ක්‍රමක්ෂය කළ මුළු කාලපරිච්ඡේදය, ක්‍රමක්ෂය සඳහා ඉතිරි කාලපරිච්ඡේදය ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.415,062,611 ක් වූ විලම්භිත වියදම් ශේෂය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබාගන්නා ආයෝජන මණ්ඩලයේ සේවකයන් විසින් මාසිකව රු.15,000 ක රියදුරු දීමනා තවදුරටත් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.2,874,500 ක්වූ මුදලක් ඉහත දීමනා සඳහා ආයෝජන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. |
| (ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2007 ජනවාරි 02 දිනැති අංක ඩීඑම්එස්/ඒ2/බීඕඅයි දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | (i) අදාළ අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආයෝජන මණ්ඩලයේ සේවකයන්ගේ වෘත්තීය දීමනා හෝ පශ්චාත් උපාධි දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රු.6,766,104 ක මුදලක් ගෙවා තිබුණි.<br>(ii) ප්‍රධාන කාර්යසාධන ගෙවීම් වෙනුවෙන් නව පැමිණීමේ දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම මගින් ආයෝජන මණ්ඩලයේ සේවකයන් සඳහා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පැමිණීමේ දිරි දීමනා සහ භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කර ගැනීමේ දීමනාද ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ මෙම දීමනා දෙක මත රු.128,419,019 ක වැඩිපුර ගෙවීමක් ආයෝජන මණ්ඩලය විසින් දරා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.432,571,478 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ ලාභය රු.313,548,256 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.119,023,222 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් දෙකකින් රු.12,807,450,000 ක් වූ මුළු ඉඩම් වාරිකයෙන් රු.289,522,676 ක්වූ ඉඩම් වාරික ආදායම් කොටස ලැබීම මඟින් ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ආයෝජන මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ඉකුත් වර්ෂ 03 සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| <u>ලාභදායිත්ව අනුපාත</u> | | | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 12.05 | 10.45 | 10.29 | 3.89 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය | 0.93 | 1.2 | 0.95 | 0.33 |
| හිමිකම් මත ප්‍රතිලාභය | 0.95 | 1.2 | 0.99 | 0.28 |
| <u>ක්‍රියාකාරී අනුපාත</u> | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර ගණන) | 4.48 | 3.98 | 3.36 | 3.19 |
| ණයගැති එකතු කිරීමේ කාලය (දින ගණන) | 81 | 92 | 109 | 114 |
| <u>ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)</u> | | | | |
| ජංගම අනුපාතය | 204.90 | 170.8 | 120.11 | 329.29 |
| මුළු වත්කම් වලට ශුද්ධ ජංගම වත්කම් | 51.19 | 41.4 | 16.75 | 69.63 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයෝජන මණ්ඩලයේ ණය එකතු කර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

(ii) ආයෝජන මණ්ඩලය විසින් විශාල මුදලක් කාරක ප්‍රාග්ධනයේ ආයෝජනය කර තිබුණි. එබැවින් ආයෝජන මණ්ඩලයේ ලාභදායීත්වය සතුටුදායක මට්ටමක නොතිබුණි.

### 3.2.2 වියදම් විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු වියදම්වලින් රු.මිලියන 2,802.7 ක් එනම් සියයට 82 ක් පරිපාලන වියදම් නියෝජනය වූ අතර පරිපාලන වියදම්වලින් සියයට 60 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබුණි. මණ්ඩලයේ වියදම පිළිබඳ විශ්ලේෂණයක් පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| වියදම් වර්ගය | වර්ෂය සඳහා වියදම | | | |
|---|---|---|---|---|
| | 2014 | | 2013 | |
| | මුදල | ප්‍රතිශතය | මුදල | ප්‍රතිශතය |
| | රු.මිලියන | | රු.මිලියන | |
| මෙහෙයුම් | 299.38 | 11 | 337.01 | 13 |
| පරිපාලන | 2,303.29 | 82 | 1,983.45 | 79 |
| රජයේ බදු | 161.68 | 6 | 148.12 | 6 |
| මූල්‍ය හා වෙනත් පිරිවැය | 38.35 | 1 | 39.95 | 2 |
| | 2,802.70 | | 2,509.03 | |

### 3.2.3 අපනයන සැකසුම් කලාප, කාර්මික උද්‍යාන හා ප්‍රාදේශීය කාර්යාල පිළිබඳ මූල්‍ය විශ්ලේෂණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශාල පරිපාලන පිරිවැය හා ආදායම් උත්පාදනය සඳහා ඉඩම් ඌන උපයෝජනය හේතුවෙන් අපනයන සැකසුම් කලාප දෙකක් හා කාර්මික උද්‍යානයක් 2008 වර්ෂයේ සිට අඛණ්ඩව පාඩු දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

| කලාප / උද්‍යාන | වර්ෂය තුළ දරන ලද පාඩු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වතුපිටිවල | 99 | 2,969 | 7,766 | 15,743 | 13,703 | 12,787 | 11,872 |
| කොග්ගල | 43,027 | 14,050 | 11,775 | 26,980 | 17,503 | 23,149 | 23,412 |
| මල්වත්ත කාර්මික උද්‍යානය | 4,635 | 2,748 | 5,531 | 3,226 | 3,458 | 3,639 | 2,576 |

(ආ) ව්‍යාපාර සඳහා ජලය සැපයීමෙන් ශුද්ධ ආදායම වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 34 කින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ බදු පෙර ලාභය වැඩි වී තිබුණි.

(ඇ) ආනයන හා අපනයන සේවා ගාස්තු වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33 කින් කටුනායක අපනයන සැකසුම් කලාපයේ බදු පූර්ව ලාභය වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) 2014 වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ 4 තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති, ගිවිසුම්වලට එළඹි ව්‍යාපෘති, අවලංගු කරන ලද සහ වසා දමන ලද හා අත් හිටුවන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වර්ෂය තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | ✓ * | ✓ * | ✓ * | ✓ ** | ✓ ** | ✓ ** |
| 2014 | 181 | 148 | 87 | 52 | 68 | 5 |
| 2013 | 176 | 145 | 93 | 120 | 38 | 7 |
| 2012 | 238 | 163 | 98 | 79 | 26 | 9 |
| 2011 | 160 | 165 | 99 | 47 | 7 | 4 |
| 2010 | 364 | 270 | 144 | 124 | 28 | 10 |
| 2009 | 384 | 182 | 134 | 93 | 12 | 4 |
| එකතුව | **1,503** | **1,073** | **655** | **515** | **179** | **39** |

✓ * පවත්නා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම ඇතුළත්ව

✓ ** ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය අනුව

(i) 2009 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 53 කින් අඩු වී තිබූ අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 3 කින් වැඩිවී තිබුණි.

(ii) වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 2009 වර්ෂයේ 134 සිට 2014 වර්ෂයේ 87 දක්වා අඩුවී තිබුණි.

(iii) පෙර වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 58 කින් අඩුවී තිබූ අතර වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 78 කින් වැඩි වී තිබුණි.

**(ආ) විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම**

(i) 2009 සිට 2013 කාලපරිච්ඡේදය තුළ ආයෝජන මණ්ඩලය විසින් ආකර්ෂණය කර ගන්නා ලද විදේශීය සෘජු ආයෝජන (FDI) පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| නිෂ්පාදන | 333.90 | 359.76 | 307.65 | 322.42 | 159.65 | 164.47 |
| කෘෂිකාර්මික | 5.72 | 8.47 | 7.17 | 17.97 | 6.45 | 3.69 |
| සේවා | 506.34 | 236.34 | 426.74 | 269.14 | 29.48 | 52.55 |
| යටිතල | 682.45 | 786.83 | 596.60 | 456.53 | 320.72 | 381.54 |
| ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යාපෘති | 87.85 | - | - | - | - | - |
| | **1,616.26** | **1,391.40** | **1,338.16** | **1,066.06** | **516.30** | **602.25** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

❖ කෘෂිකාර්මික අංශය යටතේ ආකර්ෂණය කරගන්නා ලද ආයෝජනයන් සියයට 32 කින් අඩු වී තිබූ අතර ආකර්ෂණය කර ගන්නා ලද මුළු විදේශීය සෘජු ආයෝජන පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 16 කින් වැඩි වී තිබුණි.

❖ නිෂ්පාදන අංශයේ විදේශීය සෘජු ආයෝජනයන් 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 7 කින් වැඩි වී තිබුණි.

(ii) 2009 සිට 2014 කාලපරිච්ඡේදය තුළ ආයෝජන මණ්ඩලය හරහා සිදුකළ විදේශීය සෘජු ආයෝජන (FDIS) සහ දේශීය ආයෝජනයන් (LI) පහත දැක්වේ.


| වර්ෂය | උපලබ්ධි විදේශීය සෘජු ආයෝජන (FDI) | උපලබ්ධි දේශීය සෘජු ආයෝජන |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2014 | 1,135,236 | 631,130 |
| 2013 | 956,183 | 555,025 |
| 2012 | 828,005 | 452,154 |
| 2011 | 655,513 | 368,587 |
| 2010 | 536,140 | 331,849 |
| 2009 | 495,506 | 278,762 |

සමාලෝචිත වර්ෂය තුළ උපලබ්ධි විදේශීය සෘජු ආයෝජන (FDI) සහ දේශීය ආයෝජන ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 19 කින් හා සියයට 14 කින් වැඩි වී තිබුණි.

(ඇ) ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම්

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 5 තුළ ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි මුළු ආනයන පිරිවැය සහ අපනයන ඉපැයීම් පහත වගුවෙන් හා රූප සටහනින් දැක්වේ.

| වර්ෂය | අපනයන ඉපැයීම් | ආනයන පිරිවැය |
|---|---|---|
| | එජඩො මිලියන | එජඩො මිලියන |
| 2014 | 7,257 | 5,112 |
| 2013 | 6,606 | 4,525 |
| 2012 | 6,042 | 4,345 |
| 2011 | 6,572 | 4,400 |
| 2010 | 5,171 | 3,360 |
| 2009 | 4,563 | 2,739 |




*ආනයන පිරිවැය හා අපනයන ඉපැයීම් පිළිබඳ උපනතිය*

(i) නිවාස ඉදිකිරීම පිළිබඳ ආයෝජන මණ්ඩලයට ඇති වගකීම විගණනයේදී ප්‍රශ්න සහගතය.

(ii) මෙම නිවාස වලින්, නිවාස 5 ක් දේශපාලන අධිකාරින් විසින් නම් කරන ලද බාහිර පාර්ශවයන් සඳහා භාරදී තිබුණි.

(iii)2013 දෙසැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, ඉහත ඉඩමේ අයිතිය ආයෝජන මණ්ඩලයට පැවරිය යුතුය. කෙසේ වුවද ඉඩමේ අයිතිය 2015 මැයි වන විටත් මාරු කර නොතිබුණි. එබැවින් ඉදිකරන ලද නිවාසවල අයිතිය අවිනිශ්චිතව පැවතුණි.

## 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මාතර, ගොඩගම විශේෂ ආර්ථික කලාපයක් ස්ථාපිත කිරීම සඳහා අක්කර 830 ක භූමි භාගයක් අත්පත් කර ගැනීමට අදාළ මූලික වියදම් සඳහා රු.මිලියන 15 ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. කෙසේ වුවද ආයෝජන පහසුකම් සඳහා අමාත්‍ය මණ්ඩල උප කමිටුව (CSIF) විසින් 2008 ජනවාරි 10 දින එම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නතර කර යෝජනාව අත්හිටුවා තිබුණි. එම අතරතුරදී මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔවුන් විසින් දරන ලද වියදමට එරෙහිව රු.2,899,062 ක මුදලක් ආපසු අය කරගෙන තිබු අතර පසුව නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.2,000,000 ක් අයකරගෙන තිබුණි. ඉතිරි මුදල වන රු.10,100,938 මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) ආයෝජන මණ්ඩලය විසින් 2007 හා 2008 වර්ෂ වලදී ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙන් මහල් නවයක් රු.මිලියන 1,150 මුදලකට මිලදීගෙන තිබු අතර ඉන් වර්ග අඩි 14,075 ක ප්‍රමාණයක් රේගු අමාත්‍යාංශයට කුලියට දී තිබුණි. මේ අතරතුර කුලී පදනම මත වර්ග අඩි 1,012 ප්‍රමාණයක් ආයෝජන මණ්ඩලය විසින් ලබාගෙන තිබු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.4,012,377 ක මුදලක් ගෙවා තිබුණි.

පෙර වර්ෂයට සාපේක්ෂව 2013 හා 2014 වර්ෂවලදී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මගින් අපනයන ඉපැයීම් පිළිවෙලින් සියයට 15 කින් හා සියයට 5 කින් වැඩි වී තිබූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව 2013 හා 2014 වර්ෂවලදී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් මඟින් දරන ලද ආනයන පිරිවැය පිළිවෙලින් සියයට 2 කින් හා සියයට 15 කින් වැඩි වී තිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ආයෝජන ප්‍රවර්ධනය යටතේ එකතුව රු.37,936,276 ක් වූ පහත දැක්වෙන වියදම් දරා තිබුණද මෙම වියදම් ආයෝජන ප්‍රවර්ධනය සඳහා අදාළ නොවන බැවින් මෙම මුදල් වැය කිරීමේ අරමුණු විගණනයේදී ප්‍රශ්නකාරී වේ.

(i) 2014 දෙසැම්බර් 09 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද හම්බන්තොට - කොන්ක්ලේව් - 2014 අදාළව වියදම සඳහා පුද්ගලික සමාගම් 2 කට ගෙවන ලද රු.22,425,000 ක ගෙවීම.

(ii) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය ප්‍රධානීන්ගේ රැස්වීමට (CHOGM) සමගාමීව ජනකලා කේන්ද්‍රයේ පැවති ප්‍රදර්ශනයට අදාළව 2014 මාර්තු 26 දින ශ්‍රී ලංකා සංචාරක කාර්යාංශයට කරන ලද රු.10,000,000 ක ගෙවීම.

(iii)ජනාධිපතිවරයාගේ ප්‍රතිරූපය ගොඩනැගීමට අදාළව දේශීය පුවත්පත්වල දැන්වීම් සඳහා රු.3,311,276 ක් වැය කිරීම.

(iv)උතුරු හා නැගෙනහිර පළාත්වල මෑත කාලීන සංවර්ධනය පිළිබඳ මිනිත්තු 9.5 ක වාර්තා චිත්‍රපටියක් නිෂ්පාදනය සඳහා රු.2,200,000 ක් වැය කිරීම.

(ආ) වැලිවැව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ හෙක්ටයාර් 72.8904 ක භූමි භාගයක නිවාස 15 ක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට (SLLRDC) රු.මිලියන 100 ක මුදලක් ආයෝජන මණ්ඩලය විසින් ගෙවා තිබුණි. සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වූ පුද්ගලයන් සඳහා මෙම නිවාස ඉදිකරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙන් කාර්යාල ඉඩ පහසුකම් ලබාගැනීම සඳහා 1996 නොවැම්බර් මාසයේදී පුද්ගලික සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය විසින් බදු ගිවිසුමකට එළඹ තිබූ අතර ආරම්භක තැන්පතුවක් ලෙස රු.2,637,240 ක මුදලක් ඉහත සමාගමට ගෙවා තිබුණි. පසුව මෙම කාර්යාල ඉඩ පහසුකම එම සමාගමට 2010 ජුනි මාසයේදී භාරදී තිබුණි. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 වන විටත් තැන්පත් කරන ලද මුදල අයකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඈ) මුල් ගිවිසුමේ අංක 19 දරන වගන්තිය ප්‍රකාරව ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයෝජන සමාගම් සඳහා එහි බදු දේපල අයිතීන් හා පවරා දුන් පරිශ්‍රවල අයිතීන් හා එහි ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් ත්‍රිපාර්ශ්වීය ගිවිසුමක් මගින් ඕනෑම බැංකුවකට සහ / හෝ ණය දෙන ආයතනයකට උකස් කිරීමට අවසර ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආයෝජන මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුව විසින් උකස් කරන ලද ඉඩම් හා ගොඩනැගිලි සඳහා විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ii) දේපල පිළිබඳ බදු දේපල අයිතීන් උකස් කිරීම මගින් ලබාගත හැකි වටිනාකම සම්බන්ධයෙන් මුල් ගිවිසුමේ හෝ ත්‍රිපාර්ශවීය ගිවිසුමේ සීමා කිරීම් හෝ ප්‍රමාණ කිරීම් ඇතුළත් කර නොතිබුණි. තවද සමාගම් බොහෝ ප්‍රමාණයක් මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය ගෙවීම පැහැර හැරීම මගින් ඇවර කර තිබුණි.

(iii) උකස් කරන ලද ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ නිරවුල් නොවූ ප්‍රශ්න හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම, නිශ්කාර්ය ඉඩම් මත වූ ආවස්ථික පිරිවැය ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු මුදල් අහිමි වීම වැනි අලාභ ආයෝජන මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි.

(ඉ) 2000 දෙසැම්බර් 29 දිනට පවතින විදුලි ගාස්තු රේටය වාර්ෂිකව සියයට 6.9 කට වඩා වැඩි වුවහොත් විදුලි ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීමට පෙර අදාළ රාජ්‍ය ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබාගෙන නොතිබුණි.

(ii) 2002 ජුනි සිට 2007 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ විදුලි ගාස්තු රේටය වැඩිවීම සම්බන්ධයෙන් රු.356,793,568 ක මුදලක් සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය මගින් දෙන ලද අවසාන තීරණය ප්‍රකාරව හානිය සඳහා ගෙවීම ප්‍රමාද වීම මත පොලිය සහ සමාගම විසින් දරන ලද බේරුම්කරණ පිරිවැය සඳහා රු.388,161,877 ක මුදලක් ද සමාගම විසින් දුන් තීරණයට විරුද්ධව ආයෝජන මණ්ඩලය විසින් ඉල්ලා තිබුණි. ඉහළ වාණිජ අධිකරණයේදී ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් දුන් තීරණයට විරුද්ධව ආයෝජන මණ්ඩලය විසින් අභියාචනයක් කර තිබුණි. පසුව ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් ලබාදී තිබූ තීන්දුවට එරෙහිව සමාගම විසින් අභියාචනයක් කර තිබුණි. මෙම නඩු දෙකම නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබේ.

(iii) ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීමට පෙර පරිභෝජනය සඳහා ප්‍රදේශයේ රබර් දැව ලබාගැනීමේ හැකියාව පිළිබඳව අදාළ රජයේ ආයතනවලින් තක්සේරු වාර්තාවක් ආයෝජන මණ්ඩලය විසින් ලබාගෙන නොතිබුණි.

(iv) අධිකරණ නඩු පවතින බැවින් මෙම සමාගමෙන් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු බිම් කුලිය, ජල බිල්පත් හා බංගලා කුලිය ආදිය අයකර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

ඊ) ආයෝජන මණ්ඩලය විසින් පර්ත් වතුයාය මිලදීගෙන තිබුණු අතර වතු යායෙන් කොටසක් වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (SLSPC) භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SLSPC) අදාළ මූල්‍ය ප්‍රකාශන 2006 වර්ෂයේ සිට ආයෝජන මණ්ඩලයට ලැබී නොතිබුණි.

(ii) 2005 වර්ෂය තුළදී ප්‍රේෂණය කරන ලද රු.මිලියන 10 ක මුදල හැරුණු විට, එකඟ වූ පරිදි සංස්ථාව විසින් එහි ලාභය ක්‍රමවත්ව ආයෝජන මණ්ඩලයට ප්‍රේෂණය කර නොතිබුණි. 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතුයායට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේවුවද ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල 2014 දෙසැම්බර් 31 දක්වාත් හඳුනාගෙන නොතිබුණි.

(iii)පර්ත් වතුයායේ කරුණු සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව, කළමනාකරණ ගාස්තු සියයට 15 කින් වැඩි කිරීම, පර්ත් වතුයාය විසින් ආදායම ඒකපාර්ශ්විකව උපයෝජනය කිරීම, පර්ත් වතුයායෙන් උපයා ගන්නා ලද රු.මිලියන 20 ක්වූ ආදායම කොන්ත්‍රාත්කරුගේ නමින් ආයෝජනය කිරීම, රු.මිලියන 12.42 ක්වූ මෝටර් වාහන හා බංගලා කුලී අවිධිමත්ව ජංගම ගිණුම් මාර්ගයෙන් කොන්ත්‍රාත්කරුට මාරු කිරීම වැනි කරුණු තවමත් විසඳාගත යුතුව ඇත.

## 4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

2003 ජනවාරි 08 දින රු.97,937,000 ක පිරිවැයට මිලදී ගන්නා ලද මලීදුව කන්ද වතුයාය නම් වූ අක්කර 122 රූඩ් 01 පර්චස් 27.4 ක ඉඩම 2014 මැයි අවසානය දක්වා කිසිදු කාර්යයකට උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක ශ්‍රේණියේ තනතුරු 84 ක් ඇතුලත් කාර්ය මණ්ඩලයේ විවිධ වර්ගයන්හි පුරප්පාඩු 136 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පුරවා තවද අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලයේ 11 ක් සේවයේ යෙදී සිටි අතර තනතුරු 24 ක් කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබුණි.

(ආ) ආයෝජන මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව සභාපති හෝ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් එම තනතුර සඳහා එක් නිලධාරියෙකු පමණක් අනුමත කර තිබුණි. කෙසේ වුවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව ඉහත තනතුරු සඳහා වෙනම නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

(ඇ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතිය සහ 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ලබාගැනීමෙන් තොරව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා මාසයකට ලීටර් 300ක ඉන්ධන දීමනාවක් සහිතව රු.200,000 ක හා

(ii) තවද විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, සහකාර අධ්‍යක්ෂ, ආරක්ෂක නිලධාරි, පිළිගැනීම් නිලධාරි හා කාර්යාල සහකාර තනතුරු සඳහා ආයෝජන මණ්ඩලයේ නිලධාරි 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර ඔවුන්ගේ වැටුප් හා දීමනා ලෙස රු.3,443,263 ක මුදලක් 2014 වර්ෂය සඳහා දරා තිබුණි.

(iii) ඊට අමතර වශයෙන්, මෝටර් වාහන 2 ක් එවකට රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර 2009 සිට 2013 කාලපරිච්ඡේදය සඳහා රු.2,751,809 ක මුදලක් අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස දරා තිබුණි. එහෙත් මෙම මුදල අමාත්‍යාංශයෙන් අය කරගෙන හෝ ලැබිය යුතු මුදල් ලෙස ආයෝජන මණ්ඩලයේ ගිණුම් ගත කර නොතිබුණි. මෙම වාහන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට ස්ථිරව මුදා නොහරින ලද බවත් සභාපතිවරයා ඔහුගේ පිළිතුරෙහි සඳහන් කර තිබුණි.

## 4.7 හඳුනාගන්නා ලද පාඩු

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ පුද්ගලික සමාගමක් නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාරයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම හා ඇහලුම් හා වෙනත් රෙදිපිළි අපනයනය සඳහා ආයෝජන මණ්ඩලය සමඟ 1992 අගෝස්තු 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. 1992 නොවැම්බර් 5 දින ආයෝජන මණ්ඩලය විසින් අවසන් කර එකඟ වූ වන්දිය සමඟ සියලු ගොඩනැගිලි හා එහි යන්ත්‍ර ආයෝජන මණ්ඩලයට පැවරීම සඳහා සමාගමෙන් ඉල්ලා තිබුණි. ආයෝජන මණ්ඩලය විසින් සම්පූර්ණ හා අවසාන නිරවුල් කිරීම ලෙස රු.23,835,535 ක මුදලක් ගෙවා තිබුණි.

එම ගෙවීම මත, සමාගම විසින් ආයෝජන මණ්ඩලයෙන් රු.37,200,000 ක තවදුරටත් ගෙවීමක් අපේක්ෂාවෙන් බේරුම්කරණ වන්දියක් බලපැවැත්වීම සඳහා බේරුම්කරණ පනතේ 31 වගන්තිය යටතේ අංක එච්සී/ඒආර්බී/1254/02 දරන නඩුව කොළඹ මහාධිකරණයේ ගොනු කර තිබුණි. මහාධිකරණය විසින් 2012 මැයි 14 දින කරන ලද තීන්දුව ප්‍රකාරව 2002 සිට 2014 දක්වා රු.64,938,350 ක උපචිත පොලී කොටස සමග රු.102,138,350 ක මුදලක් ගෙවීමට ආයෝජන මණ්ඩලය වගකීමට යටත් විය. තවද මහාධිකරණ තීන්දුවට අනුකූල වීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වීම හේතු කොටගෙන රු.102,138,350 කට ආයෝජන මණ්ඩලයේ බැංකු ගිණුමක් භාරයට ගැනීමට වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් 2014 දෙසැම්බර් 22 දින නියෝගයක් දී තිබුණි.

රු.525,000 ක ඒකාබද්ධ පරිශ්‍රමිකයන් මණ්ඩලය විසින් 2013 නොවැම්බර් 19 දින හා 2014 නොවැම්බර් 20 දින පැවති එහි රැස්වීම් වලදී අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාට 2014 නොවැම්බර්, දෙසැම්බර් හා 2015 ජනවාරි මාස සඳහා ඒකාබද්ධ පාරිශ්‍රමික ලෙස පිළිවෙලින් රු.337,890 ක්, රු.537,475 ක් හා රු.575,235 ක් ගෙවා තිබුණි.

(ඇ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 වගන්තියේ විධිවිධානවලට පටහැනිව සභාපතිවරයා සඳහා නේවාසික පහසුකම්, ගුවන් ගමන් බලපත්‍ර හා සංග්‍රහ දීමනා ඇතුලත්ව රු.640,000 ක මාසික පාරිශ්‍රමිකයක් ලබාදීමට මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඒ අනුව 2013 හා 2014 වර්ෂ තුළදී එවකට සභාපතිවරයාට එකතුව රු.15,578,333 ක්වූ මුදල් ගෙවා තිබුණි. කෙසේ වුවද 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.2 වගන්තිය ප්‍රකාරව, ස්වයං - මූල්‍යයන ප්‍රවර්ධනාත්මක නියෝජිතායතන (ප්‍රවර්ධනාත්මක - ඒ) යටතේ රජය සතු ව්‍යාපාරවල සභාපතිවරයෙකු මාසයකට රු.70,000 ක මාසික දීමනාවකට පමණක් හිමිකම් ලබයි. ඒ අනුව ආයෝජන මණ්ඩලය විසින් පසුගිය වර්ෂ 2 තුළ රු.13,949,666 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2014 වර්ෂය තුළ රු.344,584,251 ක මුදලක් හෝ මූලික වැටුපෙන් සියයට 96 ක් දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබාදී තිබූ සම්පත්**

------------------------------------------------------

යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති අනුව, රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායන් වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායන් විසින් වියදම් දැරීමට හෝ කිසිදු අවස්ථාවක එහි සම්පත් යෙදවීමට අවසර ලබාදී නොමැත. මෙම විධිවිධාන වලට පටහැනි පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුල රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් එකතුව රු.878,500 ක වියදම් ආයෝජන මණ්ඩලය විසින් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2009 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම දක්වා තිබූ ඉලක්කයන් සැලකිල්ලට ගැනීමෙන් තොරව 2011 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා හා 2014 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා ආයෝජන මණ්ඩලය විසින් නව සැලැස්මක් පිළියෙල කර තිබුණි. නව සැලැස්මට අනුව නිශ්චිත කාලරාමුවක් සමග නිශ්චිත ඉලක්කයන් තහවුරු කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරි සැලැස්ම

සංයුක්ත සැලැස්මට අනුකූල වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 විගණන හා කළමනාකරණ කමිටුව

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තියට අනුව, අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටුව ක්‍රමානුකූලව රැස්විය යුතු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශයන් සහිතව එහි නිරීක්ෂණයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. 2014 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 4 ක් ආයෝජන මණ්ඩලය විසින් පවත්වා තිබුණද, සියළුම රැස්වීම් වර්ෂයේ අවසාන මාස 6 තුළ පවත්වා තිබුණු බැවින් නිරීක්ෂණයන් අඛණ්ඩව සමාලෝචනය කිරීමට මෙය ඵලදායී ක්‍රමයක් ලෙස භාවිතා කර නොතිබුණි.

5.4 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම් වාර්තා/ ලේඛන පවත්වා ගැනීම

(ආ) පුද්ගලික පඩිනඩි

(ඇ) ව්‍යාපාරයන්ගෙන් ලැබිය යුතු මුදල් එකතු කර ගැනීම.

(ඈ) ජර්නල් සටහන් පිළිබඳ පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) කොන්ත්‍රාත්තු 24 ක් සම්බන්ධයෙන් කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු ලෙස සඳහන් කරන ලද රු. 35,271,497.18 ක මුදලක් 2015 වර්ෂයේදී ප්‍රාග්ධනීකරණය කරන ලදී. කොන්ත්‍රාත්තු (08) ක කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතුවලට අදාළ ඉතිරි මුදල වූ රු. 39,624,644.81 ප්‍රාග්ධනීකරණය කළ නොහැකි වූ අතර ඒ සම්බන්ධ විස්තර පහත දක්වා ඇත.

| විස්තර | කලාපය | 2014.12.31 දිනට ශේෂය (රු) | අදහස් |
|---|---|---|---|
| ටෙක්සෝන් ටෙක්නොලොජීස්: ඉතිරි වී ඇති මළ අපද්‍රව්‍ය රැස්කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම. | WEPZ | 14,411,683.25 | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හා ගෙවීම් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කරන ලදී. |
| සීමාසහිත ඉනොඇක් පොලිමර් ලංකා (පුද්) සමාගම ඉඩම් සංවර්ධන පිරිවැය ප්‍රතිපූරණය කිරීම | HEPZ | 10,321,311.00 | වියදම් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කරන ලදී. |
| සීමාසහිත ඉං⋆නියරින් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම: ප්‍රතිකාරක යෙදූ මළ අපද්‍රව්‍ය පොම්ප කිරීමේ ප්‍රධාන නළය නිර්මාණය කිරීමේ ප්‍රධාන උපදේශන සේවා | HEPZ | 1,650,000.00 | ව්‍යාපෘතියට සම්බන්ධ සියළුම කොන්ත්‍රාත්තු සම්පූර්ණ වනතුරු උපදේශන ගාස්තුව ප්‍රාග්ධනීකරණය කළ නොහැකිය. |
| S.E.C.: යෝ⋆ත පරිපාලන ගොඩනැගිල්ල සඳහා උපදේශන ගාස්තුව | HEPZ | 3,124,800.00 | ව්‍යාපෘතියට අදාළ අනෙකුත් කොන්ත්‍රාත්තු අවසන් වීමෙන් අනතුරුව උපදේශන ගාස්තුව ප්‍රාග්ධනීකරණය කළ හැකිය. |
| ගොවිජන සේවා කමිටුව: වාරි ඇළ මාර්ගය වැඩි දියුණු කිරීම | MEPP | 1,000,000.00 | කලාපයේ වැසි ජලය/ප්‍රතිකාර කරන ලද අපවාහය රැගෙන යන වාරි ඇළ මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත අරමුදල් නිදහස් කිරීම සම්බන්ධ කටයුතුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිරත වී සිටි බැවින් වියදම ප්‍රාග්ධනීකරණය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. |

| | | | |
|---|---|---|---|
| සීමාසහිත ඉං★නියරින් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම: මළ අපද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරක යෙදීම වැඩි දියුණු කිරීම. | KEPZ | 4,514,375.00 | උපදේශන සේවා සඳහා වූ මෙම කොන්ත්‍රාත්තුව අවසන් වුව ද, ඉදිකිරීම් කටයුතු සඳහා අදාළ වෙනත් ප්‍රධාන කොන්ත්‍රාත්තු අවසන් වන තුරු මෙම වටිනාකම ප්‍රාග්ධනීකරණය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නොහැකිය. මෙම කොන්ත්‍රාත්තු මේ වන තෙක් ක්‍රියාත්මකව පවතින අතර 2016 වසරේදී අවසන් වීමට නියමිතව ඇත. |
| යුනි කන්සල්ටන්ට් සර්විසස් කඩා වැටී ඇති බැවුම නිවැරදි කිරීමේ පියවර සැලසුම් කිරීම. | SEPZ | 1,071,000.00 | විම ශනයකට සහ සංරක්ෂිත ප්‍රදේශයේ කඩා වැටී ඇති බැවුම නිවැරදි කිරීමේ පියවර සැලසුම් කිරීමකට පමණක් මෙම පැවරුම සීමා විය. එම වියදම ප්‍රාග්ධනීකරණය කළ නොහැකි වූ අතර ව්‍යාපෘතියේ ඉතිරි වී ඇති ඉදිකිරීම් සම්පූර්ණ කිරීම හා සම්බන්ධ විලම්භිත වියදමක් ලෙස එය ඇතුළත් කරනු ලැබේ. |
| ශක්ති සිවිල් කන්ස්ට්‍රක්ෂන් | HEPZ | 3,531,475.56 | 2015 ව ෂයේ දී, අවසාන ගෙවීම් කටයුතු සම්පූර්ණ කර තිබුණ අතර එය 2015 වසරේදී ප්‍රාග්ධනීකරණය කර තිබුණි. (යොමුව J/E 008/F/02). |

සීමාසහිත මෙක් පම්ප් සිස්ටම්ස් (පුද්) සමාගමට ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදු වූ අතර සේවයේ යෙදවීමේ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන්ම ආපසු ලබා ගන්නා ලදී. මෙම සන්දර්භය තුළ, කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු ගිණුමට භර කරන ලද සිදු කරන ලද වැඩ ප්‍රමාණය 2015 මැයි මාසයේදී ප්‍රාග්ධනීකරණය කරන ලදී.

(ආ) ව්‍යුහයන් සත්‍යාපනය හා ප්‍රත්‍යාගණනය කිරීම පිළිබඳව SJMS ඇසෝසියේට්ස් ආයතනය මගින් නිකුත් කරන ලද වාර්තාව පදනම් කර ගනිමින් 2017 වර්ෂයේ දී, ව්‍යුහ වර්ගීකරණය කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලද අතර මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය මගින් අනුමත කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධ ප්‍රවර්ගවලට අයත් වත්කම්වලින් සමන්විත වන ව්‍යුහ එක් ව්‍යුහ අයිතමයක් ලෙස වර්ගීකරණය කර එවැනි එක් එක් ව්‍යුහ අයිතමවලට ක්ෂය කිරීම පිළිබඳ තනි අනුපාතිකයක් යොදනු ලැබීය.

(ඇ) විවිධ ණයහිමියන් යටතේ දක්වන ලද අරමුදල්

| | |
|---|---|
| විදේශ සෘජු ආයෝජන ප්‍රවර්ධන අනුග්‍රාහකත්වය වෙනුවෙන් පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල්වලින් ලද අරමුදල් | -සටහන් කර ගන්නා ලදී. |
| ගංවතුරින් හානියට පත්වූ පුද්ගලයන් වෙනුවෙන් රැස් කරන ලද අරමුදල් | - සටහන් කර ගන්නා ලදී. |
| සුනාමි 2004 සහන අරමුදල | - සටහන් කර ගන්නා ලදී. |

(ඈ) ව්‍යවසාය මගින් ලබා ගන්නා ලද ඉඩම් අක්කර 1.62 ක ප්‍රමාණයකින් අක්කර 0.16 ක ප්‍රමාණයක් සඳහා ඉන්වොයිස්පත් අදාළ ව්‍යවසාය වෙත යවා ඇති අතර 2014 වර්ෂයේ දී, ඒ සම්බන්ධයෙන් ගිණුම් තැබීමේ කටයුතු සිදු කිරීමට ද පියවර ගෙන ඇත. බදු ගිවිසුම් අත්සන් තැබීමෙන් අනතුරුව ඉතිරි අක්කර 1.46 සඳහා ඉන්වොයිස්පත් යැවිය යුතුව තිබේ.

(ඉ) "ජාතික ආර්ථික පුනරුදය වෙනුවෙන් කෘෂිකාර්මික ගොවිපළ සංවර්ධන වැඩසටහන (AFDPNER)" පිළිබඳ ව්‍යාපෘතිය යටතේ මිණුම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද මිණුම් කටයුතුවලට අදාළව විගණන විමසුමේ දක්වා ඇති වියදම සිදු කර ඇත. 2010.09.29 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, විශේෂ කමිටුවක් මගින් නිර්දේශ කරන ලද ව්‍යාපෘති සඳහා අදාළ නියෝජිතායතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් අවශ්‍ය අනුමතීන් ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකිව යුතු වේ.

මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් ඉටු කිරීමට භාර ගන්නා ලද මිණුම් කටයුතුවල තක්සේරු කළ මුළු පිරිවැය රු. 99,377,500/- ක් වන බව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (ආයෝජන හා සංචාරක කර්මාන්ත) විසින් 2010 සැප්තැම්බර් 01 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාට දන්වන ලදී. දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල හඳුනාගත් ඉඩම් සම්බන්ධයෙන් ඉටු කළ යුතු මිණුම් කටයුතු ආරම්භ කර කඩිනමින් ඉටු කිරීම සඳහා මිණුම් කටයුතු දෙපාර්තමේන්තුවට ඉහත කී මුදලින් 25% ක් මුදා හැරීමට කටයුතු කරන ලෙස ද එකී ලිපිය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව, තක්සේරු කළ පිරිවැයෙන් 25% ක් වන රු. 24,844,375/- ක මුදලක් මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරන ලදී.

අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, කෘෂි ගොවිපළ සංවර්ධන වැඩසටහන සඳහා සහභාගි වීමේ හැකියාවෙන් යුත් ආයෝජකයන්ට ඔවුන්ගේ අභිමතය ප්‍රකාශ කරන ලෙස ආරාධනා කරමින් පුවත්පත් දැන්වීමක් පළ කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කළ බව ලිපිගොනුවලින් ලබාගත හැකි තොරතුරුවලට අනුව අනාවරණය කර ගත හැකි විය.

කෙසේවුවද, 2011 ජනවාරි 04 දිනැතිව මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් එවන ලද ලිපිය ප්‍රකාරව, 2010 දෙසැම්බර් 30 දින දක්වා මිණුම් කටයුතු සඳහා ලබාගත හැකි වූ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 6000 ක් පමණක් වූ බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබුණු අතර එබැවින්, රු. මිලියන 9 ක මුදලක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආපසු ලබා දී තිබුණි.

පසුව, 2011 ජූලි මස 8 වන දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, මෙම ව්‍යාපෘතියට අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කරන ලද අතර අදාළ ඉඩම් හිමි නියෝජිතායතනවලින් ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් බරපතල ගැටළු මතු වී තිබෙන බැවින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද නියමයක් පදනම් කර ගනිමින් අනුමතිය ලබාදුන් අයදුම්කරුවන් සඳහා ඉඩම් පිරිනැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු නොකිරීමට ද එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අදාළ ගැටළු සඳහා විසඳුම් ලබා දෙන තුරු ඉඩම් පිරිනැමීම සම්බන්ධ ලිපි අනුමතිය ලත් අයදුම්කරුවන් වෙත නොයවන ලෙස එම රැස්වීම් වාර්තාවේ දක්වා තිබුණි. ඉන් අනතුරුව, මෙම වැඩසටහන ඉදිරියට කරගෙන ගිය බවට සාක්ෂි ලබා ගත නොහැකි විය.

මේ අතරතුර, මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් ඉටු කරන ලද මිණුම් කටයුතු වෙනුවෙන් වැය කරන ලද අවසන් වියදම් පිළිබඳ විස්තර එම දෙපාර්තමේන්තුව මගින් 2011 සැප්තැම්බර් 14 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. ඒ අනුව, මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් රු.1,006,492/57 ක මුදලක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ආපසු භාර දීමට නියමිතව තිබුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනෙකුත් ව්‍යාපෘතිවල මිණුම් කටයුතු සිදු කිරීම සඳහා

මිණුම් කටයුතු දෙපාර්තමේන්තුවට වැය වූ පිරිවැය මිණුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආපසු ලබා දිය යුතු ඉතිරි අරමුදල්වලින් හිලව් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරමින් සිටියි.

(ඊ)

- ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ සැපයීම සහ සවි කිරීම (රු.1,802,153)

2013 වර්ෂයේ දී වතුපිටිවල අපනයන සැකසුම් කලාපය සඳහා එකොලොජික් සිස්ටම්ස් (පුද්) සමාගමට පිරිනමන ලද කොන්ත්‍රාත්තුවක් යටතේ ඉහත දක්වා ඇති පරිදි ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ සැපයීම හා සවිකිරීම සිදු කර ඇත. පසුව, මෙම ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ හොරණ අපනයන සැකසුම් කලාපයට මාරු කරනු ලැබීය.

කොන්ත්‍රාත්තුවේ විදේශ සංරචකය වෙනුවෙන් රඳවාගත් මුදල රු.1,802,153/- ක් විය. දෝෂ සඳහා වගකීමේ කාලසීමාව සහ මෙහෙයුම් සහ නඩත්තු කාල සීමාව අවසන් වීමෙන් අනතුරුව අවසන් ගෙවීම ද සමඟ ඉහත සඳහන් කරන ලද රඳවාගත් මුදල ද ආපසු කොන්ත්‍රාත්තුකරුට ගෙවන ලදී.

එබැවින්, රු.1,802,153/- ක් වන නිරවුල් නොකර රඳවාගත් මුදලක් අප වෙත නොපවතී.

- ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ සැපයීම හා සවි කිරීම (රු. 831,127)

ඉහත "ප්‍රතිකාරක යන්ත්‍රෝපකරණ සැපයීම සහ සවි කිරීම" යටතේ විස්තර කර ඇති කොන්ත්‍රාත්තුවේ දේශීය සංරචකයට අදාළව රඳවාගත් මුදල රු. 831,127/-ක් විය. රඳවාගත් මෙම මුදල් ප්‍රමාණය ද අවසන් ගෙවීම යටතේ නිදහස් කරනු ලැබීය

- සවි කිරීමට නියමිතව තිබූ ඉතිරි මළාපවහන රැස් කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම (රු. 913,695)

වියදම ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ අවසාන ගිණුම් පිළිබඳ වාර්තාව මූල්‍ය අංශය වෙත නිකුත් කරන ලදී

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) වාවසායවලින් ලැබිය යුතු මුදල්

(i) වාර්ෂික ගාස්තුව හා බිම් බද්දේ ආපසු අය කර ගත හැකි වූ වටිනාකම ඉන්වොයිස් කරන ලද වටිනාකමින් (2011 සිට 2014 දක්වා 2015.05.31 දිනට) 97% ක් වූ බව සටහන් කිරීම යෝග්‍ය වේ.

ඒ පිළිබඳ විස්තර පහත දක්වා තිබේ.

ආදායම (අගය එකතු කළ බදු රහිතව)

| | 2014<br>රු. | 2013<br>රු. | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|---|
| බිම් කුළිය<br>වාර්ෂික ගාස්තුව | මිලියන 1,211 | මිලියන 1,149 | මිලියන 978 | මිලියන 849 |

ගෙවිය යුතු මුදල් (2015.05.31 දිනට ඉහත ඉන්වොයිස් කළ වටිනාකමින් ගෙවිය යුතු ඉතිරි මුදල)

| | | | | |
|---|---|---|---|---|
| බිම් කුළිය<br>වාර්ෂික ගාස්තුව | මිලියන 43 | මිලියන 29 | මිලියන 24 | මිලියන 17 |

ණය ආපසු ගෙවීමේ අනුපාතය

| | | | | |
|---|---|---|---|---|
| බිම් කුළිය<br>වාර්ෂික ගාස්තුව | 97% | 98% | 98% | 98% |

එබැවින්, වර්තමානයේදී ගෙවිය යුතු මුදල් ආපසු ගෙවීම ඉහළ මට්ටමකට පත් වී ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2011 (SLFRS & LKAS) සඳහා පළමුවරට අනුගත වීම හේතුවෙන්, අවලංගු කළ, වසා දැමූ හා තාවකාලිකව අත්හිටුවන ලද ව්‍යාපෘති මෙන්ම වසර දෙකකට අධික කාලයක් පුරා පවතින බොල් ණය බවට පත්විය හැකි ණය මත ද 100% ක හානිකරණ ලබා දීම අවශ්‍ය වේ. එම නිසා, 2011 වසරේ සිට ව්‍යවසායවලින් ගෙවිය යුතු මුදල් මත හානිකරණ සඳහා ප්‍රතිපාදන සැපයීම 2011 වසරේ සිට වැඩිවීමක් දක්වයි.

(ii) හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ අවලංගු කරන ලද, වසා දැමූ හා තාවකාලිකව අත්හිට වූ ව්‍යාපෘතිවලින් ගෙවිය යුතු මුදල් සඳහා 100% කින් ප්‍රතිපාදන සැපයීමයි.

(iii) වාර්ෂික ගාස්තුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා හානිකරණ සඳහා මුළු ප්‍රතිපාදන ප්‍රමාණය වූ රු. 201,545,912/- න් රු. 175,247,831/- ක් අවලංගු කරන ලද, වසා දමන ලද හා තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘතිවලින් ලැබිය යුතු වාර්ෂික ගාස්තුවට අදාළ වන අතර ඉතිරි රු. 22,283,961/- මෙහෙයුම් කටයුතු සිදු කරන ලද ව්‍යවසායවලින් වර්ෂ දෙකකට අධික කාලයක් මුළුල්ලේ ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවට අදාළ වේ.

(ආ) වෙනත් ණයගැතියන්

(i) 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS) මුල්වරට අනුගත වීමට අනුකූලව, බොල් ණය බවට පත් විය හැකි ණය මත හානිකරණ සඳහා 100% කින් ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය වේ. එබැවින් වෙනත් ණයගැතියන් විසින් ගෙවිය යුතු ණය මත හානිකරණ සඳහා ප්‍රතිපාදන සැලසීම 2012 වසරේ සිට වැඩි විය.

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ නිවාස වෙන්දේසි කිරීමේ කොන්ත්‍රාත්තුව වෙන්දේසිකරුවකුට ලබා දී තිබුණි. පුවත්පත් දැන්වීමක් පළකිරීම තුළින් හා ඉන් අනතුරුව ප්‍රසම්පාදන කමිටුව මගින් ගත් තීරණයට අනුකූලව වෙන්දේසිකරු තෝරා ගන්නා ලදී. මෙම වෙන්දේසිය සාර්ථකව අවසන් කළ අතර නිවාස ලබා ගත් ලංසුකරුවන් වෙන්දේසිකරුට අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. කෙසේ වුවද, එම මුදල් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත තැන්පත් කිරීමට වෙන්දේසිකරු අසමත් වී තිබුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රු. 1,604,200/- ක් වූ මෙම මුදල් ප්‍රමාණය ලබා ගැනීමට ප්‍රයත්න දැරූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීති අංශය මගින් මෙම වෙන්දේසිකරු වෙත එන්තරවාසි යවා තිබුණි. එසේ වුවද, මෙම ව්‍යාපාරය වසා දමා අයිතිකරු රට හැර ගොස් තිබුණු බැවින් මෙම එන්තරවාසි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත නැවතත් හරවා එවා තිබුණි.

විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීහු මෙම වෙන්දේසිකරුට එරෙහිව නඩුවක් ගොනු කිරීම සඳහා පවතින ඉඩකඩ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා වංචා විමර්ශන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා හමු වූහ.

**(iii)** මුදල් හිඟය

- 1995.02.06 දින බාරොන් ජයතිලක මාවතේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාලයක සාවද්‍ය ලෙස මුදල් අත්පත් කිරීමක් සිදු වී තිබුණි.

- මෙම සිද්ධියට සම්බන්ධ වූ සේවකයාව 1995.05.04 දින සේවයෙන් පහ කරන ලදී.

- අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මගින් මෙම නඩුව HC/12146/06 යටතේ මහාධිකරණයේදී මෙහෙයවනු ලබයි. ලැබී තිබෙන තොරතුරුවලට අනුව, විත්තිකරු අධිකරණය හමුවේ පෙනී නොසිටි බව වාර්තා වේ.

තොග හිඟය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම ශේෂයට සම්බන්ධ ඉතිහාසය පිළිබඳව සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන අතර ඒ පිළිබඳව සුදුසු පියවර ගැනීමට ද අපේක්ෂා කරයි.

(iv) • 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS) මුල්වරට අනුගත වීමට අනුකූලව, බොල් ණය බවට පත් විය හැකි ණය මත හානිකරණ සඳහා 100% කින් ප්‍රතිපාදන සලසා දීම අවශ්‍ය වේ. එබැවින් වසර දෙකකට වඩා අධික කාලයක් තිස්සේ පවතින බොල් ණය බවට පත් විය හැකි ණය සඳහා 100% කින් ප්‍රතිපාදන සලසා තිබේ.

- පුනරුත්ථාපන හා දමිළ කටයුතු අමාත්‍යාංශය - රු. 2,099,895.00

පුනරුත්ථාපන හා දමිළ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම මහතාට ඔහුගේ කාර්යාලය ස්ථාපනය කර ගත හැකිවන පරිදි, 2003 වර්ෂයේ දී කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ අංක 14 ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ගොඩනැගිල්ලේ කාර්යාලීය අවකාශය නිදහස් කර දීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සිදු විය. ඉන් අනතුරුව ගරු ඩග්ලස් දේවානන්ද මහතා මෙම අමාත්‍යධූරයට පත් කරන ලද අතර එම අමාත්‍යවරයා ද එම පරිශ්‍රයේම ඔහුගේ කාර්යාලය ස්ථාපනය කර ගන්නා ලදී. ඉන් අනතුරුව, පැවති රජය වෙනස් වීමත් සමඟ, ගරු ආචාර්ය ජයලත් ජයවර්ධන මැතිතුමා අමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබූ අතර අමාත්‍යාංශයෙන් වර්ග අඩියකට රු. 30.00 ක මාසික කුලියක් අය කිරීමට ද, මාසික විදුලි බිල්පත ගෙවීම අමාත්‍යාංශය වෙත පැවරීමට ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් භාවිත කරන ලද රු. 2,099,895.00 ක් වටිනා ඇතැම් ගෘහ භාණ්ඩ ද මෙම අමාත්‍යාංශයට භාර දී තිබුණි.

පසුව, මෙම අමාත්‍යාංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාලයෙන් ඉවත් කර ගන්නා අතර එසේ ස්ථාන මාරු කිරීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් තාවකාලිකව එම අමාත්‍යාංශයට නිදහස් කරන ලද ගෘහ භාණ්ඩ ද එම අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් තිබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් භාවිතයට ගෙන තාවකාලිකව එම අමාත්‍යාංශයට නිදහස් කරන ලද ගෘහ භාණ්ඩ සඳහා වන පිරිවැය හැර, මෙම කාලසීමාව සඳහා අදාළ වන කුළිය හා විදුලි බිල්පත් ගාස්තු අය කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් විය.

ලබා ගත හැකි වූ වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉහත අමාත්‍යාංශයෙන් එකී මුදල ආපසු ලබා ගැනීමට අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. කෙසේ වුවද, ඉහත දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ පැවති විවිධ රජයන් යටතේ අමාත්‍යාංශ නිලධාරීන් වෙනස්වීම හේතුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු මෙම මුදල ආපසු ලබා ගැනීමට ආයෝජන මණ්ඩලය අසමත් වී තිබුණි.

ව්‍යවසාය සංවර්ධන කාර්මික ප්‍රතිපත්ති සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය - රු.710,550.00

2001 වර්ෂයේදී, යටිතල පහසුකම් ආයෝජන කාර්යාංශයේ (BII) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාවිතා කරන ලද මෙම කාර්යාලීය අවකාශය එහි පැවති ගෘහ භාණ්ඩ හා උපකරණ ද සමඟ වරාය සංවර්ධන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය (PD & DS) වෙත භාර දෙන ලදී. මේ අන්දමින් භාර දුන් භාණ්ඩ තොගයේ වටිනාකම රු.710,550.00 ක් විය. වරාය සංවර්ධන හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යංශය මෙම වටිනාකම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වී සිටිය ද, මෙම වටිනාකම ප්‍රතිපූර්ණය කරන ලෙස ශ්‍රී ලංකා

ආයෝජන මණ්ඩලය නැවත නැවතත් ඉල්ලීම් කර තිබුණ ද, රු.710,550.00 ක් වූ මෙම මුදල මේ වන තුරු නිරවුල් කර නොමැත.

ඉහත සඳහන් මුදල 2002 වසරේ සිට 2011 වසර දක්වා ණය ගැති ගිණුමේ දක්වා තිබුණි. මෙම කාලසීමාව තුළ, විවිධ රජයන් යටතේ අවස්ථා කීපයකදීම අමාත්‍යධුරයේ වෙනස්කම් සිදු කිරීම හේතුකොටගෙන, එම අවධියේ මෙම ගනුදෙනුව අවසන් කිරීම පිළිබඳව වගකිව යුතු නිලධාරීහු මේ වන විට අමාත්‍යාංශ සේවයේ නිරතව නොසිටින බැවින්, එකී මුදල් ආපසු ලබා ගැනීම පිළිබඳව අපේක්ෂා තබා ගත නොහැකි වී ඇත.

ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, 27 වන මහළ - රු.2,447,534.00

ජනාධිපති ලේකම්වරයාගේ 2004 නොවැම්බර් 19 දිනැති ඉල්ලීම පරිදි, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ 27 වන මහළ උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී. ඒ අනුව, මෙම මහළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය පරිදි උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට අතුරු බදු පදනම යටතේ ලබා දෙන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත මාසික බදු කුලිය ගෙවීම තහවුරු කිරීම සඳහා එකී අමාත්‍යාංශය සමඟ බදු ගිවිසුමක් ද අත්සන් තබන ලදී.

2006 වර්ෂයේදී, අමාත්‍ය මණ්ඩලයේ වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව උසස් තාක්ෂණ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ නාමය හා එම අමාත්‍යධුරය වෙනස් කරන ලද අතර එම අමාත්‍යාංශය ව්‍යවසාය සංවර්ධන හා කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය (ED & IP) යන නාමයෙන් අමාත්‍යාංශයට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ව්‍යවසාය සංවර්ධන හා කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය (ED & IP) බදු කුලිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉල්ලීම් කරමින් යවන ලද ලිපිවලට ප්‍රතිචාර දක්වා නොතිබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දීර්ඝ කාලයක සිට ගෙවීමට ඉතිරිව තිබෙන මුදල් නිරවුල් කරන ලෙස වර්තමාන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ඉල්ලා සිටීමට කටයුතු කරන ලදී.

අමාත්‍යාංශ වෙතින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතුව තිබෙන ඉහත සඳහන් මුදල් ප්‍රමාණ ප්‍රතිපූර්ණය කරන ලෙස මහා භාණ්ඩාගාරය වෙත දැනුම් දෙනු ලැබිණි.

### 2.2.3 ගෙවීම පැහැර හැර ඇති එකතු කළ අගය මත බදු

2013 ජුනි 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ප්‍රතික්ෂේප කරන ලද යෙදවුම් මත අගය එකතු කළ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද තක්සේරු කිරීම මත පදනම් විය.

### 2.2.4 ආපසු ලබාදිය හැකි තැන්පතු

- හිරියාල වතුයායේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම (රු. 1,332,882)

ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD) මගින් ඉහත ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී.

වයඹ කලාප කාර්යාලයෙන් ලබාගත් ලේඛනවලට අනුව, නිදහස් කළ යුතු ඉතිරි මුදල රු. 663,517.35 ක් (එකතු කළ අගය මත බදු හැර) වේ.

වැඩ අවසන් කළ බවට ලබා දී ඇති අවසාන සහතිකය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලබාගෙන තිබුණි.

සිදු කරන ලද ගෙවීම්වලට අදාළ වන බදු ගණනය කිරීම සම්බන්ධයෙන් ආරවුලක් පවතින බැවින්, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය එම ආයතනයේ විගණන කමිටුවේ තීරණය දැනුම් දීමට එකඟ විය.

- මහනුවර නාගරික මධ්‍යස්ථානය (රු. 1,649,553)

  මහනුවර නාගරික මධ්‍යස්ථානය සංවර්ධනය කරනු ලබන සීමාසහිත ප්‍රොපටි ෆිනෑන්ස් සහ ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් කැන්ඩි (පුද්) සමාගම වෙත රඳවා ගත් මුදල නිදහස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

- ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 66 කට අදාළව රඳවාගත් මුදල් ප්‍රමාණ (රු.1,987,912)

  රඳවාගත් මුදල් නිදහස් කළ හැකි අවස්ථාවල කොන්ත්‍රාත්තුකරුවන්ට දැනුම් දී එසේ කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

  දීර්ඝ කාලයක් මුළුල්ලේ හිමිකම් ඉල්ලා නොමැති රඳවාගත් මුදල් සහ දෝෂ නිවැරදි නොකරන ලද කොන්ත්‍රාත්තුවලට සම්බන්ධ රඳවාගත් මුදල් ඇත්නම් ඒ ආකාරයෙන් රඳවාගත් මුදල් ප්‍රමාණ ආදායමට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

සාක්ෂි අමුණා ඇත. (1 වන ඇමුණුම)

**2.3 නීති, රීති, රෙගුලාසි, හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

(අ) <u>රියදුරු දීමනා</u>

- 2003 ජනවාරි 14 වන දින පැවැත් වූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 133 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, ආයෝජන මණ්ඩලය මගින් වාහන ලබා දී ඇති නිලධාරීන් සඳහා මසකට රු.15,000/- ක ගෙවීමක් කිරීමට තීරණය කරන ලදී.
- මෙම දීමනාව ලබා ගන්නා නිලධාරීන් වෙත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් රියදුරකු ලබා ගැනීමේ හිමිකම් ලබා දී නොමැත.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් රියදුරකු සේවයේ යෙදවීමට වඩා මෙම ක්‍රමය මූල්‍යමය හා පරිපාලනමය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පිරිවැය ඵලදායක වේ.

**(ආ)** අවශ්‍ය අනුමැතිය රහිතව සේවකයන් වෙත ගෙවීම් සිදු කිරීම.

(i) වෘත්තීය හා පශ්චාත් උපාධි දීමනා

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවයේ නිරතව සිටින වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය සඳහා මෙම ප්‍රතිලාභය ලබා දීමට ආයෝජන මණ්ඩලය තීරණය කරන ලදී.
- ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අංක E/5/GCEC/Misc හා 1991 නොවැම්බර් 1 දිනැති ලිපිය මගින් මේ සඳහා අනුමැතිය ලබා දී තිබේ.
- 1991.09.13 දින පැවති 217 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ සඳහා අනුමතිය ලබා දී තිබේ.
- 2004.06.27 දින පැවති 316 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, අවසන් වෘත්තීය දීමනාව සඳහා සංශෝධන සිදු කිරීම අවසන් කර තිබේ.

(ii) පැමිණීම සඳහා දිරි දීමනාව ගෙවීම සහ ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ලබා දීම. ▪ පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නියමවලට අනුව, සේවකයා කලට වේලාවට වැඩ කටයුතු කිරීම, ඔහුගේ/ඇයගේ නිපුණත්වය හා ආධ්‍යාත්මික ගති

ලක්ෂණ තක්සේරු කරන ප්‍රධාන කාර්යසාධන ගෙවීම් (KPP) යෝජනා ක්‍රමය මගින් 1990.11.06 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ හා 1996.11.08 දින ජනාධිපතිතුමියගේ ද අනුමතිය ලද පූර්ව පැමිණීමේ දිරි දීමනා යෝජනා ක්‍රමය ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. එකී ප්‍රධාන කාර්ය සාධන ගෙවීම් (KPP) යෝජනා ක්‍රමය 2013.10.29 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී.

- ප්‍රධාන කාර්යසාධන ගෙවීම් (KPP) ගණනය කිරීමේ ක්‍රමය 2013 වසරේදී නිර්මාණය කරන ලද පැමිණීමේ දිරි දීමනා ගෙවීමේ ක්‍රමයට වඩා වෙනස් වේ. තවද, ප්‍රධාන කාර්යසාධන ගෙවීම් (KPP) සඳහා ජීවන වියදම් දීමනාව හා අයවැය සහන දීමනාව ඇතුළත් කිරීමට ද අධ්‍යක්ෂ මණ්ඩලය 2013.10.29 දින අනුමතිය ලබා දී තිබේ. එයට අමතරව, 2014 වර්ෂයේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ රැකියා නියුක්තිය ඉහළ නැග තිබුණි. ඒ අනුව, 2014 වර්ෂයේදී ප්‍රධාන කාර්යසාධන ගෙවීම් සම්බන්ධ පිරිවැය වැඩි වී තිබුණි.

- ප්‍රධාන කාර්යසාධන ගෙවීම් (KPP) යෝජනා ක්‍රමය අනුමත කිරීම සඳහා 2014.06.03 දින පොදු ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

## 3. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

සටහන් කර ගන්නා ලදී.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාතික

(i) හා (ii) සටහන් කර ගන්නා ලදී.

#### 3.2.2 ගිණුම් විශ්ලේෂණය කිරීම

සටහන් කර ගන්නා ලදී.

#### 3.2.3 අපනයන සැකසුම් කලාප, කාර්මික උද්‍යාන හා කලාපීය කාර්යාල

(අ) ඉඩම්වලින් ලැබෙන ඍජු ආදායම් හා ආදායම් උත්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් සිදු කරන ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ආදායම යනාදී ආදායම් උත්පාදන කටයුතුවලට බරපතල බලපෑම් සිදුවන අධික පරිපාලන පිරිවැය මෙන්ම භූමි වත්කම ඌන උපයෝජනය කිරීම හේතුකොටගෙන වතු පිටිවල, මීරිගම හා කෑගල්ල අපනයන සැකසුම් කලාප අලාභ ලැබුව ද, කෑගල්ල අපනයන සැකසුම් කලාපය හැර අනෙකුත් කලාපවල අලාභය අවසාන වසර කීපය තුළ අඩු වී ඇති බව නිරීක්ෂණය කළ හැකි වේ. කෙසේ වුවද, කෑගල්ල අපනයන සැකසුම් කලාපයේ ඉඩම් අක්කර 12 කට ආසන්න ප්‍රමාණයක් නව ව්‍යාපෘති සඳහා විකුණා දැමීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකි වී තිබෙන අතර ආයෝජන මණ්ඩල සේවා ගාස්තු ආකාරයෙන් ව්‍යවසායවලින් උත්පාදනය කර ගැනීමට අපේක්ෂිත අදාළ ආදායම මගින් අලාභ ලැබීම තව දුරටත් අඩු කර ගැනීමට අනාගතයේදී හැකි වනු ඇත.

(ආ) සීතාවක අපනයන සැකසුම් කලාපයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාලය 2013 නොවැම්බර් මාසයේදී ජල ප්‍රතිකාරක කම්හලේ තුළු මං වළේ සවි කර තිබූ අඩු

ධාරිතාවකින් යුතු (පැයට ඝන මීටර් 132) ගිල්විය හැකි පොම්ප දෙකක් ඉහළ ධාරිතාවක් සපයන (පැයට ඝන මීටර් 550ක්) ගිල්විය හැකි පොම්ප දෙකක් මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙමගින්, 2014 වසර පුරා ව්‍යවසායයන් වෙත මාසිකව සපයනු ලබන ජලය ඒකක ප්‍රමාණය කැපී පෙනෙන පරිදි වැඩි කිරීමට අපට හැකියාව ලැබුණු අතර මෙමගින් ජලය සඳහා වූ ඉල්ලුම සපුරාලීමට හැකි විය. එයට අමතරව, සීතාවක අපනයන සැලසුම් කලාපයේ ව්‍යවසායවලට අයත් පුළුල් කරන ලද ව්‍යාපෘති කීපයක් හේතුවෙන් ජලය සඳහා වූ ඉල්ලුම ඉහළ ගොස් තිබුණි. එබැවින්, 2014 වසරේදී, බදුකරණයට පෙර ලාභය රු. මිලියන 3 කින් වැඩි වී තිබුණි.

(ඇ) සටහන් කර ගන්නා ලදී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) අනුමත කිරීම සංඛ්‍යාව හා අත්සන් තැබූ ගිවිසුම් සංඛ්‍යාව ආදි වශයෙන් සංඛ්‍යාත්මක වශයෙන් කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කිරීම සඳහා මිස 2013 වසර සමඟ වෙනුවට 2009 වසරට සාපේක්ෂව 2014 වසර සංසන්දනය කිරීමේ තාර්කිකභාවය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අවබෝධ කර ගත නොහැකිය.

ඒ අනුව, සමාලෝචන වර්ෂය සඳහා මෙන්ම පසුගිය වර්ෂ පහක කාලසීමාව තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වගන්තිය යටතේ ගිවිසුම් අත්සන් තැබූ, අවලංගු කළ, වසා දමන ලද හා තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති සංඛ්‍යාව පහත දක්වා ඇත.

| වසර | අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති [*] | ගිවිසුම් අත්සන් තැබූ ව්‍යාපෘති [*] | වසර තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති [*] | අවලංගු වූ ව්‍යාපෘති [**] | වසා දැමූ ව්‍යාපෘති [**] | තාවකාලිකව අත්හිටවූ ව්‍යාපෘති [**] |
|---|---|---|---|---|---|---|
| 2009 | 384 | 182 | 134 | 93 | 12 | 4 |
| 2010 | 364 | 270 | 144 | 124 | 28 | 10 |
| 2011 | 160 | 165 | 99 | 47 | 7 | 4 |
| 2012 | 238 | 163 | 98 | 79 | 26 | 9 |
| 2013 | 176 | 145 | 93 | 120 | 38 | 7 |
| 2014 | 170 | 144 | 66 | 50 | 64 | 5 |
| (2014 වසර සඳහා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා) | (181) | (148) | (87) | (52) | (68) | (5) |
| **Total** | **1492** | **1069** | **634** | **513** | **175** | **39** |

[*] පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම් ද ඇතුලත්ව

[**] ව්‍යාපෘතිවල දැනට පවත්නා තත්වයට අනුව (පුළුල් කිරීම් හැර)

(i) මේ සඳහා විද්‍යාත්මක හේතුවක් ඉදිරිපත් කිරීමට අප අසමත් වුවද, 2009 වසරේදී යුද්ධය අවසන් වීමෙන් අනතුරුව අනුමැති සංඛ්‍යාවේ හා අත්සත් තබන ලද ගිවිසුම් සංඛ්‍යාවේ වැඩි වීමක් නිරීක්ෂණය කළ හැකි වූ බව අපගේ අදහසයි. එසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආධිපත්‍ය යටතේ දිරිගැන්වීම් ලබාදීම මැඬ පවත්වමින්

දේශීය ආදායම් පනත සමග ඒකාබද්ධ කිරීමත් සමග මෙම නැඹුරුතාව ප්‍රතිවර්ත වූ බවක් නිරීක්ෂණය කළ හැකි විය.

2015 ජුනි 26 වන අද දිනයේ මෙන්ම 2014 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද සංඛ්‍යාත්මක දත්තවලට අනුව අනුමතීන් සංඛ්‍යාව 181 සහ අත්සන් තබන ලද ගිවිසුම් සංඛ්‍යාව 148 වශයෙන් පැවතුණි. 2014 වර්ෂයේදී දේශීය ආදායම් සංශෝධනය මගින් අනුමත කරන ලද කඩඉම් දින ප්‍රකාශයට පත් කිරීම තුළින් ආයෝජක ප්‍රජාව අතර අස්ථාවරභාවයක් ජනිත කරවීම මධ්‍යයේ පවා 2013 වර්ෂයේ සංඛ්‍යා ලේඛනවලට සාපේක්ෂව, ව්‍යාපෘති අනුමත කිරීම්වල 6% ක වර්ධනයක් ද, ගිවිසුම් අත්සන් තබන ලද ව්‍යාපෘති සංඛ්‍යාවේ 3% ක වර්ධනයක් ද නිරීක්ෂණය කළ හැකි වේ.

රජයේ විගණන වාර්තා සඳහා අප ලබා දුන් පූර්ව ප්‍රතිචාරවලදී පවා අප නැවත නැවතත් අවධාරණය කරන ලද්දේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ ගුණාත්මක, තිරසාර හා ඉහළ වටිනාකමකින් යුත් විදේශ සෘජු ආයෝජන අප රට වෙත ආකර්ෂණය කර ගැනීම බවයි.

එම නිසා, අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හෝ අත්සන් තබන ලද ගිවිසුම් සංඛ්‍යාව පිළිබඳ හුදු ගණන් ගැනීමක් මගින් ආර්ථික සංවර්ධනයට මඟ පෑදීමක් සිදු නොවේ. 2013 වර්ෂයේ අත්සන් තබන ලද ගිවිසුම් සංඛ්‍යාවට වඩා 2014 වර්ෂයේ අත්සන් තබන ලද ගිවිසුම් සංඛ්‍යාව ඉහළ ගොස් තිබුණ ද, 2013 වර්ෂයේ ඉතා ඉහළ ආයෝජන වටිනාකමක් සහිත වූ වරාය නගර ව්‍යාපෘතිය වැනි ප්‍රධානතම ව්‍යාපෘති අත්සන් තැබීම හේතුවෙන් 2013 වසරේ තක්සේරු කළ ආයෝජනය ඉතා ඉහළය.

(ii) අද දිනට (2015 ජුනි 26 වන දා) 2014 වසර සඳහා යාවත්කාලීන කරන ලද වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව 66 නොව 87 කි. 2013 වසරේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා සංසන්දනය කිරීමේ දී, 2014 වසරේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවේ 6% ක මඳ අඩු වීමක් නිරීක්ෂණය කළ හැකි වේ. මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර, භූමිය පිළිබඳව නිෂ්කාෂණ, පාරිසරික නිෂ්කාෂණ, නාගරික සංවර්ධන අධිකාරිය හා පළාත් පාලන ආයතනවල නිෂ්කාෂණ වැනි අනුමත කිරීම් රාශියක් ආයෝජකයා විසින් ලබාගත යුතු වන බැවින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පාලනය කළ නොහැකි විවිධ හේතු මෙවැනි අඩු වීම් සඳහා බලපාන බව සඳහන් කළ යුතුය.

(iii) මෙම අවස්ථාවේදී, රජයේ විගණනය 2013 වසරේ සංඛ්‍යාලේඛන සමඟ 2014 වසරේ සංඛ්‍යාලේඛන සසඳනු ලැබීය. වෙනත් අවස්ථාවල මෙන් නොව, 2009 වසර සමඟ ද එම සංසන්දනය කිරීම සිදු කර තිබුණි.

පසුගිය වසරේ විගණන විමසුමට ප්‍රතිචාර වශයෙන් දැනුම් දී ඇති පරිදි, 2013 වසර තුළ, මුදල් අමාත්‍යාංශයේ උපදෙස්වලට අනුව ක්‍රියාත්මක කර නොමැති ව්‍යාපෘති සහ දීර්ඝ කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව, එවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් අත්සන් තබන ලද ගිවිසුම් අවලංගු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2013 වර්ෂයේදී, අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි වූ අගයක් දක්වයි.

ගෙවිය යුතු මුදල් ආදිය ආපසු අයකර ගැනීම සඳහා අදාළ කටයුතු සිදු කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘති අවලංගු කිරීමට පියවර ගන්නා ලදී

(ආ) විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම.

(i) 2009 -2014 දක්වා කාල සීමාව තුළ ආකර්ෂණය කරගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ පහත දක්වා ඇත.

| අංශය | 2014 රු. මිලියන | 2013 රු. මිලියන | 2012 රු. මිලියන | 2011 රු. මිලියන | 2010 රු. මිලියන | 2009 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන | 333.899 | 359.765 | 307.655 | 322.418 | 159.653 | 164.470 |
| කෘෂි කර්මාන්තය | 5.719 | 8.473 | 7.169 | 17.971 | 6.448 | 3.689 |
| සේවා | 506.340 | 236.342 | 426.736 | 269.143 | 29.476 | 52.555 |
| යටිතල පහසුකම් | 682.451 | 786.825 | 596.595 | 456.527 | 320.719 | 381.536 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යාපෘති | 87.849 | | | | | |
| **එකතුව** | **1,616.258** | **1,391.405** | **1,338.155** | **1,066.059** | **516.296** | **602.250** |

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙම සංඛ්‍යාලේඛන ඇමෙරිකන් ඩොලර් මිලියනවලින් දක්වා ඇති බැවින්, විදේශ සෘජු ආයෝජන රුපියල් මිලියනවලින් දැක්වීම බරපතල වරදකි.

- විදේශීය හිමිකම් සහිත ව්‍යාපෘති මත පදනම් වීමේදී, යම් වර්ෂයකදී විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය වෙනස් වේ.

උදාහරණ:- 2011 හා 2013 වසර - කෘෂිකර්මාන්ත අංශයේ ප්‍රධාන ආයෝජකයා වන්නේ ඩෝල් ලංකා (පුද්) සමාගමයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මනා කාර්යසාධනයක් පිළිඹිබු කරන අතර මෙය 2009 වසර සමඟ සන්සන්දනය කළහොත්, 168% ක වැඩිවීමක් දක්වයි.

2013 වසර හැරුණු විට 2014 වසරේ සංඛ්‍යාලේඛන වෙනත් සියලු වසරවලට වඩා ඉහළ අගයක් වාර්තා කර ඇත.

එසේ වුව ද, 2009 වසර සමඟ සැසඳීමේදී, එය 104% ක වැඩි වීමක් වාර්තා කරයි.

(ii) 2009-2013 කාලසීමාව තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආකර්ෂණය කළ උපලබ්ධිගත විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන ප්‍රමාණ පහත වගුවේ දක්වා තිබේ.

| වසර | වි.සෘ.ආ. (රු.මිලියන) | දේශීය ආයෝජන (රු.මිලියන) |
|---|---|---|
| 2009 | 495,506 | 278,762 |
| 2010 | 536,140 | 331,849 |
| 2011 | 655,513 | 368,587 |
| 2012 | 828,005 | 452,154 |
| 2013 | 956,183 | 555,025 |

2014 වර්ෂයේ උපලබ්ධිගත විදේශ සෘජු ආයෝජන හා දේශීය ආයෝජන වාර්තා කරන දිනට කළමනාකරණ තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කර නොමැත.

මෙම සංඛ්‍යාලේඛන වාර්ෂික සංඛ්‍යාලේඛන නොවේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රජයේ විගණනය සඳහා සමුච්චිත සංඛ්‍යා ඉදිරිපත් කරන ලදී. ඊළඟ වසරේ 1 වන කාර්තුව තුළ සිදු කරන ලද සමීක්ෂණයක් තුළින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය උපලබ්ධිගත ආයෝජන සංඛ්‍යාලේඛන (උපලබ්ධිගත විදේශ සෘජු ආයෝජන නොවේ) ලබා ගන්නා ලදී. ජනවාරි මාසයේ පවත්වනු ලැබූ හෙයින් සමීක්ෂණයේ දී ලැබුණු ප්‍රතිචාර ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් සිදු වූ අතර මෙම වසරේ ජූලි මාසය අවසානයේදී මෙම සමීක්ෂණ ප්‍රතිචාර ලබා ගත හැකි විය.

(ඇ) ආනයන පිරිවැය හා අපනයන ඉපැයීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායවල ආනයන හා අපනයන කාර්යසාධනයේ වැඩිවීම් හා අඩුවීම් පිළිබඳ නිර්ණායක ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පාලනයෙන් පරිබාහිරව පවතින බව සටහන් කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

## 4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

(අ) ආයෝජන ප්‍රවර්ධනය යටතේ වැය වූ වියදම්.

(i) දේශීය හා විදේශීය ආයෝජකයන් සඳහා හම්බන්තොට ප්‍රදේශයේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමේ අරමුණින් "Hambantota Conclave" සංවිධානය කරන ලදී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවතින ආයෝජන අවස්ථා පිළිබඳව ප්‍රදර්ශනය කිරීම් හා දිවයිනේ ආයෝජන සඳහා හිතකර වාතාවරණය පිළිබඳ ඉදිරිපත් කිරීම් හා දේශන පැවැත්වීම මෙම වැඩසටහනට ඇතුළත් විය. නාගරික සංවර්ධන අධිකාරිය, මහ බැංකුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජනාධිපති ලේකම් කාර්යාලය හා සීමාසහිත ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වැනි ආයතනවල රාජ්‍ය නිලධාරීන් මෙන්ම සංචාරක කර්මාන්තය, ගුදම්, තොරතුරු තාක්ෂණය හා සැපයුම් සේවා වැනි අංශවල ප්‍රධාන පෙළේ ව්‍යාපෘතිවල නිරතව සිටින විදේශීය හා දේශීය පුද්ගලික ආයෝජකයෝ ද මෙම මෙම වැඩසටහනේ දී මෙම ඉදිරිපත් කිරීම් හා සභාව අමතා දේශන සිදු කළහ. මැලේසියාවේ හිටපු අග්‍රාමාත්‍ය ආචාර්ය මහාතීර් මොහමඩ් මැතිතුමා විසින් මෙම සභාව අමතා ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා සීමාසහිත ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, මහ බැංකුව හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වැනි අනෙකුත් පාර්ශ්වකාර රාජ්‍ය නියෝජිතායතනවල සමායෝජිත ප්‍රයත්නයන් තුළින් සංවිධානය කර පවත්වන ලද "Hambantota Conclave" උළෙලේ උත්සව අංග කළමනාකරණය හා සැපයුම් සේවා සංවිධානය කිරීමට අදාළව පුද්ගලික සමාගම් දෙකක් සඳහා එකී මුදල ගෙවා තිබුණි.

ඒ අනුව, නොවැම්බර් 20 වනදා පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද පරිදි රු.මිලියන 12.5 ක මූල්‍ය දායකත්වයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මෙම උත්සවය සඳහා ලබා දෙන ලදී.

(ii) මෙම ප්‍රදර්ශනය පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළු ක්‍රියාවලියේ කොටසක් වන අතර එය කෝට්ටේ ජනකලා කේන්ද්‍රයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා පවතින විවිධ අංශ විදේශීය නරඹන්නන් හා මහජනතාව වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීම මෙම ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණ වශයෙන් සඳහන් කළ හැකි වේ.

මෙම ප්‍රදර්ශනයේදී ගුණාත්මක අපනයන නිෂ්පාදන හා සේවා පරාසයක් සමස්තයක් වශයෙන් එකම වේදිකාවක් මත ප්‍රදර්ශනයට තබා තිබුණි. ශ්‍රී ලංකාවේ අපනයන පරාසය ප්‍රදර්ශනය කිරීම සඳහා 300 කට වඩා අධික වෙළඳ ප්‍රදර්ශන කුටි සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබුණි. මූලික කෘෂිකාර්මික නිෂ්පාදනවල සිට පිරිසැකසූ ආහාර දක්වාද, වටිනාකම එකතු කළ කර්මාන්තශාලාවල නිෂ්පාදනය කළ නිෂ්පාදනවල සිට සුවිශේෂී වෙළඳපොළ නිෂ්පාදන දක්වා ද වූ ඉතා පුළුල් පරාසයකට අයත් නිෂ්පාදන/අංශ අන්තර්ජාතික වෙළඳපොළ වෙත පිරි නමා තිබුණි.

තේ, ඇඟලුම්, රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ව්‍යාපාරික කාර්යාවලි බැහැරින් ඉටු කරවා ගැනීම, ආහාර හා වෙනත් බීම වර්ග, කුළු බඩු වර්ග සහ ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය හා ධීවර නිෂ්පාදනය, බෝට්ටු සැකසීම හා වෘත්තීමය සේවා ද ඇතුළත් වන පරිදි ප්‍රධාන නිෂ්පාදන ක්ෂේත්‍ර මෙහි දී ප්‍රදර්ශනය කරන ලදී.

මෙය ජාතික උත්සව අවස්ථාවක් වූ අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, තේ මණ්ඩලය වැනි සියළුම ප්‍රධාන පෙළේ රාජ්‍ය නියෝජිතායතන මෙන්ම මෙම උත්සවය සාර්ථක කර ගැනීම සඳහා මූල්‍ය දායකත්වය ලබාදුන් පුද්ගලික අංශයේ වෙළඳ ව්‍යාපාර ද මෙම උත්සව අවස්ථාවට සහභාගී විය.

ඒ අනුව, 2013 නොවැම්බර් 29 වන දා පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත වූ පරිදි රු. මිලියන 10 ක මුදලක් ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මෙම උළෙල වෙනුවෙන් ලබා දී තිබුණි.

(iii) ගරු ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දක්වා ඇති පරිදි පුවත්පත් දැන්වීම් දෙකක් පළ කරන ලෙස ඉල්ලීමක් කර තිබුණි.

- අතිගරු ජනාධිපතිතුමා විසින් වසර නවයක ධූර කාලය තුළ ලබා ගත් ජයග්‍රහණ සැමරීමේ අතිරේකය
  සම්පූර්ණ පිටුවේ පුවත්පත් දැන්වීම් පහක් (5)
  සම්පූර්ණ පිටුවේ පුවත්පත් දැන්වීම් හයක් (6)
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය - සම්පූර්ණ පිටුවේ පුවත්පත් දැන්වීම් හයක් (06)

මෙම පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා අමාත්‍යවරයාගේ මෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ද අනුමතිය ලැබී තිබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමතිය ලබාගෙන තිබුණු අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ද මේ සඳහා ලැබී තිබුණි.

(iv) විදේශ ඍජු ආයෝජන උතුරු හා නැගෙනහිර පළාත්වලට ලැබීම හේතුකොටගෙන එම පළාත් දෙකේ ඇති වී ඇති සංවර්ධනය පිළිබඳව අනාවරණය කරමින් කෙටි චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු ආයතනයක් හඳුනා ගන්නා ලෙස එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය අංශයෙන් ඉල්ලීමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සීමාසහිත කාල රාමුවක් ලබාදී තිබූ බැවින් විවෘත ලංසු කැඳවීමේ ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමට මාධ්‍ය අංශයට ප්‍රමාණවත් කාලයක් නොමැති විය. කෙසේ වුවද, මෙයට පෙර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා ප්‍රවර්ධනාත්මක වීඩියෝ චිත්‍රපටියක් නිෂ්පාදනය කරමින් දේශීය හා විදේශීය ආයෝජක ප්‍රජාවේ ඉහළම ඇගයීමට ලක් වූ Through the Lens සමාගම ඇතුළු ප්‍රමුඛ පෙළේ වීඩියෝ චිත්‍රපට නිෂ්පාදන සමාගම් තුනකින් තරඟකාරී මිල ගණන් කැඳවා තිබුණි. මෙම මිල ගණන් තුන (03) කැඳවීමේදී, Through the Lens සමාගම රු. මිලියන 3.3 ක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාට රු. මිලියන 3.3 ක් වූ අවම පිරිවැය රු. මිලියන 2.2 දක්වා තවදුරටත් අඩු කර ගැනීමට අවශ්‍ය වූ අතර Through the Lens සමාගම එම අඩු පිරිවැයට මෙම චිත්‍රපටය නිෂ්පාදනය කිරීමට එකඟත්වය ප්‍රකාශ කරනු ලැබීය. පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා ආයෝජන මගින් ඉටු කළ හැකි කාර්යභාරය නිරූපණය කිරීම මෙම චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමේ අරමුණ විය. දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානයේ (LTTE) කලින් සිටි සටන්කරුවන් ඇතුළු උතුරු හා නැගෙනහිර පළාත්වල තරුණ තරුණියන් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ප්‍රමුඛ පෙළේ ඇඟලුම් අපනයන කරුවන් යටතේ කිලිනොච්චියේ ස්ථාපනය කරන ලද ඇඟලුම් කර්මාන්තශාලාවල වර්තමානයේ සේවයේ නිරත වන බැවින් ඇතැම් ප්‍රමුඛ පෙළේ ඇඟළුම් අපනයනකරුවෝ ද මෙම චිත්‍රපටය නිෂ්පාදනය කිරීම සඳහා ඔවුන්ගේ සහාය ලබා දුන්හ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් මෙම චිත්‍රපටියේ එක් කොටසක් ප්‍රදර්ශනය කරන ලදී.

යාපනය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය හා මඩකලපුව වැනි ප්‍රදේශවල විවිධ ස්ථානවලදී දින පහක් (05) පුරා මෙම චිත්‍රපටියේ නිෂ්පාදන කටයුතු සිදු කරන ලදී.

අවශ්‍ය අවස්ථාවල දී, මෙම චිත්‍රපටියේ ඇතැම් සංස්කරණ සිදු කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මෙම වීඩියෝ චිත්‍රපටිය නැවත නැවතත් භාවිත කළ හැකි වේ. එවකට සිටි අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම චිත්‍රපටිය සඳහා ඔවුන්ගේ අනුමතිය ලබා දී තිබුණි.

(ආ) සූරියවැව ප්‍රදේශයේදී නිවාස අහිමි වූ පුද්ගලයන් නැවත පදිංචි කරවීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) මගින් නිවාස ඉදි කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අරමුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2013.01.22 දින පවත්වන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද එම තීරණය ඔබව දැනුවත් කිරීම සඳහා අදාළ රැස්වීම් වාර්තාවේ සඳහන් වී ඇති පරිද්දෙන් පහත දක්වා ඇත.

"රජය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නොමිලේ ලබා දී ඇති සූරියවැව ප්‍රදේශයේ දැනට පදිංචි වී සිටින පවුල් වෙනත් ස්ථානවල නැවතත් පදිංචි කිරීම අවශ්‍ය වී ඇති බව සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව *(SLLRDC)* මගින් පවුල් නැවත පදිංචි කරවීම සඳහා නිවාස ඉදි කිරීමට එකඟත්වය පළ කරනු ලැබීය".

"අදාළ ඉඩම රජය විසින් නොමිලේ ලබා දී ඇති බැවින් මෙම නැවත පදිංචි කිරීම තුළින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ද ප්‍රතිලාභ සැලසෙන බැවින්, සූරියවැව ප්‍රදේශයේ පදිංචිව සිටින පවුල් නැවත පදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව *(SLLRDC)* මගින් නිවාස ඉදි කිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රවාහ පදනම මත අරමුදල් නිදහස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමතිය ලබා දෙන ලදී"

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මෙම තීරණය ගන්නා අවස්ථාව වන විට ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) මගින් නිවාස ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර එම කටයුතු අඛණ්ඩව සිදු කරමින් පැවතුණි. නිවාස ඉදි කළ යුතු ස්ථානය තීරණය කිරීම මෙන්ම නිවාස සඳහා සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි වී නොතිබුණි.

හෙක්ටයාර් 72.8904 ක විශාලත්වයක් සහිත ඉඩමේ කොටසක නිවාස 15ක් ඉදි කර තිබුණ අතර නිවාස ඉදිකර තිබූ සමස්ත භූමියේ විශාලත්වය හෙක්ටයාර් 0.73 ක් විය.

(i2013.01.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයට අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නොමිලේ ඉඩමක් ලැබී ඇති බැවින් පවුල් නැවත පදිංචි කිරීම තුළින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රතිලාභයක් ලබා ගත හැකි බව සඳහන් කර තිබේ.

සූරියවැව ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නොමිලේ පවරන ලද ඉඩමේ සම්පූර්ණ විශාලත්වය හෙක්ටයාර් 177.29 ක් පමණ වන බව ද සඳහන් කළ යුතු වන්නේය. රජය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරන ලද ඉඩමෙන් හෙක්ටයාර් 18.77 ක විශාලත්වයක් සහිත ඉඩමක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරන ලදී. කිසිදු අයකිරීමකින් තොරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඉඩමක් ලබා දීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකීමකින් බැඳී ඇති බැවින් ප්‍රවේශ මාර්ගය සහ වෙනත් ප්‍රදේශ කිසිදු අය කිරීමකින් තොරව ලබා දීම සඳහා පවුල් නැවත පදිංචි කිරීමේ වගකීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැවරී ඇත.

(ii) නැවත පදිංචි කළ යුතු පාර්ශ්වයන් හඳුනාගැනීම ප්‍රාදේශීය ලේකම් හා දේශපාලන බලධාරීන් විසින් ඒකාබද්ධව සිදු කර ඇත. 2014.01.03 දින එළැඹුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, නිවාස ඉදි කරන ලද ඉඩම්වල අයිතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැවරිය යුතු වූ බැවින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) මගින් ඉදි කිරීම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ඒවා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන ලදී. ඒ අනුව, දේශපාලන බලධාරීන්ගේ සමායෝජනයෙන් මෙම නිවාස අදාළ පුද්ගලයන් වෙත භාර දෙන ලදී.

කෙසේ වුව ද, ප්‍රාදේශීය ලේකම්වරයාගේ 2015.02.11 දිනැති ලිපිය අනුව, නිවාස ලබා ගැනීම සඳහා පාර්ශ්වයන් 10 ක් පමණක් සුදුසුකම් ලබා ඇති බවත්, එබැවින් නිවාස 05 ක් නැවතත් ආපසු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා ගන්නා ලෙසත් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබුණි.

ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මේ වන තෙක් පහත දක්වා ඇති පරිදි කටයුතු කර ඇත.

(අ) <u>නිවාස අංක 15</u>

ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) මගින් එහි ස්ථානීය කාර්යාලය ලෙස භාවිත කරයි.

මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාරදෙන ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට (SLLRDC) 2015.04.03 දිනැතිව ලිපියක් යවා ඇත.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ (SLLRDC) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශනවලට අනුව තීරණයක් ගන්නා බව සඳහන් කරමින් 2015.03.16 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (LLRDC) එම ලිපිය සඳහා පිළිතුරු එවා ඇත.

2015.06.05 වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලබා දෙන ලෙස දන්වා 2015.05.21 දින සිහි කැඳවීමක් යවා ඇත.

2015.06.03 දින මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන ලදී.

(ආ) <u>අංක 11 දරන නිවස</u>

මෙම නිවසේ පදිංචි වී සිටි පදිංචිකරු වෙත 2015.03.04 දිනැති ලිපිය යවනු ලැබූ අතර මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන ලෙස එම ලිපිය මගින් ඉල්ලා සිටින ලදී.

මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාරදෙන ලෙස ඉල්ලා සිටිමින් 2015.05.15 දිනැතිව සිහිකැඳවීමක් ද යවන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (තාක්ෂණ සේවා) මෙම පදිංචිකරුව දුරකථනය මගින් සම්බන්ධ කර ගැනීමට සමත් වූ අතර මෙම පදිංචිකරු ප්‍රතිචාර දැක්වීම සඳහා කාලය ඉල්ලා සිටින ලදී. මේ සම්බන්ධ කරුණු පිළිබඳව මේ වන විට පසු විපරම් කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) <u>අංක 12 දරන නිවස</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නිවස භාර දෙන ලෙස ඉල්ලා මෙම නිවසේ පදිංචිකරුට 2015.02.26 දිනැතිව ලිපියක් යවන ලදී.

එම ලිපිය 2015.03.03 දින නිවසේ පදිංචිකරුට භාර දෙන ලදී.

2015.04.24 දින වන විට මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන ලෙස ඉල්ලමින් 2015.03.30 දින සිහිකැඳවීමක් යවන ලද අතර එම සිහිකැඳවීම 2015.05.11 දින නිවසේ පදිංචිකරුට භාර දෙන ලදී.

ඉහත පාර්ශ්වය නිවස ආපසු භාර දීමට අසමත් වූ බැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා (හම්බන්තොට) සූරියවැව පොලිස් ස්ථානයේ 2015.07.07 දින පැමිණිල්ලක් ගොනු කරනු ලැබීය.

(ඈ) <u>අංක 13 දරන නිවස</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නිවස භාරදෙන ලෙස ඉල්ලා මෙම නිවසේ පදිංචිකරුට 2015.02.26 දිනැතිව ලිපියක් යවන ලදී.

එම ලිපිය 2015.03.03 දින නිවසේ පදිංචිකරුට භාර දෙන ලදී.

2015.04.24 දින වන විට මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන

ලෙස ඉල්ලමින් 2015.03.30 දිනැතිව සිහිකැඳවීමක් යවන ලද අතර එය 2015.04.03 දින නිවසේ පදිංචිකරුට භාර දෙන ලදී.

ඉහත පාර්ශ්වය නිවස ආපසු භාර දීමට අසමත් වූ බැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (හම්බන්තොට) සූරියවැව පොලිස් ස්ථානයේ 2015.07.07 දින පැමිණිල්ලක් ගොනු කරන ලදී.

(ඉ) <u>අංක 14 දරන නිවස</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නිවස භාරදෙන ලෙස ඉල්ලා සිටිමින් මෙම නිවසේ පදිංචිකරුට 2015.02.26 දිනැතිව ලිපියක් යවන ලදී.

එම ලිපිය නිවසේ පදිංචිකරුට 2015.03.18 දින භාර දෙන ලදී.

2015.04.24 දින වන විට මෙම නිවස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාර දෙන ලෙස ඉල්ලා සිටිමින් 2015.03.30 දිනැතිව සිහිකැඳවීමක් යවන ලද අතර එය 2015.04.03 දින නිවසේ පදිංචිකරුට භාර දෙන ලදී.

ඉහත පාර්ශ්වය නිවස ආපසු භාර දීමට අසමත් වූ බැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (හම්බන්තොට) සූරියවැව පොලිස් ස්ථානයේ දී 2015.07.07 දින පැමිණිල්ලක් ගොනු කරන ලදී.

(iii) 2014.01.03 දින අමාත්‍ය මණ්ඩලය මගින් ලබා දෙන ලද අනුමතිය පරිදි, හෙක්ටයාර් 72.890ක විශාලත්වයක් සහිත ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරනු ලබන අතර මෙම ඉඩම් පැවරීමට අදාළ ලේඛන මේ වන විට ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයේ පවතී. ජනාධිපති ලේකම් කාර්යාලයට මෙම ලේඛන ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශය ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුව ඇත.

## 4.3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ)
- 2011.09.06 දිනැති විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති) මගින් විධායක අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත යැවූ ලිඛිත අභ්‍යන්තර පණිවුඩය මගින් රු.2,899,062.20 ක් වූ කළමනාකරණ ගාස්තුව භාර ගත් බව සැලකිය හැකිය.
- 2006 අප්‍රේල් 10 දින පැවැත් වූ ආයෝජන සඳහා පහසුකම් සැලසීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණයට අනුකූල වන පරිදි විශේෂ ආර්ථික කලාප (SEZ) ඉදිකිරීමේ අරමුණින් මාතර ගොඩගම ප්‍රදේශයේ ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා වූ මූලික වියදම් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රු. මිලියන 15 ක මුදලක් අංක 869137 හා 2006 ජුනි 07 දිනැති චෙක්පත මගින් නිදහස් කරන ලදී.
- 2008 ජනවාරි 10 දින පැවැත්වූ ආයෝජන සඳහා පහසුකම් සැලසීම (CSIF) පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ දී ලබා දෙන ලද නියෝගවලට අනුව, කාර්මික සැකසුම් කලාපය සඳහා යෝජිත ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නවතා දමන ලදී.
- තුල්හිරිය කාබුල් ලංකා ඉඩම, රෙජිඩාලේ වතුයාය, කැස්බෑව හා ගොඩගම ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කළමනාකරණ ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.2,899,062.20 ක මුදලක් රඳවා තබා ගන්නා බව නාගරික සංවර්ධන අධිකාරිය 2015.09.09 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබේ.
- කෙසේ වුවද, උසස් අධ්‍යාපන හා ආයෝජන කලාපයක් සඳහා එම ඉඩම අත්පත් කර ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බලන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නාගරික සංවර්ධන අධිකාරියෙන් 2012 වසරේදී නැවත වරක් (2012.01.30) ඉල්ලා සිටින ලදී.
- ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා එකී ඉඩමේ තක්සේරුකරණයට අනුව රු. මිලියන 830ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන ලෙස 2013.03.10 දිනැති ලිපිය මගින් නාගරික සංවර්ධන අධිකාරිය දැනුම් දී තිබුණි.

- මෙම ඉඩමේ වටිනාකම සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම හා දක්ෂිණ අධිවේගී මාර්ගය මගින් පනවන ලද සීමා කිරීම් හේතුවෙන් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නවතා දමන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2013.03.10 දිනැති ලිපිය මගින් නාගරික සංවර්ධන අධිකාරියට දැනුම් දුන් අතර ඉතිරි මුදල වූ රු. මිලියන 10,100,938.00 නිරවුල් කරන ලෙස ද නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටින ලදී.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු මුදල වන රු. මිලියන 10,100,938.00 නිරවුල් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් නාගරික සංවර්ධන අධිකාරියට 2015.06.08 දින සිහි කැඳවීමක් යවන ලදී.
- 2012 වර්ෂයේදී අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දක්වන ලද සැලකිල්ල මෙම ඉතිරි මුදල් නැවත ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් සිදු වූ ප්‍රමාදය සඳහා එක් හේතුවක් විය.

(ආ) ආයෝජක සේවා (IS) අංශය සර් බාරොන් ජයතිලක මාවත ගොඩනැගිල්ලේ (SBJM) හි පිහිටා ඇති අතර සියලුම කාර්යාල එම ගොඩනැගිල්ලෙන් ඉවත්කර ගැනීමෙන් අනතුරුව පැරණි සර් බාරොන් ජයතිලක මාවත ගොඩනැගිල්ල (SBJM) අලුත්වැඩියා කිරීමට තීරණය කරන ලදී. එබැවින්, මෙම ආයෝජක සේවා (IS) අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් 06 වන මහලේ කොටසකට රැගෙන යන ලදී. කෙසේ වුවද, ආයෝජක සේවා (IS) අංශයේ ගොනු කිරීමේ මැදිරිය ස්ථාපනය කිරීම සඳහා 06 වන මහලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව අනාවරණය විය. ආයෝජක සේවා (IS) අංශයේ එදිනෙදා කටයුතු සිදු කිරීම සඳහා ගොනු කිරීමේ මැදිරිය ආයෝජක සේවා (IS) අංශයට සමීපව පිහිටා තිබිය යුතුය. එම අවස්ථාව වන විට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් වූ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් නවය (09) ම සම්පූර්ණයෙන්ම පිරී තිබුණ බැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය මගින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහළක් වාර්ෂික කුළී පදනම මත ලබා ගැනීමට තීරණය කරන ලදී.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ බටහිර කුළුණේ 12 වන මහලේ ගරු ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයාගේ (නැසී ගිය මනෝ විජේරත්න මැතිතුමාගේ) කාර්යාලය ඉදි කර තිබුණි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 1996 නොවැම්බර් 04 දින ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ බටහිර කුළුණේ 12 වන මහල සම්බන්ධයෙන් ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පීඑල්සී (ORCL) සමඟ බදු ගිවිසුමක් අත්සන් තැබූ අතර මුල් තැන්පතුව ලෙස සහ පසුව අළුත් කරන ලද තැන්පතු මුදල් වශයෙන් රු. 2,637,240/- ක් ගෙවා තිබුණි.

2010 වසරේ සිදු කරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් අනතුරුව, අමාත්‍යවරයාගේ කාර්යාලය එක්වරම 12 වන මහළෙන් ඉවත් කර ගන්නා ලද අතර එබැවින්, ආරක්ෂක තැන්පතුව වශයෙන් තැන්පත් කළ රු.1,303,020.00 ක මුදලක් ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පීඑල්සී (ORCL) ආයතනය සතු කර ගන්නා ලදී.

2010 ජූනි මාසයේ දී එම කාර්යාල පරිශ්‍රය ඉහත සමාගමට භාර දෙනු ලැබුවත්, 2013 මැයි මාසය වනතුරුත් එසේ තැන්පත් කරන ලද මුදල ආපසු ලබා ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අසමත් විය. එසේ වුවත්, ආයෝජන මණ්ඩලයේ මූල්‍ය අංශය සහ නීති අංශය ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පීඑල්සී (ORCL) ආයතනයෙන් එම මුදල ආපසු ලබා ගැනීමට අඛණ්ඩ උත්සාහයක නිරත විය.

ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත්ව පැවති මහල්වල විද්‍යුත් සහ අනෙකුත් නඩත්තු කටයුතු හේතුවෙන් සිදු කළ යුතු ගෙවීම් සඳහා එම තැන්පතු මුදල හිලව් කළ බව ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පීඑල්සී (ORCL) ආයතනය සමඟ අඛණ්ඩව සාකච්ඡා පැවැත්වීමේ දී එම ආයතනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දෙනු ලැබීය.

(ඈ) බදු අයිතිය උගස් තැබීමේ පහසුකම

(i) ආයෝජක සමාගම, බැංකුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඇති කර ගත් සෑම ත්‍රෛපාක්ෂික ගිවිසුමක්ම Seal Register හි ලියාපදිංචි කරනු ලබන අතර එම ගිවිසුම්

පිළිබඳ විස්තර ලැයිස්තුගත කිරීම සහ පරිගණකගත කිරීම එමගින් සිදු කරනු ලැබේ. මෙයට අමතරව, නීති අංශය මගින් ද නාම ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ.

(ii) විවිධ යෝජනා පැවතියද, බදු අයිතිය උගස් තැබීමේ පහසුකම සම්බන්ධ වටිනාකම මත සීමාවක් පැනවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන නොතිබුණි. කෙසේ වුවද, ණය පහසුකම ලබා ගැනීම සඳහා ආයෝජක සමාගමට අනුමතිය ලබා දීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය/සභාපති ඔවුන්ගේ අභිමතය පරිදි ඉඩමේ/ගොඩනැගිල්ලේ වටිනාකම මත උපරිම සීමාව නියම වශයෙන් සඳහන් කර තිබුණ අතර ඒ අනුව, එය ත්‍රෛපාක්ෂික ගිවිසුමට ඇතුළත් කරන ලදී.

(iii) මුදල් ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලිය ගිවිසුමේ විශේෂයෙන් සඳහන් කරන ලද නියම සහ කොන්දේසිවලට අනුව සිදු කළ යුතු වේ. කෙසේ වුවද, නෛතික ක්‍රියාමාර්ග සඳහා කාලය ගත වන බැවින් නීති අංශය ක්ෂණිකව ක්‍රියාත්මක වීමට අවශ්‍ය වන සියලු පියවර ගෙන තිබුණි.

(ඉ) හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගම

(i) රබර් සංවර්ධන අධිකාරියෙන් තක්සේරු වාර්තාවක් ලබා නොගෙන මෙම ව්‍යාපෘතිය අධ්‍යක්ෂ ජනරාල් මට්ටමින් සලකා බලා අනුමත කර තිබුණු බව නිරීක්ෂණය කළ හැකි විය.

(ii) හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට වාසිදායක වන පරිදි මහාධිකරණය මගින් ලබා දී තිබූ තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ගොනු කරන ලදී. ඉහත දක්වා ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවල තීරණ මෙතෙක් ලැබී නොමැත.

(iii) කරුණාකර ඉහත 4.3 (ඉ) (i) සඳහා දී ඇති පිළිතුර බලන්න.

(iv) අධිකරණවල විභාග වෙමින් පවතින නඩු අවසන් වන තුරු ගෙවිය යුතු මුදල් ආපසු අය කර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකිය.

(ඊ) පර්ත් වතුයාය කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථාව වෙත පවරන ලදී.

(i) ආයෝජන මණ්ඩලය මගින් අවස්ථා ගණනාවක දී ඉල්ලීම් කර තිබුණ ද, 2007 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය සඳහා පර්ත් වතුයායේ විගණනය කරන ලද ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථාව මගින් මේ වන තෙක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2007 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල පරිච්ඡේදය සඳහා පර්ත් වතුයායේ විගණනය කරන ලද ගිණුම් ලැබීමෙන් අනතුරුව පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල් ප්‍රමාණය හඳුනා ගත හැකිය.

(iii) මේ සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වේ.

4.3 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

කීරගල ප්‍රදේශයේ පිහිටි මලිදුවාකන්ද වතුයාය ආයෝජන කලාපයක් ඉදි කිරීම සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙස ආයෝජන මණ්ඩලය මගින් හඳුනා ගනු ලැබ තිබේ. මෙම යෝජනාවට අනුව, ක්ෂුද්‍ර කාර්මික කලාපයකින් සහ ඉතිරි වන ප්‍රදේශයේ ස්ථාපනය කිරීමට අපේක්ෂිත තොරතුරු තාක්ෂණ උද්‍යානයකින් සහ දැනුමැති නගරයකින් ද මෙම ආයෝජන කලාපය සමන්විත වනු ඇත.

4.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ)

- ඇබෑර්තු සංඛ්‍යාව 104 ක් ලෙස නිවැරදි විය යුතුය.
- බඳවා ගැනීමේ පටිපාටියට අනුව, ඇබෑර්තු පිරවිය යුත්තේ ප්‍රසිද්ධ දැන්වීමක් මගිනි.
- ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා තිබුණ ද, බස්නාහිර, දකුණු සහ ඌව පළාත් සභා මැතිවරණ සහ ජනාධිපතිවරණය හේතුවෙන් 2014 වසරේ දී, ඇතැම් ඇබෑර්තු පිරවිය නොහැකි විය.
- 2015.06.30 වන විට ඇබෑර්තු 10 ක් පුරවනු ලැබීය. ඉතිරි ඇබෑර්තු පිරවීමට යථා කාලයේ දී කටයුතු කරනු ලැබේ

(ආ) 2011.09.27 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අනුව, සභාපති / අධ්‍යක්ෂ ජනරාල් තනතුරු එකක් (01) ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු එකක් (01) ක් ද පවතී. කෙසේ වුවද, 2012 අංක 3 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති තනතුර සහ අධ්‍යක්ෂ ජනරාල් තනතුර එකිනෙකින් වෙන් කර ඇත. එම නිසා, අතිගරු ජනාධිපතිතුමාට සභාපති තනතුර සහ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වෙන වෙනම නිලධාරීන් දෙදෙනෙකු පත් කළ හැකි වේ. ඉහත පනතේ 11 (1) වගන්තිය මගින් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා විධිවිධාන සලසා ඇත.

(ඇ) 2012 අංක 3 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධිත) පනතේ 11 (5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිර්ණය කරනු ලබන්නේය. ඒ අනුව, 2013.11.19 සහ 2014.11.20 යන දෙදින තුළ පිළිවෙළින් පවත්වනු ලැබූ 310 වන සහ 320 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමික පැකේජය තීරණය කර තිබුණි.

පූර්වයෙන් මෙම තනතුර දැරූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ද්විතීයනය කිරීමෙන් අනතුරුව ලද වැටුප ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස ස්ථිර තනතුරට අදාළව ඔහු ලැබූ වැටුප ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමි වැටුපෙන් 25% ක් ගෙවීම මත ද පදනම් වී තිබුණි. එයට අමතරව, ද්විතීයනය කිරීමේ පදනමින් මෙම මණ්ඩලයේ සේවය කරන සේවකයන්ට හිමි වන දීමනා ද, අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තනතුරට හිමි වන දීමනා ද ඔහු වෙත ගෙවා තිබුණි.

කෙසේ වුවද, මාස 15 ක කාල පරිච්ඡේදයක් මුළුල්ලේ එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාට රු.1,033,297.34 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණ බව මූල්‍ය අංශය මගින් දැනුම් දී තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඔහු විසින් ආපසු ගෙවිය යුතු මුදල මාසික වාරික වශයෙන් ගෙවීමේ පදනම මත වර්තමානයේ දී නිරවුල් කරමින් සිටින අතර අංක 088223 සහ 2015.05.14 දිනැති සහ අංක 088224 සහ 2015.06.25 දිනැති චෙක්පත් මගින් රු. 292,349.89 ක මුදලක් මේ වන විට ද ඔහු විසින් ගෙවා නිම කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 07 වන වගන්තිය ප්‍රකාරව, පත් කිරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා වෙත පහත සඳහන් පාරිශ්‍රමික පැකේජය ගෙවීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමතිය ලැබී ඇති බව මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් ඔහුගේ අංක PE/POLI/COM/2013/04 සහ 2014.03.07 දිනැති ලිපියෙන් දැනුම් දෙනු ලැබීය.

| | | |
|---|---|---|
| වැටුප | රු. | 325000.00 |
| නවාතැන් සැපයීම | රු. | 200,000.00 |
| ආපසු පැමිණීම සඳහා ගුවන් ටිකට් පත් දෙකක් | රු. | 65,000.00 |
| සංග්‍රහ වියදම් | රු. | 50,000.00 |
| | රු. | 640,000.00 |

(ඉ) පහත සඳහන් වන දීමනා ලබා දීම සඳහා ආරම්භයේ සිටම අවශ්‍ය අනුමති ලබාගෙන තිබුණි.

| | | |
|---|---|---|
| ප්‍රවාහණ දීමනාව | – | 1990.11.06 දින පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමතිය ලබා දෙනු ලැබීය.<br>අතිගරු ජනාධිපතිතුමා විසින් 1996.11.08 දින මේ සඳහා එතුමාගේ අනුමතිය ලබා දී තිබුණි. |
| KPPදීමනාව | – | 2013.10.29 දින පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී KPP දීමනාව සඳහා අනුමතිය ලබා දෙනු ලැබීය.<br>1990.11.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද සහ ඉන් අනතුරුව 1996.11.08 දින අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද පූර්වයෙන් ක්‍රියාත්මක කළ පැමිණීමේ දිරි දීමනා ලබා දීමේ යෝජනාක්‍රමය පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නියෝගය පරිදි, KPP දීමනාව ගෙවීම මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. පොදු ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා ගැනීම සඳහා KPP යෝජනාක්‍රමය 2014.06.03 දින එම දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී. |
| ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම | – | ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්ථාපනය කළ දිනයේ සිට ක්‍රියාත්මකව පවතී.<br>ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම 2007.03.20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැත කරන ලද මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහයට ද ඇතුළත් කර තිබුණි. |
| වෘත්තීය දීමනාව | – | 1991.09.13 දින පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී වෘත්තීය දීමනාව සඳහා අනුමැතිය ලබා දෙනු ලැබීය.<br>1991.11.01 දින ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වෘත්තීය දීමනාව සඳහා අනුමැතිය ලබා දෙන ලදී. |

4.5 <u>අනෙකුත් රාජ්‍ය ආයතනවලට ලබා දෙන ලද සම්පත්</u>

(i) ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා සහභාගී වන ලෙස දේශීය සහ විදේශීය ව්‍යාපාරික දූත මණ්ඩලවලට අයත් ව්‍යාපාරිකයන් 65 දෙනෙකු වෙත සිදු කරන ලද ආරාධනයකට අනුව තිල වශයෙන් සිදු කළ සංග්‍රහයක් සඳහා මෙම මුදල් ප්‍රමාණය වැය කර තිබුණි.

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපාරික වශයෙන් පවතින විභවය හඳුනා ගැනීමේ අරමුණින් පර්ල් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවැත් වූ මෙම රාත්‍රි භෝජන සංග්‍රහය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සත්කාරකත්වය දරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සභාපතිවරයා විසින් මෙම සංග්‍රහය සඳහා වූ පිරිවැය සඳහා අනුමතිය ලබා දුන් අතර මාධ්‍ය අයවැය උපයෝගී කර ගනිමින් මෙම ගෙවීම් සිදු කර තිබුණි.

2014 වර්ෂයේ පෙබරවාරි මස 10 සහ 11 දෙදින බෙල්ජියමේ පැවැත් වූ ආයෝජන

ප්‍රවර්ධනය පිළිබඳ රැස්වීම් මාලාවකට සහභාගි වන ලෙස ශ්‍රී ලංකාව සහ යුරෝපා හවුලේ ව්‍යාපාරික මණ්ඩලය මගින් එවකට සිටි ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත ආරාධනය කර තිබුණි. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, මේ සඳහා වූ සියලු වියදම් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ගෙවා තිබුණි.

ඉහත දක්වා ඇති රැස්වීම් අවසන් වීමෙන් අනතුරුව, ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා 2014 පෙබරවාරි 12 සිට 15 දින දක්වා පෞද්ගලික සංචාරයක් සඳහා ලන්ඩනය බලා පිටත්ව යන ලදී. ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික සංචාරය අතරතුර තවත් රැස්වීම් දෙකකට සහභාගී වන ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටින බව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2014 පෙබරවාරි 11 දිනැති ඔහුගේ ලිපියේ සඳහන් කර තිබුණ අතර අදාළ වියදම් ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාට ගෙවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2014 පෙබරවාරි 20 දිනැති ඔහුගේ ලුහුඬු සටහන මගින් උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව, ඉතිරි සංයුක්ත දීමනාව සහ අනියම් දීමනා නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත නිදහස් කර තිබුණි.

(ii) ▪ සහකාර අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළ කරුණු පිළිබඳව ආයෝජකයන් සම්බන්ධීකරණයකිරීම සහ පහසුකම් සැලසීම සඳහා ද, රාජ්‍ය නියෝජිතායතනවලින් අදාළ අනුමතීන් ලබා ගැනීම සඳහා ද මෙම නිලධාරියාව ගරු ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයාගේ කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.

- කෙසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවය සඳහා ඔහුව 2015.01.12 වන දින නැවතත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත කැඳවා තිබුණි.

▪ ආරක්ෂක නිලධාරී

- ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ කාර්යාලයට අනුයුක්ත කර ඇති
- කොන්ත්‍රාත් පදනම මත ලබා ගත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල තනතුරේ ධූර කාලය අවසන්ව තිබේ.

▪ පිළි ගැනීමේ නිලධාරී

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ භාණ්ඩ ලේඛනය නඩත්තු කරන නිලධාරියා ගරු අමාත්‍යවරයාගේ කාර්යාලයට මුදා හැර ඇති
- මෙසේ හුවමාරු කර ගන්නා ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් සේවකයකු ගරු අමාත්‍යවරයාගේ කාර්යාලයේ සේවයේ නිරත කරවා ඇති අතර එම නිලධාරියා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියා වේ.

▪ කාර්යාල සහායක

- ගරු අමාත්‍යවරයාගේ කාර්යාලයේ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ මෙම පුද්ගලයාටය.
- එම භාණ්ඩවල සුරක්ෂිතතාව සහ කල්පැවැත්ම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල ඔහුව ගරු අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා යොදවනු ලැබේ.

(iii) අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළ ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා වාහන කලින් කලට නිදහස් කරන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිලධාරින් ද අමාත්‍යාංශ නිලධාරීන් සමඟ ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා ගමන් කර තිබේ. මෙම කාර්යයන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සම්බන්ධ බැවින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල වාහන සඳහා වැය කළ යුතු අලුත්වැඩියා වියදම් ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය/ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ප්‍රතිචාර දක්වා නොමැත.

### 4.6 හඳුනාගත් අලාභ

පුද්ගලික සමාගමක් විසින් ඉතා ඉහළ අසාමාන්‍ය වන්දි මුදලක් ඉල්ලා සිටින ලද අතර අධිකරණයක දී මෙම වන්දි මුදල ඉල්ලා සිටින තත්ත්වයකට මෙම වන්දි ඉල්ලීම පත් වී තිබේ.

මෙම සමාගම මගින් අභිමත බේරුම්කරණ නඩු තීන්දුව මත රු.37,200,000/- ක අමතර ගෙවීමක් සඳහා හිමිකම් ඉල්ලා ඇති අතර මෙම අභිමත බේරුම්කරණ නඩු තීන්දුව මහාධිකරණයක දී බලාත්මක කිරීමට මෙම සමාගම බලාපොරොත්තු වේ. එම ඉල්ලීමේ යුක්තිසහගතබව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අභියෝග කරන ලද අතර මෙකී නඩුව තවමත් විභාග වෙමින් පවතී.

මෙම බේරුම්කරණ ක්‍රියාවලියේ හිමිකම් ඉල්ලා සිටින පාර්ශ්වය වන මෙම සමාගමේ සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් එකී අභිමත බේරුම්කරණ නඩු තීන්දුව සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ දී මේ වන විට අධි චෝදනා ගොනු කරමින් සිටියි. ඒ අනුව, අපරාධ නඩු දෙකක් මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

## 5. <u>ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය</u>

### 5.1 සංස්ථාපිත සැලැස්ම

මුල් සංස්ථාපිත සැලැස්ම වූයේ 2009-2013 දක්වා සම්පාදනය කරන ලද සැලැස්මයි. 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යුහය වෙනස් කරන ලද බැවින් ඒ අනුව, සංස්ථාපිත සැලැස්ම වෙනස් කිරීම අවශ්‍ය විය. එබැවින්, එහි ප්‍රතිඵලයක් ලෙස, 2011-2015 දක්වා වූ නව සංස්ථාපිත සැලැස්ම පිළියෙළ කරන ලදී. 2014 වර්ෂයේ දී, නැවත වරක් ආයෝජන ප්‍රවර්ධන සහ ආයෝජන ඇගයීමේ අංශ සඳහා නව ව්‍යුහයක් හඳුන්වා දෙනු ලැබූ අතර සංස්ථාපික සැලැස්ම 2014-2016 දක්වා කාලය සඳහා සංශෝධනය කරනු ලැබීය. 2014, 2015 සහ 2016 වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික ඉලක්ක 2014-2016 සඳහා වූ සංස්ථාපිත සැලැස්මේ අයිතම අංක 1.7 හි පැහැදිලිව සඳහන් කර ඇත.

පූර්වගාමී වසරවල තථ්‍ය සංඛ්‍යාලේඛන මත පදනම් වෙමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉලක්ක සකස් කර තිබෙන අතර දිවයිනේ ආර්ථික තත්ත්වයට අනුකූල වන පරිදි එම ඉලක්ක සංශෝධනය කළ හැකි වේ. එම නිසා රජයේ විගණන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ප්‍රකාශය සාවද්‍ය වේ.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 වර්ෂයේ දී, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කරන ලද අතර 2014.02.25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒ සඳහා අනුමතිය ලබා දී තිබුණි.

### 5.3 විගණන සහ කළමනාකරණ කමිටුව

විධිමත් පරිදි රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් බාධාවක් ලෙස ක්‍රියාත්මක වන විගණන කමිටුවේ ගණපූරණය පවත්වා ගැනීමේ අපහසුතාව අවබෝධ කර ගැනීමෙන් අනතුරුව,

කළමනාකාරීත්වය මගින් මෙම කමිටුව සඳහා තවත් සාමාජිකයකු පත් කරන ලද අතර පොදු ව්‍යවසාය මාර්ගෝපදේශවලට අනුකූලව 2014 වර්ෂයේ දී, අවම රැස්වීම් ප්‍රමාණය වශයෙන් රැස්වීම් හතරක් (04) ක් පැවැත්වීමට හැකියාව ලැබුණි.

කෙසේ වුව ද, 2015 වර්ෂයේ ජනවාරි මාසයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයෙන් අනතුරුව, එම කමිටුව විසුරුවා හරිනු ලැබූ අතර නව විගණන කමිටුව 2015 අප්‍රේල් මාසයේ දී පත් කරන ලදී. 2015 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් 2 ක් පවත්වා තිබුණි.

### 5.4 අයවැය පාලනය

අයවැය පාලන ක්‍රමය පිළිබඳ නිරීක්ෂණ සම්බන්ධයෙන් අපගේ එකඟත්වයක් නොමැත. අතිරේක අවශ්‍යතා සම්බන්ධයෙන් අනුමතිය ලැබී තිබේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අයවැය පාලන ක්‍රමය ඵලදායි කළමනාකරණ මෙවලමක් වශයෙන් භාවිත කර තිබේ.

### 6. <u>පද්ධති සහ පාලන</u>

(අ) ගිණුම් වාර්තා/ලේඛන නඩත්තු කිරීම

මිල දී ගත් දිනය, වත්කමේ පිරිවැය, වත්කමේ කේතය සහ වත්කම බැහැර කිරීම ආදිය සම්බන්ධ තොරතුරු ඇතුළත් වන IMAS පද්ධතිය තුළ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යනු ලබයි.

විලම්භිත වියදම් ලේඛනයක් පවත්වා ගෙන යෑම සඳහා පියවර ගෙන තිබේ.

ත්‍රෛපාක්ෂික ගිවිසුම් සඳහා ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ.

(b) පුද්ගල පඩිනඩි

| | | |
|---|---|---|
| වෘත්තීය දීමනාව | - | ඉහත 2.3 (ආ) (i) සඳහා දී ඇති පිළිතුර බලන්න. |
| රියදුරන් සඳහා දීමනාව | - | ඉහත 2.3 (අ) සඳහා දී ඇති පිළිතුර බලන්න. |
| මාසික ප්‍රවාහණය | - | ඉහත 4.4 (ඉ) සඳහා දී ඇති පිළිතර බලන්න. |

ඉන්ධන දීමනාවः

වාහන වෙන් කර ඇති නිලධාරීන් සඳහා මෙම දීමනාව ගෙවනු ලැබේ.

- ඉන්ධන පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා අංක 132008 (vi) සහ 2011 පෙබරවාරි 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අදාළ වේ.
- 2008 නොවැම්බර් 14 දින පවත්වන ලද 226 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දෙන ලදී

ප්‍රධාන කාර්යසාධන ගෙවීම - ඉහත 4.4 (ඉ) සඳහා දී ඇති පිළිතුර බලන්න.

(c) ව්‍යවසාය මගින් ගෙවිය යුතු මුදල් එකතු කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සෑම වසරකම ජනවාරි 1 වන දින බිම් කුලිය සහ වාර්ෂික ගාස්තු අය කර ගැනීම සඳහා සියලුම ව්‍යවසායවලට බිල්පත් යවනු ලැබේ. ගිවිසුම්වලට අනුව, සියලුම ව්‍යවසායන් විසින් සෑම වසරකම ජනවාරි 10 වන දාට පෙර බිම් කුලිය සහ වාර්ෂික ගාස්තු ගෙවිය යුතු වේ.

පහත දැක්වෙන ආකාරයෙන් විධිමත් කාල අන්තරවල දී සිහි කැඳවීම් යැවීම මගින් ව්‍යවසායන්වලින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල් ලබා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.

- පෙබරවාරි 28 වන දින වන විට ගෙවීම් නිරවුල් කරනු නොලැබුවහොත් පෙබරවාරි 28 වන දා සිට සේවා සැපයීම තාවකාලිකව අත්හිටුවනු ලබන බව දැනුම් දෙමින් පෙබරවාරි මාසයේ 1 වන සතිය තුළ සිහි කැඳවීමක් යවන ලදී.

- බිම් කුලිය සහ වාර්ෂික ගාස්තු ගෙවීම සඳහා අවසන් දිනය පෙබරවාරි 28 වන දා බව දැනුම් දෙමින් කලාප නිලධාරීන් ද දැනුවත් කරන ලදී.

- මාර්තු 2 වන දා වන විට, ගෙවීම් පැහැර හැර ඇති ව්‍යවසායන් සඳහා ලබා දෙන සියලුම සේවා තාවකාලිකව අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය දෙපාර්තමේන්තුව අදාළ දෙපාර්තමේන්තුවලට දැනුම් දී තිබුණි.

- සෑම දිනකම අවසානය වන විට ගෙවීමට ඉතිරිව ඇති මුදල පිළිබඳව

  කලාප / ප්‍රාදේශීය කාර්යාලවල අධ්‍යක්ෂවරුන් / ගණකාධිකාරීවරුන් / කළමනාකරුවන් දැනුවත් කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියේ දැක්වීමට කටයුතු පිළියෙළ කර ඇත.

- 2 වන සිහි කැඳවීම ජූනි 30 දින වන විට යවන ලදී.

- 2011 වසරේ සිට ආරම්භ කරමින් 3 වන සිහි කැඳවීම සැප්තැම්බර් මාසයේ 1 වන සතියේ දී යවන ලදී.

- 2007 වසරේ ඔක්තෝබර් 1 වන දා සිට ආරම්භ කරමින් ගෙවිය යුතු මුදල් ප්‍රමාද වී නිරවුල් කිරීම වෙනුවෙන් පොළී මුදලක් අය කරන ලදී. ඒ අනුව, මෙම වසරේ ජනවාරි 10 වන දිනෙන් පසුව පොළී මුදලක් අය කරනු ලැබීය.

- පූර්වගාමී වසරවල බිම් කුලිය සහ වාර්ෂික ගාස්තු ගෙවීම පැහැර හරින ලද ව්‍යවසාය පිළිබඳව ලැයිස්තුවක් ඒ හා සම්බන්ධ ගිවිසුම් අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අදාළ ආයෝජන පිළිබඳ ආංශික කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී.

- අදාළ ආයෝජන පිළිබඳ ආංශික කණ්ඩායම මගින් ව්‍යාපෘති අවලංගු කිරීමට පෙර ගෙවීමට ඇති මුදල් ගෙවන ලෙස ඉල්ලා සිටිමින් අදාළ වන ව්‍යවසායන් වෙත අනුගත නොවීම/අවලංගු කිරීම පිළිබඳ ප්‍රකාශයක් යවනු ලැබේ.

- අවලංගු කරන ලද ව්‍යාපෘතිවලින් ගෙවීමට ඇති මුදල් අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන ලෙස නීති දෙපාර්තමේන්තුවට

දැනුම් දෙනු ලැබේ.

- 2012 වසරේ සිට ආරම්භ කරමින් සියලු ව්‍යවසාය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලෙස නීති දෙපාර්තමේන්තුවට දන්වා ඇත. 2012 වසරට පෙර අවලංගු කරන ලද ව්‍යවසායන්වලට පමණක් ඉල්ලුම් ලිපි යවා තිබුණි.

- 2012 වසරේ සිට ආරම්භ කරමින් කලාප අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ විෂයපථයට අයත් වන ව්‍යවසායන්වල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම සඳහා මෙන්ම ණය ආපසු ගෙවීම වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා බලය බෙදා හැර තිබේ.

- 2013 මැයි මාසයේ සිට ආරම්භ කරමින් ගෙවිය යුතු මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම සඳහා වෙනම අධීක්ෂණ ඒකකයක් ස්ථාපනය කරන ලදී.

ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගෙන ඇති පියවර;

- ගෙවීමට ඉතිරිව ඇති මුදල් ප්‍රමාණ පිළිබඳව දැනුම් දෙමින් ගිවිසුම්වලට අනුගත නොවීම සම්බන්ධයෙන් ලිපි යැවීම.
- ව්‍යාපෘති පරීක්ෂා කර බැලීම සහ ගෙවිය යුතු මුදල් ආපසු ගෙවන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කිරීම.
- ව්‍යවසායවල අදාළ නිලධාරීන් සමඟ සන්නිවේදනය කිරීම.


ගෙවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා ගත හැකි සියලු ප්‍රයත්නයන් දැරීමෙන් අනතුරුව පවා ව්‍යවසායන් තවදුරටත් ගෙවීම් පැහැර හරින්නේ නම් ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් පැහැර හරින ලද ව්‍යවසායන්වල ලැයිස්තුව නීතිමය කටයුතු සිදු කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුවට යවනු ලබයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2014 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ රැස් කරන ලද ආපසු ගෙවිය යුතු මුදල් ප්‍රමාණය රු. 20,820,911.98 ක් විය.

(ඇ) ජර්නල් සටහන් පිළිබඳ පාලනය

ගෙවීම් සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද මූල්‍යමය වශයෙන් බලය බෙදා හැරීම සියලුම කලාපවලින් සිදු කරනු ලබන ජර්නල් සටහන් සම්බන්ධයෙන් ද අදාළ වේ. ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශය භාරව සිටින නිලධාරියාට ජර්නල් සටහන් අනුමත කිරීම සඳහා බලය පවරා තිබේ.

# BOARD OF INVESTMENT OF SRI LANKA - ORGANIZATION CHART (31.12.2014)




✷ POSTS WILL BE REMOVED ON THE EXIT OF CURRENT JOB HOLDERS

| POSTS | |
|---|---|
| CHAIRMAN | |
| DG | - DIRECTOR GENERAL |
| DDG | - DEPUTY DIRECTOR GENERAL |
| ED | - EXECUTIVE DIRECTOR |
| D | - DIRECTOR |
| SDD | - SENIOR DEPUTY DIRECTOR |

| LOCATIONS | | | |
|---|---|---|---|
| ACT | - AIR CARGO TERMINAL | MIEPZ | - MIRIJJAWILA EPZ |
| BEPZ | - BIYAGAMA EPZ | MWEPZ | - MAWATHAGAMA EPZ |
| CRO & KIP | - CENTRAL REGIONAL OFFICE & KANDY IP | NWRO | - NORTH WESTERN REGIONAL OFFICE |
| CVT | - CARGO VERIFICATION TERMINAL | PEPZ | - POLGAHAWELA EPZ |
| HEPZ | - HORANA EPZ | SEPZ | - SEETHAWAKA EPZ |
| JRO | - JAFFNA REGIONAL OFFICE | SRO & KGEPZ | - SOUTHERN REGIONAL OFFICE & KOGGALA EPZ |
| KEPZ | - KATUNAYAKE EPZ | SWEPZ | - SOORIYAWEWA EPZ |
| MEPP | - MALWATTE EPP | WEPZ | - WATHUPITIWALA EPZ |
| MEPZ | - MIRIGAMA EPZ | WTC | - WORLD TRADE CENTRE OFFICE |

☐ - VACANT

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය

ප්‍රධාන කාර්යාලය (ලෝක වෙළඳ මධ්‍යස්ථාන කාර්යාලය), 05, 06, 08, 09, 19, 24, 25 , 26 & 27 වන මහළ, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇවිලන් චතුරස්‍රය, කොළඹ 01.
දුරකථන: 011-2434403-5, 2435027, 2447531 2385972-6, 2346131-3 011-2435407-9, 2445779, 2331909, 2331910-3, 2342404
ෆැක්ස්: 011-2430625, 2399891
විද්‍යුත් තැපැල: infoboi@boi.lk

කටුනායක අපනයන සැකසුම් කලාපය,
කටුනායක, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9411) 2252364-5, 2252140, 2252038, 4833737, 4833741, 4833774, 4833779, 4833817, 4833819
ෆැක්ස්: (+9411) 2253207
විද්‍යුත් තැපැල: kepz@boi.lk

බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම, මල්වාන, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9411) 2465206 – 09
ෆැක්ස්: (+9411) 2465227
විද්‍යුත් තැපැල: bpz@boi.lk

හොරණ අපනයන සැකසුම් කලාපය,
බොරලුගොඩ, පෝරුවදණ්ඩ, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9434) 2269296, 2269752, 2258077
ෆැක්ස්: (+9434) 2255687, 2258029
විද්‍යුත් තැපැල: hepz@boi.lk

මීරිගම අපනයන සැකසුම් කලාපය,
මහයායවත්ත, ලෝලුවගොඩ, මීරිගම, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9433) 2274657, 2276626, 2276393
ෆැක්ස්: (+9433) 2274657, 2276393
විද්‍යුත් තැපැල: mepz@boi.lk

වතුපිටිවල අපනයන සැකසුම් කලාපය,
වතුපිටිවල, ශ්‍රී ලංකාව.
Tel : 033-2281604 , 033-2281381
ෆැක්ස්: 033-2282364
විද්‍යුත් තැපැල: wepz@boi.lk

මල්වත්ත අපනයන සැකසුම් කලාපය,
තිහාරිය, නිට්ටඹුව, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9433) 2288826, 2296166, 2296620
ෆැක්ස්: (+9433) 2288826
විද්‍යුත් තැපැල: mepp@boi.lk

සීතාවක අපනයන සැකසුම් කලාපය,
අවිස්සාවේල්ල, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9436) 2231082
ෆැක්ස්: (+9436) 2231083
විද්‍යුත් තැපැල: sip@boi.lk

කොග්ගල අපනයන සැකසුම් කලාපය,
කොග්ගල, හබරාදුව.
දුරකථන: 091-2283425
ෆැක්ස්:: 091-2283370
විද්‍යුත් තැපැල: kgepz@boi.lk

මධ්‍යම කලාප කාර්යාලය,
මහනුවර කාර්මික උද්‍යානය, කෙන්ගල්ල, ශ්‍රී ලංකාව.
දුරකථන: (+9481) 2423992, 2423994
ෆැක්ස්:: (+9481) 2420091, 2423995
විද්‍යුත් තැපැල: kip@boi.lk

වයඹ කලාප කාර්යාලය,
මාස් ෆැබ්රික් පාර්ක්, කුරුණෑගල පාර,
තුල්හිරිය.
දුරකථන: 037-2277037 , 037-2277038
ෆැක්ස්: : 037-2277036
විද්‍යුත් තැපැල: nwro@boi.lk

පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය,
කෑගල්ල පාර, පොල්ගහවෙල, ශ්‍රී ලංකාව
දුරකථන: (+9437) 2244657 / 2241526
ෆැක්ස්: (+9437) 2244657
විද්‍යුත් තැපැල: pwepz@boi.lk

මාවතගම අපනයන සැකසුම් කලාපය,
ඩිනෙවෝර් වතුයාය, නුවර පාර, මාවතගම, ශ්‍රී ලංකාව
දුරකථන: (+9437) 2298147
ෆැක්ස්: (+9437) 2296041
විද්‍යුත් තැපැල: mwepz@boi.lk

මධ්‍යම සත්‍යාපන පර්යන්තය
සිලෝන් ෂිපින් ලයින්ස් යාර්ඩ්,
අංක 70, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත.
දුරකථන: 011-2547485, 4411591, 4978969
ෆැක්ස්: 011-2547485, 4411592 026-2233002

ගුවන් භාණ්ඩ සත්‍යාපන ඒකකය
බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ,
කටුනායක.
දුරකථන: 011-2252155, 4833834, 2265183
ෆැක්ස්: 011-2252155

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල විශේෂ ආර්ථික කලාපය
ප්‍රීමා කර්මාන්තශාලා පාර, චීන බොක්ක,
ත්‍රිකුණාමලය.
දුරකථන: 026-2233003
ෆැක්ස්: 026-2233002

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල මිරිජ්ජවිල කාර්මික උද්‍යානය,
මිරිජ්ජවිල, හම්බන්තොට.
දුරකථන: 047-2221596

යාපනය කලාප කාර්යාලය,
එන්එච්ඩීඒ ගොඩනැගිල්ල, චුන්ඩුකුලි, යාපනය.
දුරකථන: 021-2221336, 021-2222130
ෆැක්ස්: 021-2221336